ශ්‍රී ලංකා
විදුලි සංදේශ
නියාමන
කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව
# 2018



**අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය**

මෑත වසරවල සැලකියයුතු ප්‍රගතියක් ලබා ඇති ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය රටේ සහ අපේ සමාජයේ සංවර්ධනයට සරිලන පරිදි වේගවත් වර්ධනයක් සඳහා සූදානම්ව සිටීම සතුටට කරුණකි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) මෙම අංශයේ සංවර්ධනය සඳහා රජයේ ප්‍රතිපත්තියට අනුකූලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර බලපත්‍ර සේවා සපයන්නන්ගේ සහාය ඇතිව රට තුළ සම්බන්ධතාවය පුළුල් කරයි. ශ්‍රී ලාංකීය සමාජය කරා අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාප්ත කිරීම මෙන්ම ස්ථාවර සහ ජංගම ක්ෂේත්‍රවල යටිතල පහසුකම් ව්‍යාප්තිය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු විය. මෙම පහසුකම් වැඩිදියුණු කිරීම නාගරික හා ග්‍රාමීය යන දෙඅංශයේම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ව්‍යාප්තියට දායක වේ. මෙමගින් දුරස්ථ වෛද්‍ය උපදෙස් සේවා, ඊ-රාජ්‍යය, ඊ-වාණිජ්‍යය, ඊ-කෘෂිකර්මය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ දුරස්ථ ඉගැන්වීම මෙන්ම විනෝදාස්වාදය සහ වෙනත් සේවා වැනි ඩිජිටල් සම්බන්ධතාවයේ වැදගත් අංශ වෙත ප්‍රවේශ වීමට හැකියාව ලැබේ.

සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ දී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ නව වෙනස්කම් ඇති කිරීම සඳහා පැහැදිලිව යොමු වීමත් සමග, විදුලි සංදේශ ක්ෂේත්‍රය රටේ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට බෙහෙවින් ඉවහල් වී තිබේ. මේ සඳහා සියලු තිරසාර සංවර්ධන ආයතන තොරතුරු

තාක්ෂණ සංවර්ධනයට සරිලන පරිදි පද්ධති වෙනස් කිරීම හා සම්බන්ධ කටයුතුවල නියැලී සිටී.

මෙම වර්ෂයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) ඒකාබද්ධ සංවිධානය කරන ලද ආසියා ශාන්තිකර කලාපීය රටවල්වල විදේශීය නියෝජිතයන්ගේ සහභාගීත්වය ඇතිව පවත්වන ලද නියාමන සම්මන්ත්‍රණය මගින් විදුලි සංදේශ නියාමකයන්, සේවා සැපයුම්කරුවන් අතර අත්දැකීම් හුවමාරුවීම ශක්තිමත් කිරීම, ප්‍රතිපත්ති සහ නියාමනය, සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරනය, ජාල, බලපත්‍රකරණය සහ වෙනත් අදාල නියාමන කරුණු වැනි ප්‍රධාන ප්‍රස්තුතයන් පිළිබඳව සාකච්ජා කරන ලද අතර අදහස් හුවමාරු කර ගන්නා ලදී. එමෙන්ම පාර්ශවකරුවන්, සේවා සැපයුම්කරුවන් සහ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) අනුග්‍රාහකත්වය ඇතිව පුහුණු පහසුකම් හුවමාරුව සහ සත්කාරකත්වය සිදු කරන ලදී.

මෙම වසර තුළදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව රට වැඩිදියුණු කිරීම සඳහා දායක වී ඇති අතර ඉදිරි වසරවලදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෙම ප්‍රශංසනීය සේවය අඛණ්ඩව ඉදිරියට ගෙන යනු ඇතැයි මම විශ්වාස කරමි. සංවර්ධන ක්‍රියාදාමයේදී මෙම වැදගත් ක්ෂේත්‍රයට අනාගත අභියෝගයන්ට සෑම අයුරකින්ම සාර්ථකව මුහුණ දීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරමි.

මෙම වසර තුළදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව රටේ ප්‍රවර්ධනය සඳහා දායක වී ඇති අතර ඉදිරි වසරවලදී මෙම ප්‍රශංසනීය සේවා වාර්තාව අඛණ්ඩව ඉදිරියට ගෙන යනු ඇතැයි මාගේ විශ්වාසයි. මෙම වැදගත් ක්ෂේත්‍රය තුළ සංවර්ධන ක්‍රියාකාරකම්වල අනාගත අභියෝග ජය ගැනීමට හැකි වනු ඇතැයි මම විශ්වාස කරමි.



මෛත්‍රීපාල සිරිසේන
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අතිගරු ජනාධිපති

# සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාව සතුව ඉතා ශක්තිමත් විදුලි සංදේශ අංශයක් පවතින අතර ජංගම දුරකථන මිලියන 32.5 ක්, ස්ථාවර ග්‍රාහකයින් මිලියන 2.5 ක් සහ අධිවේගී අන්තර්ජාල ග්‍රාහකයින් මිලියන 7.2 ක් සිටී. ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන වෙළෙඳපොළ 100% දුරකථන ග්‍රාහක ව්‍යාප්ති අනුපාතය (පුද්ගලයින් 100 කට ඇති දුරකථන සම්බන්ධතා) දැනටමත් පසු කර තිබීම සන්ධිස්ථානයකි. 2018 වසර අවසාන වන විට, ජංගම දුරකථන ව්‍යාප්ති අනුපාතය සහ ස්ථාවර දුරකථන ව්‍යාප්ති අනුපාතය පිළිවෙලින් 150% සහ 11.5%ක් විය.

3 වන පරම්පරාව (3G), 3.5 වන පරම්පරාවේ අධිවේගී පැකට් ප්‍රවේශ (3.5G HSPA), අධිවේගී පැකට් ප්‍රවේශ + සහ 4 වන පරම්පරාව - දිගු කාලීන පරිණාමය (4G -LTE – Long Term Evolution) වැනි ඊළඟ පරම්පරාවේ ජාල හඳුන්වාදුන් දකුණු ආසියානු කලාපයේ ප්‍රථම රට ශ්‍රී ලංකාවයි. මුළු ජනගහනයෙන් 75% ක් 3 වන පරම්පරාව සහ 4 වන පරම්පරාවේ තාක්ෂණයෙන් ආවරණය වන අතර වැඩිදුරටත් හිතකර තරඟකාරිත්වයක් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තාක්ෂණික ක්ෂේත්‍රය තුළ අඛණ්ඩව, ශ්‍රී ලංකාව සංවර්ධිත රටවල් සමඟ නව හා පරිණාමය වෙමින් පවතින තාක්‍ෂණයන් ශ්‍රී ලංකාව සංවර්ධිත රටවල් සමඟ නව හා පරිණාමය වෙමින් පවතින තාක්‍ෂණයන් සමඟ සමපාතවී ඇත.

ප්‍රධාන සබ්මැරීන් කේබල් පද්ධති තුනක් හරහා ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර සම්බන්ධතාවයක් ඇත. ප්‍රධාන සබ්මැරීන් කේබල් වන්නේ ගිනිකොනදිග ආසියාව - මැදපෙරදිග - බටහිර යුරෝපය (SEA-ME-WE) සහ ගෝලීය අවට දෘශ්‍ය තන්තු සම්බන්ධතාවය (FLAG) සහ බෙංගාල බොක්ක ප්‍රවේශයයි (BBG). ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම, ලංකා බෙල් සහ ඩයලොග් ආසියාටා පී.එල්.සී සමාගම විසින් භූගත මධ්‍යස්ථාන ක්‍රියාත්මක කරනු ලැබේ. SEA-ME-WE මුහුදු සංදාම දෘශ්‍ය තන්තු සම්බන්ධතා: SEA-ME-WE 3, SEA-ME-WE 4, භාරත් - ලංකාව (ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර) සහ ධිරාගු (මාලදිවයින සහ ශ්‍රී ලංකාව අතර) ගෝලීය ආවරණය ශක්තිමත් කරයි. SEA-ME-WE 5 ජාත්‍යන්තර යටි කේබල් පද්ධතිය තවත් වැදගත් සම්බන්ධතා ව්‍යාපෘතියකි. SEA-ME-WE 5 කේබල් මධ්‍යස්ථානය මාතර ස්ථාපනය කර තිබේ. තත්පරයට ටෙරාබයිට් 24 ධාරිතාවයකින් යුත් මෙම කේබලය සිංගප්පූරුවේ සිට ප්‍රංශය දක්වා දිවෙන අතර භූගත මධ්‍යස්ථාන 16 ක් ඇත.

විදුලි සංදේශ හා තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය රටේ සංවර්ධන ඉලක්ක කරා වේගයෙන් ප්‍රවේශ වන වාහකයකු වේ. රටක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් සංවර්ධනයේ බලපෑම සම්පූර්ණයෙන් වටහා ගත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සිය නියාමන කටයුතුවලට සහභාගී වෙමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම රටේ අවශ්‍යතා ඇති කොටස් වෙත ගෙන ඒමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා 2018 වසරේදී ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ බලපත්‍රලාභී විදුලි සංදේශ

ක්‍රියාකරුවන්ගේ සහාය ඇතිව ඵලදායී වැඩසටහන් දියත් කළේය. 2018 වර්ෂය තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෙරට විදුලි සංදේශ ක්‍ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ඵලදායීවූ ක්‍රියාකාරකම් රාශියක් ආරම්භ කරන ලදී.

2018 වසරේදී කොමිෂන් සභාව විසින් නියාමන ක්‍රියාමාර්ග තුළින් උපයන ලද ආදායම 2018 දී රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රශස්ත ආදායම් ප්‍රභවයක් වී තිබේ.

2018 වර්ෂය දෙස ආපසු හැරී බලන විට, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වර්ෂය තුළ සිය ප්‍රගතිය සාක්ෂාත් කර ගත් අතර මෙම අංශයේ පුහුණුව හා තාක්ෂණික දියුණුව ඇතුළු බොහෝ ප්‍රතිලාභ අත්කරගෙන විදුලි සංදේශ හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේය.

නියාමන කර්තව්‍යය සාක්ෂාත් කර ගැනීම සහ විදුලි සංදේශ ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ ප්‍රශංසනීය සේවය පූර්ණ වශයෙන් ලබාදීම මම බෙහෙවින් අගය කරමි.

සභාපති
ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ
නියාමන කොමිෂන් සභාව

# පටුන

01 පරිච්ඡේදය ..... 1
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ල.වි.ස.නි.කො.ස) ආරම්භය, දර්ශනය, මෙහෙවර, අරමුණු සහ වගකීම්

02 පරිච්ඡේදය ..... 7
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) කොමිෂන් සභා සාමාජිකයන් සහ විධායක නිලධාරීන්

03 පරිච්ඡේදය ..... 11
විදුලි සංදේශ අංශය පිළිබඳ සමාලෝචනය

04 පරිච්ඡේදය ..... 17
2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රගති සමාලෝචනය

05 පරිච්ඡේදය ..... 25
කාර්යසාධන

- බලපත්‍ර කළමනාකරණ අංශය ..... 27
- ජාල අංශය ..... 33
- ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශය ..... 39
- සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය ..... 53
- නීති අංශය ..... 59
- තරඟකාරීත්ව අංශය ..... 63
- අනුකූලතා අංශය ..... 73
- පාරිභෝගික සම්බන්ධතා සහ මහජනතාව දැනුවත්කිරීම ..... 79
- විශේෂ ව්‍යාපෘති අංශය ..... 83
- පාලන, මානව සම්පත්, ආයතනික කටයුතු සහ සැලසුම් අංශය ..... 97
- මූල්‍ය අංශය ..... 111
- තොරතුරු තාක්ෂණ ඒකකය ..... 117
- අභ්‍යන්තර විගණන ..... 119

06 පරිච්ඡේදය ..... 127
විගනණය කළ මූල්‍ය ප්‍රකාශනය

07 පරිච්ඡේදය ..... 155
විගණකාධිපතිගේ වාර්තාව

# කෙටි යෙදුම් ලැයිස්තුව

| | |
|---|---|
| APNIC | Asia Pacific Network Information Center<br>ආසියා ශාන්තිකර ජාල තොරතුරු මධ්‍යස්ථානය |
| APT | Asia Pacific Telecommunity<br>ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාව |
| ARPU | Average Revenue per User<br>පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය |
| ASMS | Antenna Structure Management System<br>ඇන්ටනා ව්‍යුහ කළමණාකරන පද්ධතිය |
| BOI | Board of Investment<br>ආයෝජන මණ්ඩලය |
| CERT | Computer Emergency Readiness Team<br>පරිගණක ආපදාවලට  සූදානම්වීමේ  සංසදය |
| CID | Criminal Investigation Department<br>අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව |
| CSR | Corporate Social Responsibility<br>ආයතනික සමාජ වගකීම් |
| CTO | Commonwealth Telecommunication Organization<br>පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය |
| CWG | Council Working Group<br>සංගම් කාර්ය කණ්ඩායම |
| DOA | Department of Agriculture<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| DTH | Direct To Home<br>සෘජු ගෘහස්ථ |
| FAO | Food and Agriculture Organization<br>ආහාර හා කෘෂිකර්ම සංවිධානය |
| GCI | Global Cyber Security Index<br>ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකය |
| GND | Grama Niladari Division<br>ග්‍රාම නිලධාරී කොට්ඨාශය |
| GMDSS | Global Maritime Distress Safety System<br>ගෝලීය සමුද්‍ර ආපදා ආරක්ෂණ පද්ධතිය |
| HFDF | High Frequency Direction Finding<br>අධි සංඛ්‍යාත දිශා නිශ්චය කිරීම |
| ICT | Information and Telecommunications Technology<br>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය |
| ICTA | Information and Communication Technology Agency<br>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය |
| IMT | Institut Mines Telecom<br>මයින්ස් ටෙලිකොම් ආයතනය |
| ISP | Internet Service Provider<br>අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් |

| | |
|---|---|
| IT | Information Technology<br>තොරතුරු තාක්ෂණය |
| ITOL | International Telecommunication Operators Levy<br>ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු |
| ITU | International Telecommunication Union<br>ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය |
| JICA | Japanese International Cooperation Agency<br>ජපන් ජාත්‍යන්තර සහයෝගීත්ව නියෝජිතායතනය |
| LT | Lotus Tower<br>නෙළුම් කුලුන |
| MFR | Master Frequency Register<br>ප්‍රධාන සංඛ්‍යාත රෙජිස්ටරය |
| MOA | Ministry of Agriculture<br>කෘෂිකර්ම අමාත්‍යාංශය |
| NIA | National Information Agency<br>ජාතික තොරතුරු නියෝජිතායතනය |
| OLAC | Outgoing Local Access Charges<br>පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු |
| OTT | Over the Top<br>විදුලි සංදේශ සේවා සැපයුම්කාර සමාගම් විසින් අන්තර්ජාල සම්මුති ජාලයක් ඔස්සේ සේවා සැපයීම |
| PCU | Project Consultancy Unit<br>ව්‍යාපෘති උපදේශන ඒකකය |
| PILD | Policy International Relation and License Division<br>ප්‍රතිපත්ති ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර අංශය |
| PPP | Private Public Partnership<br>පෞද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වය |
| PSTN | Public Switching Telephone Network<br>පොදු ස්විචීකරණ දුරකථන ජාල |
| QOS | Quality of Service<br>සේවා තත්ත්ව |
| RMC | Regional Monitoring Centers<br>ප්‍රාදේශීය පිරික්සුම් මධ්‍යස්ථාන |
| RMS | Remote Monitoring Stations<br>දුරස්ථ පිරික්සුම් මධ්‍යස්ථාන |
| RTE | Radio Terminal Equipment<br>ගුවන් විදුලි පර්යන්ත උපකරණ |
| SAARC | South Asian Association for Regional Co-opration<br>ප්‍රාදේශීය සහයෝගීත්වය පිළිබඳ දකුණු ආසියානු සංගමය |
| SAFIR | South Asian Forum for Infrastructure Regulation<br>යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සමුළුව |
| SED | Small Enterprises Development<br>කුඩා ව්‍යවසාය සංවර්ධන |
| SLLRDC | Sri Lanka Land Reclamation and Development Corporation<br>ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව |

| | |
|---|---|
| SME | Small and Medium Sized Enterprises<br>කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් |
| TL | Telecommunication Levy<br>විදුලි සංදේශ බදු |
| TDC | Telecommunication Development Charges<br>විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව |
| TRCSL | Telecommunications Regulatory Commission of SrI Lanka<br>ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව |
| TSO | Telecommunications System Operators<br>විදුලි සංදේශ පද්ධති ක්‍රියාකරුවන් |
| UDA | Urban Development Authority<br>නාගරික සංවර්ධන අධිකාරිය |
| URL | Uniform Resorce Locator<br>ඒකරූපී සම්පත් නිවේශකය |
| VTC | Vocational Training Centers<br>වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන |
| WTISD | World Telecommunication and Information Society Day<br>ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය |

# වගු


වගුව 01: 2018 දෙසැම්බර් මස අවසන් වන විට විදුලි සංදේශ අංශයේ සංඛ්‍යානමය දළ විශ්ලේෂණය ...............13
වගුව 02: දුරකථන ව්‍යාප්තිය පිළිබඳ විස්තර 2009-2018 ...............14
වගුව 03: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම ...............15
වගුව 04: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකාර සමාගම්වල එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍ය ආදායම ...............16
වගුව 05: විදුලි සංදේශ බදු, විදුලි සංදේශ සංදේශ සංවර්ධන බදු හා පිටතට යැවෙන දේශිය ප්‍රවේශ ගාස්තු බදු ....16
වගුව 06: ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ...............16
වගුව 07: ජාල අංශය ආශ්‍රිත සංඛ්‍යා ලේඛන 2017-2018 ...............37
වගුව 08: රාජ්‍ය ආයතන සඳහා වෙන් කරන ලද කෙටි සංකේත අංක...............37
වගුව 09: පෞද්ගලික අංශයේ ආයතන සඳහා වෙන් කරන ලද කෙටි සංකේත අංක...............38
වගුව 10: මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය ...............38
වගුව 11: වාර්ෂික දායකත්වය සහ සාමාජික ගාස්තු ...............51
වගුව 12: සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව...............55
වගුව 13: 2018 වර්ෂයේදී ලැබුණු පැමිණිලි සහ පැවැත්වූ විමර්ශන ...............56
වගුව 14: 2018 වර්ෂයේදී හඳුනාගත් නීතිවිරෝධී භාවිතා කරන්නන් ...............56
වගුව 15: 2018 වර්ෂයේදී නිකුත් කරන ලද නිෂ්කාශන ලිපි සංඛ්‍යාව ...............56
වගුව 16: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහක පදනමේ සංඛ්‍යාව ...............64
වගුව 17: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍ය ...............64
වගුව 18: විදුලි සංදේශ බදු ...............65
වගුව 19: සෙස් ...............65
වගුව 20: විදුලි සංදේශ සංවර්ධන ගාස්තු රැස් කිරීම ...............71
වගුව 21: පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු රැස් කිරීම් ...............72
වගුව 22: පාරිභෝගික සම්බන්ධතා ප්‍රගතිය ...............81
වගුව 23: කොන්ත්‍රාත්තු සාරාංශය ...............85
වගුව 24: නෙළුම් කුලුන ව්‍යාපෘතියේ ප්‍රගතිය ...............85
වගුව 25: කාර්යාල චක්‍රලේඛ නිකුත් කිරීම සහ කාර්යාල පටිපාටි හඳුන්වාදීම ...............99
වගුව 26: පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ සමුළු වලට සහභාගීවීම...............100
වගුව 27: කණිෂ්ඨ ප්‍රසම්පාදන කමිටුවේ සහ ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටුවේ රැස්වීම් ...............106
වගුව 28: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආදායම ...............113
වගුව 29: ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය...............115

# රූපසටහන්

රූපසටහන් 01: ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය - ජී.එස්.එම් ආයතනය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පුහුණුව “අන්තර්ජාලයේ දෑ”....................41
රූපසටහන් 02: තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා නවීන යෙදුම් සැලසුම් සහ සංවර්ධනය....42
රූපසටහන් 03: පිලියන්දල කලාපයේ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම ..........43
රූපසටහන් 04: මීගමුව කොච්චිකඩේ මහා විද්‍යාලයේ උසස් පෙළ තොරතුරු තාක්ෂණ සිසුන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම....................43
රූපසටහන් 05: කළුතර, හොරණ සහ මතුගම කලාපවල විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම ....................44
රූපසටහන් 06: විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් සහ ඔවුන්ගේ දෙමාපියන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම ....................44
රූපසටහන් 07: කැළණිය සහ ගම්පහ කලාපවල විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම ....................44
රූපසටහන් 08: ගම්පහ බණ්ඩාරවත්ත පරාක්‍රම මහා විද්‍යාලයේ උසස් පෙළ තොරතුරු තාක්ෂණ සිසුන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම....................44
රූපසටහන් 09: සීදුව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම....................45
රූපසටහන් 10: කොරියානු ස්වේච්ඡා කණ්ඩායම් සීගිරියේ කරන ලද ක්ෂේත්‍ර චාරිකාව ....................45
රූපසටහන් 11: ආ.ශා. විදුලි සංදේශ හා සන්නිවේදන තාක්ෂණ සමුළුව - 15හි සාකච්ඡා පවත්වාගෙන යමින්........47
රූපසටහන් 12: ආ.ශා. විදුලි සංදේශ හා තොරතුරු සන්නිවේදන තක්ෂණ සමුළුව 15 විවෘත කරමින් ...............47
රූපසටහන් 13: ආසියා ශාන්තිකර විදුලි සංදේශ/තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධන සමුළුව සඳහා සහභාගීවන්නන් ....................47
රූපසටහන් 14: “ජංගම දුරකථන පෞද්ගලික දත්ත රහස්‍යතා ප්‍රතිපත්ති” පිළිබඳ පුහුණු පාඨමාලාව....................48
රූපසටහන් 15: සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ සංගමයේ ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම ....................49
රූපසටහන් 16: “අන්තර්ජාල සම්මුති - බහු සම්මුති ලේබල් ස්විචීකරණ සම ජාල තාක්ෂණයන්” පිළිබඳ දේශීය පුහුණු පාඨමාලාව ....................50
රූපසටහන් 17: පොලොන්නරුව දිස්ත්‍රික්කයේ සිදු කරන ලද විමර්ශනයන් ....................68
රූපසටහන් 18: කළුතර දිස්ත්‍රික්කයේ අධ්‍යයනය කළ ප්‍රදේශ ....................69
රූපසටහන් 19: කළුතර දිස්ත්‍රික්කයේ සිදු කරන ලද විමර්ශන ....................70
රූපසටහන් 20: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳව සකස් කරන ලද අත් පත්‍රිකා....................70
රූපසටහන් 21: ස්වයං වේග පරීක්ෂණ වාර්තාව....................76
රූපසටහන් 22: ජාල වේගී පරීක්ෂණ ප්‍රතිඵල (ශ්‍රී කොමිෂන් සභාවේ ස්ථාපිත) ....................77
රූපසටහන් 23: ජාල වේගී පරීක්ෂණ ප්‍රතිඵල (ශ්‍රී කොමිෂන් සභාවේ පිටත ස්ථාපිත)....................77
රූපසටහන් 24: නෙළුම් කුලුන - සිවිල් වැඩ ....................86
රූපසටහන් 25: නෙළුම් කුලුන - කුලුනු ශෘහය ....................87
රූපසටහන් 26: නෙළුම් කුලුන - වානේ ව්‍යුහය....................87
රූපසටහන් 27: නෙළුම් කුලුන - කුලුනු පාදම....................87
රූපසටහන් 28: නෙළුම් කුලුන - ඇන්ටනා ආධාරකය....................88
රූපසටහන් 29: නෙළුම් කුලුන - බිත්ති ආවරණ ....................88
රූපසටහන් 30: නෙළුම් කුලුන - අභ්‍යන්තර අලංකරණය ....................88
රූපසටහන් 31: නෙළුම් කුලුන - මුළුතැන්ගෙය ....................89
රූපසටහන් 32: නෙළුම් කුලුන - යාන්ත්‍රික සහ විදුලි ජලනල වැඩ....................89

# ප්‍රස්ථාර

ප්‍රස්ථාරය 01: ස්ථාවර සහ ජංගම දුරකථන දායකත්වයේ වර්ධනය ....................................................................13
ප්‍රස්ථාරය 02: ස්ථාවර, පටුපරාස සහ ජංගම අධිවේගී අන්තර්ජාල සේවා දායකත්වයන්........................................14
ප්‍රස්ථාරය 03: පොදු දුරකථන කුටි පළාත් මට්ටමින් බෙදා හැරීම .......................................................................14
ප්‍රස්ථාරය 04: විදුලි සංදේශ කර්මාන්තයේ ආයෝජන ...........................................................................................15
ප්‍රස්ථාරය 05: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම..........................15
ප්‍රස්ථාරය 06: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල එක් පරිහරණය කරන්නෙකුගේ සාමාන්‍ය ආදායම...................................................................................................................................................16
ප්‍රස්ථාරය 07: විදුලි සංදේශ බදු ..........................................................................................................................65
ප්‍රස්ථාරය 08: සෙස්..............................................................................................................................................66
ප්‍රස්ථාරය 09: සැලසුම් කරන ලද ප්‍රගතියට සාපේක්ෂව තථ්‍ය ප්‍රගතිය (භෞතික)..................................................86
ප්‍රස්ථාරය 10: විදුලි සංදේශ බද්ද.......................................................................................................................113
ප්‍රස්ථාරය 11: ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුගේ බදු ................................................................................114
ප්‍රස්ථාරය 12: ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාවේ මුළු ආදායම ..............................................115

# 01 පරිච්ඡේදය

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ල.වි.ස.නි.කො.ස) ආරම්භය, දර්ශනය, මෙහෙවර, අරමුණු සහ වගකීම්

### 1.1 ආරම්භය

විදුලි සංදේශ ක්ෂේත්‍රය මුලදී රාජ්‍ය ව්‍යාපාරයක් වූ අතර 1980 දී තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව දෙඅංශයකට බෙදීමත් සමඟ මෙම අංශය ලිහිල් කිරීම ආරම්භ විය. ඉන්පසු විදුලි සංදේශ දෙපාර්තමේන්තුව සංස්ථාවක් බවට පරිවර්තනය වූ අතර 1991 දී නියාමනය හඳුන්වා දෙන ලදී. මේ අනුව 1991 දී පාර්ලිමේන්තුවේ පනතක් මගින් ශ්‍රී ලංකා විදුලි සංදේශ අධිකාරිය (SLTA) ස්ථාපනය කරන ලද අතර පසුව එය වර්තමාන තත්ත්වයට කොමිෂන් සභාව බවට පරිවර්තනය කරන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත, නම්වූ ප්‍රධාන පනත සංශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලද, 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත යටතේ ස්ථාපනය කරන ලද රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයක් වේ. මෙම වාර්තාවේ පනත යන්නෙන් 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත හැඳින්වෙන අතර කොමිෂන් සභාව යන්නෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හැඳින්වේ.

1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ප්‍රඥප්තිමය පනතට අනුකූලව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) මෙරටේ සියළුම විදුලි සංදේශ කරුණු මෙහෙයවන රාජ්‍ය බලධරයා වේ. නීතිමය පනතේ බලතල ප්‍රකාරව නීත්‍යානුකූල බලධාරියා වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) මෙරටේ සියළුම විදුලි සංදේශ කරුණු සම්බන්ධයෙන් වගකිවයුතු රජයේ බලයලත් ආයතනය වේ. ඒ අනුව කොමිෂන් සභාවට පාරිභෝගිකයින්ගේ සහ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල යහපත නිසැක කරමින් මෙරටේ විදුලි සංදේශ සේවා වැඩිදියුණු කිරීමට පනත මගින් බලය පවරා ඇත.

### 1.2 කොමිෂන් සභාව සහ කොමිෂන් සභා රැස්වීම්

කොමිෂන් සභාව කොමිෂන් සභා සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර ජනාධිපති ලේකම්වරයා නිල බලයෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා වේ.

එමෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා, ප්‍රධාන විධායක නිලධාරියා වන අතර කොමිෂන් සභා සාමාජිකයෙකුද වේ. සෙසු සාමාජිකයින් තිදෙනා පිළිවෙලින් නීති, කළමණාකරන, මූල්‍ය ක්ෂේත්‍රවල විශිෂ්ඨතාවක් ලබා ඇත්තාවූ තැනැත්තන් වේ.

2018 වර්ෂයේදී කොමිෂන් සභාව නියාමන කරුණු, පරිපාලනමය කරුණු, කොමිෂන් සභාවේ වාර්ෂික අයවැය ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නියාමන සම්මන්ත්‍රණ සඳහා සත්කාරකත්වය දැක්වීම, විශේෂ ව්‍යාපෘති යනාදී පුළුල් කරුණු පරාසයක් පිළිබඳව සාකච්ඡා කිරීම සහ අනුමැතිය ප්‍රදානය කිරීම පිණිස කොමිෂන් සභා රැස්වීම් පහළොවක් පවත්වා ඇත.

## 1.3 දර්ශනය

*විද්‍යාත්මක හා නියාමන විශිෂ්ටතාව මගින් දියුණුවෙමින් ඉදිරියට යන විදුලි සංදේශ කර්මාන්තයේ විශ්වීය නියාමකයකු වශයෙන් පිළිගැනීමට ලක්වීම.*

## 1.4 මෙහෙවර

*කුසලතාවයෙන් පිරිපුන් සදාචාර සම්පන්න ශ්‍රම බලකායක් මගින් තරඟකාරී වෙළඳපලෙහි සාධාරණත්වය හා යුක්තිය ප්‍රවර්ධනය කිරීමෙන් පිළිගත හැකි ගුණාත්මක බවකින් හා දැරිය හැකි මිලකින් යුක්ත සේවාවක් දීප ව්‍යාප්තව කලට වේලාවට ලබාදීමට වග බලා ගැනීම.*

## 1.5 මෙහෙවර ප්‍රකාශනය අර්ථ නිරූපනය කිරීම

ශ්‍රී ලංකාවේ දිගු කාලීන සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කරනු වස් සාධාරණත්වය, තරඟකාරිත්වය සහ ආයෝජන දිරිගන්වන නියාමන පරිසරයන් නිර්මාණය කිරීම උදෙසා සියළුම පාර්ශවකරුවන් සමඟ ස්වාධීන, විවෘත සහ පාරදෘශ්‍ය ආකාරයෙන් ක්‍රියා කිරීම තුලින් සියළුම පරිභරණය කරන්නන්ට සාධාරණ, යුක්තිසහගත සහ දැරිය හැකි මිල ගනන් යටතේ වැඩිදියුණු සහ ගුණාත්මක බවෙන් ඉහළ සන්නිවේදන තාක්ෂණ සේවා සැපයිය හැකි බව සහතික කිරීම.

## 1.6 අරමුණු

විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාක්ෂාත් කළ යුතු අරමුණු පහත දැක්වේ.

1.6.1 ජාතික අභිවෘද්ධියට හේතු වන හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, දුරකථන නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා සහ ග්‍රාමීය සේවා වැනි සේවාවන්වල අවශ්‍යතාවය සපුරාලමින් ශ්‍රී ලංකාව තුළ දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සාධාරණව හා කාර්යක්ෂමව සැපයීමට වගබලා ගැනීම ( එහි ප්‍රතිපාදන ප්‍රායෝගික නොවන තෙක් ඉතිරි කිරීම).

1.6.2 සෑම ක්‍රියාකරුවෙකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමණාකරන සම්පත් ඇති බවට සහ ඔවුන් විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.

1.6.3 අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් මෙන්ම විදුලි සංදේශ උපකරණවල තත්ත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාවිච්චිකරන්නන්ගේ සම්බන්ධතාවන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

1.6.4 විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතු වල නිරත තැනැත්තන් අතර ඵලදායී තරඟකාරිත්වයක් පවත්වාගෙනයාම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාව සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.

1.6.5 අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳව සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

1.6.6 අනවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරතාවයන්ගෙන් තොරව විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමේ තම වගකීම ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.

1.6.7 විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම වැඩි දියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිතා කිරීම.

1.6.8 ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චිකරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම සහ ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම පිණිස දිරි ගැන්වීම.

## 1.7 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වගකීම්

රජයේ ප්‍රධාන ආයතනයක් වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ ජාතික නියාමන නියෝජිතායතනය වන අතර කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වන්නේ වර්ධනය වන තරඟකාරී වෙළඳපලේ උද්ගත වන අභියෝග වලට ප්‍රතිචාරීව සහ මහජන යහපත ආරක්ෂා කර, නියාමන ක්‍රියාවලිය ස්ථායී ලෙස ශක්තිමත් කරමින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, මහජන යහපත ආරක්ෂා කිරීමයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ සේවා නොසපයන නමුත් කාර්යක්ෂමව හා ක්‍රමවත්ව විදුලි සංදේශ සේවා සැපයීමෙහිලා විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් දිරිගන්වයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල පහසුකම් විශ්වීය මට්ටමට වැඩිදියුණු කිරීම පිණිස සියළුම විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් වලට සහාය වේ.

කොමිෂන් සභාවේ ප්‍රධාන වගකිම් පහත දැක්වේ.

1.7.1 පනතේ විධිවිධාන බලාත්මක කිරීම සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රයේ කොන්දේසි තරයේ පිළිපැදීම.

1.7.2 බලපත්‍රලාභී ක්‍රියාකරුවන් අතර නිදහස් සහ සාධාරණ තරඟකාරිත්වයක් පවත්වා ගැනීමට දිරි ගැන්වීම.

 1.7.2.1 දුරකථන ක්‍රියාකාර සමාගම් මහජන යහපත සලසන්නේද යන්න නිශ්චය කිරීම සහ අපක්ෂපාතී ලෙස හිතකර ක්‍රියාවන්හී නිරතවීම සඳහා තරඟකාරිත්වය පිරික්සීම.

 1.7.2.2 ජාල හා සේවා අතර අන්තර් සම්බන්ධතාවය ඇති කිරීමට වග බලා ගැනීම.

 1.7.2.3 විවෘත ප්‍රවේශය, අවහිරතා නැති කිරීම සහ විනිවිද පෙනෙන බලපත්‍ර ක්‍රියාවලියක් ඇති කිරීමට හැකි වන පරිදි පොදු නීති රාමුවක් සකස් කිරීම.

1.7.3 මිල

පොදු මහජනතාවට දුරකථන ක්‍රියාකාර සමාගම්වල මිල දරාගත හැකිද යන්න බව සැලකිල්ලට ගෙන සාධාරණ මිල සහතික කිරීම.

1.7.4 පාරිභෝගික ආරක්ෂාව

මහජනතාව සහ පාරිභෝගිකයන් විසින් ඉදිරිපත් කරන පැමිණිළි පිළිබඳව විමර්ශන පැවැත්වීමේදී සවන් දීමට ඇති කැමැත්ත, සන්නිවේදනය සහ මහජන සහභාගීත්වය දිරිගැන්වීම සහ මහජන සුරක්ෂිතතාවය ඇති කිරීම.

1.7.5 සමාජ නියාමනය

1.7.5.1 විශ්වීය ප්‍රවේශය/සේවා

1.7.5.2 ග්‍රාමීය ප්‍රජාව, වැඩිහිටි ජනතාව සහ විවිධ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට විශ්වීය ප්‍රවේශ/සේවා සැපයීමට වග බලා ගැනීම.

1.7.5.3 හදිසි අවස්ථාවකදී ක්‍රියා කිරීම සඳහා පූර්ව සූදානමින් සිටීම.

1.7.5.4 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට විදුලි සංදේශ සේවා සැපයීම.

1.7.6 අඩු පහසුකම් සහ සීමිත සම්පත් නියාමනය කිරීම

1.7.6.1 වර්ණාවලි කළමණාකරනය (Spectrum Management)

1.7.6.2 අංකනය (Numbering)

1.7.6.3 නීත්‍යානුකූල අවසරය ලබාදීම (Right of Way)

1.7.6.4 අවකාශ පරාස (Space Segment)

1.7.6.5 අන්තර් සම්බන්ධතාවය (Interconnection)

1.7.6.6 ජාත්‍යන්තර සම්බන්ධතා මධ්‍යස්ථාන වලට ප්‍රවේශවීම (Access to International Landing Stations)

1.7.6.7 ප්‍රධාන ජාතික ජාල වලට ප්‍රවේශවීම (Access to Backbone)

1.7.7 ගුණාත්මක විදුලි සංදේශ සේවා

පාරිභෝගිකයා සෑහීමකට පත්වන ආකාරයෙන් අවශ්‍යතාවයන් සපුරාලන ලෙස සාධාරණ හා දරාගත හැකි පරිදි ඉහළ ගුණාත්මක භාවයකින් යුතුව විදුලි සංදේශ සේවා සැපයීමට වගබලා ගැනීම.

1.7.8 යහපාලනය ප්‍රවර්ධනය කිරීම

ස්වාභාවික යුක්තියේ මූලධර්ම පිළිපදිමින් කාලෝචිත තීරණ ලබාදීම, මහජන සහභාගීත්වය දිරිගැන්වීම හා විනිවිද පෙනෙන තීරණ ක්‍රියාවලියක් ඇති කිරීමට වග බලා ගැනීම.

1.7.9 සාධාරණ සහ ඒකපාර්ශවීය නොවූ තීරණ ලබාදීමට වග බලා ගැනීම.

1.7.10 සිවිල් සමාජය නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණයෙන් හෙබි දැනුවත් සමාජයක් බවට ගොඩනැංවීමට සහායවීම.

1.7.11 ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ අදාල ජාත්‍යන්තර සංවිධාන විසින් විදුලි සංදේශ උපකරණ සහ තාක්‍ෂණික ප්‍රමිතීන් සම්බන්ධයෙන් පනවන නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට සියළුම විදුලි සංදේශ ක්‍රියාකරුවන් හා එක්ව කටයුතු කිරීමට වග බලා ගැනීම.

## 1.8 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන්

ඉහත අරමුණු සාක්ෂාත් කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පහත සඳහන් නියාමන කාර්යයන් ඉටු කිරීමෙහිලා නිරත වේ.

1.8.1 බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ පටිපාටිය සහ බලපත්‍ර ප්‍රදානය කිරීම

1.8.1.1 පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රය.

පනතේ 17 වන වගන්තියට අනුකූලව කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් දෙන ලද බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතුය. කෙසේවුවද පනතේ 20 වන වගන්තියේ බලපත්‍ර ආදියෙන් නිදහස් කිරීම සඳහන් කර ඇත.

1.8.1.2 පනතේ 22 වන වගන්තිය යටතේ ගුවන් විදුලි සංඛ්‍යාත හා ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ පාවිච්චි කිරීම සඳහා බලපත්‍රය විදුලි සංදේශ පනතේ 22 (1) වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තකු විසින් තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ යම් ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ යම් කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් නැවක හෝ ගුවන් යානයක පාවිච්චි නොකළ යුතුය.

1.8.1.3 පනතේ 21 වන වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර

පනතේ 21 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් යම් විදුලි සංදේශ උපකරණයක් වෙළඳාමක් වශයෙන් නිශ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදුදීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය.

1.8.2 අයක්‍රම නියාමනය කිරීම

1.8.2.1 පනතේ 5 (ඔ) වගන්තියේ නියමයන් ප්‍රකාරව කොමිෂන් සභාවට ඇති බලතල අනුව අමාත්‍යවරයා විමසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන්ගේ අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් අයක්‍රම හෝ අයක්‍රම තීරණය කිරීමේ ක්‍රම නිශ්චය කිරීම.

1.8.2.2 පනතේ 5(1) ප්‍රකාරව අන්තර්ජාල ගාස්තු අනුමත කිරීම/නිශ්චය කිරීම.

1.8.3 විදුලි සංදේශ පනත (ඒ යටතේ වූ නීති සහ රීති ඇතුලත්ව) සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රවල අනුකූලතාවය පිරික්සීම සහ සහතික කිරීම.

1.8.4 ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නිසි ලෙස පාවිච්චි කිරීමට වගබලා ගැනීම මෙන්ම පිරික්සීම සහ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමණාකරනය කිරීම.

1.8.5 පාරිභෝගික පැමිණිලි සහ විමර්ශන/පරීක්ෂණ පැවැත්වීමට ප්‍රතිචාර දැක්වීම.

පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරුවකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා පිළිබඳව විදුලි සංදේශ සේවා දායකයකු හෝ මහජනයා අතුරින් කෙනෙකු හෝ විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කරනු ලැබූ විට අවශ්‍යයයි කොමිෂන් සභාව සලකන විමර්ශනයක් කොමිෂන් සභාවට පැවැත්විය හැකි අතර කාරණයට අදාල අවස්ථානුගත කරුණු අනුව ගත යුතු ප්‍රතිකර්ම යෙදීමටද සැලැස්විය යුතුය.

පනතේ 9(2) වගන්තිය අනුව යම් විමර්ශනයක් පැවැත්වීමේදී, පනතේ 9(1) ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ඒ පැමිණිල්ලට හේතු වූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍යයයි පෙනී යන පරිදි එවැනි ක්‍රියාමාර්ග ගන්නා ලෙස එකී දූරකථන ක්‍රියාකාර සමාගම් වලට නියම කළ හැකි අතර අවශ්‍යයැයි හැඟෙන පරිදි මූල්‍යය වන්දි ගෙවන ලෙසද නියම කළ හැකිය.

1.8.6 විදුලි සංදේශ සේවාවල ගුණාත්මකභාවය සහ විවිධත්වය සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම සහ මහජන ක්‍රියාවලීන් සහ ප්‍රසිද්ධ විභාග පැවැත්වීමේදී ඔවුන්ගේ සහභාගීත්වය දිරි ගැන්වීම.

1.8.7 විදුලි සංදේශ ක්ෂේත්‍රයට සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ/ජාත්‍යන්තර හා විදේශීය ආයතනවල කටයුතු වලදී ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීම.

1.8.8 කොමිෂන් සභාව විසින් නියෝග, උපදෙස් හා තීරණ නිකුත් කිරීම

ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව නියෝග, උපදෙස් සහ තීරණ නිකුත් කිරීම සම්බන්ධයෙන් විනිවිද පෙනෙන ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. ප්‍රසිද්ධ විභාග සහ සෙසු සමුළු වලට සහභාගීවන සහ ඒවා නියෝජනය කරන විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ක්‍රියාකරුවන්ට, පාරිභෝගිකයින්ට සහ වෙනත් ඒ සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට වැඩි අවස්ථාවක් ලබා දෙනු ලැබේ.

1.8.9 විදුලි සංදේශ උපකරණ සහ මාදිලි අනුමැතිය සඳහා තාක්ෂණික ප්‍රමිතීන් සඳහන් කිරීම.

## අන්තර් අංශ සහයෝගීත්වය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් අංශ රැසක් විසින් ඉටු කරන ලදී. 2018 වසරේ කොමිෂන් සභාවේ අදාල අංශවල ප්‍රධාන කාර්යයන් සහ කාර්ය සාධනය මතු පරිච්ඡේදවල දැක්වේ. ඇතැම් ක්‍රියාකාරකම් කිසියම් අංශයක් යටතේ සඳහන් කර ඇතත් එම ක්‍රියාකාරකම් අදාල අංශය මගින් ඉටු කරනු ලැබ ඇත්තේ අනෙකුත් අංශවල සහාය ඇතිව බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) කොමිෂන් සභා සාමාජිකයන් සහ විධායක නිලධාරීන්

## කොමිෂන් සභාව

| | | |
|---|---|---|
| ඔස්ටින් ප්‍රනාන්දු මහතා | - | සභාපති (2018 ජූනි දක්වා) |
| උදය ආර්. සෙනෙවිරත්න මහතා | - | සභාපති (2018 ජූලි සිට) |
| පී.ආර්.එස්.පී.ජයතිලක මහතා | - | සාමාජික |
| බණ්ඩාර දිසානායක මහතා | - | සාමාජික |
| ලලිත් සේනානායක මහතා | - | සාමාජික |
| ජී.බී.කේ. පෙරේරා මහතා | - | සාමාජික |

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ විධායක නිලධාරීන්

**අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය**
පී.ආර්.එස්.පී. ජයතිලක මහතා
අධ්‍යක්ෂ ජනරාල්

**කොමිෂන් සභා කාර්යාලය**
ආර්.එස්. ගුණරත්න මහත්මිය
වැඩබලන කොමිෂන් සභා ලේකම්

**බලපත්‍ර කළමනාකරණ අංශය**
ආර්.ජී.එච්.කේ. රණතුංග මහතා
අධ්‍යක්ෂ බලපත්‍ර කළමනාකරණ

**ජාල අංශය**
එච්.පී. කරුණාරත්න මහතා
අධ්‍යක්ෂ ජාල

කේ.එස්.එම්. විශාකා මෙනවිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ-ජාල
(අංකන සහ නව සේවා)

එස්.ඊ. වාකිෂ්ට මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ - ජාල
(යටිතල පහසුකම් සංවර්ධන)

අයි.එම්. ජවුසි මහතා
සහකාර අධ්‍යක්ෂ - ජාල
(වෙළඳ බලපත්‍ර සහ මාදිලි අනුමැති)

**ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා අංශය**
එම්.කේ. ජයසේකර මහතා
අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා

ආර්.එම්.ජේ.කේ.බී. රත්නායක මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා

**සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ අංශය**
ඊ.එන්.පී.කේ. රත්නපාල මහතා
වැඩබලන අධ්‍යක්ෂ - සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ

ශාන්ත ගුණානන්දන මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ - සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ
(සංඛ්‍යාත වර්ණාවලි පිරික්සුම් සහ අනුකූලතා)

එම්.සී.එම්. ෆාරුක් මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ - සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ
(සංඛ්‍යාත වර්ණාවලි සැලසුම් සහ දත්ත සේවා)

එල්. ගනේෂ්මූර්ති මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ - සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ
(විකාශන සහ වෙනත් සේවා)

එම්.පී. ගුණසිංහ මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ - සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ
(ස්ථාවර සේවා)

එස්.ඒ.ආර්. කමලනයනා මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ - සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ
(ජංගම සේවා)

**නීති අංශය**

ජී.සී.පී. මොරගොඩ මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ - නීති

රුවනී ගුණරත්න මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ - නීති

එල්.එස්.පී. රුද්‍රිගු මෙනවිය
සහකාර අධ්‍යක්ෂ - නීති
අයි.එන්. මැතිව් මහතා
සහකාර අධ්‍යක්ෂ - නීති

**තරඟකාරිත්ව අංශය**

එච්.ඩබ්.කේ. ඉන්ද්‍රජිත් මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ - තරඟකාරිත්ව
(අන්තර්සම්බන්ධතා සහ ආංශික විශ්ලේෂණ)

එච්.එම්.ශ්‍රියානි මාවැල්ලගේ මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ - තරඟකාරිත්ව
(ක්‍රියාකරු විශ්ලේෂණ)

නිශාන්ත පළිහවඩන මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ - තරඟකාරිත්ව
(අයක්‍රම)

**අනුකූලතා අංශය**

තරලිකා ලිවේරා මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ - අනුකූලතා
(ආවේක්ෂණ, සේවා තත්ත්ව)

මේනකා පතිරණ මහත්මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ - අනුකූලතා
(පාරිභෝගික පැමිණිලි)

ඩබ්ලිව්.ඒ.ටී.ඩී. මධුශංක
සහකාර අධ්‍යක්ෂ - අනුකූලතා

**විශේෂ ව්‍යාපෘති**

ශාන්ත ගුණානන්දන මහතා
වැඩබලන අධ්‍යක්ෂ විශේෂ ව්‍යාපෘති

**පාලන, මානව සම්පත් සහ ආයතනික කටයුතු අංශය**

වී.අරුණ එන්. ප්‍රේමරත්න මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ - පාලන සහ මානව සම්පත්

ආර්.එම්.ජේ.කේ.බී.රත්නායක මහතා
වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ - ආයතනික කටයුතු සහ සැලසුම් (2018 ඔක්තෝම්බර් සිට)

**මූල්‍ය අංශය**

එම්.කේ.ජයන්ත මහතා
අධ්‍යක්ෂ - මූල්‍යය

ඒ.එස්.හපුආරච්චි මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ - මූල්‍යය

**අභ්‍යන්තර විගණන අංශය**

සමන් කිත්සිරි මහතා
අභ්‍යන්තර විගණක

**තොරතුරු තාක්ෂණ ඒකකය**

එම්.සී.එම්.ෆාරුක් මහතා
ප්‍රධානී
නියෝජ්‍ය අධ්‍යක්ෂ - සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණ




සටහන: සේවක සංඛ්‍යාව, ආයතනික ව්‍යුහය සහ බඳවා ගැනීමේ පටිපාටිය සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත.

## විදුලි සංදේශ අංශය පිළිබඳ සමාලෝචනය

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තයේ නව ප්‍රවණතාවයන් විද්‍යාමාන වන අතර ශක්තිමත්වූ ශ්‍රී ලංකාවේ විදුලි සංදේශන/තොරතුරු සන්නිවේදන තාක්ෂණ වෙළඳපල (ICT) ආයෝජන ක්‍රියාකාරකම්, ඒකාබද්ධ කිරීම් සහ අත්පත් කර ගැනීම්, කොටස්කරුවන් සහ හවුල්කාරිත්වයන් වැනි නියාමන සංවර්ධනයන් ස්ථාවර, ජංගම සහ අන්තර්ජාල අංශ වලින් සමන්විත වේ. ප්‍රමුඛ පෙළේ බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් සිය සේවාවන්, තාක්ෂණික කාර්යසාධනය, වියදම් සහ මෙම අංශයේ නවතම විදුලි සංදේශ/තොරතුරු සන්නිවේදන තාක්ෂණයන් වැඩිදියුණු කිරීමෙහිලා පූර්ණ ලෙස නිරත වේ.

විදුලි සංදේශ නියාමනය, සංඛ්‍යාත වර්ණාවලිය කළමනාකරණය කිරීම, බලපත්‍ර ලබා දීම, තරඟකාරී ක්‍රියාවලිය පවත්වාගෙන යාම, සේවා තත්ත්වය, ප්‍රතිපත්ති, අනුකූලතාව, අධීක්ෂණය, ජාත්‍යන්තර සබඳතා විවෘත විදුලි සංදේශ පරිසරයක් යටතේ ආරක්ෂා කරන සහ අධීක්ෂණය කරන වැදගත් ක්ෂේත්‍ර වේ. තවද, රටේ ශීඝ්‍ර ආර්ථික හා සමාජීය ප්‍රගමනය සඳහා විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල සහාය ඇතිව විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ද වැදගත් ය.

රටේ සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා විදුලි සංදේශ හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය වේගයෙන් සංවර්ධනය වෙමින් පවතී. රටේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් සංවර්ධනය අවබෝධ කරගත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය සහ ආධාර ලබා දීම කෙරෙහි අවධානය යොමු කරයි.

මේ වන විට ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරුවන් තිදෙනෙකු, ජංගම දුරකථන ක්‍රියාකරුවන් පස් දෙනෙකු, පහසුකම් සහ පහසුකම් පාදක කරගත් සහ නොගත් දත්ත සන්නිවේදනය සහ අන්තර්ජාල සේවා සපයන්නන් 7 ක්, එක් දිගුදුර ජංගම මෙහෙයුම්කරුවෙකු, ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන් හත්දෙනෙකු (බාහිර ප්‍රවේශ ක්‍රියාකරුවන්), සෘජු ගෘහස්ථ චන්ද්‍රිකා විකාශන සේවා සපයන්නන් පස් දෙනෙකු, කේබල් රූපවාහිනී බෙදාහැරීමේ ජාල ක්‍රියාකරුවන් තිදෙනෙක් සහ තවත් ක්‍රියාකරුවන් දෙදෙනෙක් සිටින අතර සමස්තයක් ලෙස විදුලි සංදේශ බලපත්‍ර සේවා සපයන්නන් තිස් තුන්දෙනෙකු මෙම කර්මාන්තයට සක්‍රීයව සම්බන්ධ වී සිටිති.

ජංගම ග්‍රාහකයින්ගේ ව්‍යාප්තිය 2009-2018 කාලය තුළ දැකිය හැකි අතර ස්ථාවර ග්‍රාහකයන්ගේ සංඛ්‍යාව අඩුවෙමින් පවතී. මෙම කාල සීමාව තුළ ස්ථාවර, පටු කළාප සහ ජංගම අධිවේගී අන්තර්ජාල සේවා දායකත්වය කෙරෙහි වැඩි ප්‍රවණතාවක් පවතී. එමෙන්ම ජංගම සේවා පුළුල් වීම නිසා පොදු දුරකථන කුටි සේවා වියැකී යාමට පටන්ගෙන තිබේ.

3 වන පරම්පරාව (3G), 3.5 පරම්පරාව (3.5G), අධිවේගී පැකට් ප්‍රවේශ (HSPA), අධිවේගී පැකට් ප්‍රවේශ HSPA + සහ 4 වන පරම්පරාව 4G-LTE (දිගු කාලීන පරිණාමය) වැනි ඊළඟ පරම්පරාවේ ජාල හඳුන්වා දුන් දකුණු ආසියානු කලාපයේ පළමු රට ශ්‍රී ලංකාවයි. ජනගහනයෙන් 75% කට වඩා තෙවන පරම්පරාව(3G) සහ හතරවන පරම්පරාවේ (4G) තාක්ෂණයන්ගෙන් ආවරණය වන අතර එය හිතකර තරඟකාරිත්වයක් සහිතව තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාව නව සබ්මැරීන් කේබල් පද්ධති තුනක් ඔස්සේ නව්‍ය තාක්‍ෂණයන් හඳුන්වා දී ඇති අතර ජාත්‍යන්තර සම්බන්ධතා ස්ථාපනය කර තිබේ. ප්‍රධාන සබ්මැරීන් කේබල් අග්නිදිග ආසියාව - මැදපෙරදිග - බටහිර යුරෝපයේ (SEA-ME-WE) ඇති අතර ලෝක ගෝලය වටා සහ බෙංගාල බොක්ක ප්‍රවේශයේ දෘශ්‍ය තන්තු සම්බන්ධතා පවතී. ශ්‍රී ලංකා ටෙලිකොම්, ලංකා බෙල් සහ ඩයලොග් ආසිආටා පීඑල්සී විසින් භූගත මධ්‍යස්ථාන ක්‍රියාත්මක කරනු ලැබේ. SEA-ME-WE මුහුද පත්ලෙහි ඇති දෘශ්‍ය තන්තු සම්බන්ධතා මගින් ගෝලීය ආවරණය: SEA-ME-WE 3, SEA-ME-WE 4, Bharat-Lanka (ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර) සහ Dhiraagu (මාලදිවයින සහ ශ්‍රී ලංකාව අතර) ශක්තිමත් කරයි. SEA-ME-WE 5 ජාත්‍යන්තර මුහුදු පත්ලෙහි ඇති කේබල් පද්ධතිය තවත් වැදගත්වූ සම්බන්ධතා ව්‍යාපෘතියකි. SEA-ME-WE 5 කේබල් මධ්‍යස්ථානය මාතර පිහිටුවා ඇත. මුළු සැලසුම් ධාරිතාවය ටෙරා බයිට් 24 වීමත් සහිතව, මෙම කිලෝමීටර් 20,000 කේබල් සිංගප්පූරුව සිට ප්‍රංශය දක්වා දිවෙන අතර පවතින මුළු භූගත මධ්‍යස්ථාන සංඛ්‍යාව 16 කි.

වර්තමානයේ ජනතාව අතුරින් වැඩි පිරිසක් අන්තර්ජාල සේවා මගින් සම්බන්ධ වී ඇත. ඒ අතරම, පසුගිය දශකය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ අයක්‍රම ගෝලීය වශයෙන් පහත වැටී ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ මිල අඩු කිරීම තුළින් හිතකර පරිසරයක් නිර්මාණය කිරීමෙහිලා වැඩි දියුණු කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියාමනය සහ ප්‍රතිපත්ති සම්පාදනය වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇති අතර එමඟින් වැඩි පිරිසකට ප්‍රතිලාභ සැලසේ. අධිවේගී අන්තර්ජාල සේවා තාක්‍ෂණය සඳහා වැඩි ආයෝජනයක් කිරීම අධිවේගී අන්තර්ජාල සේවාවන්ට ප්‍රවේශ වීමට වැඩි පිරිසකට හැකි වන පරිදි ගෝලීය ඩිජිටල් පරිවර්තනයට හේතු වී ඇත.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT), දකුණු ආසියානු විදුලි සංදේශ නියාමන සංගමය (SATRC), පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය (CTO) සහ යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සංගමයේ (SAFIR) සාමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලංකාව ආර්ථික වර්ධනය ඇති කිරීම පිණිස අවශ්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සහ කුසලතා වැඩිදියුණු කිරීම සහ නවෝත්පාදනයන්ට සහ රටේ විදුලි සංදේශ පහසුකම් ව්‍යාප්ති පරතරය අවම කිරීම සඳහා සහාය සහ ආධාර ලබා ගනී. ආර්ථික වර්ධනය ඇති කිරීම, සන්නිවේදනය වැඩි දියුණු කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ ජනතාවගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කර ගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විශාල කාර්යභාරයක් ඉටු කරයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යටතේ බලපත්‍රලත් සේවා ප්‍රභේදවල වර්තමාන තත්ත්වය සහ ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ අංශයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන සටහන් පහත වගුවේ දැක්වේ.

*වගුව 01: 2018 දෙසැම්බර් මස අවසන් වන විට විදුලි සංදේශ අංශයේ සංඛ්‍යානමය දළ විශ්ලේෂණය*

| | |
|---|---|
| ස්ථාවර ප්‍රවේශ දුරකථන සේවා ක්‍රියාකරුවන් | 3 |
| සෙලෙයුලර් ජංගම දුරකථන ක්‍රියාකරුවන් | 5 |
| දත්ත සන්නිවේදන (පහසුකම් පාදකකරගත් ක්‍රියාකරුවන් | 2 |
| දත්ත සන්නිවේදන {පහසුකම් පාදක කර නොගත් සහ අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් (ISP)} | 5 |
| දිගු දුර ජංගම ගුවන්විදුලි ක්‍රියාකරුවන් | 1 |
| ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන් | 7 |
| සෘජු ගෘහස්ථ චන්ද්‍රිකා විකාශන සේවා ක්‍රියාකරුවන් | 5 |
| කේබල් රූපවාහිනී බෙදාහැරීමේ ජාල ක්‍රියාකරුවන් | 3 |
| වෙනත් ක්‍රියාකරුවන් (ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් / සුප්‍රීම් සැට්) | 2 |
| මුළු පද්ධති බලපත්‍ර සංඛ්‍යාව | 33 |
| ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකවීම් සංඛ්‍යාව | 2,484,616 |
| පදිංචිකරුවන් 100 දෙනෙකුට ස්ථාවර ප්‍රවේශ දුරකථන දායකත්වය | 11.5 |
| සෙලෙයුලර් ජංගම දුරකථන දායකවීම් සංඛ්‍යාව | (90 days) 32,528,104 |
| පදිංචිකරුවන් 100 දෙනෙකුට සෙලෙයුලර් ජංගම දායකවීම් | 150 |
| ස්ථාවර පටු පරාස දායකවීම් | 63 |
| ස්ථාවර අධිවේගී අන්තර්ජාල සේවා දායකවීම් | 1,530,036 |
| ජංගම අධිවේගී අන්තර්ජාල සේවා දායකවීම් (3G*, 4G**) | 5,733,062 |
| පොදු දුරකථන කුටි සංඛ්‍යාව | 5,091 |

*3G යනු රැහැන් රහිත ජංගම විදුලි සංදේශ තාක්ෂණයේ තුන්වන පරම්පරාවයි. එය 2G සහ 2.5G GPRS ජාල සඳහා යාවත්කාලීන කිරීමකි. ජාත්‍යාන්තර විදුලි සංදේශ සංගමය (ITU) විසින් ඉදිරිපත් කරන ලද IMT-2000 (ජාත්‍යාන්තර ජංගම දුරකථන සන්නිවේදන - 2000) පිරිවිතරයට අනුව ජංගම දුරකථන, ජංගම විදුලි සංදේශ සේවා භාවිතා කරන හා ජාල සඳහා මෙය පාදක වේ. 3G මඟින් රැහැන් රහිත දුරකථන, ජංගම අන්තර්ජාල ප්‍රවේශය, ස්ථාවර අන්තර්ජාල ප්‍රවේශයන්, වීඩියෝ දුරකථන ඇමතුම් හා ජංගම රූපවාහිනී පහසුකම් සඳහා යෙදවුම් බිහි වී ඇත.

**4G යනු 3G සේවාවන් පසු කර සෙලියුලර් අධිවේගී අන්තර්ජාල තාක්ෂණයේ සිව් වන පරම්පරාවයි. ITU මඟින් ඉදිරිපත් කර ඇති "IMT Advanced" හි දක්වා ඇති සේවාවන් සැපයිය යුතුය. 4G මඟින් ජංගම අන්තර්ජාල ප්‍රවේශයන්, IP දුරකථන සම්බන්ධතා, පරිගණක ක්‍රීඩා, ජංගම දුරකථන සඳහා HD රූපවාහිනී ප්‍රවේශය, වීඩියෝ සම්මන්ත්‍රණ සහ ත්‍රිමාණ රූපවාහිනී පහසුකම් සඳහා උපයෝගී කර ගනියි.

***ශ්‍රී ලංකා ටෙලිකොම් (පී.එල්.සී) , ලංකා බෙල් සහ ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් සමාගම් සිය බලපත්‍ර වලින් පොදු දුරකථන කුටි සේවා සහ දත්ත සේවා සැපයීමට සුදුසුකම් ලබති. 2018 වසර මැද භාගය වන විට ජනගහනය = මිලියන 21.670.

***ප්‍රස්ථාරය 01:ස්ථාවර සහ ජංගම දුරකථන දායකත්වයේ වර්ධනය 2009-2018***



*ප්‍රස්ථාරය 02: ස්ථාවර අධිවේගී අන්තර්ජාල සේවා, පටුපරාස සහ ජංගම අධිවේගී අන්තර්ජාල සේවා දායකත්වයන් 2009-2018*




*ප්‍රස්ථාරය 03: පොදු දුරකථන කුටි පළාත් මට්ටමින් බෙදා හැරීම*




*වගුව 02: දුරකථන ව්‍යාප්තිය පිළිබඳ විස්තර 2009-2018*

| වර්ෂය | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ථාවර | 16.8 | 17 | 17.5 | 17.0 | 13.2 | 13.0 | 12.4 | 12.0 | 12.1 | 11.5 |
| ජංගම | 69.0 | 82 | 88.6 | 100.0 | 99.3 | 106.5 | 116.3 | 123.7 | 131.5 | 150 |
| එකතුව | 85.8 | 99 | 106.1 | 117.0 | 112.5 | 119.5 | 128.7 | 135.7 | 143.6 | 161.5 |

2009 - 2017 කාලපරිච්ඡේදය සඳහා ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් කරන ලද ආයෝජන පහත දැක්වෙන වගු සහ ප්‍රස්ථාර වලින් දැක්වේ. [ආයෝජන වලට දේපල, පිරියත, උපකරණ, අස්පෘශ්‍ය වත්කම් හා කෙරීගෙන යන වැඩ සඳහා එකතු කිරීම් ඇතුලත් වේ.]

*ප්‍රස්ථාරය 04: විදුලි සංදේශ කර්මාන්තයේ ආයෝජන රුපියල් මිලියන වලින්*




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම | 45,970 | 24,387 | 41,999 | 29,508 | 49,509 | 23,444 | 22,703 | 27,121 | 36,151 | 36,151* |
| ස්ථාවර | 15,441 | 9,646 | 14,055 | 20,610 | 19,052 | 21,640 | 26,245 | 58,963 | 42,112 | 28,000* |
| එකතුව | 61,411 | 34,033 | 56,054 | 50,118 | 68,561 | 45,084 | 48,948 | 86,084 | 78,263 | 64,151* |

* තාවකාලික දත්ත

**මුළු කර්මාන්ත ආදායම:** පහත දැක්වෙන වගුව සහ ප්‍රස්ථාරයෙන් දැක්වෙන පරිදි 2018 වර්ෂය සඳහා ජංගම හා ස්ථාවර ප්‍රවේශ කර්මාන්ත ආදායම රු. බිලියන 216ක් විය. ආදායමෙන් 67%ක් ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම් වලින්ද සහ 29% ක් ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම් වලින්ද ලැබුණි.

*වගුව 03: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම 2013-2018 (රු.මිලියන වලින්)*

| වර්ගය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | % වෙනස්වීම 2013-2014 | % වෙනස්වීම 2014-2015 | % වෙනස්වීම 2015-2016 | % වෙනස්වීම 2016-2017 | % වෙනස්වීම 2017-2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම | 111,586 | 119,144 | 125,120 | 137,770 | 139,990 | 149,225 | 7% | 5% | 10% | 2% | 7% |
| ස්ථාවර ප්‍රවේශ | 46,318 | 48,652 | 51,138 | 55,591 | 59,718 | 66,930 | 5% | 5% | 9% | 7% | 12% |
| එකතුව | **157,904** | **167,796** | **176,258** | **193,361** | **199,708** | **216,155** | **6%** | **5%** | **10%** | **3%** | **8%** |

*ප්‍රස්ථාරය 05: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම 2013-2018*



*වගුව 04: 2011-2018 කාලපරිච්ඡේදය සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකාර සමාගම්වල එක් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍ය ආදායම (ARPU)*

| වර්ගය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|
| ජංගම | 4,560 | 5,004 | 5,457 | 5,386 | 5,131 | 5,258 | 4,977 | 4,588 |
| ස්ථාවර ප්‍රවේශ | 12,100 | 12,583 | 17,112 | 17,954 | 19,659 | 21,691 | 22,911 | 30,745 |

*ප්‍රස්ථාරය 06: ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල එක් පරිහරණය කරන්නෙකුගේ සාමාන්‍ය ආදායම*




*වගුව 05: විදුලි සංදේශ බදු, විදුලි සංදේශ සංදේශ සංවර්ධන බදු හා පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු (2017-2018) රුපියල් මිලියන වලින්*

| වර්ෂය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| විදුලි සංදේශ බදු | 30,346 | 29,128 | 24,319 |
| මුළු සෙස් | 4,067 | 4,209 | 4,443 |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු රැස්කිරීම් | 8,689 | 6,202 | 5,579 |
| පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු රැස්කිරීම් | 1,125 | 729 | 538 |

විදුලි සංදේශ අංශයෙන් රැස්කර ගන්නා ආදායම රටේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබේ.

*වගුව 06: ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ*

| වර්ෂය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|
| එකතුව (බිලියන) | 37.5 | 35.1 | 41.3 | 43.6 | 63.8 | 55.7 | 49.53 |

# 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රගති සමාලෝචනය

2018 වසර අවසන් වන විට ශ්‍රී ලංකාව තුළ ජංගම දුරකථන ග්‍රාහකයන් මිලියන 32.5ක්, ස්ථාවර දුරකථන ග්‍රාහකයින් 2.5 ක් සහ අධිවේගී අන්තර්ජාල සේවා ග්‍රාහකයින් මිලියන 7.2ක් සිටින ඉතා ශක්තිමත් විදුලි සංදේශ අංශයක් ඇත. ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන වෙළෙඳපොළ දැනටමත් 100% ග්‍රාහකයින් ව්‍යාප්තවීමේ (පුද්ගලයින් 100 කට ඇති සම්බන්ධතා) සන්ධිස්ථානය පසු කර ඇත. ජංගම දුරකථන ව්‍යාප්තිය සහ ස්ථාවර දුරකථන ව්‍යාප්තිය පිළිවෙලින් 150% සහ 11.5% ක් විය. 2018 වර්ෂය තුළ ස්ථාවර දුරකථන ප්‍රවේශ ක්‍රියාකරුවන් තිදෙනෙකු, සෙලියුලර් ජංගම දුරකථන ක්‍රියාකරුවන් පස් දෙනෙකු, දත්ත සන්නිවේදන සැපයුම්කරුවන් දෙදෙනෙකු (පහසුකම් පාදකකරගත්), දත්ත හා අන්තර්ජාල සේවා සපයන්නන් පස් දෙනෙකු (පහසුකම් පාදක කර නොගත්) සහ බාහිර ප්‍රවේශ ක්‍රියාකරුවන් හත් දෙනෙකු මෙම අංශයේ සිටියහ.

2018 වර්ෂය තුළ දී කොමිෂන් සභාව විසින් නියාමනය, පරිපාලනය, විශේෂ ව්‍යාපෘති කරුණු, කොමිෂන් සභාවේ වාර්ෂික අයවැය සහ ජාත්‍යන්තර නියාමන සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා සත්කාරකත්වය දැක්වීම වැනි කරුණු පරාසයක් පිළිබඳව සාකච්ඡා කිරීම සහ තීරණය කිරීම සඳහා රැස්වීම් 15 ක් පවත්වා ඇත. වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 05 ක් පවත්වා ඇති අතර පැන නැගුණු විගණන විමසුම් සාකච්ඡා කර ඒ අනුව ක්‍රියාමාර්ග ගන්නා ලදී.

වර්ණාවලි කළමනාකරණ අංශය විසින් වර්ණාවලි බලපත්‍ර අළුත් කරන ලද අතර කාලානුරූපව වර්ණාවලි බලපත්‍ර ගාස්තු රැස්කිරීම පිණිස නව ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියා පටිපාටියේ දී, කල් ඉකුත් වූ බලපත්‍ර අලුත් නොකරන ක්‍රියාකරුවන්ට එරෙහිව මූලික බලාත්මක කිරීමේ පියවර ගනු ලැබේ. බලපත්‍රය අළුත් නොකළහොත් අදාල මෙහෙයුම් උපකරණ මුද්‍රා තබනු ලැබේ. ස්වයංක්‍රීය වර්ණාවලී කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම හා දීප ව්‍යාප්ත ආවේක්ෂණය සඳහා නව ගුවන් විදුලි පද්ධතියක් මිලදී ගැනීම සම්බන්ධ කටයුතු සිදු වෙමින් පවතී.

2018 වර්ෂයේදී නිකුත් කරන ලද වර්ණාවලි බලපත්‍ර ගණන:

- ස්ථාවර සේවා බලපත්‍ර - 167
- විකාශන සේවා බලපත්‍ර (රූපවාහිනී සහ ගුවන් විදුලි) - 39
- ට්‍රන්කින් / පේජිං / සිටිසන් බෑන්ඩ් සේවා බලපත්‍ර - 10
- දත්ත / ගුවන් විදුලි ටෙලිමෙට්‍රි සේවා බලපත්‍ර - 20/28
- ගුවන් හා සමුද්‍රීය සේවා - 1221
- පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවා - 361
- ආධුනික ගුවන් විදුලි සේවා බලපත්‍ර - 33

මෙම වසරේදී රූපවාහිනී විකාශන සහ වෙනත් ගුවන් විදුලි සේවා ක්ෂේත්‍රවල සංඛ්‍යාත ආශ්‍රිත පැමිණිලි 35ක් අංශය වෙත ලැබී ඇත.

සිදු විය හැකි බාධාවන් අවම කිරීම සඳහා පිරික්සුම් හා විමර්ශන පහසුකම් කාලෝචිත ආකාරයකින් සපයන ලදී. විකාශන සේවාව යටතේ නීතිවිරෝධී භාවිතා කරන්නන් දෙදෙනෙකු සහ සෙසු ගුවන් විදුලි සේවා යටතේ නීතිවිරෝධී භාවිතාකරන්නන් අට දෙනෙකු හඳුනාගෙන ඇත. වසර මුළුල්ලේ සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කිරීම වැළැක්වීමට පියවර ගන්නා ලදී.

වර්ෂය තුළ ස්ථාවර සේවාව යටතේ ගුවන් විදුලි උපකරණ 506 ක්, රූපවාහිනී හා ගුවන් විදුලි විකාශනය යටතේ 57 ක්, සෙලියුලර් සේවාව යටතේ 7473 ක්, දත්ත සේවා/ගුවන් විදුලි ටෙලිමෙට්‍රි සේවාව යටතේ 173 ක්, චන්ද්‍රිකා සේවා යටතේ 173 ක්, ආධුනික ගුවන්විදුලි සේවා යටතේ 21 ක් සහ අඩු බලැති ගුවන් විදුලි උපකරණ යටතේ සඳහා 1037 ක් ආනයනය කිරීම සඳහා අවසරය ලබා දී ඇත.

සියළුම සංඛ්‍යාත වර්ණාවලී පිරික්සුම් කටයුතු කොළඹ, කදිරාන සහ මහනුවර පිහිටි ප්‍රාදේශීය පිරික්සුම් මධ්‍යස්ථාන (RMC) 03 මෙන්ම යක්කල සහ කටුබැද්ද පිහිටි දුරස්ථ පිරික්සුම් මධ්‍යස්ථාන (RMS) දෙකක සහාය ඇතිව සිදු කරන ලදී. මීට අමතරව, සංඛ්‍යාත වර්ණාවලි අවහිරතාවයන් විමර්ශනය කිරීම සහ අවම කිරීම පිණිස හා නීති විරෝධී සම්ප්‍රේෂණ අනාවරණය කර ගැනීම සඳහා නවීන සංඛ්‍යාත වර්ණාවලි ආවේක්ෂන වාහනයක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතුව ඇත.

අනුකූලතා අංශය විසින් බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම්වල ජාල වෙත නීති විරෝධීව ඇමතුම් අවසන් කිරීම පිළිබඳ පැමිණිලි විමර්ශනය කරයි. මෙම අංශය සුදුසු නියාමන ක්‍රියාමාර්ග ගනී. බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් නීතිවිරෝධී ඇමතුම් අවසන් කිරීම පිළිබඳ පැමිණිලි ආශ්‍රිත පරීක්ෂණ 7ක් (07) මේ වසරේදී සිදු කර ඇත.

බලපත්‍රලාභී වෙළෙන්දන් විසින් මාදිලි අනුමත නොකරන ලද විදුලි සංදේශ උපකරණ විකිණීම පිළිබඳ විමර්ශන අවස්ථා 122 ක් මෙම අංශය විසින් සිදු කරන ලද අතර, බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය වී ඇති බව අනාවරණය වුවහොත් නිසි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

බලපත්‍රලාභී පොදු ස්විචීකරණ දුරකථන ජාල (PSTN) දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් අනුමත නොකරන ලද අයක්‍රම පැකේජ ලබා දීම පාලනය කිරීම සඳහා නියමයන් හා කොන්දේසි, විශ්ලේෂණය කරන ලද සහ සම්මත කර ගන්නා ලද නියාමන ක්‍රියාමාර්ග වලට අනුකූලව ක්‍රියා කරන්නේදැයි පිරික්සනු ලබන අතර; බලපත්‍රලාභී ක්‍රියාකාර සමාගම් විසින් අනුමත නොකළ අයක්‍රම පැකේජ ලබා දුන් අවස්ථා 13 ක් මෙම අංශය විමර්ශනය කර ඇත.

පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ කොළඹ, මහනුවර, කෑගල්ල, මතුගම, මාතලේ, හොරණ ප්‍රදේශවල වෙළෙන්දන් සඳහා විදුලි සංදේශ පනතේ විධිවිධාන ප්‍රකාර විදුලි සංදේශ සේවා සැපයීම සඳහා බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

සමාජ වගකීම්වල කොටසක් ලෙස, ශ්‍රී ලංකා පොලිසියේ සහාය ඇතිව අස්ථානගත වූ ජංගම දුරකථන (සාමාන්‍යයෙන් දෛනිකව පැමිණිලි 300ක්) සොයා ගැනීමේ ක්‍රියාවලියෙහි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නිරත විය.

පොලිස් නිලධාරීන් සඳහා පොලිස් පුහුණු මධ්‍යස්ථාන 04ක සහ ග්‍රාම නිලධාරීන්, සංවර්ධන හා ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 40ක දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. සන්නිවේදනය සදාචාරාත්මක ලෙස භාවිතා කිරීම පිළිබඳ විද්‍යුත් මාධ්‍ය, පෝස්ටර්, පත්‍රිකා සහ ස්ටිකර් මගින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදී.

2018 නොවැම්බර් 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි විදුලි සංදේශ සේවා සඳහා විදුලි සංදේශ බදු (TL) අනුපාතය 25% සිට 15% දක්වා අඩු කරන ලදී. අන්තර්ජාල සේවා සඳහා විදුලි සංදේශ බද්ද ඉවත් කිරීම නිසා බදු එකතු කිරීමේ අඩුවීමක් පෙන්නුම් කරන ලදී.

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 22 (ළ) වගන්තියේ විධිවිධාන යටතේ දුරකථන ක්‍රියාකාර සමාගම් වලින් රැස් කරන ලද සෙස් මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 4,551කි.

වර්ෂය තුළ සිදු කරන ලද මෙහෙයුම් තුළින්, කර්මාන්තයෙන් ලැබෙන ආදායම සහ එහි දායකත්වය ජංගම, ස්ථාවර සහ වෙනත් බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගෙන් ලැබුණි.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රකාශනයක් වන "තොරතුරු සමාජ වාර්තාව 2018 - 1 වන වෙළුම" මගින් අනාවරණය කර ඇති සංඛ්‍යාලේඛන වලට අනුව, දළ ජාතික ආදායමේ ප්‍රතිශතයක් ලෙස ලොව අඩුම ජංගම දුරකථන මිල ගණන් සහිත රටවල් අතරින් ශ්‍රී ලංකාව 12 වන ස්ථානයේ පසුවේ.

මිල ගණන් අඩු කිරීම මගින් ජනගහනයේ අඩු ආදායම්ලාභී කොටස් කරා ළඟා විය හැකි අතර අනෙක් අතට, ජංගම මිල ඉතා අඩු නම්, එය කර්මාන්තයේ දිගුකාලීන තිරසාරභාවයට තර්ජනයක් විය හැකිය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පසුගිය වසර 9ක කාලය තුළ පැවති මිලගනන් පිළිබඳව අවධානය යොමු කරමින් 2018 අගෝස්තු මාසයේදී පාදස්ථ මිල පාලනය අවලංගු කිරීමටත් මෙම කරුණු දෙක තුලනය කිරීමටත් පියවර ගෙන ඇත.

ප්‍රකාශිත දත්ත මිලගනන් සඳහා වන අධික ගාස්තුව හඳුනාගෙන, කොමිෂන් සභාව විසින් මිලගනන් අඩු කිරීමට තීරණය කරන ලදී. 2018 ජූලි සිට බලපැවැත්වෙන පරිදි පවත්නා අනුපාතය මෙගාබයිට් එකකට රු. 1.00 සිට රු. 0.30 දක්වා අඩු කරන ලදී.

නියාමන ක්‍රියාවලියේ කොටසක් ලෙස, දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් ඉදිරිපත් කරනු ලබන අයක්‍රම යෝජනා කොමිෂන් සභාව විසින් අනුමත කරයි. ඒ අනුව, 2018 වර්ෂය තුළදී උත්සව අයක්‍රම යෝජනා 15 ක්, ප්‍රවර්ධන අයක්‍රම යෝජනා 36 ක් සහ දිගු කාලීන පදනම් අයක්‍රම යෝජනා 5 ක් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

රටේ නොදියුණු හා සංවර්ධනය වෙමින් පවතින ප්‍රදේශ වැඩිදුරටත් හඳුනාගැනීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් "ගමට සන්නිවේදනය" වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 14ක සහ කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 26ක ප්‍රායෝගික පරීක්ෂණ පවත්වන ලදී. විදුලි සංදේශ, අධිවේගී

අන්තර්ජාල පහසුකම් සහ පොලොන්නරුව සහ කළුතර දිස්ත්‍රික්කවල ගුවන් විදුලි සේවා (රූපවාහිනී/ගුවන්විදුලි) ලබා දීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම සඳහා මෙම අධ්‍යයනය සිදු කර ඇත.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මඟ පෙන්වීම ඇතිව තිරසාර සංවර්ධන අරමුණු යටතේ ප්‍රකාශිත විදුලි සංදේශ/තොරතුරු සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම හෝ නැවත භාවිතා කිරීම සඳහා කර්මාන්තයේ නිරතවන්නන් සහ මහජනතාව දිරිගැන්වීම සඳහා උපාය මාර්ග හා මාර්ගෝපදේශ සකස් කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මූලික පියවර ගෙන තිබේ. මේ සඳහා මෙම අංශය පාසල් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

පෙර වසරට සාපේක්ෂව 2018 දී විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) රැස් කිරීම අඩු විය.

2017 වසරේ සිට විදුලි සංදේශ සේවා සැපයුම්කාර සමාගම් විසින් අන්තර්ජාල සම්මුති ජාලයක් ඔස්සේ සේවා සැපයීම (OTT) සාපේක්ෂව ජනප්‍රිය වූ බැවින් පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු (OLAC) එකතු කිරීමද අඩු මුදලක් පෙන්නුම් කරන ලදී.

මෙම වර්ෂයේදී ජංගම අංශයේ ආයෝජන ඉහළ මට්ටමක පැවති අතර ස්ථාවර ප්‍රවේශ අංශයේ ආයෝජන අඩු විය.

ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (පුද්ගලික) සමාගමේ අන්තර්ජාල සේවා සැපයුම්කරුගේ (ISP) බලපත්‍රය (පහසුකම් පාදක කර නොගත්) අලුත් කිරීම සඳහා ඇගයීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. ඇගයීම් කමිටුව කමිටු නිර්දේශ සහිතව වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

විදුලි සංදේශ ජාල සඳහා අවශ්‍ය වන සංඛ්‍යා සම්පත සීමිත වන අතර ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) විසින් ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තයේ ජාතික අංකන සැලැස්ම කළමනාකරණය කරයි. මහජනතාවට හෝ ගනුදෙනුකරුවන්ට කඩිනම් ප්‍රවේශය අවශ්‍ය අවස්ථාවන්හිදී ආයතන සඳහා කෙටි සංකේත අංක වෙන් කරනු ලැබේ. 2018 වර්ෂයේදී රාජ්‍ය ආයතන හයකට සහ පෞද්ගලික අංශයේ සංවිධාන තුනකට කෙටි සංකේත අංක පවරා ඇත.

ජාල අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය යටතේ තඹ හෝ දෘශ්‍ය තන්තු ජාල, මුහුදු සංදාම භූගත කේබල් මධ්‍යස්ථාන සහ විදුලි සංදේශ ඇන්ටනා කුළුණු වැනි විදුලි සංදේශ යටිතල පහසුකම් සැපයීමේ පහසුකම් සැලසීම අධීක්ෂණය කරනු ලැබේ. ඉහත සඳහන් භෞතික යටිතල පහසුකම් භාවිතා කරමින් පවත්නා ජාල පුළුල් කිරීම සඳහා නිෂ්කාශනය ලබා ගැනීමට හෝ නව සේවාවන් හඳුන්වාදීමට විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් ඉල්ලීම් කරයි. අදාළ රාජ්‍ය ආයතන කිහිපයක් සමඟ සම්බන්ධීකරණයෙන් අදාළ අනුමැතිය නිකුත් කිරීම මගින් ජාල අංශය පහසුකම් සපයයි. විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය පවත්වා ගෙන යන අතරම පාරිසරික බලපෑම්, සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ ගැටළු, ජාතික ආරක්ෂාව සහ මහජන අවශ්‍යතා පිළිබඳව නිසි අවධානය යොමු කෙරේ. ඉදිකරන ලද විදුලි සංදේශ කුළුණු සංඛ්‍යාව 6885 දක්වා ඉහළ ගොස් ඇති අතර එයට 2018 දී ඉදිකරන ලද නව කුලුනු 79 ක් ඇතුළත් වේ.

මෙම වසරේදී කුලුනු සම්බන්ධ පැමිණිලි 196 ක් ලැබී ඇති අතර මහජනයා විසින් කරන ලද කුලුනු ඉදිකිරීමට එරෙහි පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ 29 ක් සිදු කරන ලදී. විදුලි සංදේශ කුලුනු සම්බන්ධ අධිකරණ නඩු කිසිවක් ගොනු කර නොමැත.

ජාල ක්ෂේත්‍රය පිළිබඳ වෘත්තීමය විශේෂඥයින්ගේ සහාය ඇතිව ජාල අංශය මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් නවයක් (09) සම්පූර්ණ කළේය. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් වල ප්‍රධාන පරමාර්ථය වූයේ විද්‍යුත් චුම්භක විකිරණ සහ අකුණු වැනි ඇන්ටෙනා කුලුනු සම්බන්ධ ගැටළු පිළිබඳව ජනතාව දැනුවත් කිරීමයි.

මෙම වර්ෂය තුළ විවිධ වර්ගයේ විදුලි සංදේශ උපකරණ වෙළෙන්දන්ට විකුණුම් බලපත්‍ර 821 ක් නිකුත් කර ඇත. පැවරුණු නියාමන කාර්යයන් ප්‍රකාරව කරන ලද ඉල්ලීම් සම්බන්ධ ක්‍රියාවලියේදී ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා මාදිලි අනුමැතිය සහ නිෂ්කාශන ලිපි නිකුත් කිරීම පිණිස කටයුතු කර ඇත. මෙම වර්ෂය තුළ ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා උපකරණ නිෂ්කාශන 4098ක් සහ මාදිලි අනුමැති 21ක් ප්‍රදානය කර ඇත.

මෙම වසර තුළදී ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්වල පමණක් කේබල් රූපවාහිනී සේවා සැපයීම සඳහා වසර 05 ක කාලයක් සඳහා නව 17 වන පද්ධති බලපත්‍රයක් නිකුත් කරන ලදී. ට්‍රන්කින් ජංගම සේවා, කේබල් ටීවී, දත්ත සන්නිවේදනය සහ අන්තර්ජාල සේවා  කාණ්ඩ තුන යටතේ බලපත්‍ර 17 ක් අළුත් කරන ලදී. එක් ජංගම සේවා බලපත්‍රයක් සහ එක් චන්ද්‍රිකා සේවා බලපත්‍රයක් යාවත් කාලීන කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

සේවා ප්‍රමිතිවල ගුණාත්මකභාවය බලාත්මක කිරීම සහ ජංගම ග්‍රාහකයින්ගේ සිම් ලියාපදිංචි කිරීම පහසු කිරීම සඳහා ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව විසින් නීති සම්පාදනය කරන ලදී. විදුලි සංදේශ ක්‍රියාකරු බදු සඳහා 2004 අංක 11 මුදල් පනතේ 23 වන වගන්තිය යටතේ මාර්ගෝපදේශ සකස් කරන ලදී.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ශීඝ්‍ර සංවර්ධනය සපුරාලීම පිණිස ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාව වර්තමාන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සංශෝධනය කරමින් සිටී.

තොරතුරු සන්නිවේදන තාක්ෂණ සඳහා විශේෂිත ආයතනයක් වන ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) වැනි ජාත්‍යන්තර ආයතන එහි සාමාජික රටවලට නව තාක්ෂණයන්, නියාමන ක්‍රියාමාර්ග සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ යාවත්කාලීන ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා පහසුකම් සැලසීමේ දී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2018 වර්ෂය තුළ ප්‍රතිපත්ති හා නියාමන කටයුතු, පුහුණු ක්‍රියාකාරකම්, වැඩමුළු සහ සම්මන්ත්‍රණවලට අදාළ ප්‍රගතිශීලී ක්‍රියාකාරකම් රැසකට ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව සම්බන්ධ විය.

වර්ෂය තුළ පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී.

1. අධ්‍යාපනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දකුණු ආසියානු කලාපීය සම්මන්ත්‍රණය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO) සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB)

එක්ව සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණය 2018 පෙබරවාරි 27 සිට 28 දක්වා කොළඹ ෂැන්ග්‍රි-ලා හෝටලයේදී පැවැත්වුණු අතර දකුණු ආසියාව පුරා රජයේ නිලධාරීන්, පෞද්ගලික අංශය, පර්යේෂකයින්, සංවර්ධන හවුල්කරුවන් සහ සිවිල් සමාජය සහභාගී වූහ.

2. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ එහි හවුල්කාර සංවිධානය වන ජී.එස්.එම්.ඇසෝෂියේෂන් (GSMA) සහ ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) එක්ව "අන්තර්ජාලයේ දෑ" පිළිබඳ පුහුණු වැඩසටහනක් සංවිධානය කළේය. මෙම වැඩසටහන 2018 මැයි 17 සිට 18 දක්වා ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවෙහිදී පැවති අතර එයට කොමිෂන් සභාවේ සහ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල 50 දෙනෙකුගෙන් සමන්විත පිරිසක් සහභාගී වූහ.

3. "තිරසාර සංවර්ධන සාක්ෂාත් කර ගැනීම සඳහා නවීන යෙදුම් සැලසුම් සහ සංවර්ධනය" පිළිබඳ ITU-TRCSL පුහුණුව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) එක්ව ආරම්භ කරන ලදී. මෙම පුහුණු වැඩසටහන කොළඹ ග්ලෝබල් ටවර්ස් හෝටලයේදී 2018 දෙසැම්බර් 10 සිට 14 දක්වා පැවැත්විණි.

4. "කොරියානු ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඒකාබද්ධ (NIA-TRCSL) කොරියානු තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා (KIV) වැඩසටහන 2018" 2018 වසරේ ජුනි 24 සිට අගෝස්තු 10 දක්වා ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත තැනැත්තන්ගේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දැනුම සහ කුසලතා වැඩිදියුණු කිරීමේ අරමුණින් කොරියාවේ ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනය (NIA), ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL), බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව එක්ව මෙම වැඩසටහන සංවිධානය කර ඇත.

5. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 15 වන විදුලි සංදේශ/තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධන සමුළුව (ADF-15) සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය හා කොරියානු තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (APT-NIA) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවය පිළිබඳ වැඩමුළුව 2018 ජුනි මස 11 සිට 14 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹදී පැවැත්විණි.

6. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ ජී.එස්.එම්.ඇසෝෂියේෂන් (GSMA) එක්ව දුරකථන ක්‍රියාකාර සමාගම් සහ ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ කාර්ය මණ්ඩලය සඳහා "ජංගම දුරකථන රහස්‍යභාවයේ ප්‍රතිපත්ති" පිළිබඳ පුහුණු පාඨමාලාව සංවිධානය කරන ලදී.

7. සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ ක්‍රියාකාරී සැළැස්ම හයවන අදියර සඳහා දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ (SATRC) කාර්ය කණ්ඩායමේ රැස්වීම 2018 ජුනි 25 සිට 26 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹදී පැවැත්විණි.

8. ආසියා පැසිෆික් විදුලි සංදේශ සංගමය (APT) සහ ආසියා ශාන්තිකර ජාල තොරතුරු මධ්‍යස්ථානය (APNIC) එක්ව සංවිධානය කරන ලද ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය - ජී.එස්.එම් ඇසෝසියේෂන් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (APT-GSMA-TRCSL) "අන්තර්ජාල සම්මුති - MPLS සම ජාල තාක්ෂණයන් (IP-MPLS Core Network Technologies)" පිළිබඳ පුහුණු පාඨමාලාව 2018 ඔක්තෝබර් 01 සිට 05 දක්වා පැවැත්විණි.

“ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය” (WTISD) සෑම වසරකම මැයි 17 වන දිනට යෙදී ඇත. ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය 2018 සඳහා තේමාව වූයේ “කෘතිම බුද්ධිය සැමදෙනාටම ප්‍රායෝගිකව භාවිතා කිරීමට හැකියාව ලබාදීම” යන්නයි.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU) ලෝක විදුලි සංදේශ/තොරතුරු සන්නිවේදන තාක්ෂණ දර්ශක පිළිබඳ සමීක්ෂණය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අංශවල සහ පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව පවත්වන ලදී.

ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකය (GCI) පිළිබඳ ප්‍රශ්නාවලිය ශ්‍රී ලංකා පරිගණක ආපදා සූදානම් කිරීමේ සංසදය (CERT) සහ ටෙක් පරිගණක ආපදා සූදානම් කිරීමේ සංසදයේ (Tech CERT) සහාය ඇතිව සම්පූර්ණ කරන ලද අතර ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) වෙත ඉදිරිපත් කර ඇත.

අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, ගොඩනැගිලි යනාදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නව තාක්‍ෂණයන් හඳුන්වාදීමට හැකි පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීම මෙන්ම පරිශීලක අත්දැකීම් වැඩිදියුණු කිරීම විශේෂ ව්‍යාපෘති අංශය සතු වගකීමකි.

කොළඹ නෙළුම් කුලුන ඉදිකිරීම ශ්‍රී ලංකාවේ අද්විතීය ඉදිකිරීමක් වන අතර දැන් එහි වැඩ අවසන් වෙමින් පවතී.

ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් දෙන ලද නියෝගයකට අනුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මේ වන විට තොරතුරු තාක්ෂණ උද්‍යාන - හම්බන්තොට ව්‍යාපෘතිය රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව පදනම මත ඉදිරියට ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව ගවේෂණය කරමින් සිටී. මේ සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දැනටමත් උනන්දුවක් දක්වන සමාගම්වලින් යෝජනා කැඳවා ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා පස් මහල් නව ගොඩනැගිල්ල ඉදිකිරීමේදී මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකය (PCU) ව්‍යාපෘතිය සඳහා ඉන්ජිනේරු වශයෙන් පත් කර ඇති අතර වානේ ව්‍යුහගත ගොඩනැගිල්ල දැනට පවතින ප්‍රධාන ගොඩනැගිල්ලට ඈමුණුමක් ලෙස සැලසුම් කර ඇති අතර සෙසු ගොඩනැගිලි දෙක පාලම් මගින් සම්බන්ධ කර ඇත.

කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයේ ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.

නෙළුම් කුලුන අදියර 02 ව්‍යාපෘතිය යටතේ - වාහන නැවැත්වීමේ පහසුකම සහිතව මිශ්‍ර සංවර්ධනය සමඟ යාබද ඉඩම විනෝදාස්වාදය සපයන පහසුකම් සහිතව බහුකාර්ය වාහන රථගාල් සංකීර්ණයක් බවට පත් කිරීමට මූලික පියවර ගෙන තිබේ.

2018 වර්ෂයේදී අදාල පනත මගින් පවරන ලද බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පද්ධති ක්‍රියාකරු බලපත්‍රය, සෙස්, ගුවන්විදුලි සංඛ්‍යාත, සංඛ්‍යාත පෙරගෙවුම්, විකුණුම්කරුගේ බලපත්‍රය, ආධුනික ගුවන්විදුලි බලපත්‍රය, නැව් මධ්‍යස්ථාන බලපත්‍රය, ගුවන් යානා මධ්‍යස්ථානය, රැහැන් රහිත දුරකථන බෙදාහරින්නන්ගේ ගාස්තු, විභාග, අයදුම්පත් සැකසුම්, කෙටි සංකේත ගාස්තු, අතිරික්ත ආදායම සහ ගාස්තු රැස් කරන ලද අතර එහි වටිනාකම රු. 17,799,994 කි. එම කාල සීමාව සඳහා එකතු කරන ලද විදුලි සංදේශ බදු මුදල් ප්‍රමාණය රු. 24,349කි.

විදුලි සංදේශ පනත, විදුලි සංදේශ බදු පනත සහ මුදල් පනත අනුව එකතු කරන ලද මුළු ආදායම රු. 48,033 කි. කොමිෂන් සභාව 2018 දී දේපළ, පිරියත සහ උපකරණ සඳහා මිලියන 4.89 ක් වැය කර ඇත. 2018 වසරේදී කොටස් වෙළඳපොළ හරහා මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන දෛනික ගනුදෙනු ගිණුම හරහා රුපියල් මිලියන 384 උපයා ගන්නා ලදී.

2018 වර්ෂය තුළදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රුපියල් බිලියන 49.53ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඇත. කොමිෂන් සභාව විසින් නියාමන ක්‍රියාමාර්ග තුළින් ඉදිරි වර්ෂවලදී උපයන ලද ආදායම රටේ රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රශස්ත ආදායම් ප්‍රභවයක් වී තිබේ.

අනුමත සේවක සංඛ්‍යාව, සංවිධාන සටහන, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර අවශ්‍ය පියවර ගෙන තිබේ.

2018 වසරේදී ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව විසින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 4 ක් පවත්වා අදාල කරුණු සාකච්ඡා කර ඇති අතර 2018 වසරේ නියාමන ක්‍රියාකාරකම් වල කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඇත. කාලානුරූප ආයතනික සැලසුම් වාර්තා මෙන්ම වාර්ෂික වාර්තා සකස් කර ඉදිරිපත් කරන ලදී.

'ඩිජිටල් ආර්ථිකයක් කරා' යන තේමාව යටතේ ජාතික තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රදර්ශනයක් ලෙස 2018 වර්ෂය සඳහා වූ ඉන්ෆෝටෙල් ප්‍රදර්ශනය නොවැම්බර් 02 සිට 04 දක්වා BMICH පරිශ්‍රයේදී පැවැත්විණි. ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය (FITIS) විසින් මෙම ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ විශාලතම හා වඩාත්ම ගෞරවනීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රදර්ශනය ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2018 ඉන්ෆෝටෙල් ප්‍රදර්ශනයට සහභාගී වූ අතර 2018 ඉන්ෆෝර්ටෙල් ප්‍රදර්ශනයේ ප්‍රශස්ත නිරූපණ කුටිය සඳහාවූ පදක්කම පිරිනමන ලදී.

# කාර්යසාධන

# බලපත්‍ර කළමනාකරණ අංශය

සමාලෝචනය

1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව කිසියම් තැනැත්තෙකුට විදුලි සංදේශ පද්ධතියක් ස්ථාපනය කිරීම හෝ පවත්වාගෙන යාම හෝ විදුලි සංදේශ සේවාවක් සැපයීම පිණිස බලපත්‍රයක් තිබීම අවශ්‍යවේ. මේ ආකාරයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දුරකථ ක්‍රියාකාර සමාගම් අතර පවතින වෙනස්කම් සැලකිල්ලට ගෙන පහසුකම් පාදක කරගත් හෝ පහසුකම් පාදක කර නොගත් වශයෙන් බලපත්‍රකරණ ප්‍රවේශයක් තෝරා ගෙන ඇත.

**පහසුකම් පාදක කර ගත් බලපත්‍ර**

මෙම බලපත්‍ර කාණ්ඩයට ස්වාභාවික සම්පත් භාවිතා කිරීම අවශ්‍ය වේ (සංඛ්‍යාත වර්ණාවලිය සහ/හෝ මාර්ගයේ අයිතිය, අංකනය) සහ එයින් අදහස් කරන්නේ ඕනෑම ආකාරයක මහජන විදුලි සංදේශ ජාලයක්, විදුලි සංදේශ සේවා සැපයීමේ තොරතුරු පද්ධති ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි.

**පහසුකම් පාදක කර නොගත් බලපත්‍ර**

පහසුකම් පාදක කර නොගත් යන්නෙන් අදහස් වන්නේ කිසියම් පෞද්ගලික දුරකථන ක්‍රියාකාර සමාගමකින් ස්වකීය විදුලි සංදේශ සේවා සැපයීම හෝ තෙවන පාර්ශවයකට ස්වකීය විදුලි සංදේශ බලපත්‍ර විකිනීම හෝ එකතු කල අගය මත සේවා සැපයීම පිණිස විදුලි සංදේශ ජාල මූලිකාංග (සම්ප්‍රේෂණ ධාරිතාවය සහ ස්විචිකරණය) බද්දට ගැනීමට අදහස් කරන දුරකථන ක්‍රියාකාර සමාගම්ය.

**බලපත්‍ර ප්‍රභේද**

පුද්ගලික බලපත්‍රවලට ස්ථාවර විදුලි සංදේශ ජාල සහ සේවා ඇතුළත් වේ. මෙම කාණ්ඩය යටතේ ස්ථාවර විදුලි සංදේශ ජාලය හෝ ජාත්‍යන්තර ප්‍රවේශ පහසුකම් සහිත ස්ථාවර හා රැහැන් රහිත ප්‍රවේශ ජාලය සහ අන්තර්ජාල සේවා සැපයුම්කරු (ISP) සේවා, අගය එකතු කළ සේවා හෝ වෙනත් සහායක සේවාවන් ඇතුළු ජාල මූලිකාංග ස්ථාපනය කිරීමට අවසර ලබා දී ඇත.
ජංගම විදුලි සංදේශ ජාල සේවා

මෙයට ස්ථාවර පාදක විදුලි සංදේශ ජාල, ජාත්‍යාන්තර පොදු ජංගම විදුලි සංදේශ සේවා, ජාත්‍යන්තර රෝමින් සේවා, ට්‍රන්කින් සේවා, එකතු කළ අගය මත සේවා, මහ පරිමාන සේවා, සම්ප්‍රේෂණ සහ වෙනත් උපයෝගී සේවා ඇතුලත්වේ.

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බලපත්‍රකරණ පටිපාටිය**

අයදුම්පත්‍රය විදුලි සංදේශ පනතේ 17 වන වගන්තියට සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පිළිගත් 2006 බලපත්‍රකරණ මාර්ගෝපදේශන සහ පටිපාටි වලට අනුකූල විය යුතුය. බලපත්‍ර ප්‍රදානය කිරීමේදී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විවෘත, සාධාරණ සහ පාරදෘශ්‍ය ලංසුකරණ ක්‍රමවේදයක් සලකා බලනු ලබයි.

- විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අභිලාෂය දක්වන පාර්ශවයන් 2006 බලපත්‍රකරණ මාර්ගෝපදේශන සහ පටිපාටිවල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව සිය යෝජනා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව බලපත්‍ර ප්‍රදානය කිරීම 2006 බලපත්‍රකරණ මාර්ගෝපදේශන සහ පටිපාටිවල සවිස්තරාත්මකව විස්තර කර ඇති පරිදි විවෘත, සාධාරණ සහ විනිවිද පෙනෙන පොදු තරඟකාරී ලංසුකරණ ක්‍රියාවලියක් මත සිදු කරයි.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නිකුත් කළ යුතු බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳව පූර්ව වශයෙන් නිශ්චය නොකරයි. කෙසේ වෙතත් පොදු යහපත සලකා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ස්වභාවික හා/හෝ සීමිත සම්පත් අවහිරතා ඇති විට ඇතැම් සේවා සඳහා ලබා ගත හැකි බලපත්‍ර සංඛ්‍යාව සීමා කළ හැකිය.

- බලපත්‍රලාභියා ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් විය යුතුය.
- ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිර්දේශය මත විදුලි සංදේශ භාර අමාත්‍යවරයා විසින් පෞද්ගලික බලපත්‍ර විශේෂිත නොවන පදනමක් මත නිකුත් කෙරේ.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් බලපත්‍ර අයදුම්පත්‍රය 2006 බලපත්‍ර මාර්ගෝපදේශන සහ පටිපාටිවලට අනුකූල නොවන්නේදැයි සලකා බලනු ලැබේ.
- තාක්ෂණික-ආන්තික ප්‍රවේශ වලට අනුකූලව අයදුම්කරුවන්ට, කිසියම් ගැටලුවක් පැන නගින්නේ නම් බලපත්‍ර කොන්දේසි මඟින් පනවන සීමාකිරීම් සහ මහජන යහපත පිළිබඳ කරුණු වලට යටත්ව, ස්වකීය වාණිජමය තීරණ පාදක කරගෙන, ඔවුන්ගේ යෝජිත මෙහෙයුම් සඳහා වඩාත් සුදුසු තාක්ෂණය තෝරා ගැනීමට නිදහස ඇත. කෙසේ වෙතත්, බලපත්‍රය ලබා දෙන විට ඔවුන්ගේ ජාලයක් සහ සේවා සැපයුම් වල සිදුවන ඕනෑම වෙනස්වීමක් සඳහා බලපත්‍රලාභියා විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය හිඟ වීමෙන්, රැහැන් රහිත තාක්ෂණික විසඳුම් යෙදවීමට අදහස් කරන දුරකථන ක්‍රියාකාර සමාගම් වලට සංසන්දනාත්මක තෝරාගැනීමේ ක්‍රියාවලියක් සහ/හෝ විකල්පයක් මඟින් සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කරනු ලැබේ. ලබා දෙනු ලබන ගුවන් විදුලි සංඛ්‍යාත බලපත්‍ර සංඛ්‍යාව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණවලි ලබාගත හැකි වීම මත රඳා පවතී.
- විදුලි සංදේශ නියාමක වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජාතික අංකන සැලැස්ම පාලනය සහ කළමනාකරණය කිරීම සිදු කරයි. සීමිත අංකන සම්පත් කාර්යක්ෂම ආකාරයෙන් භාවිතා කිරීම නිසැක කිරීම පිණිස අංක වෙන් කරති. එමෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තරඟකාරීත්වය සඳහා සම අවස්ථා සලසා දීම පිණිස අංක වෙන් කිරීමේ ක්‍රියාවලිය සාධාරණ හා විනිවිද පෙනෙන ආකාරයෙන් සිදු කිරීමට වග බලා ගනී.
- පහසුකම් පාදක කර ගත් බලපත්‍රලාභීන්ට පහසුකම් පාදක කර නොගත් බලපත්‍රලාභීන් විසින් සපයන සේවාවන් සැපයීමටද හැකිවේ. පෞද්ගලික බලපත්‍ර වලින් සෙසු බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල ව්‍යාපාරික පාරිභෝගිකයන් සහ මහජනතාව ඇතුලත් විය හැකි පරිදි තෙවැනි පාර්ශව වලට සිය සේවා සැපයීමට අවසර ලැබේ. පෞද්ගලික බලපත්‍රලාභීන්ට වෙන් කරන ලද බලපත්‍රලාභීන් සඳහා සේවා සැපයීමට හැකි නමුත් අනෙක් අතට ඔවුන්ට පෞද්ගලික බලපත්‍රලාභීන් සඳහා සේවා සැපයිය හැකි නොවේ.
- පෞද්ගලික බලපත්‍ර වසර දහයක කාලපරිච්ඡේදයක් සඳහා නිකුත් කරන නමුත්, පහසුකම් පාදක කර නොගත් බලපත්‍ර වල වලංගුභාවය වසර පහකට සීමාවේ. බලපත්‍රය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය හෝ/සහ විවිධ කොන්දේසි, කාර්ය සාධනය මත පදනම්ව එහි මුල් කාලය නොඉක්මවන කාලපරිච්ඡේදයක් සඳහා යාවත්කාලින කල හැකිය.
- බලපත්‍ර ගාස්තුව සපයන සේවා වර්ගය පදනම් කරගෙන ශ්‍රී ලංකා විදුලි සන්දෙශ්ස නියාමන කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චය කරනු ඇත. බලපත්‍ර ගාස්තු විදුලි සංදේශ පනත සහ වෙනත් නීති රීති යටතේ කොමිෂන් සභාවේ වගකීම්, කාර්යයන් සහ බලතල පවත්වාගෙන යාම, වැය වන වියදම් සපුරාලීමට භාවිත කරනු ලැබේ. මීට අමතරව, බලපත්‍රලාභියා මුළු පිරිවැටුපෙන් 3% ප්‍රමාණයක් වාර්ෂික සෙස් ගාස්තු වශයෙන් ගෙවීම අවශ්‍ය වේ.

- විදුලි සංදේශ සේවා සැපයුම්කරුවකු විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට ඉල්ලා සිටිය හැකි අතර එලෙස ආරක්ෂා කරන ලෙස අයදුම්කරු ඉල්ලා සිටින සියළුම තොරතුරු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් හෙළිදරව් හෝ භාවිත කිරීමෙන් තොරව ආරක්ෂා කළ යුතුය.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිර්දේශ මත විදුලි සංදේශ විෂයය භාර අමාත්‍යවරයා විසින් සුවිශේෂී නොවන පදනම මත පුද්ගලික බලපත්‍ර නිකුත් කරනු ලැබේ.
- ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව විසින් 2006 බලපත්‍ර නිර්නායක හා පටිපාටිවලට අනුකූලව බලපත්‍ර අයදුම්පත්‍රය ඇගයීමට ලක් කරනු ඇත.
- තාක්ෂණික-ආන්තික ප්‍රවේශයට අනුකූලව, බලපත්‍ර කොන්දේසි මගින් පනවා ඇති සීමාවන්ට යටත්ව ඔවුන්ගේම වාණිජමය තීරණ මත පදනම්ව, යෝජිත මෙහෙයුම් සඳහා වඩාත් සුදුසු තාක්ෂණය තෝරා ගැනීමට අයදුම්කරුවන්ට නිදහස තිබේ. කෙසේ වෙතත් බලපත්‍රය ලබා දුන් පසු, බලපත්‍රලාභීන් ඔවුන්ගේ ජාල සහ සේවා ප්‍රදානයන්ට පසුව සිදුවන වෙනස්කම් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.
- ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සීමිත වීමෙන්, රැහැන් රහිත තාක්ෂණික විසඳුම් යෙදවීමට අපේක්ෂා කරන දුරකථන ක්‍රියාකාර සමාගම් වලට සංසන්දනාත්මක තෝරා ගැනීමේ ක්‍රියාවලියක් සහ/හෝ විකල්පයක් මඟින් සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කරනු ලැබේ. ලබා ගත හැකි සංඛ්‍යාත වර්ණාවලී බලපත්‍ර සංඛ්‍යාව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය ලබා ගත හැකිවීම මත රඳාපවතී.
- විදුලි සංදේශ නියාමකයා වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ජාතික අංකන සැලැස්ම පාලනය සහ කළමනාකරණය කරයි. සීමිත සංඛ්‍යා සම්පත කාර්යක්ෂමව භාවිතා කිරීම නිසැක කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ විසින් අදාළ ක්‍රියාකරුවන්ට කොටස් වශයෙන් අංක වෙන් කරනු ලැබේ. එමෙන්ම ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව විසින් තරඟකාරිත්වය සඳහා සම අවස්ථා සැපයීම පිණිස අංක වෙන් කිරීමේ ක්‍රියාවලියේ සාධාරණත්වය හා විනිවිද භාවය සහතික කරයි.
- පහසුකම් පාදක කරගත් බලපත්‍රලාභීන්ට පහසුකම් පාදක කර නොගත් බලපත්‍රලාභීන් විසින් සපයනු ලබන සේවාවන් සැපයීමට හැකිය. පුද්ගලික බලපත්‍ර මගින් සෙසු බලපත්‍රලාභී විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්, ව්‍යාපාරික ගනුදෙනුකරුවන් සහ සාමාන්‍ය ජනතාව ඇතුළත් විය හැකි තෙවන පාර්ශවයන්ට ඔවුන්ගේ සේවාවන් සැපයීමට අවසර ලබා දෙනු ලැබේ. පුද්ගලික බලපත්‍රලාභීන්ට වර්ගීකරණ කරන ලද බලපත්‍රලාභීන් සඳහා සේවා සැපයිය හැකි නමුත් අනෙක් අතට වර්ගීකරණ කරන ලද බලපත්‍රලාභීන්ට පුද්ගලික බලපත්‍රලාභීන් සඳහා සේවා සැපයිය හැකි නොවේ.
- වසර දහයක කාලයක් සඳහා පුද්ගලික බලපත්‍ර නිකුත් කරනු ලබන නමුත් පහසුකම් පාදක කර නොගත් බලපත්‍රවල වලංගුභාවය වසර පහකට සීමා වේ. සමාන හෝ/සහ වෙනස් කොන්දේසි ප්‍රකාරව කාර්ය සාධනය මත එහි මුල් කාල සීමාව ඉක්මවා නොයන කාලයක් සඳහා බලපත්‍ර යාවත්කාලීන කළ හැකිය.

- සපයනු ලබන සේවාවේ වර්ගය මත ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව විසින් බලපත්‍ර ගාස්තු කලින් කල තීරණය කරනු ලැබේ. විදුලි සංදේශ පනත ප්‍රකාරව වගකීම්, කාර්යයන් සහ බලතල මෙන්ම වෙනත් නීති ක්‍රියාත්මක කිරීමේදී වැය කරනු ලබන ශ්‍රී .ල.වි.ස.නි.කො.සභාවේ වියදම් පියවා ගැනීම පිණිස බලපත්‍ර ගාස්තු භාවිතා කරනු ලැබේ. ඊට අමතරව, බලපත්‍රලාභීන් විසින් මුළු පිරිවැටුම 3% ක වාර්ෂික සෙස් මුදලක් ගෙවිය යුතුය.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත සේවා සැපයුම්කරුවකු විසින් ඉදිරිපත් කරන තොරතුරු රහස්‍ය ලෙස සලකන මෙන් ඉල්ලීමක් කළ හැකි අතර අයදුම්කරු එලෙස රහස්‍ය යැයි සැලකීමට ඉල්ලා සිටින තොරතුරු අවභාවිතා කිරීම හෝ හෙළිදරව් කිරීමකට අවකාශ නොලැබෙන පරිදි ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව විසින් එම තොරතුරු ආරක්ෂා කළ යුතුය.

**බලපත්‍රකරණ රාමුව පිළිබඳ ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ පරමාර්ථය**

වෙළඳපල වර්ධනයට සහ සමාජයේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා වඩාත් හිතකර පරිසරයක් සැපයීම සඳහා, කොමිෂන් සභාව ඊළඟ පරම්පරාවේ ජාල සහ කේන්ද්‍රගත තාක්ෂණයන්ට අනුගතව කටයුතු කරයි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පහත සඳහන් කරුණු සලකා බලනු ලැබේ.

**රාමුව**

- තරඟකාරීත්වය වර්ධනය කිරීම
- සේවා තත්ත්වය
- දුරකථන සනත්වය
- නව තාක්ෂණය ව්‍යාප්ත කිරීම
- කාර්යක්ෂමතාවය සහ කේන්ද්‍රගතවීම
- විවෘත ප්‍රවේශය

**නව බලපත්‍ර නිකුත් කිරීම**

- ශ්‍රී ලංකාවේ කේබල් රූපවාහිනී සේවා සැපයීම සඳහා වසර 5ක බලපත්‍ර කාලයක් සඳහා 2018 නොවැම්බර් මස 02 වන දින ට්‍රයිමාස් මීඩියා නෙට්වර්ක් (පුද්) සමාගමට නව බලපත්‍රයක් නිකුත් කරන ලදී.

**බලපත්‍ර අළුත් කිරීම**

- ඩයිනකොම් ඉන්ජිනියරින් (පුද්) සමාගම
- ආස්ක් කේබල් විෂන් (පුද්) සමාගම
- සොසයිටේ ඉන්ටර්නැෂනල් ටෙලිකොමියුනිකේෂන්ස් එරෝනොටික්ස් (SITA)

**බලපත්‍ර යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය**

- එටිසලාට් ලංකා (පුද්) සමාගම
- සුප්‍රීම් සැට් (පුද්) සමාගම

# ජාල අංශය

ස
මා
ලෝ
ච
න
ය

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන රාජ්‍ය හා පෞද්ගලික විදුලි සංදේශ ජාල ආශ්‍රිත ගැටළු නියාමනය කිරීමේ වගකීම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාල අංශය සතුය.

පොදු විදුලි සංදේශ ජාල සඳහා ජාතික අංකන සැලැස්ම කළමනාකරණය කිරීම, සංඥා සංකේත අංක හා ජාල සංකේත අංක වෙන් කිරීම, ඉලක්ක හඳුනාගැනීම, යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම, විදුලි සංදේශ උපකරණ බලපත්‍ර වෙළඳුන්ට ලබා දීම, ජාල උපකරණ සඳහා මාදිලි අනුමැති සහතික පත්‍ර සහ රේඩියෝ නිෂ්කාශනය නිකුත් කිරීම, ශ්‍රී ලංකා විදුලි සංදේශ ජාල සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම සවිබල ගැන්වීම ජාල අංශයේ විෂය පථය යටතට ගැනේ.

1.1. කාර්යයන්

### 1.1.1.අංකනය

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල සඳහා අවශ්‍ය අංකනය සීමිත සම්පතක් වන බැවින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශන කර්මාන්තයේ ජාතික අංකන සැලැස්ම කළමනාකරණය කරයි. රටේ විදුලි සංදේශ ජාල සඳහා ලබාගත හැකි අංකන සම්පත භාවිතා කිරීම සඳහා රාමුව සහ මාර්ගෝපදේශන අංකන සැලැස්මේ සඳහන් වේ. අංකනය සීමිත සම්පතක් වන බැවින්, නිසි සැලසුමකින් යුතුව කළමනාකරණය කර ඇත. එබැවින් අංකන සැලැස්ම කර්මාන්තයේ නව සංවර්ධනයන් සහ වත්මන් ප්‍රවනතාවයන් රඳාපවත්නා කර්මාන්තයේ ඉල්ලුමට අනුකූලව කලින් කල වෙනස් වේ. මෙම කාර්යයන්ට අදාල ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

- ජාතික අංකන සම්පත කළමනාකරණය කිරීම
- රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා කෙටි සංකේත අංක වෙන් කිරීම
- කෙටි සංකේත අංක ආශ්‍රිත කරුණු සම්බන්ධව විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් සම්බන්ධීකරණය කිරීම
- දුරකථන ක්‍රියාකාර සමාගම් සඳහා ජාත්‍යන්තර සහ දේශීය සංඥා ඒකක සංකේත අංක, ජාල සංකේත අංක වෙන් කිරීම
- Object Identifiers (OID)s වෙන් කිරීම

### 1.1.2 යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම

ජාල අංශය මගින් සිදු කරන තවත් ප්‍රධාන කාර්යයක් වන්නේ තඹ හෝ දෘශ්‍ය තන්තු ජාල, මුහුද යට කේබල් මධ්‍යස්ථාන සහ විදුලි සංදේශ ඇන්ටනා කුළුණු වැනි විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීමේ පහසුකම් සැපයීමයි. විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් පවතින ජාල ව්‍යාප්ත කිරීම සඳහා අවසරය ලබා ගැනීම සහ ඉහත සඳහන් භෞතික යටිතල පහසුකම් භාවිතා කරමින් නව සේවා හඳුන්වාදීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරයි.ජාල අංශය අනෙකුත් අදාල රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අදාල අනුමැතීන් නිකුත් කිරීම මගින් ඒවාට පහසුකම් සපයයි.

විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය පවත්වාගෙන යන අතරම, පාරිසරික බලපෑම්, සෞඛ්‍ය හා ආරක්ෂක ගැටළු, ජාතික ආරක්ෂාව මෙන්ම මහජන යහපත ආශ්‍රිත කරුණු කෙරෙහිද අවධානය යොමු කරයි. මේ සම්බන්ධයෙන් මෙම අංශය විසින් සිදු කරන කාර්යයන්වල සාරාංශයක් පහත දැක්වේ.

- විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම ආශ්‍රිත කරුණු පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.
- අලුතින් මිලදීගත් ඇන්ටනා ව්‍යුහ කළමනාකරණ පද්ධතියක් (Antena Structure Management System - ASMS) මගින් ඇන්ටනා ව්‍යුහ ඉදිකිරීමේ අයදුම්පත්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීම. 2017 වර්ෂයේදී ඇන්ටනා ව්‍යුහ කළමනාකරණ පද්ධතියට ඇතුලත් කරන ලද ඇන්ටනා ව්‍යුහ දත්ත ප්‍රමාණය 80%ක් වන අතර අදාල දුරකථන ක්‍රියාකාර සමාගම් සමඟ පද්ධතිය ලබා ගන්නා දත්ත පිරික්සීම දැනටමත් ආරම්භ කර ඇත.

- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකර සමාගම් වලට සිය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහිලා පහසුකම් සැපයීම.
- විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සම්බන්ධතා අංශයේ සම්බන්ධීකරණය සහිතව, ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් සඳහා IPv4/IPv6 BGP Routing දේශීය පුහුණු පාඨමාලාව පැවැත්වීම.
- විදුලි සංදේශ කුළුණු සම්බන්ධ මහජන පැමිණිලි මෙහෙයවීම
- විදුලි සංදේශ යටිතල පහසුකම් ව්‍යාපෘතිය ආශ්‍රිතව පෞද්ගලික/අයතනිකමය වශයෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා අධ්‍යයනය කිරීම, නිර්දේශ කිරීම සහ ඒ සම්බන්ධ වාර්තා ඉදිරිපත් කිරීම.
- ඇන්ටනා ව්‍යුහ අනුමත කිරීමේ ක්‍රියාවලියේදී පැන නගින ප්‍රයෝගික දුෂ්කරතා පිළිබඳව අවධානය යොමු කෙරෙන ඇන්ටනා ව්‍යුහ මාර්ගෝපදේශන සංශෝධනය කිරීම අවසන් කිරීම සහ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සහ වෙනත් කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් විදුලි සංදේශ කර්මාන්තයේ අඛණ්ඩ සංවර්ධනයට පහසුකම් සැලසීම.
- ඉහල ගොඩනැගිලිවල සන්නිවේදන සේවා සැපයීම සඳහා තාක්ෂණික ප්‍රමිති මාර්ගෝපදේශන පිළියෙල කිරීම.

#### 1.1.2.1 කේබල් රූපවාහිනී සේවා වල නීති විරෝධී ආකාරයෙන් පවත්වාගෙන යන මෙහෙයුම් පාලනය කිරීම

විදුලි සංදේශ පනතේ 22 (අ) (1) වගන්තිය ප්‍රකාරව කිසිම තැනැත්තෙකු විසින් කොමිෂන් සභාව තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අවසරය යටතේ හැර කිසිම පරිශ්‍රයක කේබල් වැඩ සිදු නොකළ යුතුය. ජාල අංශය අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ සහය ඇතිව දිවයින පුරා නීති විරෝධී ආකාරයෙන් පවත්වාගෙන යන කේබල් රූපවාහිනී සේවා සැපයීම පාලනය කිරීමේ කටයුතුවල නිරත වී සිටියි.

### 1.1.3 මාදිලි උපකරණ සහ උපකරණ නිෂ්කාශනය

විදුලි සංදේශ පනතේ 5(ක) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට විදුලි සංදේශ පද්ධතියට සම්බන්ධ කල හැකි විදුලි සංදේශ උපකරණ වර්ග අනුමත කිරීමට බලය ඇත. විදුලි සංදේශ පනතේ 5(ක) වගන්තියේ පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විදුලි සංදේශ උපකරණ සම්බන්ධ කිරීම සඳහා පනතේ 17 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද පද්ධති බලපත්‍රවල 2 වන උපලේඛනයේ දක්වා ඇති සියලුම දුරකථන ක්‍රියාකාර සමාගම් වලට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් බලය පවරා ඇත.

ඒ අනුව, දුරකථන ක්‍රියාකාර සමාගම්, වෙළෙන්දන් හෝ පුද්ගලයන් විසින් බලපත්‍රලාභී ජාලයකට සම්බන්ධ කරනු ලබන දුරකථන උපකරණ, ෆැක්ස් යන්ත්‍ර, පොදු ස්වයංක්‍රීය ශාඛ හුවමාරුව (PABXs – Private Automated Branch Exchange), මොඩම් යන්ත්‍ර, රැහැන් රහිත දුරකථන සහ වෙනත් පාරිභෝගික පරිශ්‍ර උපකරණ දේශීයව නිෂ්පාදනය කරන්නේද නොඑසේනම් ආනයනය කරන්නේද යන්න පිළිබඳව මාදිලි අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.

පර්යන්ත ජාල උපකරණ සඳහා මාදිලි අනුමැතිය ලබාදීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීම සහ සියලුම ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා රේගුව,ආයෝජන මණ්ඩලය හා ආනයන පාලක වෙත අවසරදීමේ ලිපි නිකුත් කරන ලද කාර්යයන් පහත සඳහන් පරිදි සාරාංශ කර ඇත.

- විදුලි සංදේශ පර්යන්ත සහ ජාල උපකරණ වල මාදිලි අනුමත කිරීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- නිර්දේශ ලිපි වශයෙන් නිෂ්කාශනය කිරීමේ කාර්යයෙහිලා රේගුව, ආයෝජන මණ්ඩලය, ආනයන පාලක වෙත නිර්දේශ කිරීම.
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ නිර්දේශ සහ මාර්ගෝපදේශන වලට අනුකූලව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ අංශයේ ජාල උපකරණවල තාක්ෂණික ප්‍රමිතියේ අනුකූලභාවය සහතික කිරීම.
- නීති විරෝධී ආකාරයෙන් ලැබෙන ජාත්‍යන්තර ඇමතුම් අවසන් කිරීම වැලැක්වීම පිණිස සාමාන්‍ය (හෝ ඇනලොග්) දුරකථන මාර්ගයක් වෙනුවට අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවයක් භාවිතා කරමින් හඬ ඇමතුම් ලබා ගැනීම (VOIP - Voice Over Internet Protocol ports), අන්තර්ජාල සම්මුති සහ භාවිතාවන් සඳහා විදුලි සංදේශ දුරකථන ක්‍රියාකාර සමාගම් වලට අනුමැතිය ලබා දීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාල කරුණු ආශ්‍රිතව මහජන ආරක්ෂාව, නීතිය හා සාමය සම්බන්ධව පොලිස්/ අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ විමර්ශන වලට සහය වීම.
- රාජ්‍ය ආයතනවල සහ රාජ්‍ය සංස්ථාවල තාක්ෂණික ඇගයීම් කමිටුවල සහභාගීවීම සහ විදුලි සංදේශන ආශ්‍රිත තාක්ෂණික ආදාන ලබා දීම.

### 1.1.4 වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම

විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අවසරය යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ යම් විදුලි සංදේශ උපකරණයක් හෝ ගුවන් විදුලි සන්නිවේදන උපකරණයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, කුලියට දීම, බදු දීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය. වෙළෙඳ බලපත්‍රය යනු පූර්වෝක්ත ක්‍රියාකාරකම් ඉටුකිරීමෙහිලා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයකි. වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම ආශ්‍රිතව සිදු කරන ක්‍රියාකාරකම් පහත දැක්වේ.

- වෙළඳ බලපත්‍ර පිළිබඳ අයදුම්පත්‍ර ක්‍රියාවලිය සහ ඉල්ලුම්කරු විසින් අවශ්‍ය කොන්දේසි සපුරා ඇති බවට වගබලා ගැනීමෙන් පසු බලපත්‍ර නිකුත් කිරීම
- වෙළඳ බලපත්‍ර පාලනය කළමනාකරණය කිරීම
- වෙළඳ බලපත්‍ර ආශ්‍රිත කරුණු වලදී මහජන ආරක්ෂාව, නිතිය හා සාමය සම්බන්ධයෙන් පොලිසිය/ අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තු විමර්ශන වලට සහායවීම

#### 1.1.4.1 නීති විරෝධී වෙළෙන්දන් විමර්ශනය කිරීම

ජංගම දුරකථන ඇතුළු විදුලි සංදේශ උපකරණ නිත්‍යානුකූලව අලෙවි කිරීමේ ස්ථාන ස්ථාපනය කිරීම බලාත්මක කිරීම සහ දිරිගැන්වීම පිණිස ජාල අංශය ශ්‍රී ලංකා පොලීසියේ සහාය ඇතිව නීති විරෝධී වෙළෙන්දන් විමර්ශනය කිරීම සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව පවත්වයි.

## 1.2 කාර්යසාධනය

ජාල අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වලට අදාල සංඛ්‍යා ලේඛන පහත දැක්වේ.

*වගුව 07: ජාල අංශය ආශ්‍රිත සංඛ්‍යා ලේඛන 2017-2018*

| විස්තරය | 2017 | 2018 |
|---|---|---|
| නිකුත් කරන ලද මුළු බලපත්‍ර සංඛ්‍යාව | 834 | 821 |
| ඉදි කරන ලද සමුච්චිත කුළුණු සංඛ්‍යාව | 6776 | 6885 |
| කුළුණු සම්බන්ධන්යෙන් ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව | 98 | 196 |
| මෙහෙයවන ලද මුළු විමර්ශන සංඛ්‍යාව (කුළුණු ආශ්‍රිත) | 32 | 29 |
| කුළුණු සම්බන්ධ මුළු අධිකරණ නඩු සංඛ්‍යාව | 0 | 0 |
| පවත්වන ලද මහජනතාව දැනුවත් කිරීමේ මුළු වැඩසටහන් සංඛ්‍යාව | 04 | 09 |
| දෙන ලද මුළු මාදිලි අනුමැති සංඛ්‍යාව | 38 | 21 |
| මුළු ආනයන නිෂ්කාශන නිකුත් කිරීම් සංඛ්‍යාව | 3475 | 4098 |
| මුළු පුද්ගලික නිෂ්කාශන කිරීම් සංඛ්‍යාව | 31 | 29 |
| නිකුත් කරන ලද මුළු සමුච්චිත නව කෙටි සංකේත අංක සංඛ්‍යාව | 75 | 77 |

### 1.2.1 අංකනය

- **කෙටි සංකේත අංක වෙන් කිරීම**

  මහජනතාවට හා පාරිභෝගිකයන්ට දුරකථන ඇමතුම කඩිනමින් ලබා ගැනීම පිණිස ආයතන සඳහා කෙටි සංකේත අංක වෙන් කරනු ලැබේ. රාජ්‍ය ආයතන සඳහා එක් පරාසයක් හා පෞද්ගලික ආයතන සඳහා තවත් පරාසයක් වශයෙන් ආයතනයේ ස්වභාවය පදනම් කරගෙන කෙටි සංකේත අංක පරාස දෙකක් හඳුන්වා දී ඇත. රාජ්‍ය ආයතන සඳහා 19XX කෙටි සංකේත අංක පරාසය වෙන් කර ඇත. ඊට සමානව පෞද්ගලික අංශයේ ආයතන සඳහා 13XX පරාසයේ කෙටි සංකේත අංක හතරක් වෙන් කර දී ඇත.

- **2018 වසරේදී වෙන් කරන ලද කෙටි සංකේත අංක**
  - රාජ්‍ය ආයතන

    2018 වර්ෂයේදී , රාජ්‍ය ආයතන සඳහා 19XX පරාසයේ කෙටි සංකේත අංක හය (06) වෙන් කරන ලදී. ආයතනයේ නම සහ අදාල කෙටි සංකේත අංක පහත දැක්වේ.

*වගුව 08: රාජ්‍ය ආයතන සඳහා වෙන් කරන ලද කෙටි සංකේත අංක*

| ආයතනය | කෙටි සංකේත අංක |
|---|---|
| පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 1915 |
| සංචාරක අමාත්‍යාංශය | 1912 |
| ලංකා බැංකුව | 1975 |
| ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 1951 |
| ජාතික තරුණ සේවා සභාව | 1926 |
| මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය | 1925 |

- පෞද්ගලික අංශයේ ආයතන

  2018 වර්ෂයේදී, පෞද්ගලික අංශයේ ආයතන සඳහා 13XX පරාසයේ කෙටි සංකේත අංක තුනක් වෙන් කරන ලදී. ආයතනයේ නම සහ අදාල කෙටි සංකේත අංක පහත දැක්වේ.

*වගුව 09: පෞද්ගලික අංශයේ ආයතන සඳහා වෙන් කරන ලද කෙටි සංකේත අංක*

| ආයතනය | කෙටි සංකේත අංක |
|---|---|
| සීමාසහිත ආසිරි හොස්පිටල් හෝල්ඩිංග්ස් (පුද්) සමාගම | 1313 |
| ශ්‍රී ලංකා රතුකුරුස සංගමය | 1366 |
| සීමාසහිත සර්වෝදය ඩිවෙලොප්මන්ට් ෆයිනෑන්ස් සමාගම | 1319 |

## 1.2.2 යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම

- **විදුලි සංදේශ කුළුණු ඉදි කිරීම**

  2018 වසරේදී ඉදි කරන ලද නව කුළුණු 79 ඇතුලත්ව ඉදි කරන ලද සමුච්චිත විදුලි සංදේශ කුළුණු සංඛ්‍යාව 6885 දක්වා වර්ධනය වී ඇත.

- **යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම ආශ්‍රිත පැමිණිලි මෙහෙයවීම**

  ජාල අංශය විසින් 2018 වසරේදී මහජනතාවගෙන් කුළුණු ඉදිකිරීමට එරෙහිව ලැබුණු පැමිණිලි 32 සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කර ඇත. කෙසේ වුවද 2018 වසරේ විදුලි සංදේශ කුළුණු ආශ්‍රිත නඩු විභාග නොමැත. කුළුණු ආශ්‍රිත මහජන පැමිණිලි 196ක් 2018 වසරේදී ලැබිණි.

- **මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්**

  2018 වසරේදී, ජාල අංශය මෙම ක්ෂේත්‍රයේ විශේෂඥ වෘත්තිකයන්ගේ සහාය ඇතුව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් නවයක් (09) පවත්වා ඇත. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන්වල අරමුණ වුයේ විද්‍යුත් චුම්භක විකිරණ සහ අකුණු ගැසීම වැනි ඇන්ටනා කුළුණු ආශ්‍රිත කරුණු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමයි.

## 1.2.3 වෙළෙඳ බලපත්‍ර ලබාදීම

2018 වසරේදී විවිධ වර්ග වලට අයත් විදුලි සංදේශ උපකරණ වෙළඳුන් සඳහා වෙළඳ බලපත්‍ර 821 ක් නිකුත් කරන ලදී.

## 1.2.4 මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය කිරීම

ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම සඳහා නිෂ්කාශන ලිපි සහ මාදිලි අනුමැතිය නිකුත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමෙහිලා අංශයට පැවරී ඇති නියාමන කර්තව්‍යයන් ජාල අංශය විසින් අඛණ්ඩව සිදු කර ඇත.

*වගුව 10: මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය*

| විස්තරය | 2018 දී නිකුත් කරන ලද ලිපි ලේඛන සංඛ්‍යාව |
|---|---|
| උපකරණ නිෂ්කාශනය කිරීම | 4098 |
| මාදිලි අනුමැතීන් | 21 |

## ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශය

ස
මා
ලෝ
ච
න
ය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශය දේශීය හා ජාත්‍යන්තර නියාමන කටයුතු සඳහා වගකියනු ලබන අතර විදුලි සංදේශ අංශයට අදාළ ප්‍රතිපත්තිමය උපදෙස් ලබා දෙයි. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ එක් අරමුණකි. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල සමඟ අදාළ පර්යේෂණ අධ්‍යයන සැලසුම් කිරීම හා සංවිධානය කිරීමෙහිලා මෙම අංශය නිරත වේ.

එමෙන්ම මෙම අංශය විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර සංවිධාන හා පාර්ශවකරුවන් සමඟ විදුලි සංදේශ අංශයේ සංවර්ධන ව්‍යාපෘති රැසක් සිදු කරන ලදී . මෙම අංශය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රශස්ත වූ ජාත්‍යන්තර ක්‍රියාපටිපාටී ක්‍රියාත්මක කිරීමෙහිලා සහාය වේ.

**ශ්‍රී ලංකාව (ITU-UNESCO-ADB-TRCSL වැඩසටහන)**
**2018 පෙබරවාරි 26-28**

අධ්‍යාපනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ දකුණු ආසියානු කලාපීය සම්මන්ත්‍රණය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය, යුනෙස්කෝ සහ ආසියානු සංවර්ධන බැංකුව එක්ව සංවිධානය කරන ලදී. මෙම සම්මන්ත්‍රණය 2018 පෙබරවාරි 27 සිට 28 දක්වා කොළඹ ෂැන්ග්‍රි-ලා හෝටලයේදී පැවැත්විණි. මේ සම්බන්ධයෙන්, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් දකුණු ආසියානු රටවල සාර්ථකව සිදු කර ඇති ව්‍යාපෘති ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඒකාබද්ධව සංවිධානය කරන ලද ITU-TRCSL "පාසල මගින් ප්‍රජාව සම්බන්ධීකරණය කිරීම" මෙම අවස්ථාව ප්‍රදර්ශනය කළ සාර්ථක ව්‍යාපෘති අතර වේ.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වනුයේ ශ්‍රී ලංකාවේ පාසල් සඳහා අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවයන් ප්‍රවර්ධනය කිරීමත් ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පහසුකම් ව්‍යාප්තවීමේ පරතරය අවම කිරීම මෙන්ම ඔවුන්ගේ ප්‍රජාවන්ට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවස්ථා ලබා දීමයි.

**ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය 2018**

"ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනය" (WTISD) සෑම වසරකම මැයි 17 වන දිනට යෙදී ඇත. ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ තේමාව වූයේ "කෘතිම බුද්ධිය සෑම දෙනාටම ප්‍රායෝගිකව භාවිතා කිරීමට හැකියාව ලබාදීම" යන්නයි.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් සිය 153 වන සංවත්සරය සැමරීම පිණිස සාමාජික රටවලට ආරාධනා කළ අතර ලෝක විදුලි සංදේශ හා තොරතුරු සමාජ දිනයේ තේමාව ශ්‍රී ලංකා ප්‍රජාව අතර ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම උත්සවය ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේදී සමරනු ලැබීය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සමස්ථ කාර්ය මණ්ඩලය මෙම අවස්ථාවට සහභාගී වූහ. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ඉතිහාසය සහ කෘතිම බුද්ධිය පිළිබඳ වාර්තාමය වීඩියෝ ප්‍රදර්ශනය කරන ලදී. ජනාධිපති, අගමැති සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහලේකම් හූලින් ෂාවෝ මහතාගේ පණිවිඩ ද අපගේ වෙබ් අඩවියේ පළ කර ඇත.

## APT-GSMA-TRCSL "අන්තර්ජාලයේ දෑ" පිළිබඳ පුහුණු පාඨමාලාව
## 2018 මැයි 17-18

ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සිය හවුල්කාර සංවිධානය වන ජීඑස්එම්ඒ සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව එක්ව "අන්තර්ජාලයේ දෑ" පිළිබඳ පුහුණු වැඩසටහනක් සංවිධානය කළේය. මෙම වැඩසටහන 2018 මැයි 17 සිට 18 දක්වා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දී පැවති අතර එයට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සහ දූරකථන ක්‍රියාකාර සමාගම්වල 50 දෙනෙකුගෙන් සමන්විත පිරිසක් සහභාගී වූහ. මෙම පාඨමාලාව මගින් අන්තර්ජාලයේ දෑ සම්බන්ධ සංකල්ප පිළිබඳව ඉහළ මට්ටමේ දළ විශ්ලේෂණයක් ලබා දී ඇති අතර අන්තර්ජාලයේ දෑ මගින් පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ඉටු කළ හැකි කාර්යභාරය ගෙන හැර දක්වා ඇත.



*රූපසටහන 01: ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය - ජී.එස්.එම් ආයතනය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පුහුණුව "අන්තර්ජාලයේ දෑ"*

තවද, කර්මාන්තයේ සහයෝගීතාව, සුදුසු නියාමනය සහ ප්‍රශස්ත ජාලයන් සම්බන්ධ කර ගනිමින් නව අන්තර්ජාලයට සම්බන්ධ කරන උපකරණ සහ සේවාවන් ලබාදීම කඩිනම් කිරීම සඳහා දූරකථන ක්‍රියාකාර සමාගම් වලට සහ නියාමන ආයතන වලට මෙම වැඩසටහන උපකාර කරයි.

### තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා
### නවීන යෙදුම් සැලසුම් සහ සංවර්ධනය පිළිබඳ ITU-TRCSL පුහුණුව
### 2018 දෙසැම්බර් 10-14

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) එක්ව "තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා නවීන භාවිතාවන් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම " පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඒකාබද්ධ පුහුණුව ආරම්භ කරන ලදී. මෙම පුහුණු වැඩසටහන 2018 දෙසැම්බර් 10 සිට 14 දක්වා කොළඹ ග්ලෝබල් ටවර්ස් හෝටලයේ පැවැත්විණි. මෙම පුහුණු වැඩසටහනේ අරමුණ වූයේ වෙබ් සංවර්ධනය සඳහා රැකියා අභිමුඛ ප්‍රායෝගික / ඩිජිටල් කුසලතා හඳුන්වා දීම සහ කෘතිම බුද්ධිය වැනි නැගී එන තාක්ෂණයන් කෙසේ අධ්‍යයනය කරන්නේදැයි වන අතර සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කිරීමට Blockchain භාවිතා කළ

හැකිය. ආයතන රසක 42 සමන්විත පිරිසක් මෙම පුහුණුවට සහභාගී වූ අතර ඔවුන් ශ්‍රී ලංකාව, ඉන්දියාව සහ ඇෆ්ගනිස්ථානය නියෝජනය කරන ලදී.



*රූපසටහන **02:** තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා නවීන යෙදුම් සැලසුම් සහ සංවර්ධනය*

## NIA - TRCSL කොරියානු තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා (KIV) වැඩසටහන 2018

"ජාතික කොරියානු තොරතුරු නියෝජිතායතනය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (NIA-TRCSL) කොරියානු තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා (KIV) වැඩසටහන 2018" 2018 ජුනි 24 සිට අගෝස්තු 10 දක්වා ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම හා කුසලතා ඉහළ නැංවීමේ අරමුණින් ජාතික කොරියානු තොරතුරු නියෝජිතායතනය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL), බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ සමාජ සේවා දෙපාර්තමේන්තුව එක්ව මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

2001 වසරේ සිට කොරියානු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා (KIV) වැඩසටහන ජාතික කොරියානු තොරතුරු සංගමය (NIA) විසින් සංවිධානය කර කළමනාකරණය කරනු ලැබේ. දකුණු කොරියානු රජය විසින් සෑම වසරකම තොරතුරු තාක්ෂණය (IT) පිළිබඳ නිපුණතාවයෙන් යුතු කොරියානු ස්වේච්ඡා කණ්ඩායම් සංවර්ධනය වෙමින් පවතින රටවලට යවයි. සෙසු රටවල්වලට වඩා වෙනස්ව, අපි විසින් ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපනය නංවාලීමේ අදහසින් "ජාතික කොරියානු තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන" භාවිතා කර ඇත.

මේ වසරේදී, කොරියානු උපාධි අපේක්ෂකයින් විසිහතර දෙනෙකුගෙන් සමන්විත කොරියානු ස්වේච්ඡා කණ්ඩායම් හයක් කළුතර, ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්කවල පුහුණු මධ්‍යස්ථාන හයක පන්ති පවත්වන ලදී. තෙවැනි වරටත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් "විශේෂ අධ්‍යාපනය ලබාදෙන පාසල් ගුරුවරුන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පුහුණු වැඩසටහන" සංවිධානය කරන ලදී. කණ්ඩායම් හයෙන් ස්වේච්ඡා කණ්ඩායම් පහක් අධ්‍යාපන දෙපාර්තමේන්තුව අයත් පාසල් හා පුහුණු මධ්‍යස්ථාන වෙත යොමු කරන ලද අතර, අනෙක් ස්වේච්ඡා කණ්ඩායම සමාජ සේවා දෙපාර්තුමේන්තුවේ සීදූව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වෙත යොමු කිරීම සිදුවිය. මෙම වසරේ කොරියානු තොරතුරු තාක්ෂණ ස්වේච්ඡා

සේවක වැඩසටහනේ සිසුන් 160කට වැඩි ප්‍රමාණයක් සහ ගුරුවරුන් 120ක සංඛ්‍යාවක් පුහුණුව ලැබීය. මෙම ස්වේච්ඡා කණ්ඩායම් විසින් උසස් පෙළ තොරතුරු තාක්ෂණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ගුරුවරුන් (විශේෂ අධ්‍යාපනය) සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා පහත පුහුණු මධ්‍යස්ථානවල දී අදාල ප්‍රායෝගික පුහුණු කිරීම් සිදු කරන ලදී.

i. දීපන්ගොඩ ශ්‍රී මේධානන්ද මහා විද්‍යාලය, හෝමාගම
ii. කොච්චිකඩේ මහා විද්‍යාලය, මීගමුව
iii. බස්නාහිර පළාත් ගුරු පුහුණු මධ්‍යස්ථානය, ඉඹුල්ගොඩ, ගම්පහ
iv. ද සොයිසා මහා විද්‍යාලය, පිලියන්දල
v. ශ්‍රී සුභූති මහා විද්‍යාලය, වස්කඩුව, කළුතර
vi. සීදූව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, මීගමුව

*රූපසටහන **03:** පිලියන්දල කලාපයේ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම*




"You and Me Rendezvous" කණ්ඩායමේ සාමාජිකයින් වන්නේ හයොන් ජී කිම් මෙනවිය (කණ්ඩායම් නායක), ඔහ් සුජින් මෙනවිය, කිම් හ්යුන් ගියු මහතා සහ ලී සාංහූන් මහතායි. විශේෂ අධ්‍යාපනයට සම්බන්ධ ගුරුවරුන් සහ සිසුන් සඳහා ඔවුන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු වැඩසටහන පිලියන්දල ද සොයිසා මහා විද්‍යාලයේ දී පවත්වන ලදී.

*රූපසටහන **04:** මීගමුව කොච්චිකඩේ මහා විද්‍යාලයේ උසස් පෙළ තොරතුරු තාක්ෂණ සිසුන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම*




කිම් තායියොන්ග් මහතා (කණ්ඩායම් නායක), ජියොන්ග් මින්සියෝ මෙනෙවිය, ජෝ යොංජුන් මහතා සහ ලී ජිනියූ මහත්මිය "KFC" කණ්ඩායමේ සාමාජිකයින් වූහ. ඔවුන් ගුරුවරුන් (විශේෂ අධ්‍යාපනය) සහ උසස් පෙළ තොරතුරු තාක්ෂණ සිසුන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පුහුණු වැඩසටහන මීගමුව කොච්චිකඩේ මහා විද්‍යාලයේදී පවත්වන ලදී.

*රූපසටහන 05: කළුතර, හොරණ සහ මතුගම කලාපවල විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම*




“Arirang Srirang” කණ්ඩායම කළුතර, වස්කඩුව ශ්‍රී සුභූති මහා විද්‍යාලයේ ගුරුවරුන් (විශේෂ අධ්‍යාපන) සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පුහුණු වැඩසටහන පවත්වන ලදී. චෝයි සුං හූන් මහතා (කණ්ඩායම් නායක), හොං ජින් මෙනවිය, ලී යං ග්වාන් මහතා සහ බේ ජී මින් මෙනවිය “Arirang Srirang” කණ්ඩායමේ සාමාජිකයෝ වූහ.

*රූපසටහන 06: විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් සහ ඔවුන්ගේ දෙමාපියන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම*



කිම් යුජි මෙනවිය (කණ්ඩායම් නායක), හැන් ජියොන්ග්යොප් මහතා, පාක් යුන්වූ මහතා සහ කිම් මින්ජි මෙනවිය “IT’s gonna be HAPPY” කණ්ඩායමේ සාමාජිකයින් වූහ. හෝමාගම සහ ජයවර්ධනපුර කලාපවල ගුරුවරුන් (විශේෂ අධ්‍යාපනය) සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා ඔවුන්ගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ පුහුණු වැඩසටහන හෝමාගම දීපංගොඩ ශ්‍රී මේධානන්ද මහා විද්‍යාලයේදී පවත්වන ලදී.

*රූපසටහන 07: කැළණිය සහ ගම්පහ කලාපවල විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම*




“RAON” කණ්ඩායම ඉඹුල්ගොඩ ගුරු පුහුණු මධ්‍යස්ථානයේ සහ ගම්පහ බණ්ඩාරවත්ත පරාක්‍රම මහා විද්‍යාලයේ ගුරුවරුන් (විශේෂ අධ්‍යාපන) සහ සිසුන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. කිම් මින්ජි මෙනවිය (කණ්ඩායම් නායක), කිම් ජුන්කුම් මහතා, සුං ජින්සිල් මෙනවිය සහ ලී අරිම් මෙනවිය “RAON” කණ්ඩායමේ සාමාජිකයෝ වෙති.



*රූපසටහන 08: ගම්පහ බණ්ඩාරවත්ත පරාක්‍රම මහා විද්‍යාලයේ උසස් පෙළ තොරතුරු තාක්ෂණ සිසුන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම*

*රූපසටහන 09: සීදූව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සමඟ කොරියානු ස්වේච්ඡා කණ්ඩායම*




චෝයි හේ-මින් මෙනවිය (කණ්ඩායම් නායක), කිම් සූයොන් මෙනවිය, ෂින් ජිවොන් මෙනවිය සහ ලී හයූං මහතා සීදූව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණුව ලබා දුන් කොරියානු ස්වේච්ඡා කණ්ඩායමේ සාමාජිකයින් වේ.

කොරියානු ස්වේච්ඡා කණ්ඩායම් විසින් පවත්වනු ලබන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වැඩසටහනේ විෂය නිර්දේශයට Adobe Photoshop, Scratch, MS Office, Video Editing, Java, Web Development සහ Drone Demonstration යනාදිය ඇතුළත් වේ. එමෙන්ම කොරියානු සංස්කෘතිය හා කොරියානු භාෂාවේ විවිධ විෂය පැතිකඩ හඳුන්වාදීම මෙම පාඨමාලාවේ කොටසකි. මෙම කොරියානු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (KIV) ස්වේච්ඡා වැඩසටහන මගින් ගම්පහ, කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කවල විශේෂ අධ්‍යාපනයේ සැලකියයුතු වැඩිදියුණු වීමක් වනු ඇති බවට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අපේක්ෂා කරයි. කොරියානු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (KIV) ස්වේච්ඡා වැඩසටහන 2018 ශ්‍රී ලංකාවේ සාර්ථක කර ගැනීමෙහිලා සිය තිරසාර දායකත්වය ලබාදීම පිළිබඳව ජාතික කොරියානු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට මෙන්ම කොරියානු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡාදායකයින්ට අපගේ ප්‍රශංසාව හා ස්තූතිය පළ කරමු.

*රූපසටහන 10: කොරියානු ස්වේච්ඡා කණ්ඩායම් සීගිරියේ කරන ලද ක්ෂේත්‍ර චාරිකාව*



**15 වන ආසියා ශාන්තිකර විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධන සමුළුව**

**2018 ජූනි 11-14, කොළඹ, ශ්‍රී ලංකාව**

15 වන ආසියා ශාන්තිකර විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධන සමුළුව (ADF-15) 2018 ජූනි 11 සිට 13 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹදී පැවැත්විණි. මෙම සමුළුවෙන් අනතුරුව 2018 ජූනි 14 වන දින දකුණු කොරියාවේ ජාතික තොරතුරු සමාජ නියෝජිතායතනයේ (NIA) සහාය ඇතිව

"තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවය" පිළිබඳ එක්දින වැඩමුළුවක් එම ස්ථානයේදීම පවත්වන ලදී. මෙම වැඩසටහන් දෙකටම සත්කාරකත්වය සපයනු ලැබුවේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසිනි.

ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සාමාජිකයින්, ආශ්‍රිත සාමාජිකයන්, අනුබද්ධ සාමාජිකයන්, ජාත්‍යන්තර/කලාපීය සංවිධාන, වෙනත් සංවිධාන සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ මහලේකම් කාර්යාලයේ සාමාජිකයින් ඇතුළු 141 ක පිරිසක් සහභාගී වූහ.

සමාරම්භක උත්සවයේ මුලසුන හෙබවූයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසිනි. ජනාධිපති ලේකම් හා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති ඔස්ටින් ප්‍රනාන්දු මහතා විසින් සමාරම්භක දේශනය පවත්වන ලදී. ආසියා ශාන්තිකර විදුලි සංදේශ/තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධන සමුළුවේ නව සභාපතිවරයා ලෙස ආචාර්ය කයි ලෙන්ග් (කාම්බෝජය) පත් කර ගන්නා ලද අතර තකාෂි මසුමිට්සු මහතා ආසියා ශාන්තිකර විදුලි සංදේශ/තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධන සමුළුවේදී නව උප සභාපති ලෙස තෝරාගෙන තිබේ.
මෙම සමුළුවේදී 2018-2020 සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධන සමුළුවේ උපාය මාර්ගික සැලැස්මේ නවෝත්පාදන හා සම්බන්ධතා තත්ත්වයන් වලට අදාළ මාතෘකා පිළිබඳව සාකච්ඡා කරන ලදී. එමෙන්ම ජාත්‍යන්තර සහයෝගිතා පර්යේෂණ (1 වන කාණ්ඩය), ග්‍රාමීය ප්‍රදේශ සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියමු ව්‍යාපෘති (II කාණ්ඩයේ ව්‍යාපෘතිය) වැනි ජපානයේ අමතර අයවැය දායකත්වය (EBC-J ව්‍යාපෘති) මගින් සහාය දක්වන ව්‍යාපෘති සඳහා අවස්ථාව ලබා දුන්නේය. ඔවුන්ගේ ප්‍රතිඵල සහ සාක්ෂාත් කර ගැනීම් හුවමාරු කර ගැනීම පිණිස EBC-K ව්‍යාපෘතියට කොරියාවේ අමතර අයවැය දායකත්වයෙන් සහාය ලැබේ. එමෙන්ම මෙම සමුළුවේදී අරමුදල් සපයන ව්‍යාපෘතිවල තිරසාරභාවය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ (ITU-D) හි කාර්යය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ කාර්යභාරය අතර සම්බන්ධය පිළිබඳව කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

ආසියා සංවර්ධන බැංකුව (ADB), ඕස්ට්‍රේලියානු විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුව (DFAT), ජපාන තොරතුරු සන්නිවේදන තාක්ෂණ අරමුදල (JICT) සහ කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (KOICA) නියෝජිතයෝ අරමුදල් සපයන ව්‍යාපෘති තිරසාරභාවය පිළිබඳ අදහස් හුවමාරු කර ගත්හ. සංවිධාන අතර සහයෝගීතාව සඳහා යාන්ත්‍රණයක් සැකසීමට එකඟ විය. මීට අමතරව, ප්‍රතිදාන ලේඛනය (වාර්තාව හෝ නිර්නායකයන්) ඉදිරිපත් කිරීම සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධන (ADF) කාර්ය ක්‍රම සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය කමිටු සාකච්ඡාවේදී හඳුනා ගන්නා ලදී. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ කළමනාකරණ කමිටුවේදී සහ ඉදිරියේදී ආසියා ශාන්තිකර විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධන රැස්වීමේදී මෙය තවදුරටත් සාකච්ඡා කරනු ඇත.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධිවේගී අන්තර්ජාල සම්බන්ධතාවය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය - ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතන (APT-NIA) වැඩමුළුවේදී, ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් ආරාධනා කරන

ලද කථිකයින්, කොරියාවේ අධිවේගී අන්තර්ජාල ජාලයන් සකස් කිරීමේදී ඉගෙන ගත් අත්දැකීම් සහ පාඩම් බෙදා ගත්හ. නියෝජිතයින් අසන ලද ප්‍රශ්න හා ඊට ලබාදුන් පිළිතුරු වැඩමුළුවේ සාර්ථකත්වය පෙන්නුම් කරයි.




*රූපසටහන 11: ආ.ශා. විදුලි සංදේශ හා සන්නිවේදන තාක්ෂණ සමුළුව - 15හි සාකච්ඡා පවත්වාගෙන යමින්*




*රූපසටහන 12: ආ.ශා. විදුලි සංදේශ හා තොරතුරු සන්නිවේදන තක්ෂණ සමුළුව 15 විවෘත කරමින්*



*රූපසටහන 13: ආසියා ශාන්තිකර විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධන සමුළුව (ADF-15) සඳහා සහභාගීවන්නන්*

## APT- GSMA- TRCSL "ජංගම දුරකථන පෞද්ගලික දත්ත රහස්‍යතා ප්‍රතිපත්ති" පිළිබඳ දේශීය පුහුණු පාඨමාලාව

ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ ජී.එස්.එම්.ඒ විසින් දුරකථන ක්‍රියාකාර සමාගම් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා "ජංගම දුරකථන පෞද්ගලික දත්ත රහස්‍යතා ප්‍රතිපත්ති" පිළිබඳ පුහුණු පාඨමාලාව සංවිධානය කරන ලදී. පුහුණු වැඩසටහන 2018 සැප්තැම්බර් 10 වන දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේදී පැවැත්විණි.

පාඨමාලා අන්තර්ගතය තුළ ජංගම දුරකථන පෞද්ගලික දත්ත රහස්‍යතාවය පිළිබඳ විෂය පථය මගින් ජංගම දුරකථන දත්ත සුරැකීම, දත්ත ආරක්ෂණය,දත්තවල රහස්‍යභාවය, ජංගම දුරකථන අන්තර්ජාල සන්දර්භය, අන්තර්ජාලයේ දෑ පිළිබඳ රහස්‍යභාවය, සහ පුළුල් දත්ත, නියාමනය සහ අනාගත දත්ත රහස්‍යතා ප්‍රතිපත්ති, කණ්ඩායම් සිද්ධි අධ්‍යයනය යන අංශවලින් ආවරණය විය.

ඉලක්කගත කණ්ඩායමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සහ දුරකථන ක්‍රියාකාර සමාගම් ඇතුළත් විය. මෙම පාඨමාලාව ජී.එස්.එම් සමාගමේ ජංගම දුරකථන

පෞද්ගලික දත්ත රහස්‍යතා ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යක්ෂ බොරිස් වොජ්තාන් මහතා විසින් මෙහෙයවන ලද අතර හතළිහක පිරිසක් පුහුණු පාඨමාලාව හැදෑරූහ.




*රූපසටහන **14:** "ජංගම දුරකථන පෞද්ගලික දත්ත රහස්‍යතා ප්‍රතිපත්ති " පිළිබඳ පුහුණු පාඨමාලාව*

**ක්‍රියාකාරී සැලසුම අදියර VI සඳහා සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම**
**25 - 26 ජූනි 2018, කොළඹ, ශ්‍රී ලංකාව**

ක්‍රියාකාරී සැලැස්ම හයවන අදියර සඳහා සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ (SATRC) ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම 2018 ජූනි 25 සිට 26 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹදී පැවැත්විණි. මෙම රැස්වීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් මෙහෙයවන ලද අතර දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ (SATRC) සාමාජිකයින් සහ අනුබද්ධ සාමාජිකයින් 19 දෙනෙකු සහභාගී විය.

පහත සඳහන් න්‍යාය පත්‍ර අයිතමයන් පිළිබඳව සාකච්ඡා කර කටයුතු කරන ලදී.

1. සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ (SATRC ) ක්‍රියාකාරී කණ්ඩායම (SAPVI) යටතේ කාර්ය අයිතම සඳහා කාර්ය සැලැස්ම.
2. 2017 අගෝස්තු 16-18, පාකිස්තානයේ ඉස්ලාමාබාද් හීදී පවත්වන ලද සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ වැඩමුළුවේ ප්‍රතිඵල.
3. ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ උපායමාර්ගික සැලැස්ම 2018-2020.
4. එක් එක් කාර්යය අයිතමය සම්බන්ධ ප්‍රගතිය සාකච්ඡා කිරීම සහ ප්‍රතිඵල කෙටුම්පත් කිරීම.
   - අ. දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ රටවල්වල අනාගත ජංගම අධිවේගී සේවා සඳහා සංඛ්‍යාත වර්ණාවලි මාර්ගෝපදේශන වැඩිදියුණු කිරීම
   - ආ. රැහැන්රහිත (backhaul) - සංඛ්‍යාත වර්ණාවලිය, තාක්ෂණය සහ ප්‍රතිපත්ති සලකා බැලීම
   - ඇ. අන්තර්ජාලයේ දෑ ව්‍යාප්ත කිරීම සඳහා සංඛ්‍යාත වර්ණාවලිය කළමණාකරනය කිරීම
   - ඈ. දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ Wi- Fi ජාලය ව්‍යාප්ත කිරීම

5. දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ ක්‍රියාකාරී සැලැස්ම අදියර VII සඳහා නව කාර්යය අයිතම සලකා බැලීම

මෙම රැස්වීමේදී පහත සඳහන් කරුණු ඇතුලත්ව ආදාන හා ප්‍රතිදාන ලේඛන 30 ක් පමණ සලකා බලන ලදී.

1. සංඛ්‍යාත වර්ණාවලි නිර්නායකයන්ට අදාල කාර්යය අයිතම, රැහැන් රහිත (backhaul), අන්තර්ජාලයේ දැ සහ Wi-Fi ජාලය පිළිබඳ කෙටුම්පත් වාර්තා හතර.
2. දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ රටවල 5G සංඛ්‍යාත වර්ණාවලි පරාස, BB-PPDR ජාල, සංඛ්‍යාත වර්ණාවලි මිල සහ මිල දරාගතහැකිබව, සංඛ්‍යාත වර්ණාවලි පරාස සුසංගත කිරීම, මීළඟ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ අදියර VII සඳහා නව කාර්යය අයිතම යෝජනා.

මෙම රැස්වීමේ ආදාන ලේඛන මෙම වසර අගදී පැවැත්වීමට නියමිත දකුණු ආසියානු විදිලි සංදේශ නියමකයින්ගේ සංගමයේ (SATRC-19) මීළඟ රැස්වීමට ඉදිරිපත් කරනු ලැබේ.




*රූපසටහන 15: සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ සංගමයේ ක්‍රියාකාරී කණ්ඩායමේ රැස්වීම*

**ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය, ආසියා ශාන්තිකර ජාල තොරතුරු මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ "අන්තර්ජාල සම්මුති - බහු සම්මුති ලේබල් ස්විචීකරණ සම ජාල තාක්ෂණයන් පිළිබඳ දේශීය පුහුණු පාඨමාලාව**

**2018 ඔක්තෝබර් 01 - 05**

දුරකථන ක්‍රියාකාර සමාගම් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය - ආසියා ශාන්තිකර ජාල තොරතුරු මධ්‍යස්ථානය - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ( APT - APNIC - TRCSL) "අන්තර්ජාල සම්මුති - බහු සම්මුති ලේබල් ස්විචීකරණ සම ජාල තාක්ෂණයන් ("IP - MPLS Core Network Technologies") පිළිබඳ දේශීය පුහුණු පාඨමාලාව ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) සහ ආසියා ශාන්තිකර ජාල තොරතුරු මධ්‍යස්ථානය (APNIC) එක්ව සංවිධානය කරන ලදී. මෙම පුහුණු වැඩසටහන 2018 ඔක්තෝබර් 01 සිට 05 දක්වා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේදී පැවැත්විණි.

*රූපසටහන 16: "අන්තර්ජාල සම්මුති - බහු සම්මුති ලේබල් ස්විචීකරණ සම ජාල තාක්ෂණයන්" පිළිබඳ දේශීය පුහුණු පාඨමාලාව*



## ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ, තොරතුරු සන්නිවේදන තාක්ෂණ දර්ශක ප්‍රශ්නාවලි සමීක්ෂණය

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ඉල්ලීම පරිදි, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනෙකුත් අංශවල සහ පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව ලෝක විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ දර්ශක පිළිබඳ සමීක්ෂණය පවත්වන ලදී. සමීක්ෂණයේ පරමාර්ථය වූයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධන දර්ශකය ගණනය කිරීම සඳහා ගෝලීය දත්ත එක්රැස් කිරීම/යාවත්කාලීන කිරීම වන අතර ලොව පුරා රජයන්, ජාත්‍යන්තර සංවිධාන, සංවර්ධන බැංකු සහ පෞද්ගලික අංශයේ විශ්ලේෂකයින් විසින් ගෝලීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධනයේ තත්ත්වය පිළිබඳ විශ්ලේෂණය බෙහෙවින් විශ්වාස කරයි. සපයන ලද දත්ත ලෝක විදුලි සංදේශ/තොරතුරු සන්නිවේදන තාක්ෂණ දර්ශක දත්ත සමුදාය, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සංඛ්‍යාන ප්‍රකාශන සහ ලෝක බැංකු ප්‍රකාශන යනාදිය යාවත්කාලීන කිරීම සඳහා භාවිතා කරන ලදී.

## ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ගෝලීය සයිබර් ආරක්ෂණ සමීක්ෂණය

ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශක (GCI) ප්‍රශ්නාවලිය යනු ශ්‍රී ලංකා පරිගණක ආපදාවලට සූදානම්වීමේ සංසදය (CERT) සහ ටෙක් පරිගණක ආපදාවලට සූදානම්වීමේ සංසදයේ (Tech CERT) සහාය ඇතිව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය වෙත සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලද තවත් සමීක්ෂණයකි. ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකය (GCI) යනු සයිබර් ආරක්ෂාව සඳහා රටවල් දක්වන කැපවීම මැනීම සඳහා වන බහු - පාර්ශවීය ව්‍යාපෘතියක් වන අතර එක් එක් රටේ සංවර්ධන මට්ටම නෛතික මිනුම්, තාක්ෂණික මිනුම්, ආයතනික මිනුම්, ධාරිතා වර්ධනය සහ සහයෝගීතාව වශයෙන් කාණ්ඩ පහකින් විශ්ලේෂණය කරනු ලැබේ.

## ජාත්‍යන්තර සංවිධානවල වාර්ෂික දායකත්වයන්

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU), ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT), දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයන්ගේ සංගමය (SATRC) සහ පොදුරාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය (CTO) සහ යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සංසදයේ (SAFIR) සාමාජිකයෙකි. මෙම ආයතනවල සාමාජිකත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වාර්ෂික පදනමින් ගෙවනු ලැබේ. සාමාජිකත්ව ගාස්තු පහත සඳහන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංවිධානවලට ගෙවන ලදී.

*වගුව 11: වාර්ෂික දායකත්වය සහ සාමාජික ගාස්තු*

| ITU | APT | CTO | SAFIR |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රුපියල් - 26,636,950.72 2018 මාර්තු | ශ්‍රී ලංකා රුපියල් - 2,397,117.57 2018 ජනවාරි | ශ්‍රී ලංකා රුපියල් - 5,666,571.77 2018 සැප්තැම්බර් | ශ්‍රී ලංකා රුපියල් - 211,833.43 2018 නොවැම්බර් |

මෙම ජාත්‍යන්තර සංවිධානවලින් විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ධාරිතාවය ගොඩනැංවීම සඳහා තාක්ෂණික සහාය, විශේෂඥ සහාය, ව්‍යාපෘති වැඩසටහන් සහ ශිෂ්‍යත්ව අවස්ථා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලැබුණි.

## විදුලි සංදේශ නියාමන සමීක්ෂණය 2018

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ නියාමන සමීක්ෂණය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දත්ත රැස් කළේය. පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව සමීක්ෂණය සිදු කරන ලද අතර සම්පූර්ණ කරන ලද සමීක්ෂණය අදාල කාල සීමාව තුළ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයට ඉදිරිපත් කරන ලදී.

## අධ්‍යයන/ක්‍රියාකාරී කණ්ඩායම් ප්‍රශ්නාවලිය 2018

විදුලි සංදේශ සම්බන්ධව ජාත්‍යන්තර සංවිධානවලින් ලැබුණු අධ්‍යයන/ක්‍රියාකාරී කණ්ඩායම් ප්‍රශ්නාවලිය සම්පූර්ණ කර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනෙකුත් අංශ සම්බන්ධීකරණයෙන් ඉදිරිපත් කරන ලදී.

## විදේශීය නියෝජිතයින්ගේ චාරිකා

පුහුණු වැඩසටහන් හා විශේෂඥ සහාය වැඩසටහන්, අනුග්‍රාහකත්ව චාරිකා වැනි විදුලි සංදේශ නියාමන කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණි විදේශීය නියෝජිතයින්ගේ චාරිකා මෙම අංශය සම්බන්ධීකරණය කළේය.

# සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය

ස
මා
ලෝ
ච
න
ය

ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය යනු ස්වාභාවික හා සීමිත සම්පතක් වන අතර එය සමාජීය ජීවන තත්ත්වය සහ ආර්ථිකයේ වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කිරීමෙන් අත්කර ගත හැකි ප්‍රතිලාභ උපරිම කර ගැනීමට නිසියාකාරව කළමනාකරණය කළ යුතුය. ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංඛ්‍යාත වර්ණාවලිය ආශ්‍රිතව පැවරුණු සියළුම වගකීම් ඉටු කිරීමටත්, සීමිත ජාතික සම්පතක් වශයෙන් ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කාර්යක්ෂමව කළමණාකරනය කිරීමේත් බලතල ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සංඛ්‍යාත කළමණාකරන අංශයට පවරා ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 10 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම සහ භූස්ථානගත චන්ද්‍රිකා කක්ෂයට අදාළ කරුණු කළමණාකරනය කිරීම සහ පාලනය කිරීම, අවශ්‍ය අවශ්‍යතාවල එකී සියළුම සංඛ්‍යාත භාවිතය තහනම් කිරීම හෝ එහි භාවිතය අත්හිටුවීම හෝ ආපසු ගැනීමට බලය පැවරී ඇති ශ්‍රී ලංකාවේ එකම නීත්‍යානුකූල බලධරයා වේ.

එමෙන්ම පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගුවන් විදුලි සන්නිවේදන සේවා පරිහරණය කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම, ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සංරක්ෂණය කිරීම සහ ගුවන් විදුලි සන්නිවේදන ස්ථාපනය කිරීම මගින් නිපදවෙන විද්‍යුත් චුම්භක අවහිරතා අවම කිරීම පිණිස රීතිවල අනුකූලතාවය බලාත්මක කිරීමේ බලධාරියා වේ.

**සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශයේ කාර්යයන්**

- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ගුවන් විදුලි රීති (5 වගන්තිය) සහ ජාතික ප්‍රමුඛතාවයන්ට අනුකූලව ගුවන් විදුලි සංඛ්‍යාත පරාස වෙන් කිරීම;
- බලපත්‍රයේ 22 වන වගන්තිය ප්‍රකාරව සංඛ්‍යාත පැවරීම;
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සහ රටට අයත් චන්ද්‍රිකා කක්ෂ භාවිතා කිරීම සඳහා අවශ්‍ය රීති, තාක්ෂණික ප්‍රමිති, ස්ථාපනය කිරීම;
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සැලසුම් කිරීම;
- ගුවන් විදුලි සන්නිවේදන උපකරණ සඳහා තාක්ෂණික ප්‍රමිති නියම කිරීම;
- රටේ සමාජ ආර්ථික ඉලක්ක සඳහා අදාල වැදගත්කම මත විවිධ සේවා ප්‍රමාණවත් පරිදි සැපයීම පිණිස ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමණාකරනය කිරීම;
- නීති විරෝධි ලෙස භාවිතා කරන, භාවිතයේ නොමැති සහ ඌන භාවිතය සහිත ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය අනාවරණය කර ගැනීම සඳහා ගුවන් විදුලි සංඛ්‍යයාත වර්ණාවලිය පිරික්සීම;
- ගුවන් විදුලි පර්යන්ත උපකරණ (Radio Terminal Equipment - RTE) සඳහා මාදිලි අනුමැතිය ලබා දීම.
- බලපත්‍රයේ නියම කරන ලද තාක්ෂණික ප්‍රමිති සහ පරාමීතීන්ට අනුකූලව සිය මෙහෙයුම් කටයුතු සිදු කිරීමට වගබලා ගැනීම පිණිස ගුවන් විදුලි සන්නිවේදන මධ්‍යස්ථානවල බලපත්‍ර අනුකූලතා විමර්ශන පැවැත්වීම;
- ගුවන් විදුලි සංඛ්‍යාත භාවිතා කිරීම සඳහා කලාපීය සහ ජාත්‍යන්තර සම්බන්ධිකරණය සහ සහයෝගීත්වය පවත්වාගෙන යාම;
- ගුවන් විදුලි සංඛ්‍යාත, පිහිටීම, සම්ප්‍රේෂණ බලය, ඇමතුම් සංඥා යනාදිය සම්බන්ධයෙන් ප්‍රධාන සංඛ්‍යාත රෙජිස්ටරය (Master Frequency Register - MFR)පවත්වාගෙනයාම;
- නව තාක්ෂණයන් සහ සේවා සම්පාදනය කිරීම පිණිස නව සංඛ්‍යාත වර්ණාවලි අවකාශ නිදහස් කර ගැනීම සඳහා නිසි ගුවන් විදුලි සන්නිවේදන සේවා ක්‍රමවත්ව පවත්වාගෙන යා හැකි පරිදි විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නැවත සකස් කිරීම;
- අවහිරතාවයන්ගෙන් තොරව අවසරලත් විමෝචන භාවිතා කිරීම, සහ අනුකූලතාවය පිරික්සීම, අවහිරතාවයන් ඇතිවන ආකාරය අනාවරණය කර ගැනීම මෙන්ම ඒවා නිරාකරණය කිරීම;
- ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු රැස් කිරීම;
- ආධුනික ගුවන් විදුලි සහ ගෝලීය සමුද්‍රීය ආපදා ආරක්ෂණ පද්ධතිය (Global Maritime Distress Safety System (GMDSS) පිළිබඳ විභාග පැවැත්වීම;

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සේවා වර්ගයට අනුකූලව විවිධ පරාසයන්ට වෙන් කරනු ලැබේ. ගුවන් විදුලි තරංග, උපකරණයේ තාක්ෂණික පරාමිතීන් සහ භාවිතයන් වල ලක්ෂණ පදනම් කරගෙන සේවාවේ ස්වභාවය එකකින් අනෙකට වෙනස් වේ. එබැවින් ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය විසින් සිදු කරන සේවා වර්ග කීපයකට බෙදා වෙන් කරනු ලැබේ.

විදුලි සංදේශ පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ භාවිතා කරන කිසියම් තැනැත්තෙකු සතුව කොමිෂන් සභාව විසින් නිකුත් කරන වලංගු බලපත්‍රයක් තිබිය යුතුය. බලපත්‍රය, වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේ නම් මිස, එම කරුණු තීරණය කිරීම පිණිස සාදන ලද රීති වල සඳහන් පරිදි ගාස්තුවක් ගෙවීමෙන් නිකුත් කරනු ලැබේ. බලපත්‍රයේ කොන්දේසි පැහැදිලිව සඳහන්වේ. බලපත්‍රයේ කොන්දේසි සේවාවෙන් සේවාවට වෙනස් වේ. මෙම කොන්දේසි කඩ කරනු ලැබූ අවස්ථාවලදී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට උපකරණ මුද්‍රාතැබීම හෝ බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට බලතල ඇත.

කිසියම් තැනැත්තෙකු හෝ සමාගමක් විසින් උපකරණ ආනයන නිෂ්කාශණය සඳහා ඉල්ලා සිටින විට එය නිකුත් කිරීමට පෙර, උපකරණය ක්‍රියා කරවීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ගුවන් විදුලි සංඛ්‍යාතයන් තිබෙන බව සහ උපකරණය අවශ්‍යය ප්‍රමිතිවලට අනුකූල බව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය විසින් සහතික කරනු ලැබේ. මෙම ක්‍රියා මාර්ගය බලපත්‍රලාභි සංඛ්‍යාත වර්ණාවලි පරිහරණය කරන්නන්ට පවතින ගුවන් විදුලි අවහිරතා අවම කරයි.

කෙසේ වුවද පරිහරණය කරන්නන් සිය සම්ප්‍රේෂණ වලට බලපාන අවහිරතාවයන්ට ලක්වීමේදී සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරණ අංශයට පැමිණිලි කරයි. එවිට එම අවහිරතාවය ඇතිවීමට හේතුවන ප්‍රභවය හඳුනාගෙන අවශ්‍ය නිසි ක්‍රියා මාර්ග ගනු ලැබේ.

**වර්ෂයේ ප්‍රගතිය**

වර්ෂය තුළ වර්ණාවලි කළමනාකරණ අංශය විසින් වර්ණාවලි බලපත්‍ර අළුත් කරන ලද අතර කාලානුරූපව වර්ණාවලි බලපත්‍ර ගාස්තු එකතු කිරීම සඳහා නව ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියා පටිපාටියේ දී, කල් ඉකුත් වූ බලපත්‍ර අලුත් නොකරන ක්‍රියාකරුවන්ට එරෙහිව මූලික බලාත්මක කිරීමේ පියවර ගනු ලැබේ. බලපත්‍රය අළුත් නොකළහොත් මේ සම්බන්ධ මෙහෙයුම් උපකරණ මුද්‍රා තබනු ලැබේ.

ස්වයංක්‍රීය වර්ණාවලි කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම හා දීප ව්‍යාප්තව ආවේක්ෂණ කටයුතු සිදුකිරීම සඳහා නව ගුවන් විදුලි පද්ධතියක් මිලදී ගැනීම සම්බන්ධ කටයුතු සිදු වෙමින් පවතී.

2018 වසරට අදාළ මූලික සංඛ්‍යාලේඛන පහත වගුවල දක්වා ඇත.

**සංඛ්‍යාත බලපත්‍ර නිකුත් කිරීම**

*වගුව 12: සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව*

| සේවාවේ වර්ගය | බලපත්‍ර සංඛ්‍යාව | |
|---|---|---|
| | **2017** | **2018** |
| ස්ථාවර සේවාව | 153 | 167 |
| විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලි) | 37* | 39* |
| ට්‍රන්කින්/පේජින්/සිටිසන් බ්‍රෑන්ඩ් | 7 | 10 |
| දත්ත / ගුවන් විදුලි ටෙලිමෙට්‍රි සේවාව | 49/39 | 20/28 |
| ගුවන් සහ සමුද්‍ර සේවා | | |
| (i) ගුවන් යානා මධ්‍යස්ථාන | 74 | 74 |
| (ii) නැව් මධ්‍යස්ථාන | 91 | 94 |
| (iii) සමුද්‍රීය ජංගම | 1872 | 1041 |
| (iv) ගුවන් යානා ගමන් හැසිරවීම | 10 | 12 |
| පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව | 272 | 361 |
| ආධුනික ගුවන් විදුලි | 65 | 33 |

*ප්‍රධාන බලපත්‍ර පමණක් එකතු කරන ලදී.

## 2018 වර්ෂයේදි ලැබුණු පැමිණිලි සහ පැවැත්වූ විමර්ශන

*වගුව 13: 2018 වර්ෂයේදී ලැබුණු පැමිණිලි සහ පැවැත්වූ විමර්ශන*

| සේවාව | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | | පැවැත්වූ සංඛ්‍යාව | විමර්ශන |
|---|---|---|---|---|
| | 2017 | 2018 | 2017 | 2018 |
| රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශනය | 3 | 5 | 3 | 5 |
| වෙනත් සේවාවන් | 14 | 32 | 13 | 30 |

*වගුව 14: 2018 වර්ෂයේදී හඳුනාගත් නීතිවිරෝධී භාවිතා කරන්නන්*

| වර්ගය | හඳුනාගත් නීති විරෝධී භාවිතා කරන්නන් සංඛ්‍යාව | | ගනු ලැබූ ක්‍රියාමාර්ගය |
|---|---|---|---|
| | 2017 | 2018 | |
| විකාශන සේවා (රූපවාහිනී සහ ගුවන් විදුලි) | 02 | 02 | සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කිරීම වැලැක්වීමට පියවර ගන්නා ලදී. |
| වෙනත් සේවා | 01 | 08 | |

රැහැන් රහිත විදුලි සංදේශ උපකරණ ආනයනය කිරීම සඳහා නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව.

*වගුව 15: 2018 වර්ෂයේදී නිකුත් කරන ලද නිෂ්කාශන ලිපි සංඛ්‍යාව*

| සේවා වර්ගය | නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව | |
|---|---|---|
| | 2017 | 2018 |
| සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ ඇතුළු ස්ථාවර සේවාව | 649 | 506 |
| විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලි) | 76 | 57 |
| සෙලියුලර් ජංගම සේවාව<br>(i) වෙළඳ බලපත්‍ර<br>(ii) ජංගම ක්‍රියාකරුවන්<br>(iii) පෞද්ගලික ජංගම ගුවන් විදුලි | <br>7325<br>1130<br>645 | <br>6526<br>757<br>190 |
| දත්ත සේවාව / ගුවන් විදුලි ටෙලි මෙට්‍රි | 152/39 | 173 |
| චන්ද්‍රිකා සේවා | 513 | 153 |
| ආධුනික ගුවන් විදුලි | 15 | 21 |
| අඩු බලැති උපකරණ | 2188 | 1036 |

### සංඛ්‍යාත පිරික්සීම සහ විමර්ශනය

සංඛ්‍යාත කළමණාකරනයේදී ඉතා අත්‍යාවශ්‍ය අංගයක් වන්නේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පිරික්සීමයි. බලපත්‍රයේ 22 වන වගන්තියෙන් අවහිරතාවයන්ගෙන් තොරව සහතිකලත් ගුවන් විදුලි සේවා භාවිතා කරන බව නිසැක කරනු ඇත.ගුවන් විදුලි සම්ප්‍රේෂක වලින් පරාස විමෝචනයන්ගෙන් බැහැරව අනවශ්‍ය සහ ව්‍යාජ විමෝචනයන් උත්පාදනය වන බැවින් අවහිරතාවයන්ගෙන් තොරව ගුවන් විදුලි සන්නිවේදන සේවා භාවිතා කිරීම බෙහෙවින් දුෂ්කර බව යථාර්ථයයි. එමෙන්ම එය අනපේක්ෂිතව අවහිරතාවයන්ට හේතු විය හැකි සන්තෘප්තිය කරා යොමු කරන සංවේදී ආදායකයන් කරා මෙහෙයවයි. එබැවින් අවහිරතාවයන් අනාවරණය කර ගැනීම සහ අවම කිරීම බෙහෙවින් අසීරු කාර්යයක් වන අතර

ඒවා අනාවරණය කර ගැනීම පිණිස නවීන තාක්ෂණික උපකරණ අවශ්‍ය වේ. සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය විසින් කොළඹ, කදිරාන සහ නුවර ප්‍රාදේශිය පිරික්සුම් මධ්‍යස්ථාන (Regional Monitoring Centres) පවත්වාගෙන යයි. එමෙන්ම මෙම කාර්යය සඳහා යක්කල සහ කටුබැද්ද දුරස්ථ පිරික්සුම් මධ්‍යස්ථානද ස්ථාපනය කර ඇත. මෙම සියළුම පද්ධතිවලට දුරස්ථව සිට ප්‍රවේශ විය හැකිය.

එමෙන්ම, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ සිට දුරස්ථව මෙහෙයවීමේ පහසුකම් සහිත නවීන අධි සංඛ්‍යාත දිශා නිශ්චය කිරීම සහ පිරික්සීමේ පද්ධතිය (Modern High Frequency Direction Finding - HFDF and Monitoring System) කදිරාන පිරික්සුම් මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක වේ. මෙම කාර්යය සඳහා ජාල උපකරණ මිලදී ගැනීම මගින් දීප ව්‍යාප්තව පිරික්සුම් ක්‍රියාකාරකම් ව්‍යාප්ත කිරීම පිණිස මෙම අංශය විසින් පියවර ගන්නා ලදී.

# නීති අංශය

ස
මා
ලෝ
ච
න
ය

සියළුම නෛතික හා නියාමන කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාවට උපදෙස් ලබා දීමේදී නීති අංශය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පාර්ශවකරුවෙකු වන සියලුම නඩු කටයුතු මෙම අංශය විසින් කළමනාකරණය කරයි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියාමන කටයුතු සඳහා නීති අංශයේ කාර්යභාරය අවශ්‍ය වේ. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත ප්‍රකාරව නෛතික උපදෙස් සැපයීම නීති අංශයේ වගකීම වේ. මීට අමතරව, නියාමන කටයුතු වලට සෘජුවම සම්බන්ධ නීති සම්පාදනය කරන අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයේ සංවර්ධනයට සම්බන්ධ වී ඇති කරුණු සම්බන්ධයෙන් වෙනත් සංසදවලදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියෝජනය කරයි.

**කාර්යයන්**

මෙම අංශයේ ප්‍රධාන වගකීම සහ කාර්යයන් වන්නේ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නීති, රීති, රෙගුලාසි සහ ප්‍රමිතිවලට අදාලව ප්‍රාථමික සහ ද්විතීයික නීති සම්පාදන කෙටුම්පත් කිරීම, නීති අර්ථ නිරූපනය කිරීම, නීති උපදෙස් ලබාදීම සහ නීති සමාලෝචනය කිරීමයි. එමෙන්ම බලපත්‍රලාභීන්, පාර්ශවකරුවන්, අමාත්‍යාංශ/අංශ හා වෙනත් සංසද මෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සෙසු අංශ විසින් යොමු කරන කරුණු පිළිබඳ නීතිමය උපදෙස් සැපයීම මෙම අංශය විසින් සිදු කරයි. විවිධ නියාමන කරුණු සම්බන්ධයෙන් නීතිමය දායකත්වය අවශ්‍ය නඩු වලට මෙන්ම 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ නීතිමය කටයුතු ආරම්භ කිරීම අවශ්‍ය වන අවස්ථා වලදී නීති අංශය කොමිෂන් සභාවට උපදෙස් දෙයි. එමෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පාර්ශවයක් වන , ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහේස්ත්‍රාත්ධිකරණය, මහාධිකරණය සහ කම්කරු විනිශ්චය සභාව වැනි නීතිමය අධිකරණවල ගොනු කර ඇති නඩු මෙහෙයවීම සඳහා වගකියනු ලැබේ.

**කාර්යසාධනය**

2018 වර්ෂයේදී නීති අංශය කොමිෂන් සභාවේ නියාමන කටයුතු රැසක නිරත වී ඇති අතර ඒ සඳහා දායකත්වය ලබා දී ඇත.

සේවා ප්‍රමිතිවල ගුණාත්මකභාවය බලාත්මක කිරීම සහ ජංගම ග්‍රාහකයින්ගේ සිම්පත් ලියාපදිංචි කිරීම සඳහා නීති කෙටුම්පත් කරන ලදී. විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) සඳහා 2004 අංක 11 මුදල් පනතේ 23 වන වගන්තිය යටතේ මාර්ගෝපදේශ සකස් කරන ලදී. ස්ථාවර, ජංගම, කේබල් රූපවාහිනී සේවා බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් 17 වන වගන්තියට අනුකූලව ක්‍රියාමාර්ග ගැනීම, සංඛ්‍යාත වර්ණාවලි ගැටළු, වෙළඳ බලපත්‍ර ගැටළු, විදුලි සංදේශ ක්‍රියාකරු, ජාල සම්බන්ධ ගැටළු සඳහා නීතිමය උපදෙස් ලබා දී ඇත.

පාරිභෝගික ගැටළු විසඳීම පිණිස පැමිණිලි ගණනාවක් සඳහා නීති උපදෙස් ලබා දෙන ලදී.

එමෙන්ම මෑතකදී දුරකථන ක්‍රියාකාර සමාගම් දෙකක් ඒකාබද්ධ කිරීමේ නියාමන කාර්යය සඳහා නීති අංශය දායක විය. 2018 වසරේදී ජංගම/ස්ථාවර දුරකථන පිළිබඳ තොරතුරු සඳහා කරන ලද ඉල්ලීම්වලට අදාළ අධිකරණ නියෝග 663 කට අධික සංඛ්‍යාවක් නීති අංශය විසින් ක්‍රියාවට නංවා ඇත.

විදුලි සංදේශ කර්මාන්තයේ ශීඝ්‍ර වර්ධනයන් සපුරාලීම පිණිස වර්තමාන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ නව සංශෝධනයන් සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේ අපි නිරත වී සිටිමු.

**නඩු මගට බැසීම**

2018 වර්ෂයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට එරෙහිව නඩු කිහිපයක් ගොනු කරන ලදී. 2018 වර්ෂයේදී නඩු හතරක් සාර්ථකව අවසන් කෙරිණි. එමෙන්ම බලපත්‍ර ප්‍රත්‍යාදිෂ්ට කිරීම, ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය වෙන් කිරීම, 17 වන වගන්තිය යටතේ වූ පද්ධති බලපත්‍ර ආශ්‍රිත කරුණු ගනනාවක් උසාවියේ විභාග වෙමින් පවතී.

නීති අංශය මගින් බලාත්මක කිරීමේ කොටසක් වශයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත උල්ලංඝනය කරමින් සිදුකරන වැරදි වෙනුවෙන් අදාල තැනැත්තන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මුලපුරා ඇත.

සමාලෝචනය

## තරඟකාරීත්ව අංශය

තරඟකාරීත්ව අංශය විසින් පාරිභෝගිකයන්ගේ සහ දුරකථන ක්‍රියාකාර සමාගම් වල යහපත පිණිස කාර්යක්ෂම සහ පූර්ණ ස්වාධීන විදුලි සංදේශ සේවාවක් සැපයීමෙහි ලා නියාමන කටයුතු මෙහෙයවයි. මෙම අංශය විසින් සාධාරණ වූ ගාස්තු සහ ගුණාත්මක සේවා පවත්වාගෙන යන අතර අයක්‍රම, අන්තර්ජාල සේවා නියාමනය කිරීම, විදුලි සංදේශ කර්මාන්තයේ තොරතුරු ප්‍රසිද්ධ කිරීම, විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල කාර්යසාධනය විශ්ලේෂණය කිරීම සහ අදාළ පාර්ශ්වයන් සඳහා අවශ්‍ය උපදෙස් සැපයීම සිදු කරනු ලැබේ. ඌන සංවර්ධිත ප්‍රදේශ සඳහා විදුලි සංදේශ පහසුකම් සැපයීම මෙම අංශය සිදු කරන තවත් එක් කාර්යයකි. මෙම අංශය විසින් විදුලි සංදේශ බදු, ජාත්‍යන්තර විදුලි සංදේශ බදු සහ සෙස බදු රැස් කරනු ලබයි. නව සේවා සපයන විදුලි සංදේශ තාක්ෂණය විකාශනය කිරීමෙහි ලා ක්‍රියා කරන විදේශීය විශේෂඥයින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම දිරිගන්වමින් එම විදේශීය විශේෂඥයින් වීසා ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සහ අවසර ලබාදීම මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

## අන්තර්සම්බන්ධතාවය සහ ආංශික විශ්ලේෂණය

තරඟකාරීත්ව අංශයේ කාර්යයන් (අන්තර්සම්බන්ධතාවය සහ ආංශික විශ්ලේෂණය)

1. බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම්වල මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය විශ්ලේෂණය කිරීම තුළින් ප්‍රවණතාවන් අධීක්ෂණය කිරීම.
2. විදුලි සංදේශ කර්මාන්තයේ සංඛ්‍යාලේඛන තොරතුරු රැස්කිරීම සහ විශ්ලේෂණය කිරීම.
3. විදුලි සංදේශ කර්මාන්තයෙන් රාජ්‍ය බදු/අයබදු (විදුලි සංදේශ බද්ද, ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු සහ සෙස්)එකතු කිරීම.
4. ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ආශ්‍රිත ව්‍යාපෘතිවල නිරත විදේශීය විශේෂඥයින් සඳහා අදාල වීසා ලබාගැනීමට පහසුකම් සැපයීම.
5. අන්තර් සම්බන්ධතාවයට අදාළ තොරතුරු රැස් කිරීම සහ පැන නගින අදාළ ගැටළු විසඳීම.

### ප්‍රගතිය

### ග්‍රාහක පදනම

2018 දෙසැම්බර් 31 දින වන විට ජංගම හා ස්ථාවර ප්‍රවේශ ග්‍රාහක පදනම රු. 35,012,720 කි. 2017 වසරට සාපේක්ෂව ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම්වල ග්‍රාහක පදනමේ වැඩි වීමක් පෙන්නුම් කළ අතර 2017 වර්ෂය හා සසඳන විට ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකාර සමාගම්වල ග්‍රාහකයින්ගේ අඩුවීමක් පෙන්නුම් කළේය.

*වගුව 16: 2012 – 2018 කාලය සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහක පදනමේ සංඛ්‍යාව*

| වර්ගය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | % වෙනස 2013-2014 | % වෙනස 2014-2015 | % වෙනස 2015-2016 | % වෙනස 2016-2017 | % වෙනස 2017-2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම | 20,447,508 | 22,123,000 | 24,384,544 | 26,227,631 | 28,199,083 | 32,528,104 | 8% | 10% | 8% | 8% | 15% |
| ස්ථාවර ප්‍රවේශ | 2,706,787 | 2,709,848 | 2,601,196 | 2,550,432 | 2,603,178 | 2,484,616 | 0% | -4% | -2% | 2% | -5% |
| එකතුව | 23,154,295 | 24,801,739 | 26,985,740 | 28,778,063 | 30,802,261 | 35,012,720 | 7% | 9% | 7% | 7% | 14% |

### පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍ය ආදායම (ARPU)

2013 සිට 2018 දක්වා ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම්වල සාමාන්‍ය ආදායම (ARPU) (වාර්ෂිකව) පහත වගුවේ දැක්වේ. 2018 වර්ෂය සඳහා දුරකථන ක්‍රියාකාර සමාගම්වල දත්ත අපේක්ෂාවෙන් සිටී. (විගණනය නොකරන ලද ක්‍රියාකරුවන්ගේ ආදායම මත පදනම්ව පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන සාමාන්‍ය ආදායම (ARPU) සඳහා පහත ගණනය කිරීම් සලකා බලනු ලැබේ).

*වගුව 17: 2013-2018 කාලපරිච්ඡේදය සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍ය*

| වර්ගය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | % වෙනස 2013-2014 | % වෙනස 2014-2015 | % වෙනස 2015-2016 | % වෙනස 2016-2017 | % වෙනස 2017-2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජංගම | 5,457 | 5,386 | 5,131 | 5,258 | 4,977 | 4,588 | -1% | -5% | 2% | -5% | -8 |
| ස්ථාවර ප්‍රවේශ | 17,112 | 17,954 | 19,659 | 21,691 | 22,911 | 30,745 | 5% | 9% | 10% | 6% | 34% |

**විදුලි සංදේශ බදු (TL)**

විදුලි සංදේශ බදු ශ්‍රී ලංකා රජය විසින් 2011 වසරේදී විදුලි සංදේශ කර්මාන්තය සඳහා "තනි අනුපාත බද්දක්" ලෙස හඳුන්වා දුන් අතර ආරම්භයේදී සැපයුම් වටිනාකම මත  බදු අනුපාතය  20% ක් විය. අධිවේගී අන්තර්ජාල සේවා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2013 ආරම්භයේ සිට අන්තර්ජාල සේවා සඳහා 10% ක සහනදායී විදුලි සංදේශ බදු අනුපාතයක් පැනවිය. අනෙකුත් විදුලි සංදේශ සේවා සඳහා වන විදුලි සංදේශ අනුපාතය නොවෙනස්ව පැවතුනි. 2014 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි විදුලි සංදේශ බදු  අනුපාතය 20% සිට 25% දක්වා වැඩිවූ අතර අන්තර්ජාල සේවා සඳහා  විදුලි සංදේශ බදු අනුපාතය 10% ලෙස නොවෙනස්ව පැවතුනි. පසුව, 2017 සැප්තැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි අන්තර්ජාල සේවා සඳහා වන බද්ද අහෝසි කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2016ට සාපේක්ෂව 2017 වර්ෂය සඳහා එකතු කරන ලද විදුලි සංදේශ බදු ප්‍රමාණය පහළ වැටිණි. 2018 නොවැම්බර් 10 දින සිට බලපැවැත්වෙන පරිදි විදුලි සංදේශ සේවා මත විදුලි සංදේශ බදු අනුපාතය 25% සිට 15% දක්වා වෙනස් විය.

*වගුව 18: විදුලි සංදේශ බදු 2012-2018 (රු. මිලියන)*

| වර්ෂය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|
| විදුලි සංදේශ බදු | 19,746 | 20,027 | 26,152 | 27,837 | 30,347 | 29,128 | 24,319 |

*ප්‍රස්ථාරය 07: විදුලි සංදේශ බදු*




**සෙස්**

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත  පනතේ 22 ඡ් වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දුරකථන ක්‍රියාකාර  සමාගම් වලින් සෙස් බදු එකතු කරනු ලැබේ.

*වගුව 19: සෙස් 2012-2018 (රු. මිලියන)*

| වර්ෂය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|
| මුළු සෙස් | 3,152 | 3,455 | 3,652 | 3,841 | 4,127 | 4,209 | 4,443 |

*ප්‍රස්ථාරය 08: සෙස් (2012-2018)*




**වීසා අයදුම්පත්‍ර නිර්දේශ කිරීම**

විදුලි සංදේශ කර්මාන්තය ශීඝ්‍රයෙන් වෙනස් වන කර්මාන්තයක් බැවින්, ලෝකයේ නව තාක්ෂණයන් සමඟ සිය ජාල වැඩිදියුණු කිරීමට දුරකථන ක්‍රියාකාර සමාගම් අඛණ්ඩව උත්සාහ කරති. දුරකථන ක්‍රියාකාර සමාගම් සිය විශේෂ ව්‍යාපෘතිවල වැඩ කිරීමේදී විශේෂඥ සේවය ලබා ගැනීම සඳහා විදුලි සංදේශ කර්මාන්තයේ විදේශීය වෘත්තිකයන් මෙරටට ගෙන්වා ගනු ලබයි. දුරකථන ක්‍රියාකාර සමාගම් වෙනුවෙන් කොමිෂන් සභාව එවැනි වෘත්තිකයන්ගේ වීසා බලපත්‍ර ජනාධිපති ලේකම් කාර්යාලයට නිර්දේශ කරයි. 2018 වර්ෂය තුළ එවැනි වෘත්තිකයින්ගේ වීසා බලපත්‍ර අයදුම්පත් 250ක් මෙම අංශය විසින් සකස් කරන ලදී.

**විදුලි සංදේශ කර්මාන්තයේ තොරතුරු මෙහෙයවීම**

තරඟකාරිත්ව අංශය විසින් විදුලි සංදේශ කර්මාන්තයේ දත්ත රැස්කර තොරතුරු වරින් වර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ. තවද, මෙම අංශය ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT) වැනි දේශීය හා ජාත්‍යන්තර ආයතන සඳහා විදුලි සංදේශ කර්මාන්ත තොරතුරු ඉදිරිපත් කරයි.

**අන්තර්සම්බන්ධතාවය මෙහෙයවීම**

තරඟකාරිත්ව අංශය විසින් දුරකථන ක්‍රියාකාර සමාගම්වල අන්තර් සම්බන්ධතා තොරතුරු රැස්කරනු ලබන අතර 2018 වසරේදී අන්තර් සම්බන්ධතාවය තීරණය කිරීම පිළිබඳව කිසිදු ආරවුලක් හෝ පැමිණිල්ලක් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත වාර්තා නොවීය.

**ක්‍රියාකරු විශ්ලේෂණය**

**තරඟකාරිත්ව අංශයේ කාර්යයන් (ක්‍රියාකරු විශ්ලේෂණය)**

1. "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතිය - ඌන සංවර්ධිත හා අඩු පහසුකම් සහිත ප්‍රදේශවල විදුලි සංදේශ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.
2. විදුලි සංදේශ හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය වලින් තොර බව සහතික කිරීම - විදුලි සංදේශ හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන.
3. ජාත්‍යන්තර විදුලි සංදේශ බඳු නිවැරදිව හා කාලීනව එකතු කිරීමට වගබලා ගැනීම.
4. අන්තර්ජාල සේවා සැපයුම්කරුවන්ගේ බලපත්‍ර නිකුත් කිරීම (පහසුකම් පාදක කර නොගත්)
5. බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම්වල විගණනය කළ ගිණුම් රැස් කිරීම.
6. පොදු ස්විචීකරණ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල (PSTN) ආදායම, ලාභ සහ අලාභ සහ ආයෝජන විශ්ලේෂණය කිරීම

**කාර්යසාධනය**

**1. "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රටේ ඌන සංවර්ධිත හා අඩු පහසුකම් සහිත ප්‍රදේශ තවදුරටත් හඳුනා ගැනීම පිණිස 2017 වසරේදී "ගමට සන්නිවේදනය " ලෙස අධ්‍යයනයක් ආරම්භ කරන ලදී.

විදුලි සංදේශ හා අධිවේගී අන්තර්ජාල පහසුකම්වල අවශ්‍යතාවය හඳුනා ගැනීම සඳහා 2018 වර්ෂයේදී තරඟකාරිත්ව අංශය විසින් පොලොන්නරුව සහ කළුතර දිස්ත්‍රික්කවල ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වන ලදී.

අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාශවල (GND) ග්‍රාම නිලධාරීන්ගෙන් දුරකථන ඇමතුම්, විද්‍යුත් තැපැල් සහ ලිපි මගින් විදුලි සංදේශ පහසුකම් නොලැබීම පිළිබඳ ප්‍රතිචාර ලැබී තිබේ.

**1.1 පොලොන්නරුව දිස්ත්‍රික්කය**

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය, දිඹුලාගල, ඇලහැර සහ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාම නිලධාරි වසම් 14 ක භෞතිකමය පරීක්ෂණ සිදු කරන ලදී.

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ඉහත ග්‍රාම නිලධාරි කොට්ඨාශ 14 හි 2018 ජූලි 13 සිට 15 දක්වා අධ්‍යයනය සිදු කරන ලදී. එය පහත සඳහන් කාණ්ඩ යටතේ සිදු කරන ලදී.

a. ස්ථාවර සහ ජංගම හඬ සේවා ලබාගත හැකිවීම
b. අධිවේගී අන්තර්ජාල සේවා ලබාගත හැකිවීම (ස්ථාවර/ජංගම)
c. විකාශන සේවා ලබාගත හැකිවීම (රූපවාහිනීය/ගුවන්විදුලිය)

සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශයේ පිරික්සුම් රථ භාවිතා කරමින් ලැබුණු සංඥා ශක්තිය (dBm) ප්‍රකාරව පොදු ස්විචීකරණ දුරකථන ක්‍රියාකාර සමාගම්වල සේවා ලබා ගැනීමේ හැකියාව (2G, 3G, 4G) මනිනු ලැබේ. මීට අමතරව, ජංගම දුරකථන භාවිතා කිරීමෙන්මද මැනීම් යන්ත්‍රානුසාරයෙන් තොරව අතින්ද සිදු කරනු ලැබීය.

**භෞතිකමය විමර්ශනයේ සොයාගැනීම්**

අ. ස්ථාවර සහ ජංගම හඬ සේවා ලබාගත හැකිවීම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරක ග්‍රාම නිලධාරී කොට්ඨාශවල ස්ථාන 14ක භෞතිකමය විමර්ශනය සිදු කරන ලදී. ග්‍රාම නිලධාරී වසම් 14 අතුරින් ග්‍රාම නිලධාරී වසම් 4ක, සේවාව ලබාගත හැකිවීම ප්‍රශස්ත මට්ටමක පැවති අතර ග්‍රාම නිලධාරී වසම් 10ක සංඥා ශක්තිය වැඩිදියුණු කිරීමට අවශ්‍ය වනු ඇති බව නිරීක්ෂණය විය.

කෙසේවුවද, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ **බෝගස්වැව සහ දිඹුලාගල** අඩු ජංගම හා ස්ථාවර ආවරණයක් ඇති බව හඳුනාගෙන ඇත.

ආ. අධිවේගී අන්තර්ජාල සේවා ලබාගත හැකිබව (ස්ථාවර /ජංගම)

අධ්‍යයනයට අනුව, ග්‍රාම නිලධාරී කොට්ඨාශ 14හිම අධිවේගී අන්තර්ජාල සේවා පහසුකම් (ස්ථාවර/ජංගම) සතුටුදායක මට්ටමක නොමැති බව හඳුනාගෙන තිබේ.

ඇ. විකාශන සේවා ලබාගත හැකිබව (රූපවාහිනී / ගුවන්විදුලි)

අධ්‍යයනයෙන් අනාවරණය වූයේ එක් රූපවාහිනී නාලිකාවක් හැර ප්‍රධාන රූපවාහිනී නාලිකාවලින් ලැබුණු මට්ටම් සතුටුදායක මට්ටමක පවතින බවත් ප්‍රධාන ගුවන් විදුලි නාලිකාවන් සතුටුදායක මට්ටමින් ක්‍රියාත්මක වන බවත්ය.





*රූපසටහන 17: පොලොන්නරුව දිස්ත්‍රික්කයේ සිදු කරන ලද විමර්ශනයන්*

## 1.2. කළුතර දිස්ත්‍රික්කය

විදුලි සංදේශ සේවා ලබාගත හැකිවීම පිළිබඳ ක්ෂේත්‍ර විමර්ශනය "ගමට සන්නිවේදනය" ව්‍යාපෘතිය යටතේ ලැබුණු ප්‍රතිචාර පදනම් කරගෙන කළුතර දිස්ත්‍රික්කයේ සිදු කරන ලදී. අදාල ග්‍රාම නිලධාරී කොට්ඨාශවල ග්‍රාමනිලධාරීන් මගින් විදුලි සංදේශ පහසුකම් ලබාගත නොහැකිවීම පිළිබඳ දුරකථන ඇමතුම්, විද්‍යුත් තැපැල සහ ලිපි මගින් ප්‍රතිචාර ලැබී ඇත.

කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක ග්‍රාම නිලධාරී කාර්යාල 26 ක භෞතිකමය පරීක්ෂණ 2018 අගෝස්තු 7, 8, 17 සහ 22 යන දිනවල සිදු කරන ලදී.

භෞතිකමය විමර්ශනයේ නිගමනයන්

අ. ස්ථාවර සහ ජංගම හඬ සේවා ලබාගත හැකිවීම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක ග්‍රාම නිලධාරී වසම් 26ක් භෞතිකව පරීක්‍ෂාවට ලක් කරන ලදී. ග්‍රාම නිලධාරී වසම් 26 අතුරින් ග්‍රාම නිලධාරී වසම් 06 ක සේවා ලබා ගත හැකි මට්ටම සතුටුදායක මට්ටමක පැවති අතර ග්‍රාමනිලධාරී වසම් 20ක සංඥා ශක්තිය වැඩි දියුණු කළ යුතු බව නිරීක්ෂණය විය.

කෙසේ වෙතත්, ගුලවිට, මැන්ඩගල, ඕමත්ත, ගිරිකොල, කුඩාකලුපහන, සඳසිරිගම, බටගොඩවිල, ඉහල කුඩලිගම සහ දිගන්න ග්‍රාමනිලධාරී වසම්වල ජංගම හා ස්ථාවර සේවා ආවරණ නොමැති බව හඳුනාගෙන ඇත.




*රූපසටහන 18: කළුතර දිස්ත්‍රික්කයේ අධ්‍යයනය කළ ප්‍රදේශ*

ආ. අධිවේගී අන්තර්ජාල සේවා ලබාගත හැකිවීම (ස්ථාවර/ජංගම)

ග්‍රාමනිලධාරී කොට්ඨාශ 26 හි අධිවේගී අන්තර්ජාල සේවා පහසුකම් (ස්ථාවර/ජංගම) සතුටුදායක මට්ටමක නොමැති බව හඳුනා ගන්නා ලදී.

ඇ. විකාශන සේවා ලබාගත හැකිවීම (රූපවාහිනී/ගුවන්විදුලිය)

- නිවාස බහුතරයක් සෘජු ගෘහස්ථ (DTH) චන්ද්‍රිකා සම්බන්ධතා වලින් සමන්විත බව මෙම අධ්‍යයනයේදී අනාවරණය වී ඇත.
- බොහෝ අධි උච්ච සංඛ්‍යාත සහ අති උච්ච සංඛ්‍යාත රූපවාහිනී නාලිකා වල සංඥා මට්ටම් සතුටුදායක මට්ටමක නොතිබුණි.
- ගුවන්විදුලි නාලිකා බහුතරයක් සතුටුදායක මට්ටමක ක්‍රියාත්මක විය.

විමර්ශන කණ්ඩායමේ නිර්දේශ පහත පරිදි වේ;

1. අඩු පහසුකම් සහිත ප්‍රදේශවල ජාල ආවරණය සහතික කිරීම සඳහා ජංගම ප්‍රධාන මධ්‍යස්ථාන ඉදිකිරීම.
2. පොලොන්නරුව සහ කළුතර දිස්ත්‍රික්කවල සියලුම ග්‍රාමනිලධාරී වසම්වල අධිවේගී අන්තර්ජාල සේවා (ස්ථාවර/ජංගම) ආවරණය වැඩි දියුණු කිරීම.
3. හඳුනාගත් ප්‍රදේශවල රූපවාහිනී ආවරණය වැඩි දියුණු කිරීම.

පොලොන්නරුව සහ කළුතර දිස්ත්‍රික්ක සඳහා වඩා හොඳ ජාල ආවරණයක් නිසැක කිරීම සඳහා කොමිෂන් සභාව සියළුම පොදු ස්විචීකරණ දුරකථන ක්‍රියාකාර සමාගම් සමඟ කටයුතු කරමින් සිටී.




*රූපසටහන 19: කළුතර දිස්ත්‍රික්කයේ සිදු කරන ලද විමර්ශන*

## 2. විදුලි සංදේශ / තොරතුරු සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති

විදුලි සංදේශ හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයේ නියාමකයා වශයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, විදුලි සංදේශ/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම හෝ නැවත භාවිතා කිරීම සඳහා කර්මාන්තයේ නිරතවූවන් සහ පොදු මහජනතාව දිරිගැන්වීම සඳහා ක්‍රමෝපායන් හා නිර්නායකයන් සකස් කිරීමේ වගකීම දරයි.

**විදුලි සංදේශ/තොරතුරු සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්**

විදුලි සංදේශ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ නිසි ලෙස බැහැර කිරීම හෝ නැවත භාවිතා කිරීම සඳහා පාසල් මට්ටමේ අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කළ පත්‍රිකා සහ ඊට අදාළ ලියකියවිලි සම්පූර්ණ කර ඇත.



*රූපසටහන 20 : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අපද්‍රව්‍ය කළමණාකරනය පිළිබඳව සකස් කරන ලද අත් පත්‍රිකා*

## 3. අන්තර්ජාල සේවා සැපයුම්කරු බලපත්‍ර නිකුත් කිරීම

**අන්තර්ජාල සේවා සැපයුම්කරුගේ (ISP) බලපත්‍ර නිකුත් කිරීම / අලුත් කිරීම**

"අන්තර්ජාල සේවය" යනුවෙන් ගෝලීය ජාලයක් හෝ ජාල මගින් සපයන, සහ බලපත්‍රලාභී දූරකථන ක්‍රියාකාර සමාගම් ඔස්සේ පරිගණක සහ මෝඩම් යන්ත්‍ර මගින් ප්‍රවේශවන සේවාවක් අදහස් වේ. මහජනතාවට ඉහත සේවා සැපයීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව දූරකථන ක්‍රියාකාර සමාගම් සතුව අන්තර්ජාල සේවා සැපයුම්කරු බලපත්‍රයක් තිබිය යුතුය.

අන්තර්ජාල සේවා සැපයුම්කරු (ISP) බලපත්‍රය (පහසුකම් පාදක කර නොගත්) නිකුත් කිරීම සහ අළුත් කිරීම සඳහා ක්‍රියාකරු විශ්ලේෂණ ඒකකය වගකිව යුතු ය. "පහසුකම් පාදක කර නොගත්" අධිවේගී අන්තර්ජාල සේවා බලපත්‍රයක් යනු දූරකථන ක්‍රියාකාර සමාගම සතුව ජාලයක් නොමැති නමුත් පහසුකම් පාදක කරගත් ක්‍රියාකාර සමාගමක බද්දට ගත් ජාලයක් මගින් අන්තර්ජාල සේවා සැපයීමයි.

පහත සඳහන් ක්‍රියාකාර සමාගම් පහ සිය පාරිභෝගිකයින් සඳහා අන්තර්ජාල සේවා (පහසුකම් පාදක කර නොගත්) සපයයි. (අනෙකුත් පොදු ස්විචීකරණ දූරකථන ජාල ක්‍රියාකරුවන්ගේ අන්තර්ජාල සැපයුම් සේවා සිය ස්ථාවර හා ජංගම බලපත්‍රය යටතේ ආවරණය වේ)

1. ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (පුද්) සමාගම
2. භාරතීඑයාර්ටෙල් ලංකා (පුද්) සමාගම
3. එටිසලාට් ලංකා (පුද්) සමාගම
4. ටාටා කමියුනිකේෂන් ලංකා සමාගම
5. ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය

සීමාසහිත ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (පුද්) සමාගම සඳහා අන්තර්ජාල සේවා සැපයුම්කරුගේ බලපත්‍රය (පහසුකම් පාදක කර නොගත්) අළුත් කිරීම ආරම්භ කරන ලදී. ඇගයීමේ කමිටුව විසින් කමිටු නිර්දේශය සහිතව වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර ඇත.

## 4. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු (ITOL)

ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු (OLAC) ලෙස ශ්‍රී ලංකාව තුළ ආරම්භ කරන හෝ අවසන් කරන සියළුම ලැබෙන සහ පිටතට යැවෙන ඇමතුම් සම්බන්ධයෙන් සියළුම ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු (ITO) කොමිෂන් සභාව විසින් ගෙවනු ලැබේ.

*වගුව 20: විදුලි සංදේශ සංවර්ධන ගාස්තු රැස් කිරීම*

| වර්ෂය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තු රැස් කිරීම (රු. මිලියන ) | 5,861 | 8,689 | 6,202 | 5,579 |

## පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු (OLAC)

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දුරකථන ක්‍රියාකාර සමාගම් වලින් සියළුම පිටතට යැවෙන ජාත්‍යන්තර ඇමතුම් සඳහා මිනිත්තුවකට රුපියල් 3.00 ක් අය කරනු ලබන අතර පසුගිය වර්ෂ තුන තුළ පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු රැස්කිරීම් පහත වගුවේ දැක්වේ.

*වගුව 21: පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු රැස් කිරීම්*

| වර්ෂය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු රැස්කිරීම් (රු. මිලියන ) | 1,592 | 1,125 | 729 | 538 |

### අයක්‍රම

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රකාශනය වන “තොරතුරු සමාජය මැනීම පිළිබඳ වාර්තාව 2018-1 වන වෙළුම” හි දක්වා ඇති සංඛ්‍යාලේඛනවලට අනුව, ශ්‍රී ලංකාව දළ ජාතික ආදායමේ ප්‍රතිශතයක් ලෙස ලොව අඩුම ජංගම දුරකථන මිල ගණන් සහිත රටවල් අතර 12 ස්ථානය උසුලයි. මිල අඩු කිරීමෙන් අඩු ආදායම්ලාභී ජනතාවට පවා දැරිය හැකි මිලක් ලැබෙනු ඇත. අනෙක් අතට, ජංගම දුරකථන ගාස්තු ඉතා අඩු නම්, එය දිගු කාලීනව කර්මාන්තයේ තිරසාරභාවයට තර්ජනයක් විය හැකිය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් 2018 අගෝස්තු මාසයේදී තීරණයක් ගනිමින් පසුගිය වසර 9ක කාලය තුළ පැවති පාදස්ථ මිල පාලනය අහෝසි කිරීමටත් මිල තුලනය කිරීමටත් අවශ්‍ය පියවර ගෙන තිබේ.

ප්‍රකාශිත දත්ත අනුපාතය සඳහා වන අධික ගාස්තුව හඳුනා ගනිමින්, කොමිෂන් සභාව දත්ත අනුපාතය අඩු කිරීමට තීරනයක් නිකුත් කර තිබේ. 2018 ජූලි මස සිට බලපැවැත්වෙන පරිදි මෙගාබයිට් එකකට රු. 1.00 ක්වූ පසුගිය දත්ත අනුපාතය රු. 0.30 දක්වා පහත දමන ලදී.

නියාමන ක්‍රියාවලියේ කොටසක් ලෙස, දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් ඉදිරිපත් කරනු ලබන අයක්‍රම යෝජනා කොමිෂන් සභාව අනුමත කරයි. ඒ අනුව, 2018 වර්ෂය තුළ උත්සව අයක්‍රම 15 ක්, ප්‍රවර්ධන අයක්‍රම අනුමත කිරීම් 36 ක් සහ දිගු කාලීන පදනම් අයක්‍රම 5ක් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අංශය මගින් බලාත්මක කිරීමේ කොටසක් වශයෙන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත උල්ලංඝනය කරමින් සිදුකරන වැරදි වෙනුවෙන් අදාල තැනැත්තන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මුලපුරා ඇත.

## අනුකූලතා අංශය

ස
මා
ලෝ
ච
න
ය

ශ්‍රී ලංකා විදුලි සංදේශ කොමිෂන් සභාවේ එක් ප්‍රධාන අරමුණක් වන්නේ ශ්‍රී ලංකාව තුළ විශ්වාසනීය සහ කාර්යක්ෂම දේශීය සහ ජාත්‍යාන්තර විදුලි සංදේශ සේවාවක් සැපයීමට වගබලා ගැනීමයි. මෙම කාර්යයේදී, විශ්වාසනීය, කාර්යක්ෂම සහ ගුණාත්මක විදුලි සංදේශ සේවාවක් සැපයීම පිණිස විදුලි සංදේශ සේවා ක්‍රියාකරුවන්ගේ සිය නියාමන බැදීම් ආශ්‍රිත පැමිණිලි තහවුරු කිරීම පිණිස අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගත යුතුය. මෙම අවශ්‍යතාවය මුදුන්පත් කර ගැනීමේදී විදුලි සංදේශ කර්මාන්තය අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ උචිත නියාමන ක්‍රියාමාර්ග බලාත්මක කිරීම අවශ්‍ය කෙරේ. පාරිභෝගික කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ පාරිභෝගිකයන් සෑහීමකට පත්වන ආකාරයෙන් ඔවුන්ගේ ගැටළු වලට සාධාරණ විසඳුම් ලබාදීම මෙන්ම ප්‍රජාවගේ අවශ්‍යතාවයන් වලට සරිලන ප්‍රශස්ථ සේවාවක් සැපයීම සහ විදුලි සංදේශ සේවා පද්ධතිය භාවිතා කිරීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ඇතුළු සමස්ථයක් වශයෙන් සියළුම පැතිකඩ වැඩිදියුණු කිරීම සිදු කරනු ලැබේ. මෙම වගකීම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුකූලතා අංශය විසින් සිදු කරනු ලැබේ.

**සේවා තත්වය (QOS) ඒකකය**

**කාර්යයන්**

- බලපත්‍රයේ සඳහන් කර ඇති සේවා තත්ත්ව ප්‍රමිති සහ පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන්ගේ (PSTN) අන්තර් සම්බන්ධිය ගිවිසුම් වලට අනුකූලව කටයුතු කරන්නේද යන්න පිරික්සීම.
- පොදු ස්විචීකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන්ගේ (PSTN) ජාල කාර්ය සාධනය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සකස් කරන ලද සේවා තත්ත්ව පරාමිති ඉලක්කගත අගය සාක්ෂාත් කර ගැනීම පිරික්සීම.
- පොදු ස්විචීකරණ දුරකථන ජාල ක්‍රියාකරුවන් විසින් හඬ සේවා සඳහා මිනුම්ගත සේවා තත්ත්ව පරාමිති අගයන් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විගණනය කල අගයන් අතර සන්නසද්නාත්මක වාර්තාවක් පිළියෙල කිරීම.
- කාර්ය සාධන මිනුම්වල නිරවද්‍යාතාවය වැඩිදියුණු කිරීම සහ දැන ගැනීම පිණිස පොදු ස්විචීකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් අතර සන්සන්දනාත්මක වාර්තාව බෙදා හැරීම.
- කාලානුරූප විගණන සිදු කිරීම මගින් පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් සකස් කළ සේවා තත්ව කාර්යසාධන මිනුම්වල නිරවද්‍යාතාව ඇගයීම සහ විදුලි සංදේශ සේවාවල සේවා තත්වය සඳහා නීති සහ රෙගුලාසි පිළියෙල කිරීම මෙම ඒකකය විසින් සිදු කරනු ලැබේ.

**2018 වර්ෂයේදී සිදු කරන ලද ක්‍රියාකාරකම්/කාර්යයන්:**

- පොදු ස්විචීකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් මගින් ලැබෙන මාසික සේවා තත්ව වාර්තා සැලකිරීම් විශ්ලේෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී සේවා තත්ත්ව පරාමීතින් වැඩිදියුණු කිරීම පිණිස ඔවුන් සමග සාකච්ජා පැවැත්වීම.
- තෙවන කාර්තුව සඳහා අවශ්‍ය සන්සන්දනාත්මක වාර්තා පිළියෙල කිරීම සහ කාර්යසාධන මිනුම්වල නිරවද්‍යාතාවය වැඩිදියුණු කිරීම සහ දැනගැනීම පිණිස පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් අතර වාර්තා බෙදා හැරීම.
- පොදු ස්විචීකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් ජාල කවුළු මගින් ලබා ගන්නා කාර්ය සාධන මිනුම් දත්ත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දෙනු ලබන සමීකරණය ප්‍රකාර ගණනය කිරීම් සිදුකර, සේවා තත්ත්ව පරාමීතින් ආකාරයෙන් වාර්තාව නැවත ලබාදීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දුරකථන ක්‍රියාකාර සමාගම්වල ජාල නිරීක්ෂණය කිරීම සහ ගණනය කිරීමේ ක්‍රමවේදය නැවත ඇගයීම සහ සේවා තත්ත්ව පරාමීතින් ගණනය කිරීම පිණිස ජාල කවුළු මගින් සකස් නොකරන ලද දත්ත ලබා ගැනීම.

**ආවේක්ෂණ ඒකකය**

**කාර්යයන්**

- 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නිකුත් කළ බලපත්‍ර නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව පොදු ස්විචිකරණ දුරකථන ජාල ක්‍රියාකාර සමාගම් කටයුතු කරන බව පිරික්සීම.

- බලපත්‍රලාභී පොදු ස්විචිකරණ දූරකථන ක්‍රියාකාර සමාගම් විසින් අනුමත නොකරන ලද අයක්‍රම පැකේජ ලබාදීම පාලනය කිරීම පිරික්සීම, විශ්ලේෂණය කිරීම සහ නියාමන ක්‍රියාමාර්ග අනුමත කිරීම.
- බලපත්‍රලාභී දූරකථන ක්‍රියාකාර සමාගම් විසින් නීති විරෝධී ලෙස දූරකථන ඇමතුම් අවසන් කිරීම පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සහ අවශ්‍ය යැයි හැගෙන පරිදි සුදුසු නියාමන ක්‍රියාමාර්ග ගැනීම.
- බලපත්‍රලාභී වෙළෙන්දන් විසින් මාදිලි අනුමත නොකරන ලද විදුලි සංදේශ උපකරණ විකිණීම පිළිබඳ විමර්ශන පැවැත්වීම සහ බලපත්‍රයේ නියාමනයන් සහ කොන්දේසි උල්ලංඝනය කිරීම පිළිබඳව අනාවරණය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නිකුත් කළ වෙළඳ බලපත්‍රයක් රහිතව නීති විරෝධී ආකාරයෙන් වෙළෙන්දන් විදුලි සංදේශ උපකරණ විකිණීම පිරික්සීම සහ විමර්ශන පැවැත්වීම මෙන්ම කිසියම් නීති විරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන් අවශ්‍ය යැයි හැගෙන පරිදි සුදුසු නියාමන ක්‍රියාමාර්ග ගැනීම.
- අනුකූලතා ක්‍රියාකාරකම් වලට අදාලව නීති සහ රීති පිළියෙල කිරීම.

**2018 වර්ෂයේදී සිදු කරන ලද ක්‍රියාකාරකම්/කාර්යයන්:**

- බලපත්‍රලාභී දූරකථන ක්‍රියාකාර සමාගම් නීති විරෝධී ආකාරයෙන් ඇමතුම් අවසන් කිරීම පිළිබඳ පැමිණිලි 7 සම්බන්ධයෙන් විමර්ශනය කිරීම.
- වෙළෙන්දන් විසින් මාදිලි අනුමත නොකරන ලද විදුලි සංදේශ උපකරණ විකිණීමේ අවස්ථා 122 පිළිබඳ විමර්ශන සම්පූර්ණ කිරීම.
- දූරකථන ක්‍රියාකාර සමාගම් විසින් අනුමත නොකරන ලද අයක්‍රම පැකේජ් ලබාදීමේ අවස්ථා 13ක් පිළිබඳව විමර්ශන පැවැත්වීම.

**අධිවේගී අන්තර්ජාල සේවා ඒකකය**

**කාර්යයන්**

ගුණාත්මකවූ අධිවේගී අන්තර්ජාල සේවා පිළිබඳ ලක්ෂණ විග්‍රහ කිරීමේදී වේගය පොදු මිනුම් ඒකකයක් වශයෙන් පිලිගෙන ඇත. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නියාමකයා වශයෙන්, ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව සිය ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති අතර, එමගින් පාරිභෝගිකයන් සඳහා ගුණාත්මක අධිවේගී අන්තර්ජාල සේවා සැපයීම තුලින් නිරවද්‍ය තොරතුරු සැපයීමට අපේක්ෂා කෙරේ. නිරවද්‍ය තොරතුරු පිළිබඳව අවධානය යොමු කිරීමේදී එය දෙවර්ගයක් වන අතර , පළමුවැන්න පාරිභෝගික ආරක්ෂණය වන අතර දෙවැන්න වන්නේ එම තොරතුරු සේවා තරඟකාරිත්වය හමුවේ සිය අධිවේගී අන්තර්ජාල සේවා වැඩිදියුණු කර ගැනීමට සැපයුම්කාර සමාගම් දිරිගැන්වීමයි.
මෙම සන්දර්භය තුළ , ශ්‍රී .ල.වි.ස.නි.කො.සභාව වෙනුවෙන් , මොරටුව විශ්ව විද්‍යාලය භාගත කිරීමේ වේගය ප්‍රකාරව අධිවේගී අන්තර්ජාල සේවා ඇගයීම සිදු කිරීමට හැකි වන පරිදි මෙවලමක් සැලසුම් කර ඇත. මෙම මෙවලම සංරචකයන් දෙකකින් සමන්විත වේ.

1. පාරිභෝගිකයින් විසින් ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ වෙබ් අඩවිය ඔස්සේ වේගය මැනීම බාගත කිරීම (*the On-line Speed Test – MySpeed*)

2. ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව විසින් භාවිතා කරන අධිවේගී අන්තර්ජාල සේවා වේග පිරික්සීම බාගත කිරීම (*ISP's Internet Speed Test – NetSpeed*)

ඉහත භාවිතාවන් සහ අවශ්‍යතාවයන්ට පහසුකම් සැලසීම පිණිස වෙන් වෙන්වූ වෙබ් පාදක යෙදුම් දෙකක් ක්‍රියාත්මක කෙරේ. ReST (Representational State Transfer) service on Node.js , a server-side platform built on Google Chrome's JavaScript Engine (V8 Engine). ජාල යෙදුම් නිසි ලෙස පවත්වාගෙනයාමේ පහසුකම් සැලසීමෙහිලා Node.js පහත ලක්ෂණ වලින් සමන්විත වේ.

- Asynchronous and event- driven
- Rich library of various JavaScript modules
- Very fast in code execution
- Single Threaded but Highly Scalable

මෙම සේවා දායකය භාවිතා කිරීම සඳහා HTML 5 enabled web browser අවශ්‍ය වේ. අන්තර්ජාල සම්බන්ධතාවයේ වේගය මැනීමේ වෙබ් යෙදුම් සඳහා සිංගප්පූරුවේ ස්ථාපනය කරන ලද ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව සතු වෙබ් සර්වරයෙන් පහසුකම් සපයනු ලැබේ. දත්ත සමුදාය සම්බන්ධ සර්වරය සඳහාද එම සර්වරය මගින් පහසුකම් සැපයේ. විවිධ ප්‍රමාණවල බාගත කළ හැකි පොදු නමක් යටතේ ගොනුවූ දත්ත සිංගප්පූරුවේ සත්කාරක සර්වරය, ඇමරිකා එක්සත් ජනපදයේ සහ නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු වෙබ් සර්වර් යනාදී වශයෙන් විවිධ ස්ථාන තුනක පවතී.

"MySpeed" යෙදුම් ක්‍රමලේඛයේ ප්‍රධාන අරමුණ වන්නේ අන්තර්ජාල සේවා පරිභරණය කරන්නන්ට සිය සම්බන්ධතාවයේ වේගය මැනීම පිණිස අවස්ථාව සලසා දීමයි. පරිභරණය කරන්නන්ට සිය කැමැත්ත අනුව පොදු නමක් යටතේ ගොනුවූ දත්ත බාගත කර ගත හැකිය. සිය අන්තර්ජාල පුළුල් කළාප වේගය මැනීමට අවශ්‍ය අවසාන පරිභරණය කරන්නාට ශ්‍රී. ල.වි.ස.නි.කො.සභාවේ නිල වෙබ් අඩවියේ ([www.trc.gov.lk](http://www.trc.gov.lk)) දැක්වෙන වේග පරීක්ෂණ කේතය ක්ලික් කර කිසියම් web browser මගින් හෝ වේග පරීක්ෂණ භාවිතය URL ([http://speedtest.trc.gov.lk](http://speedtest.trc.gov.lk)) සෘජුවම ප්‍රවේශවීමෙන් මෙම යෙදුම් ක්‍රමලේඛය භාවිතා කළ හැකිය.




*රූපසටහන 21: ස්වයං වේග පරීක්ෂණ වාර්තාව*

“Net Speed” සියළුම අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් (ISP) විසින් සපයන අන්තර්ජාල සම්බන්ධතාවල වේගය මැනීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. මෙම යෙදුම් ක්‍රමලේඛය ක්‍රමානුකූල කාල අන්තරයකදී ස්වයංක්‍රීයව පවත්වාගෙන යාමට අවශ්‍ය නිසා අවම මිනිස් අන්තර් ක්‍රියාකාරිත්වයකින් යුතුව පවත්වාගෙන යාම පිණිස සැලසුම් කෙරේ. මෙම යෙදුම් ක්‍රමලේඛයේ මූලික නිර්මිතය “MySpeed” යෙදුම් ක්‍රමලේඛයට සමාන වන අතර යෙදුම් ක්‍රමලේඛය හා දත්ත සමුදාය උදෙසා පහසුකම් සැලසීමේදී සමාන ක්‍රම භාවිතා කරයි. කෙසේවුවද, Net Speed ක්‍රමලේඛක අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් ලබාදෙන විශේෂ පරිගණක / ලැප්ටොප් මගින් පවත්වාගෙන යනු ලැබේ. මෙම යෙදුම් ක්‍රමලේඛය පූර්ව නිශ්චිත පිහිටීමක සිට පූර්ව නිශ්චිත ගොනුවක් බාගත කිරීමෙන් browser එකක් මගින් පවත්වාගෙන යාමට නිර්මාණය කරනු ලැබේ. මෙම browser ක්‍රමානුකූල අන්තරයකදී යෙදුම් ක්‍රමලේඛය පවත්වාගෙන යාමට සකස් කරනු ලැබේ. URL, සත්කාරක සර්වරයේ අන්තර්ජාල මූලලේඛ ලිපිනය හා පූර්ව නිශ්චිත මෘදුකාංග පරිගණකගත කිරීම යන දෙකම අන්තර්ගතවේ. එම මෙහෙයුම් කාලය තුළදී, බාගත කරන ගොනුව ආශ්‍රිත සංඛ්‍යා ලේඛන හා අන්තර්ජාල වේගය දත්ත සමුදායේ තැන්පත් වේ. පරීක්ෂණ ප්‍රතිඵල දෛනිකව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ (www.trc.gov.lk) දැක්වේ.




*රූපසටහන 22: ජාල වේගී පරීක්ෂණ ප්‍රතිඵල (ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ස්ථාපිත)*




*රූපසටහන 23: ජාල වේගී පරීක්ෂණ ප්‍රතිඵල (ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පිටත ස්ථාපිත)*

## පාරිභෝගික සම්බන්ධතා සහ මහජනතාව දැනුවත්කිරීම

සමාලෝචනය

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (1996 පනතින් සංශෝධිත) පනත ප්‍රකාරව, විදුලි සංදේශ සේවා ග්‍රාහකයකු හෝ මහජන සාමාජිකයෙකු දුරකථන ක්‍රියාකාර සමාගමක් සපයන විදුලි සංදේශ සේවා සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කලවිටෙකදී කොමිෂන් සභාවට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට බලය පවරා ඇත. යම් විමර්ශනයක් පැවැත්වීමේදී ඒ පැමිණිල්ලට හේතුවූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍යයයි කොමිෂන් සභාවට පෙනී යන පියවර ගන්නා ලෙස කොමිෂන් සභාව විසින් ඒ ක්‍රියාකරුට විධාන කළ හැකි අතර උචිත අවස්ථා වලදී මුදල් සහන සලසන ලෙසද විධාන කළ හැකිය.

**අංශයේ කාර්යයන්**

- **පාරිභෝගික පැමිණිලි සම්බන්ධ ලිපිගොනු පවත්වාගෙන යාම**

  විදුලි සංදේශ සේවා ආශ්‍රිතව කොමිෂන් සභාව වෙත ලැබෙන පාරිභෝගික පැමිණිලි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාල සේවා සැපයුම්කරුවන් වෙත ඉදිරිපත් කරනු ලැබේ. පාරිභෝගික සම්බන්ධතා ඒකකය විසින් පැමිණිලිකරු සඳහා සාධාරණවූත් යුක්තිසහගතවූත් විසඳුම් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

  සේවා සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන විසඳුම පිළිබඳව පැමිණිලිකරු සෑහීමකට පත් නොවන්නේ නම් එවැනි අවස්ථාවකදී අවශ්‍යයැයි හැගෙන පරිදි ගැටළුව සමථයකට පත්කිරීම සඳහා ගැටළුව සාකච්ඡා කිරීම පිණිස නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාරිභෝගික සම්බන්ධතා සහ මහජනතාව දැනුවත් කිරීම) පාර්ශවයන් දෙකම සමන්විත රැස්වීමක් පවත්වනු ලැබේ.ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මෙම ගැටළුව සම්බන්ධයෙන් සමථයකට පත්විය හැකි විසඳුමක් ලබාගැනීමට පාර්ශවයන් දෙකටම අවස්ථාව සලසයි.

- **අස්ථානගතවූ ජංගම දුරකථන පිළිබඳ ඉල්ලීම් මෙහෙයවීම**

  ඉහත සේවාවන්ට අමතරව, සමාජීය වගකීම්වල කොටසක් වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අස්ථානගතවූ ජංගම දුරකථන සොයා දීම ක්‍රියාවලියේ ක්‍රියාකාරීව නිරතවේ. අස්ථානගතවූ ජංගම දුරකථන පිළිබඳ පැමිණිලි 300 සංඛ්‍යාවක් දෛනිකව අප වෙත ලැබේ.පසුගිය වර්ෂ කිහිපය තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අස්ථානගතවූ ජංගම දුරකථන සොයාගැනීම සඳහා පොලිසියේ සහය ලබාගෙන ඇත.

- **දැනුවත් කිරීමේ වැඩසටහන්**

  පාරිභෝගික පැමිණිලි විශ්ලේෂණය කිරීමේදී, දුරකථන භාවිතය මෙන්ම වෙනත් අදාල කරුණු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැදගත්කම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අවබෝධ කරගෙන ඇත. එබැවින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් වශයෙන් සංවිධානය කිරීමෙන් සමාජයට ඵලදායි සේවාවක් සපයන බව අවබෝධ කරගෙන ඇත. විදුලි සංදේශ සේවා නිසි පරිදි භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව මහජනතාව දැනුවත් කළ යුතු බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දැඩි ලෙස විශ්වාස කරන අතර එය නියාමකයෙකුගේ සමාජීය වගකීමක් ලෙස සැලකේ.

  1. පොලිස් නිලධාරින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන

     සම්පත් දායකයකු වශයෙන් අප කටාන ජාතික පොලිස් ඇකඩමිය,කළුතර පොලිස් පුහුණු විද්‍යාලය, මිරිහාන පොලිස් ස්ථානය, කොළඹ විශේෂ කාර්ය බලකාය සහ ශ්‍රී ලංකා යුධ හමුදාව යන ස්ථානවල දේශන පවත්වන ලදී.

  2. ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන

     අපගේ අත්දැකීම් වලට අනුව මහජනතාවට සන්නිවේදනය සහ මාධ්‍ය සදාචාර සම්පන්නව භාවිතා කිරීම පිළිබඳව නිසි දැනුවත්භාවයක් තිබීම අවශ්‍ය වේ.එබැවින් පාරිභෝගික පැමිණිලි සහ මහජනතාව දැනුවත් කිරීමේ ඒකකය විසින් රටේ පරිපාලන ඒකකයේ පහල නිලධාරී මට්ටම ලෙස පිළිගැනෙන ග්‍රාම නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ආරම්භ කර ඇත. මෙම වැඩසටහන අනුව ප්‍රජාව සමඟ සෘජු සම්බන්ධතා පවත්වන ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා දැනුවත්

කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවත්වන ලදී.වැඩමුළුවේදී ගත් වැදගත් තීරණ ප්‍රකාශ කරන ලද අතර පසු විපරම් කරුණු ප්‍රාදේශීය ලේකම් මගින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

වැඩිදුරටත් මෙහිදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 40ක් ආවරණය කිරීමට හැකි වී ඇත.

3. රූපවාහිනී/ගුවන් විදුලි වැඩසටහන්:

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නීති රාමුව තුළ ප්‍රධාන තොරතුරු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සඳහා රූපවාහිනී වැඩසටහන් රැසක් පවත්වා ඇත.

4. පොස්ටර්, අත් පත්‍රිකා, ස්ටිකර්ස්

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සන්නිවේදනය යහපත් ආකාරයෙන් භාවිතා කිරීම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම උදෙසා පොස්ටර් සහ අත්පත්‍රිකා හා ස්ටිකර් ව්‍යාපාරයක් පවත්වා ඇත. පෝස්ටර් සියළුම දුම්රිය ස්ථාන, පොලිස් ස්ථාන, පාසල්වල බෙදාහරින ලද අතර ස්ටිකර්ස් ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ලබා දෙන ලදී.

- පාරිභෝගික ආරක්ෂණය

පාරිභෝගික හිතකර පරිසරයක් පවත්වාගෙනයාම පිණිස පාරිභෝගික සම්බන්ධතා ඒකකය විසින් පාරිභෝගික ආරක්ෂණය මෙහෙයවනු ලැබේ.

වර්ෂයේ ප්‍රගතිය

*වගුව 22: පාරිභෝගික සම්බන්ධතා ප්‍රගතිය*

| අංකය | අරමුණ | ක්‍රියාකාරකම | | විස්තර | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 1 | සමාජීය සහ වාණිජමය ප්‍රතිලාභ සඳහා විදුලි සංදේශ පහසුකම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම | 1.1 | දැනුවත්කිරීමේ වැඩසටහන | ග්‍රාමනිලධාරීන් / රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 90% |
| | | | | පොලිස් නිලධාරීන් - පුහුණු විද්‍යාලය | |
| | | 1.2 | රූපවාහිනී/ගුවන්විදුලි වැඩසටහන | ප්‍රසිද්ධ කරන ලදී | |
| | | 1.3 | පෝස්ටර්/ අත්පත්‍රිකා / ස්ටිකර්ස් | ප්‍රසිද්ධ කරන ලදී | |
| 2 | පාරිභෝගික ආරක්ෂණය සහතික කිරීම | 2.1 | පවතින පාරිභෝගික ගැටළු සහ පාරිභෝගික ආරක්ෂණ නිර්නායකයන් අධ්‍යයනය කිරීම | ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම | 95% |
| 3 | පාරිභෝගික පැමිණිලි නිරාකරණය සහතික කිරීම | 3.1 | සුබවාදී එකඟතාවයකට පැමිණීමට පාරිභෝගිකයින්ට පහසුකම් සැලසීම | ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම | 90% |

# විශේෂ ව්‍යාපෘති අංශය

සමාලෝචනය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයතනික සැලැස්ම ප්‍රකාරව විශේෂ ව්‍යාපෘති අංශය ජාතික යහපතට මං සැලසෙන ව්‍යාපෘති මෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහිලා වගකියනු ලැබේ.

අවශ්‍ය යටිතල පහසුකම් සපයමින් විදුලි සංදේශ කර්මාන්තය වැඩි දියුණු කිරීම, ගොඩනැගිලි යනාදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ශ්‍රී ලංකා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නව තාක්ෂණයක් හදුන්වාදීමට ඉවහල්වන පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම සහ පරිහරණය කරන්නන්ගේ අත්දැකීම් ප්‍රවර්ධන කිරීම මෙන්ම විශේෂ ව්‍යාපෘති අංශයේ විෂය පථය යටතට ගැනෙන විශේෂ ව්‍යාපෘති ඉලක්කගත විෂය ක්ෂේත්‍ර ක්‍රියාත්මක කිරීම මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

### 1.1 කාර්යයන්

2018 වර්ෂයේ දී විශේෂ ව්‍යාපෘති අංශය කොළඹ නෙළුම් කුලුන, අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව ප්‍රකාරව විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය (හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය) 3 වන මහල දක්වා නිම කිරීම, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන ගොඩනැගිල්ලට දිගුවක් වශයෙන් නව ගොඩනැගිල්ල ඉදිකිරීම, කදිරාන පුනරුත්ථාපන නවීකරණ හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සහ නෙළුම් කුලුන ව්‍යාපෘතියේ 02 වන අදියරේ කාර්යයන් අඛණ්ඩව සිදු කරන ලදී.

#### 1.1.1 කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය

නගරය කේන්ද්‍රගතව පිහිටි විකාශන කුලුනු ලෝකයේ සියළුම සංවර්ධිත නගරවල දක්නට ලැබෙන පොදු ලක්ෂණයකි. රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන වැඩසටහන් ඉදිරිපත් කිරීමට සහයවීම සහ විදුලි සංදේශ ජාල සඳහා කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම එවැනි ජාලවල ප්‍රධාන අරමුණ වේ.

එක් දිශාවක සිට,තනි ඇන්ටනාවක් භාවිතා කර, විකාශන සංඥා නිසි ලෙස භාර ගැනීම මහජනතාවට සැලසෙන ප්‍රධාන ප්‍රතිලාභයක් වන අතර, එවැනි සංවර්ධනය කිරීම් මගින් යටිතල පහසුකම් හුවමාරු කර ගැනීමට ඉඩ සැලසෙන බැවින් ප්‍රාග්ධනය සහ මෙහෙයුම් වියදම් අඩුවීම විකාශන සමාගම් වලට ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභ අතර වේ.

නගරය කේන්ද්‍රගතව ස්ථාපිත විකාශන කුලුනු මගින් නගරයේ ක්ෂිතිජයට අලංකාර පෙනුමක් ලැබෙන අතර, කොළඹ නගරයේ පවත්වන ගැටළුවක් වන, අහස උසට නැගුනු විකාශන කුලුණු අවම වීමෙන් නගරයේ අහස් ක්ෂිතිජයේ දර්ශනීය බව වැඩිදුරටත් වැඩිදියුණු වීමට ඉවහල් වේ.

සංකේතයක් බවට පත්වී ඇති නගරය කේන්ද්‍රගත විකාශන කුලුනු නගර මධ්‍යයේ ස්ථාපනය කරනු ලබන අතර ඉඩම් වටිනාකම ඇතුලු සංවර්ධන පිරිවැය බොහෝ දුරට ඉහල අගයක් ගනී. එබැවින් ආයෝජන තහවුරුකර අවශ්‍ය ආදායම නිසැක කර ගෙන කුලුනු සංකීර්ණයේ භාවිතය වැඩිදියුණු කිරීම සහ කුලුනු සංකිර්ණයේ මෙහෙයුම් පවත්වාගෙන යාම පිණිස ඉහල උන්නතාංශ නැරඹුම් මැදිරි, ආපන ශාලා, සාප්පු සංකීර්ණ වැනි ආකර්ශනීය ස්ථාන රැසක් එකතු කරනු ලැබේ.

**කොළඹ නෙළුම් කුලුනේ ප්‍රධාන ආකර්ශනීය ස්ථාන**

- කොළඹ නගරය සහ ඊට තදාසන්න ප්‍රදේශවල අවම දර්ශනය අත්විදිය හැකි පරිදි නරඹන්නන් සඳහා ඉහල උන්නතාංශයකින් යුතු නැරඹුම් මැදිරි
- උත්සව ශාලා දෙකක් -විවාහ මංගල උත්සව, සමාජ සහ ආයතනික කටයුතු
- විශේෂ අමුත්තන් සඳහා නවාතැන් පහසුකම් සැපයීම, භෝජනශාලා මෙහෙයුම් වලට සහාය කර ගැනීම පිණිස රජයේ තානායම
- විශාල සාප්පු සංකීර්ණ සහ ආහාර භෝජනාගාර
- කැරකෙන අවන්හල්
- කොළඹ නගරය සහ තදාසන්න ප්‍රදේශවල විකාශන පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීම, එෆ්.එම් නාලිකා 50, ඩිජිටල් වීඩියෝ විකාශන සේවා 50 සේවා සැපයිය හැකි විකාශන කුලුනු.
- මහජනතාවට විවේකය ගතකළ හැකි පරිදි විශාල උද්‍යානයක්.

### කොන්ත්‍රාත්තුව පිළිබඳ සාරාංශය

*වගුව 23: කොන්ත්‍රාත්තු සාරාංශය*

| සේවා දායකයා (ආයෝජක) | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව |
|---|---|
| කොන්ත්‍රාත්කරු | CEIEC සහ ALIT |
| කොන්ත්‍රාත් වර්ගය | සැලැස්ම සහ ගොඩනැගිල්ල |
| ව්‍යාපෘති ඉංජිනේරු | මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒ |
| කොන්ත්‍රාත් මුදල | ඇමරිකානු ඩොලර් මිලියන 104.3 |
| ආරම්භ කරන ලද දිනය | 2012 නොවැම්බර් 16 |
| කොන්ත්‍රාත් ව්‍යාපෘතිය අවසන් කරන දිනය | 2017 ඔක්තෝම්බර් 31 (දින 912 මුල් ඉදිකිරීමේ කාලය + ශ්‍රී.වි.සං.නි.කො.ස. ප්‍රදානය කරන ලද දීර්ඝ කිරීමේ කාලය) |
| ප්‍රධාන කොන්ත්‍රාත්කරු සහ ව්‍යාපෘති ඉංජිනේරු විසින් ව්‍යාපෘතිය අවසන් කර භාරදීමට අපේක්ෂිත තාවකාලික දිනය | 2018 දෙසැම්බර් 31 |

## 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

*වගුව 24: නෙළුම් කුලුන ව්‍යාපෘතියේ ප්‍රගතිය*

| විස්තරය | සම්පූර්ණ කරන ලද ප්‍රමාණය % |
|---|---|
| ඇන්ටනා ආධාරකය | 100% |
| ආධාරක පාදම පිරිසිදු කිරීම සහ පින්තාරු කිරීම | 95% |
| කුලුනු ශිර්ෂය සවි කිරීම | 99% |
| කුලුනු බඳ පින්තාරු කිරීම | 99% |
| අභ්‍යන්තර අලංකරණය | 85% |
| කුලුනු ශිර්ෂයට විදුලිය සැපයීම | 85% |
| කැලුනු ශිර්ෂයට(ගිනි,ජලය) | 70% |
| කුලුනු ශිර්ෂයට ජලය සැපයීම සහ ජලපවාහනය | 70% |
| කුලුනු පාදම විදුලිය සැපයීම | 95% |
| කුලුනු පාදම විදුලිය සැපයීම හා ජලපවාහනය | 90% |
| බාහිර විදුලි සැපයීම | 85% |
| කුලුනු පාදම ඉහල | 95% |
| කුලුනු ශිර්ෂය,පාදම සහ බඳ ආලෝක කරණය | 98% |
| විදුලි සෝපාන සහ විදුලි පියගැටපෙල | 80% |
| ගොඩනැගිලි කළමණාකරන තොරතුරු පද්ධතිය | 40% |

**සැලසුම් කරන ලද ප්‍රගතියට සාපේක්ෂ තථ්‍ය ප්‍රගතිය සහ නිම කිරීමේ ඉලක්කගත දිනය රහිතව අඛණ්ඩව පවත්වාගෙනයාම**

*ප්‍රස්ථාරය 09: සැලසුම් කරන ලද ප්‍රගතියට සාපේක්ෂව තථ්‍ය ප්‍රගතිය (භෞතික)*




**සිවිල් වැඩ**



*රූපසටහන 24 : නෙළුම් කුලුන - සිවිල් වැඩ*

### කුලුනු ගෘහය



*රූපසටහන 25: නෙළුම් කුලුන - කුලුනු ගෘහය*

### වානේ ව්‍යුහය



*රූපසටහන 26: නෙළුම් කුලුන - වානේ ව්‍යුහය*

### කුලුනු පාදම



*රූපසටහන 27: නෙළුම් කුලුන - කුලුනු පාදම*

## ඇන්ටනා ආධාරකය



*රූපසටහන 28: නෙළුම් කුලුන - ඇන්ටනා ආධාරකය*

## බිත්ති ආවරණ



*රූපසටහන 29: නෙළුම් කුලුන - බිත්ති ආවරණ*

## අභ්‍යන්තර අලංකරණය



*රූපසටහන 30: නෙළුම් කුලුන - අභ්‍යන්තර අලංකරණය*

## මුළුතැන්ගෙය



*රූපසටහන 31: නෙළුම් කුලුන - මුළුතැන්ගෙය*

## යාන්ත්‍රික, විදුලි ජලනල වැඩ



*රූපසටහන 32: නෙළුම් කුලුන - යාන්ත්‍රික සහ විදුලි ජලනල වැඩ*

### 1.1.2 හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානය

අමාත්‍ය මණ්ඩලය විසින් 2012.06.14 දිනැති අංක 12/0836/501/019 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව පදනම් කරගෙන 2012 ජුලි 04 දින පවත්වන ලද අමාත්‍යාය මණ්ඩල රැස්වීමේදී එළැඹී තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය (හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය) ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව KPMG විගණන ආයතනය විසින් සකස් කරන ලද අතර තිරසාර පදනම මත වාණිජමය වශයෙන් ලාභ ලැබිය හැකි ව්‍යාපෘතියක් බවට පත් කිරීමෙහිලා වාණිජමය හවුල්කරුවන් සහ බදුකරුවන් සොයා ගැනීමේ වගකීම සහිතව අනුග්‍රාහකත්ව නියෝජිතායතනය වූයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRPC) ව්‍යාපෘති ඉංජිනේරු වශයෙන් පත්කරන ලද අතර අනුමත ටෙන්ඩර් පටිපාටිය මත, සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම වෙත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2014 ජුලි 11 දින සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම වෙත වැඩබිම බාර දෙන ලද අතර ඉදිකිරීමේ වැඩ 2016 අගෝස්තු 11 දින ආරම්භ කරන ලදී.කොන්ත්‍රාත්තු කාලය දින 730 කි.

සැලසුම්කර ඇති පරිදි, 2015 ජුනි වන විට ගොඩනැගිල්ලේ තෙවන මහල දක්වා සැලකිය යුතු පමණකින් ගොඩනැගිලි ව්‍යුහය සම්පූර්ණ කරන ලදී. නමුත් මෙම ප්‍රදේශයේ වෙනත් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කල ආකාරයට ආරම්භවී නොතිබූ අතර, එය තොරතුරු තාක්ෂණ උද්‍යානයෙන් අපේක්ෂිත විවිධ ආදායම් උත්පාදන හැකියාවන් කෙරෙහි අහිතකර අන්දමට බලපානු ඇති බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ආයෝජන මණ්ඩලය හා ජනාධිපති ලේකම් කාර්යාලය නිරීක්ෂණය කරන ලදී.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මෙකී ව්‍යාපෘතිය ආශ්‍රිත කරුණු පරික්ෂා කරන ලද අතර එම ගොඩනැගිල්ලේ තෙවන මහල දක්වා ඉදිකිරීම් අවසන් කිරීමට තීරණය කෙරිණි.

මෙම ව්‍යාපෘතියේ ඉංජිනේරු උපදේශක වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව(SLLRDC) ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ කටයුතුවල තිරන වන අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ සීමාසහිත තුඩාවේ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම අතර එලැබුණු කොන්ත්‍රාත්තුව අවසන් විය. එබැවින් ව්‍යාපෘති ඉංජිනේරු වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශය ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සීමාසහිත තුඩාවේ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම සමගවූ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හැර වෙනත් විකල්පයක් නොතිබිණි.

**2018 දෙසැම්බර් 31 දින වන විට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතියේ තත්වය**

කොන්ත්‍රාත්කරු 2016 සැප්තැම්බර් 26 දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත වැඩබිම භාරදී ඇති අතර, එතැන් සිට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ආරක්ෂක කටයුතු සහ විදුලිය සඳහා මාසිකව රු.300,000/- දළ පිරිවැයක් දරමින් මෙම වැඩබිම නඩත්තු කරනු ලබයි.

ආර්ථික කළමණාකරනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව විසින් දෙන ලද නියෝගය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, රාජ්‍ය හා පෞද්ගලික හවුල් පදනම මත මෙම ව්‍යාපෘතිය දියුණු කරමින් ඉදිරියට පවත්වාගෙනයාමේ හැකියාව මේ වන විට සලකා බලමින් පවතී.
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් පුවත්පත් දැන්වීමක් මගින් මේ පිළිබඳව උනන්දුවක් දක්වන සමාගම් වලින් දැනටමත් යෝජනා කැඳවනු ලැබීය.

### 1.1.3 කොළඹ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පුළුල් කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කළමනාකාරිත්වය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය සඳහා පස්මහල් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට තීරණය කර ඇත. මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකය ඉහත ව්‍යාපෘතිය සඳහා උපදේශකයෙකු වශයෙන් පත්කරන ලදී. ව්‍යාපෘති උපදේශන ඒකකය සෙසු ගොඩනැගිලි දෙකට යාවන පාලම් සහිතව පවතින ප්‍රධාන ගොඩනැගිල්ලට ඇමුණුමක් වශයෙන් වානේ ව්‍යුහය සහිත ගොඩනැගිල්ල සැලසුම් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් සමස්ථ ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 502 අරමුදලක් අනුමත කර ඇත. විස්තරාත්මක ප්‍රමාණාත්මක බිල්පත ප්‍රකාරව ඇස්තමේන්තුව, මුළු ඉදිකිරීමේ ඇස්තමේන්තු පිරිවැයේ 5% උපදේශන ගාස්තුව ඇතුලත්ව, ශ්‍රී ලංකා රුපියල් මිලියන 344 කි.

නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ පරමාර්ථ අරමුණ සහ ප්‍රතිලාභ මෙම සංවර්ධන ව්‍යාපෘතියේ අපේක්ෂිත පරමාර්ථ සහ අරමුණු පහත දැක්වේ.

I. නියාමන සේවා ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත දිනපතා පැමිණෙන පොදු මහජනතාව, ක්‍රියාකාර සහ විකාශන සමාගම් සඳහා වඩා ප්‍රශස්ත සහ කාර්යක්ෂම සේවා පහසුකම් සැපයීම.
II. ඵලදායිත්වය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා යටිතල පහසුකම් අවශ්‍යතාවයන් සැපයීම.
III. කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ පිරිවැය ඉතිරි කිරීමේ අරමුණ ඇතිව පරිශ්‍රය තුල රැස්වීම් සහ සම්මන්ත්‍රණ සඳහා පහසුකම් ප්‍රවර්ධනය කිරීම.

**මෙම සංවර්ධන ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිලාභ පහත දැක්වේ;**

අ) මහජනතාව සඳහා වඩා ප්‍රශස්ථ සේවාවක් සැපයීම පිණිස අංශ ඵලදායි ලෙස ප්‍රතිසංවිධානය කිරීම.

ආ) මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු යනාදිය සඳහා වඩා උචිත ස්ථානයක් සැපයීම.

ඇ) ජාතික යහපත සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු ඉඩම් දේපල නිසි ලෙස පරිහරණය කිරීම.

**ව්‍යාපෘතියේ ප්‍රගතිය**

- සංවර්ධනය කිරීමේ බලපත්‍ර/ය ලබාගැනීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී
- විස්තරාත්මක සැලැස්ම සහ ලංසුකරණ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් නිම කරන ලදී.

### 1.1.4. කදිරාන ප්‍රතිසංස්කරණය සහ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය

කලාපීය මට්ටමින් UHF/VHF ගුවන් විදුලි සංඛ්‍යාත විශ්ලේෂණ අවශ්‍යතාවයන් මෙන්ම ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් HF (අධි සංඛ්‍යාත) පිරික්සීමට සහ දිශා නිර්ණය කිරීම සපුරාලීම පිණිස කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය පිරික්සුම් සහ දිශා - නිර්ණය කිරීමේ උපකරණ සහ පද්ධති වලින් සමන්විත වී ඇත. මෙම මධ්‍යස්ථානය අධිසංඛ්‍යාත පිරික්සීම සහ දිශාව නිර්ණය කිරීම සඳහා ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලියාපදිංචි ඇත.

ලෝක බැංකු අරමුදල් ව්‍යාපෘතියක් යටතේ Rohde සහ Schwarz විසින් සපයන ලද උපකරණ සහ පද්ධති ක්‍රියාත්මක කරමින්, 2000 දශකයට පෙර කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය ඉහල ප්‍රමිතියකින් යුතු පිරික්සුම් මධ්‍යස්ථානයක් බවට වැඩි දියුණු කරන ලදී.ස්වාධීන අංග සම්පූර්ණ ප්‍රාදේශීය පිරික්සුම් මධ්‍යස්ථානයක් වශයෙන් කදිරාන පිරික්සුම් මධ්‍යස්ථානයේ නිල කාර්යයන් සිදු කිරීම පිණිස එක් ඉංජිනේරුවරයකු සහ විදුලි සංදේශ නිලධාරින් දෙදෙනෙකුගෙන් සමන්විත පරිපාලන කාර්ය මණ්ඩලයක් සේවය කරන අතර, ජංගම සංඛ්‍යාත පිරික්සුම් ආවේක්ෂණ රථයක් (MFMSV) සහ ඩබල් කැබ් රථයකින් සමන්විතය. ප්‍රධාන කාර්යාලයේ හදිසි කාර්ය මණ්ඩල අවශ්‍යතාවයන් නිසා මීට වසර කිහිපයකට පෙර ප්‍රධාන කාර්යාලයේ බලධාරීන්ට මෙම මධ්‍යස්ථානය ඵලදායී ලෙස මෙහෙයවන ලද කාර්යමණ්ඩලය සහ වෙන් කරන ලද වාහන නැවත ගෙන්වා ගැනීමට සිදු විය.

ලෝක බැංකුව අරමුදල් සපයන ව්‍යාපෘති යටතේ 2000 දශකය ආරම්භයේදී ලබාගත් භෞතිකමය සහ පිරික්සුම් උපකරණ පසුගිය දශකය පුරා ක්‍රමිකව යල් පැන ගිය තත්ත්වයට පත් විය. මහජනතාව විසින් පිරික්සුම් මධ්‍යස්ථානය පිහිටි ඉඩම අනවසරයෙන් අල්ලා ගන්නා ලද අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කළමනාකාරීත්වය විසින් ඉතිරි ඉඩම් කැබැල්ල (අක්කර 53 ක් පමණ) සඳහා පිරික්සුම් මධ්‍යස්ථාන මායිම් සීමාකිරීමට තීරණය කරන ලදී. ඉතිරි ඉඩම් කැබැල්ල ආරක්ෂා කිරීම පිණිස ඉඩමෙන් ගලන ඇළ මාර්ගය ඔස්සේ වෙන් වූ ස්ථාන දෙක සම්පූර්ණ කිරීමෙන් තොරව ආරක්ෂක තාප්පයක් ඉදි කරන ලදී. මෙම ආරක්ෂක තාප්පයේ කොටසක් කඩා වැටීමට ආසන්න අතර වැසි ජලය ගලා යාම සඳහා ඉඩකඩ සැලසීම පිණිස ගම්වාසීන් විසින් එම තාප්පයේ ස්ථාන කිහිපයකට හානි කර ඇත.

ලෝක බැංකු අරමුදල් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද අධි සංඛ්‍යාත දිශා නිර්ණය කිරීමේ (HFDF) පද්ධතිය හැර සෙසු උපකරණ පරිභෝජනය කළ හැකි කාලය, නව තාක්ෂණයට අනුකූලවීම, නවීන පිරික්සුම් විශේෂාංග පහසුකම් ලබා ගැනීමට නොහැකිවීම නොසලකා හරිමින් තවමත් භාවිතයේ පවතී. එමෙන්ම එහි දේශීය සහ ජාත්‍යන්තර වැදගත්කම නිසා ප්‍රමුඛතාවය දිය යුතු කරුණක් ලෙස සලකා 2015 වසරේදී අධි සංඛයාත දිශා නිර්ණය කිරීමේ පද්ධතිය ප්‍රතිස්ථාපනය කරන ලදී.

පසුගිය දශකය පුරා නොසලකා හැර තිබූ ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත පහසුකම් නවීකරණය සහ ප්‍රතිසංස්කරණය කිරීම කළ යුතුව ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ප්‍රධාන භූගෝලීය විෂය ක්ෂේත්‍ර වලට ඉවහල් කර ගැනීම පිණිස මෙහෙයුම් පහසුකම් ව්‍යාප්ත කිරීම සඳහා දීප ව්‍යාප්ත පදනමක් මත ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත. කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානය ප්‍රදේශීය කාර්යාලයක් ද වනු ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, කදිරාන පිරික්සුම් මධ්‍යස්ථානය නවීකරණය සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලංසු ලියකියවිලි, ඉංජිනේරු ඇස්තමේන්තුව, සැලසුම් සහ නිර්මාණ ඉදිරිපත් කරන ලෙස මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන ඒකකයෙන් ඉල්ලා සිට ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තාක්ෂණික, පරිපාලන සහ සහායක කාර්ය මණ්ඩලයක් සහිතව කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථාන පරිශ්‍රයේ ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කෙරේ. එබැවින්, කාර්ය මණ්ඩලයේ නවාතැන් පහසුකම් සැලකිල්ලට ගෙන ස්ථිර ප්‍රාදේශීය කාර්යාලයක් සඳහා අවශ්‍ය සුදුසු පහසුකම් සැපයීමට යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම අවශ්‍ය කෙරේ. කදිරාන සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථානයේ සැලකිය යුතු කොටසක් විවිධ පුද්ගලයන් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන ඇති බැවින් වැඩි දුරටත් ඉඩම බලෙන් අල්ලා ගැනීමෙන් මුදා ගැනීම පිණිස ඵලදායී පියවර ගැනීම වැදගත්ය. එමෙන්ම ශක්තිමත් ආරක්ෂක තාප්පයක් සම්පූර්ණ කිරීම සහ ආරක්ෂක මුර පොලක් ස්ථාපනය කිරීම අවශ්‍යය.

මෙම සන්දර්භය තුළ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනාගත ඉලක්ක සපුරා ගැනීම සඳහා පහත නවීකරණයන් සහ ඉදිකිරීම් යෝජනා කෙරේ.

i. පවත්නා ආරක්ෂක පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම
ii. පවත්නා ලේඛනාගාරය ප්‍රතිසංස්කරණය කිරීම.
iii. අනවශ්‍ය ගරාවැටුන ගොඩනැගිලි ඉවත් කිරීම
iv. පවතින සම්මන්ත්‍රණ ශාලාව සහ කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
v. පවතින නිල නිවාස ප්‍රතිසංස්කරණය කිරීම.
vi. පවතින පිරික්සුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
vii. ආරක්ෂක තාප්පය සම්පූර්ණ කිරීම සහ අවශ්‍ය පාලම් ඉදිකිරීම
viii. නව කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම
ix. ආරක්ෂක මුරපොල ස්ථාපනය කිරීම (අභ්‍යන්තර පාරවල්වල නව ප්‍රවේශ ගේට්ටුව, ආරක්ෂක කටයුතු සඳහා වැඩබිම අවට ඇවිදීමේ මංතීරු)
x. ඉහළ පවතින වතුර ටැංකිය ප්‍රතිසංස්කරණය කිරීම

පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම පිණිස මෙම අවශ්‍යතාවයන් මොරටුව විශ්ව විද්‍යාලය වෙත යොමු කරන ලදී. ක්ෂේත්‍ර වැඩබිම පරීක්ෂා කිරීමෙන් අනතුරුව මොරටුව විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති උපදේශන කමිටුව විසින් ව්‍යාපෘතියේ ඉන්ජිනේරු සඳහා වන 5% උපදේශන ගාස්තුව රහිතව ශ්‍රී ලංකා රුපියල් මිලියන 200 වටිනාකමකින් යුත් ව්‍යාපෘතිය සඳහා ගොඩනැගිලි සැලසුම්, ලංසු ලියකියවිලි සහ ඉන්ජිනේරු ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇත.

**මෙම සංවර්ධන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු සහ පරමාර්ථ පහත දැක්වේ;**

i. කදිරාන ප්‍රාදේශීය කාර්යාලය පුළුල් කළ යුතු බැවින් අපේක්ෂිත කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
ii. වැඩබිමේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම.
iii. පිරික්සුම් උපකරණ සඳහා ආරක්ෂක ඉඩකඩ සැපයීම.
iv. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ වර්තමානයේ පවත්නා අධික වැඩ කොටස් අවම කරමින් වඩා ප්‍රශස්තව සහ කාර්යක්ෂමව නියාමන සේවා සැපයීම. යෝජිත කදිරාන කාර්යාලය කටුනායක ගුවන්තොටුපලේ සිට දිවයිනට පැමිණෙන සිය විදුලි සංදේශ උපකරණ ආනයනය කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් නිශ්කාශන ලිපි ලබා ගැනීමට අවශ්‍ය මගීන්ට මෙන්ම මීගමුව සහ ඒ අවට ප්‍රදේශවල ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් සංඛයාත බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය තැනැත්තන්ට පහසු ස්ථානයක් වනු ඇත.
v. දේශීය / ජාත්‍යන්තර රැස්වීම් සහ සම්මන්ත්‍රණ සඳහා ස්ථානය සැපයීම.
vi. වැඩි දුරටත් අනවසරයෙන් ඉඩම අත්පත් කර ගැනීමෙන් ආරක්ෂා කිරීම.

**මෙම සංවර්ධන ව්‍යපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිඵල පහත දැක්වේ;**

අ. ප්‍රාදේශීය කාර්යාලය මගින් මහජනතාව සඳහා ඵලදායී, විමධ්‍යගත වූ සේවා සැපයීම.
ආ. ප්‍රාදේශීය මට්ටමින් අවහිරතාවයන් සහ දෛනික පිරික්සුම් ක්‍රියාකාරකම් වල නිරතවීම.
ඇ. නීති විරෝධී ආකාරයෙන් සංඛ්‍යාත පරිහරණය කරන්නන් හඳුනා ගැනීම පිණිස ධාරිතාවය ඉහළ නැංවීම.
ඈ. මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් , සම්මන්ත්‍රණ සහ වැඩමුළු යනාදිය සඳහා සුදුසු ස්ථානයක් සැපයීම.
ඉ. ජාතික යහපත සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු ඉඩම සහ දේපල නිසි ලෙස පරිහරණය කිරීම.

**ව්‍යාපෘතියේ ප්‍රගතිය**

අ. සංවර්ධන බලපත්‍ර/ය ලබා ගන්නා ලදී.
ආ. විස්තරාත්මක සැලැස්ම සහ ලංසුකරණ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් අවසන් කිරීම.

### 1.1.5 නෙළුම් කුලුන අදියර 02 ව්‍යාපෘතිය - වාහන නැවතුම් පහසුකම සහිතව මිශ්‍ර සංවර්ධනය

කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය ආශ්‍රිතව අවට ප්‍රදේශය සංවර්ධනය කිරීම දිගු කාලීනව සියළුම පාර්ශවකරුවන්ට එහි ප්‍රතිලාභ උපරිම කර ගැනීමට ඉතා වැදගත්වේ. කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය අවට ප්‍රදේශය, මේ වන විට, සංවර්ධිත නොවූ තත්ත්වයක පවතින අතර කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය අවට ප්‍රදේශය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රධාන සැලැස්මක් ඒකාබද්ධව සංවර්ධනය කිරීමෙහි ලා විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය (UDA) වැනි අදාළ රාජ්‍ය ආයතන සමග කටයුතු කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ප්‍රශස්ත අවස්ථාවක් උදාවෙන අතර, ඉදිරි වසර 75 තුළ මෙම සමස්ථ ප්‍රදේශය මහජන ආකර්ශණයට ලක් වූ ප්‍රදේශයක් බවට පත් වනු ඇත. කොළඹ නෙළුම් කුලුන සංකීර්ණය අවට සියළුම අක්‍රමවත් සංවර්ධනයන් එහි දිගුකාලීන සාර්ථකත්වයට දැඩි බලපෑමක් වෙනු ඇත.

කොළඹ නෙළුම් කුලුන සංකීර්ණයට යාබද ඉඩම විනෝස්වාදය සපයන පහසුකම් සහිතව බහුකාර්ය රථගාල සංකීර්ණයක් ලෙස වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පියවර ගෙන ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් ඉඩම වෙන් කිරීම දැනටමත් අනුමත කර ඇති අතර, නාගරික සංවර්ධන අධිකාරිය ඉඩම අත්පත් කර ගැනීම සහ පැවරීම සඳහා වග කියනු ලැබේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගොඩනැගිලි මෙහෙයුම් සහ පැවරුම් (BOT) පදනම මත යාබද ඉඩම වැඩිදියුණු කිරීමට තීරණය කර ඇති අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මේ සම්බන්ධ අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලිය මේ වනවිට ආරම්භ කර ඇත.

# පාලන, මානව සම්පත්, ආයතනික කටයුතු සහ සැලසුම් අංශය

ස
මා
ලෝ
ච
න
ය

පාලන සහ ආයතනික කටයුතු අංශයේ විෂයය පථය පුළුල් වන අතර ආයතනයේ කාර්යයන් ප්‍රශස්ත ආකාරයෙන් පවත්වාගෙනයාම සඳහා ඉතා වැදගත් කාර්යභාරයන් රැසක් ඉටු කිරීමෙහිලා නිරත වේ. ආයතනික සැලසුම්කරණය හා මෙහෙයවීම; ආයතනය තුළ මෙන්ම ආයතනයෙන් බැහැර වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම; මානව සම්පත් පරිපාලනය; ආයතනික කටයුතු සඳහා කාර්යාල අවශ්‍යතා හා උපකරණ පහසුකම් සැපයීම; කාර්ය මණ්ඩලයේ ශුභ සාධන කටයුතු නිසැක කිරීම; භෞතිකමය පරිසරය පවත්වාගෙනයාම; තොරතුරු තාක්‍ෂණ යටිතල පහසුකම් සැපයීම වැනි ක්ෂේත්‍රයන් රැසක් මීට ඇතුලත් වේ.

පාලන සහ ආයතනික කටයුතු අංශය විසින් සිදු කරන කාර්යයන් සහ කාර්යසාධනය පහත දැක්වේ.

**කාර්යයන්**

- මානව සම්පත් කළමණාකරනය සහ පොදු පරිපාලනය සම්බන්ධයෙන් නීති, රෙගුලාසි සහ පටිපාටි පිළියෙල කිරීම.
- කාර්ය මණ්ඩලය බඳවා ගැනිම, ස්ථිර කිරීම, කාර්ය සාධන ඇගයීම, උසස් කිරීම,නිවාඩු වාර්තා, පැමිණීම,ස්ථාන මාරු, කාර්ය සාධන ඇගයීම, සහ විනය පරීක්‍ෂණ, සේවයෙන් නිදහස් කිරීම හා විශ්‍රාම ගැන්වීම සම්බන්ධ සියළුම කටයුතු සිදු කිරීම.
- කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු පවත්වා ගැනීම.
- අදාල ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයේ උපදෙස් සහිතව එක් එක් තනතුරු සඳහා රැකියා පිරිවිතරයන් සැපයීම ඇතුළුව කොමිෂන් සභාව සඳහා කාර්ය මණ්ඩල සැලැස්මක් සකස් කිරීම.
- ජ්‍යෙෂ්ඨ කාර්ය භාර ප්‍රධානීන් සමඟ එක්ව මානව සම්පත් සංවර්ධන අයවැය පිළියෙල කිරීම.
- වාර්ෂික කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පිළියෙල කිරීම.
- පුහුණු පාඨමාලා (දේශීය සහ විදේශීය යන දෙකම) සම්බන්ධීකරණය කිරීම , අවශ්‍ය වාරිකා සංවිධානය කිරීම සහ පුහුණු ලාභීන් ලියාපදිංචි කිරීම සහ අවශ්‍ය සෙසු කටයුතු පිළියෙල කිරීම.
- වාර්ෂික වාර්තාව, ආයතනික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම සඳහා අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආරක්ෂක සේවා,පවිත්‍රතා සේවා, ගොඩනැගිලි නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම මෙන්ම යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම ආශ්‍රිත කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- විදුලිය, ජලය සහ දුරකථන සේවා කාර්යක්ෂමව සැපයීමට වග බලා ගැනීම.
- වාහන සංඛ්‍යාව නඩත්තු කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සෙසු අංශ මගින් සිදු කරන කාර්යයන් සඳහා නිසි සහයෝගය ලබා දීම.
- ගෙවීම් නිර්දේශ කිරීම/අනුමත කිරීම.
- කොමිෂන් සභාවේ භාණ්ඩ පිළිබඳ ලේඛනය සහ ලේඛණාගාරය පවත්වාගෙන යාම.
- වාර්ෂිකව වත්කම් පිළිබඳ සමීක්ෂණ මණ්ඩල පැවැත්වීම සහ අවශ්‍ය නොවන සහ අබලි ද්‍රව්‍ය අයිතමයන් බැහැර කිරීම.
- මාධ්‍ය ඒකකය සහ තොරතුරු සහ ප්‍රලේඛන ඒකකය පාලනය කිරීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම, විගණකාධිපති සහ රාජ්‍ය ව්‍යාවාසයක කමිටුව (COPE) සඳහා වාර්තා ඉදිරිපත් කිරීම මෙන්ම අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව,කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වැනි ආයතන සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම.
- ප්‍රදර්ශන සහ සම්මේලන වලට සහභාගිවීම සම්බන්ධ සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- වෘත්තීමය හිතකරභාවය සහ ආරක්ෂක අවශ්‍යතා සපුරාලීමට වග බලා ගැනීම.
- කාර්ය මණ්ඩලය සඳහා වන ජීවිත ආරක්ෂණ සහ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම.
- කාර්ය මණ්ඩලය සඳහා සුභසාධන සේවා සැපයීම පිණිස සුභසාධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ මූල්‍ය සහ මූල්‍යය නොවන දිරි දීමනා පැකේජ සැපයීමට උපදෙස් ලබාදීම මෙන්ම අඩුපාඩු සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.
- ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ තොරතුරු තාක්‍ෂණ අවශ්‍යතාවයන් ඉටු කිරීම.
- කාර්යක්‍ෂම පුස්තකාල සේවාවක් සැපයීම.
- මාධ්‍ය ක්‍රියාකාරකම් පරිපාලනය කිරීම.

**කාර්යසාධනය**

**විශේෂිත පරිපාලන සහ මානව සම්පත් කටයුතු ප්‍රතිසංවිධානය කිරීම**

- අනුමත සේවක සංඛ්‍යාව, සංවිධාන ව්‍යුහය සහ බඳවා ගැනීමේ පටිපාටිය (SOR) සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් කමිටුවක් පත් කර ඇති අතර එය ක්‍රියාත්මක වෙමින් පවතී.
- ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය සේවා වර්ගීකරණ තිස් දෙකකින් (32) සමන්විත වන අතර ස්ථිර සේවකයන් එක සිය අසූ පහක් (185), කොන්ත්‍රාත් සේවකයන් විසි නව දෙනෙකු (29) සහ ද්විතීයන පදනම මත සේවකයන් අට දෙනෙකු (08) සේවය කරන අතර 2018 වර්ෂයේදී පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව හැත්තෑ හයකි (76). ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව 298 කි.

**කාලානුරූප සැලසුම් පිළියෙල කිරීම/ප්‍රගති සමාලෝචන පැවැත්වීම**

- ආයතනික සැලැස්මේ පවතින ගැටළු සම්පූර්ණ කරන ලද අතර වාර්ෂික වාර්තා පිළියෙල කරන ලදී.
- ප්‍රගති සමාලෝචන රැස්වීම් හතරක් පවත්වා ඇති අතර සංවිධානයේ ඉහළ කළමනාකාරිත්වය වෙත කාර්යසාධනය වාර්තා කරන ලදී.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පොදු කාර්යයන් ආශ්‍රිත ගැටළු මෙහෙයවා ඇති අතර ජනාධිපති ලේකම් කාර්යාලය, අමාත්‍ය මණ්ඩල කාර්යාලය, භාණ්ඩාගාරය, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු යනාදිය සමඟ එක්ව සම්බන්ධීකරණය කරන ලදී.
- කොමිෂන් සභා තීරණය ප්‍රකාරව පූර්ව ආයතනික සමාජීය වගකීම් මෙහෙයවන ලදී.

**කාර්යාල චක්‍රලේඛ නිකුත් කිරීම සහ කාර්යාල පටිපාටි හඳුන්වාදීම**

2018 වර්ෂයේදී , ආයතනයේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සහ කාර්යක්ෂම කිරීම පිණිස පාලන සහ ආයතනික කටයුතු අංශය විසින් පහත සඳහන්ක්ෂේත්‍ර වලට අදාල කාර්යාල චක්‍රලේඛ නිකුත් කරන ලදී.

*වගුව 25: කාර්යාල චක්‍රලේඛ නිකුත් කිරීම සහ කාර්යාල පටිපාටි හඳුන්වාදීම*

| චක්‍රලේඛ අංකය/කාර්යාල නියෝගය | විෂයය | නිකුත් කරන ලද දිනය | ප්‍රස්තුතය |
|---|---|---|---|
| කාර්යාල නියෝග 01/2018 | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා නිවාඩු | 2018.11.23 | කාර්යාල නියෝග |
| අභ්‍යන්තර චක්‍රලේඛ TRC/01/2018 | බාහිර ආයතන සමඟ ගිවිසුමක් පවත්වා ගැනීම | 2018.01.15 | අභ්‍යන්තර මැමය |
| TRC/02/2018 | විදේශීය පුහුණු, වැඩමුළු, කණ්ඩායම් රැස්වීම් සහ සම්මන්ත්‍රණ වලට සහභාගි වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් | 2018.12.13 | නව චක්‍රලේඛ |

## පුහුණු කිරීම

ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව විසින් කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කිරීම, නිපුණතා වර්ධනය කිරීම හා ආකල්ප වෙනස් කිරීම සඳහා දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථා සේවකයන්ට ලබා දී ඇත. ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ කාර්ය මණ්ඩලය විදුලි සංදේශ නියාමන කටයුතු ආශ්‍රිතව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ/ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ජාත්‍යන්තර සමුළු වලට සහභාගී වී ඇත. 2018 වසර තුළ පවත්වන ලද සමුළු සහ පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ වලට අදාල තොරතුරු පහත දැක්වේ.

*වගුව 26: පුහුණු වැඩසටහන් , සම්මන්ත්‍රණ සහ සමුළු වලට සහභාගීවීම*

**a) විදේශීය වැඩසටහන්**

| අංකය | සමුළුව/පුහුණු පාඨමාලාව/සම්මන්ත්‍රණය | රට | අරමුදල් සපයන ආයතනය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | සුහුරු සමාජය සහාය කර ගනිමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා හා ඊ - භාවිතාවන් පරිහරණය කිරීම ජපානය | ජපානය | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 2 | ලෝක තොරතුරු සමාජ සමුළුව | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 3 | ආ.ශා.වි.ස.ස රැහැන් රහිත කණ්ඩායමේ 23 වැනි රැස්වීම | වියට්නාමය | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 4 | ආර්ථික හා ප්‍රතිපත්ති කරුණු පිළිබඳ ITU-T අධ්‍යයන | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 5 | විකාශන සේවා පිලිබඳ ITU-R අධ්‍යයන කණ්ඩායම් රැස්වීම | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 6 | "සයිබර් ආරක්ෂණය" පිළිබඳව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා ශාන්තිකර මධ්‍යස්ථානයේ පුහුණුව | ඉරානය | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 7 | ජාල ආරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ITU T- අධ්‍යයන කණ්ඩායමේ 17 වන රැස්වීම | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 8 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධන දර්ශක (IDI) පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා ශාන්තිකර කලාපීය වැඩමුළුව | පිලිපීනය | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 04 |
| 9 | The 3rd Meeting of the conference preparatory Group for WRC-19 (APG 19-3) සඳහා පූර්ව කණ්ඩායම් සම්මන්ත්‍රණයේ 3 වන රැස්වීම | ඔස්ට්‍රේලියාව | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 10 | මීළඟ හා නව පරම්පරාවේ ජංගම සන්නිවේදන පද්ධති පිලිබඳ ක්‍රියාමාර්ග | ජපානය | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 11 | අධ්‍යයන කණ්ඩායම 9 ( අධිවේගී අන්තර්ජාල සේවා කේබල් සහ රූපවාහිනී) | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 12 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය -R කාර්ය කණ්ඩායම 5/1: ලෝක ගුවන් විදුලි සමුළුව -19 න්‍යායපත්‍ර අයිතමය | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 13 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ -T අධ්‍යයන කණ්ඩායම 15: ප්‍රවාහනය, ප්‍රවේශ හා ගෘහස්ථ සඳහා ජාල, තාක්ෂණය හා තාක්ෂණය | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |

| | | | | |
|---|---|---|---|---|
| 14 | ක්වාලා ලම්පූර් කුලුන වාණිජකරණය කිරීම අධ්‍යයනය කිරීම සඳහා අධ්‍යයන චාරිකාව | මැලේසියාව | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 05 |
| 15 | සුහුරු නගර සඳහා අන්තර්ජාලයේ දෑ පිළිබඳ තාක්ෂණය හා භාවිතාවන් | ඉන්දියාව | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 16 | පුළුල් දත්ත හා විදුලි සංදේශනයේ බලපෑම පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව | චීනය | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 17 | ඊ - කෘෂිකාර්මික විසඳුම් පිළිබඳ සමුළුව | චීනය | ශිෂ්‍යත්වයකි | 01 |
| 18 | WRC-19P පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ 2 වන අන්තර්කලාපීය වැඩමුළුව | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 19 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රාරම්භක රැස්වීම 2018 (PP-18) | එක්සත් අරාබි එමීර් රාජ්‍යය | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 06 |
| 20 | විදුලි සංදේශ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක (EGTI) පිළිබඳ විශේෂඥ කණ්ඩායමේ 9 වන රැස්වීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගෘහස්ථ දර්ශක (EGH) පිළිබඳ විශේෂඥ කණ්ඩායමේ 6 වන රැස්වීම | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 21 | විදුලි සංදේශ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක (EGTI) පිළිබඳ විශේෂඥ කණ්ඩායමේ 9 වන රැස්වීම සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගෘහස්ථ දර්ශක (EGH) පිළිබඳ විශේෂඥ කණ්ඩායමේ 6 වන රැස්වීම | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 22 | අන්තර්ජාලයේ දෑ හා එහි භාවිතාවන් හා යෙදුම් | තායිලන්තය | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 23 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ R නිර්දේශ ප්‍රකාරව ගුවන් විදුලි පිරික්සුම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය /R&S වැඩමුළුව | සිංගප්පූරුව | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 03 |
| 24 | අන්තර්ජාල ප්‍රවේශය හා අනුගතවීම පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ITU-USF පාතිස්තාන වැඩමුළුව | පාකිස්තානය | ජා.වි.ස.ස (ITU) | 01 |
| 25 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය -D අධ්‍යයන කණ්ඩායම -2 වාර්තාකරුවන්ගේ කණ්ඩායම | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 26 | ජාල ආරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ T අධ්‍යයන කණ්ඩායම 17 රැස්වීම | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 27 | PP-18 පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පූර්ව කණ්ඩායමේ 4 වන රැස්වීම | මැලේසියාව | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 28 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 18 වන ප්‍රතිපත්ති හා නියාමන සමුළුව | බංග්ලාදේශය | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL ) | 01 |
| 29 | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමය විසින් පවරන ලද කාර්ය අයිතමයන් පිළිබඳ කාර්ය කණ්ඩායම් ක්‍රියාකාරකම් පිළිබඳ රැස්වීම | මාලදිවයින | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 30 | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවන් සඳහා සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරනය පිළිබඳ නව සංවර්ධනයන් සම්බන්ධ වැඩමුළුව | ජර්මනිය | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 02 |

| | | | | |
|---|---|---|---|---|
| 31 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය -D අධ්‍යයන කණ්ඩායම 1 වාර්තාකරුවන්ගේ කණ්ඩායම් රැස්වීම | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 32 | "ඩිජිටල් යෙදුම් පරිසරය තුළ තරඟකාරී විශ්ලේෂණය" පිළිබඳව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා ශාන්තිකර මධ්‍යස්ථානයේ සම්මුඛ පුහුණුව | තායිලන්තය | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 33 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ රැහැන් රහිත කණ්ඩායම (AWG – 24) 24 වැනි රැස්වීම | තායිලන්තය | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 34 | චන්ද්‍රිකා සන්නිවේදනය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව | ඉන්දියාව | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 35 | සයිබර් ආරක්ෂණය පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සමුළුව | කොරියාව | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 36 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා ශාන්තිකර මධ්‍යස්ථානයේ ආසියානු ශාන්තිකර කලාපය සඳහා "අනුකූලතාව සහ අන්තර් ක්‍රියාකාරිත්වය" පිළිබඳව පුහුණුව | චීනය | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 37 | මැලේසියාවේ විධායක නායකත්ව සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන | මැලේසියාව | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 38 | ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ සංඛ්‍යාත වර්ණාවලි කළමනාකරණය පිළිබඳ සමුළුව | පිලිපීනය | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 39 | " ජංගම අධිවේගී අන්තර්ජාල සේවා තත්ත්ව (QOS)" පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා ශාන්තිකර මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන | ඉන්දියාව | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 02 |
| 40 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ -D අධ්‍යයන කණ්ඩායම 01 & 02 (2018-2021) ප්‍රථම රැස්වීම | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 41 | මෑත කාලීන ප්‍රවණතා හා තාක්ෂණයන් (5G & IoT) පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ වැඩමුළුව | ඉරානය | ආ.ශා.වි.ස.ස (APT) | 02 |
| 42 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ITU-R 5/1 කාර්ය කණ්ඩායම් රැස්වීම | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 43 | අන්තර්ජාලය Plus සහ 5G, BUPT පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව | චීනය | ආ.ශා.වි.ස.ස (APT) | 02 |
| 44 | ආසියා ශාන්තිකර කලාපය සඳහා"'අන්තර්ජාලය සහ IPv6 යටිතල පහසුකම් ආරක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා ශාන්තිකර (ITU ASP CoE) වැඩසටහන | තායිලන්තය | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 45 | නියාමකයින් සඳහා ගෝලීය සම්මන්ත්‍රණය (GSR) | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 46 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ක්ලවුඩ් කම්පියුටින් පිළිබඳ රාජ්‍ය පුළුල් දත්ත කළමනාකරණය හා භාවිතය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 01 |
| 47 | ලෝක ගුවන් විදුලි සන්නිවේදන සම්මන්ත්‍රණය | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |

| | | | | |
|---|---|---|---|---|
| 48 | මහජන ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා සයිබර් ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව | තායිලන්තය | ආ.ශා.වි.ස.ස (APT) | 02 |
| 49 | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ 19 වන රැස්වීම | පාකිස්තානය | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 50 | දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ (SATRC) ප්‍රතිපත්ති, නියාමනය හා සේවා පිළිබඳ වැඩමුළුව | නේපාලය | ආ.ශා.වි.ස.ස (APT) ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 03 |
| 51 | සංවර්ධනය වෙමින් පවතින රටවල්වල අධිවේගී අන්තර්ජාල සේවා ජාල ඉදිකිරීම | චීනය | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව | 02 |
| 52 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ 23 වන TDAG රැස්වීම | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 53 | රැහැන් රහිත භාවිතයන් සහිත ග්‍රාමීය විදුලි සංදේශනය පිළිබඳ ප්‍රායෝගික තාක්ෂණය | ජපානය | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 54 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සංඛ්‍යාත වර්ණාවලි පිරික්සුම පිළිබඳ කාර්ය කණ්ඩායම IC රැස්වීම | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 55 | 5G සන්නිවේදන පද්ධතිය හා අන්තර්ජාලයේ දෑ පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව | චීනය | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 56 | 2018 ටෙක් ආසියා සම්බන්ධීය සමුළුව | සිංගප්පූරුව | ජා.වි.ස.ස (ITU) ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 57 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - R කාර්ය කණ්ඩායම 5B රැස්වීම | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 58 | 30 වැනි ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රමිතිකරණ වැඩසටහන් සමුළුව | තායිලන්තය | ආ.ශා.වි.ස.ස (APT) | 01 |
| 59 | යුරෝපය සඳහා ITU-EC සමුළුව "සියළුම දෙනාට ප්‍රවේශ විය හැකි යුරෝපීය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | ඔස්ට්‍රියාව | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 60 | 16 වැනි ලෝක විදුලි සංදේශ / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සමුළුව | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 61 | ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක ගුවන් විදුලි විදුලි සංදේශ සම්මන්ත්‍රණය | ජිනීවා | ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව (TRCSL) | 01 |
| 62 | විදුලි සංදේශ පහසුකම් ව්‍යාප්තවීමේ පරතරය අවම කිරීම සඳහා කලාපීය ප්‍රජාව තුළ ඊ-අයදුම් කිරීම සඳහා මූලික ජාල සැලසුම් කුසලතා සංවර්ධනය කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව | ජපානය | ආ.ශා.වි.ස.ස (APT) | 01 |

ආ) දේශීය වැඩසටහන්

| පුහුණු වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව | ආයතනය | දිනය |
|---|---|---|---|
| රජයේ අයවැය පිළිබඳ සම්මන්ත්‍රණය 2018 | 01 | ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය | 2018.01.18 |
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 01 | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | 2018 පෙබරවාරි 14, 16 සහ 19 |
| වාර්තා ලිවීම සහ වෘත්තීය ලිපි ලිවීම | 30 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 2018.04.20 |
| ලංසු ඇගයීම | 30 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල i | 2018.03.29 2018.04.06 |
| අකුණු ආරක්ෂාව පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 2018 මාර්තු 15, 16, 17 |
| නව දේශීය ආදායම් පනත පිළිබඳ සම්මන්ත්‍රණය | 02 | ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය | 2018.05.15 |
| ලෝක මිනුම් විද්‍යා දිනය සැමරීමේ වැඩමුළුව 2018 | 01 | මිනුම් ඒකකය, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව | 2018.05.25 |
| රාජ්‍ය සේවා සැපයීමේ ඩිජිටල් පරිවර්තනය | 04 | ඉංජිනේරු හා තාක්ෂණ ආයතනය | 2018.07.17 |
| නීතිය සහ ව්‍යාපාර පිළිබඳ කොළඹ LowBiz 2018 සම්මන්ත්‍රණය | 02 | කොළඹ නීති සංගමය | 2018 ජූලි 20 - 21 |
| වත්කම් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | 01 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 2018.07.17 |
| ඩිජිටල් අපරාධ හා ඩිජිටල් අධිකරණ වෛද්‍ය විද්‍යාව විමර්ශනය පිළිබඳ ප්‍රශස්ත පුහුණුව | 09 | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය | 2018.09.17 |
| සයිබර් ආරක්ෂක සමුළුව 2018 | 01 | CICRA කැම්පස් | 2018.09.20 |
| ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ 39 වන ජාතික සමුළුව | 02 | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | 2018 ඔක්තෝබර් 8-10 |
| නිශ්පාදිතයන් ඇගයීම සහ තක්සේරු කිරීම පිළිබඳ වැඩමුළුව | 02 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 2018 ඔක්තෝබර් 01 - 02 |
| ධනාත්මක ආකල්ප, අභිප්‍රේරණය සහ නායකත්වය පිළිබඳ වැඩමුළුව 1 වන කණ්ඩායම | 40 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 2018.09.27 |
| ඊ - රාජ්‍යය, සයිබර් ආරක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | 2018.10.16 |
| ජාත්‍යන්තර ඉංග්‍රීසි ඩිප්ලෝමාව | 01 | ඊසොෆ්ට් මෙට්‍රෝ විද්‍යාලය | මාස 4 |
| ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධිකරණ ගිණුම්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 02 | ව්‍යාපාරික පාසල / ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | මාස 3 |
| ධනාත්මක ආකල්ප, අභිප්‍රේරණය සහ නායකත්වය පිළිබඳ වැඩමුළුව දෙවන කණ්ඩායම | 40 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 2018.10.25 |
| ගබඩා කළමනාකරණය සහ පොදු වත්කම් අපහරණ ක්‍රියා පටිපාටි | 35 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 2018 ඔක්තෝබර් 30 - 31 |

| | | | |
|---|---|---|---|
| ජාතික විගණන පනත පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | PRAG ආයතනය | 2018 ඔක්තෝබර් 30 |
| ජාතික විගණන පනත පිළිබඳ වැඩමුළුව | 02 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 2018.11.29 |
| රාජ්‍ය අංශයේ මූල්‍ය රෙගුලාසි වල ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි පිළිබඳ වැඩමුළුව | 01 | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 2018 දෙසැම්බර් 06 - 07 |
| මූල්‍ය ප්‍රකාශන (අවසන් ගිණුම්) - 2018 | 03 | PRAG ආයතනය | 2018.12.18 |
| ධනාත්මක, ආකල්ප, අභිප්‍රේරණය සහ නායකත්වය පිළිබඳ වැඩමුළුව 3 වන කණ්ඩායම | 40 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල | 2018.12.17 |

වෘත්තීමය සංවර්ධන ප්‍රතිලාභ අත් කර ගැනීම සහ කර්මාන්ත කාර්යසාධනය ප්‍රවර්ධනය කිරීම පිණිස දේශීය සහ ජාත්‍යන්තර ආයතනවල වෘත්තීමය සාමාජිකත්වය ලබාගැනීමෙහිලා කාර්යමණ්ඩලය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මූල්‍යාධාර සපයා ඇත.

**ඇ) 2018 සඳහා ගෙවන ලද වෘත්තීමය සාමාජිකත්ව ගාස්තු ප්‍රතිපූර්ණය කිරීම**

| අංකය | ආයතනය | සාමාජිකයන් සංඛ්‍යාව | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 01 | ඉලෙක්ට්‍රිකල් සහ ඉලෙක්ට්‍රොනික්ස් ඉංජිනේරු ආයතනය (IEEE) | 02 | 14,178.03<br>US $ 89.50 |
| 02 | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) | 07 | 40,492.00 |
| 03 | ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය සංගමය(AAT) | 01 | 2,500.00 |
| 04 | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරන ආයතනය(ICASL) | 03 | 24,500.00 |
| 05 | ඉන්ජිනේරු සහ තාක්ෂණ ආයතනය (IET) | 14 | 125,290.30<br>GBP 1119.40 |
| 06 | ශ්‍රී ලංකා කළමනාකාරිත්ව ආයතනය (IMSL) | 01 | 5,700.00 |
| 07 | ශ්‍රී ලංකා සහතිකලත් කළමණාකරන ගණකාධිකාරවරුන්ගේ ආයතනය (ICMA) | 01 | 7,500.00 |
| 08 | වරලත් ලේකම් සහ පරිපාලකයන් පිළිබඳ ආයතනය (ICSA) | 01 | 40,724.05 |
| 09 | ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය | - | |
| 10 | වරලත් වෘත්තීය කළමනාකරණ ආයතනය (ICPM) | - | |
| 11 | එක්සත් රාජධානියේ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනය | | GBP 75 |
| 12 | ශ්‍රී ලංකා සංස්ථාගත ඉන්ජිනේරු ආයතනය | | 18,520.00 |
| 13 | එක්සත් රාජධානියේ වෘත්තීය සංගමය | | 27,500.00 |
| 14 | ශ්‍රී ලංකා පුස්තකාල සංගමය | | 1,250.00 |
| 15 | ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනය | | 1,000.00 |
| 16 | ශ්‍රී ලංකා පරිගණක සමාජය | | 6,000.00 |

**ප්‍රසම්පාදන කටයුතු**

මෙම අංශය මගින් කොමිෂන් සභාව වෙත විවිධ භාණ්ඩ සහ සේවා වර්ග සැපයීමේ සියළුම කටයුතු සම්බන්ධීකරණය කරනු ලැබේ. මෙම කාර්යයන් අතර,

- ලංසු ලේඛන පිළියෙල කිරීම
- දැන්වීම් පළ කිරීම
- ප්‍රසම්පාදන කමිටු (PCs) හා තාක්‍ෂණික ඇගයීම් කමිටු පත් කිරීම(TECs)
- අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා වාර්තා පිළියෙල කිරීම
- අදාල පාර්ශවයන්ට තීරණ දැනුම්දීම
- නීති අංශයේ සහයෝගීත්වය ඇතිව සේවා ගිවිසුම් සකස් කිරීම
- සේවා සැපයුම්කරුවන්ගේ කාර්යයන් අධීක්‍ෂණය කිරීම
- සේවා ගිවිසුම්වල සඳහන් කර ඇති වගකීම් උල්ලංඝනය වූ අවස්ථා දක්නට ලැබුන විට ඒවා නිවැරදි කිරීමට පියවර ගැනීම ඇතුලත් වේ.

වර්ෂය තුළ, කණිෂ්ඨ ප්‍රසම්පාදන කමිටු 11 සහ ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටු 09 ක් පවත්වා ඇති අතර සාරාංශය පහත දැක්වේ.

*වගුව 27: කණිෂ්ඨ ප්‍රසම්පාදන කමිටුවේ සහ ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටුවේ රැස්වීම්*

| | රැස්වීම්වල දිනය සහ ගන්නා ලද තීරණ සංඛ්‍යාව | | | | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කණිෂ්ඨ ප්‍රසම්පාදන කමිටුව | දිනය | පෙබ 26 | මාර් 23 | මැයි 04 | මැයි 28 | ජූලි 25 | අගෝ 20 | සැප් 11 | ඔක් 05 | ඔක් 31 | නොවැ 26 | දෙසැ 26 | 11 |
| | ගන්නා ලද තීරණ සංඛ්‍යාව | 07 | 03 | 06 | 03 | 06 | 06 | 05 | 03 | 03 | 06 | 04 | 52 |

| | | | | | | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන කමිටුව | දිනය | මාර් 02 | මාර් 28 | අප්‍රේ 27 | ජූලි 03 | සැප් 18 | ඔක් 09 | නොවැ 08 | නොවැ 26 | දෙසැ 20 | 09 |
| | ගන්නා ලද තීරණ සංඛ්‍යාව | 05 | 01 | 02 | 04 | 03 | 02 | 04 | 02 | 02 | 25 |

මෙම අංශය විසින් විදුලිය, ජලය සහ දුරකථන සේවා කාර්යක්ෂමව සැපයීම සිදු කරයි. මීට අමතරව, ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ සෙසු අංශවලට ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ සහ යන්ත්‍රෝපකරණ නියමිත වේලාවට ලබා දීමට පියවර ගෙන තිබේ.

මෙම කාර්යයන්වල පොදු පරමාර්ථය වූයේ ආයතනයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා විනිවිද පෙනෙන, පිරිවැය ඵලදායී හා සාධාරණ ආකාරයකින් කාල සීමාව තුළ අවශ්‍ය සේවාවන් හා ද්‍රව්‍ය සැපයීම ය.

**වාහන සංචිතය නඩත්තු කිරීම**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාහන සංචිතය කාර් එකොළහක්, ඩබල් කැබ් දෙකක්, ජීප් රථ හතරක්, වෑන් රථ 4 ක්, එක් බස් රථයක්, ජංගම පිරික්සුම් වාහන තුනක් සහ මෝටර් බයිසිකල් දෙකකින් සමන්විත වේ. විමර්ශන කටයුතු, ප්‍රදර්ශන සඳහා නිලධාරීන් ප්‍රවාහනය කිරීම, කාර්ය මණ්ඩල සුභසාධන කටයුතු යනාදිය සඳහා මෙම බස් රථය භාවිතා කරන ලදී. සෙසු වාහන නිල

ගමන් සඳහා භාවිතා කරන ලදී. එනම් නිරීක්ෂණ චාරිකා, රැස්වීම්/වැඩමුළු/සම්මන්ත්‍රණවලට සහභාගී වීම, ප්‍රදර්ශන සංවිධානය කිරීම, තැපැල් එකතු කිරීම, නිල ලිපි භාර දීම යනාදිය ය. වාහන සංචිතය නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කටයුතු සඳහා 2018 දී රුපියල් මිලියන 10.2 ක් වියදම් කරන ලදී.

**වාර්ෂික සමීක්ෂණය**

2017 වර්ෂය සඳහා වාර්ෂික සමීක්ෂණය 2018 වර්ෂයේදී පවත්වන ලදී. සමීක්ෂණය සිදු කිරීම සඳහා සාමාජිකයින් 05 දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් පත් කරන ලදී. වැඩිදුර කටයුතු සඳහා මණ්ඩලයේ වාර්තාව කළමනාකාරිත්වයට ඉදිරිපත් කරන ලදී. බැහැර කළ යුතු අයිතම හඳුනාගෙන පිළිගත් ක්‍රියා පටිපාටියට අනුව ඒවායින් සමහරක් බැහැර කිරීමට පියවර ගන්නා ලදී.

## Infortel 2018 ප්‍රදර්ශනයේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම

තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය (FITIS) විසින් සංවිධානය කරනු ලබන "ඩිජිටල් ආර්ථිකයක් කරා" යන තේමාව යටතේ ජාතික තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රදර්ශනයක් ලෙස 2018 වර්ෂය සඳහා වූ ඉන්ෆෝටෙල් ප්‍රදර්ශනය නොවැම්බර් 02 සිට 04 දක්වා BMICH පරිශ්‍රයේදී පැවැත්විණි. ශ්‍රී ලංකාවේ සහ සමස්ත දකුණු ආසියාවේ විශාලතම හා වඩාත්ම කීර්තිමත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රදර්ශනය ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ඉන්ෆෝටෙල් ප්‍රදර්ශනය 2018 සඳහා සහභාගී වූ අතර ප්‍රදර්ශන කුටිය සඳහා පදක්කමක් දිනා ගැනීමට සමත් විය.

**කාර්ය මණ්ඩල සුභසාධන කටයුතු**

**සුභසාධක සමිතිය**

වාර්ෂික මහා සභා රැස්වීමේදී (AGM) තේරී පත් වූ විධායක කමිටුවක කළමනාකාරිත්වය යටතේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගෙන් සමන්විත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සුභසාධක සංගමය ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු කරයි. අදාල කාල සීමාව තුළ පහත සඳහන් සුභසාධන කටයුතු සිදු කරන ලදී.

**වාර්ෂික සේවක අභිප්‍රේරණ වැඩසටහන**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල් සඳහා ඔවුන්ගේ සම්බන්ධතා සහ ඵලදායිතාව ශක්තිමත් කිරීමේ අරමුණින් වාර්ෂික සේවක අභිප්‍රේරණ වැඩසටහන සංවිධානය කරන ලදී.

මෙම සේවක අභිප්‍රේරණ වැඩසටහනේ අරමුණු වනුයේ සේවකයින් ආයතනික අරමුණු වෙත යොමු කිරීම, ඔවුන්ගේ සාරධර්ම ඉස්මතු කිරීම සහ කණ්ඩායම් ගොඩනැගීම සහ සම්බන්ධතා දිරිමත් කිරීමයි. මෙම උත්සවය පානදුර ජී ජී බීච් හෝටලයේ දී පවත්වන ලදී. මෙම සේවක අභිප්‍රේරණ වැඩසටහනේ කොටසක් ලෙස බාහිර දේශකයකු විසින් එම ස්ථානයේම අභිප්‍රේරණට සම්බන්ධ වැඩසටහනක් පවත්වන ලදී.

කාර්ය මණ්ඩල සුභසාධන කටයුතු සඳහා 2018 වර්ෂය සඳහා අනුමත වාර්ෂික අයවැයෙන් රුපියල් මිලියන 9.0 ක් වෙන් කර ඇත. මෙම අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමේදී මෙම වාර්ෂික සේවක අභිප්‍රේරණ වැඩසටහන සඳහා මිලියන 6.0 ක් ද, කොමිෂන් සභාවේ අනෙකුත් සුභසාධන කටයුතු සඳහා රුපියල් මිලියන 3.0 ක් ද වෙන් කරන ලදී.

**වාර්ෂික ක්‍රීඩා උත්සවය**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 11 වන වාර්ෂික ක්‍රීඩා උත්සවය 2018 දෙසැම්බර් 15 වන දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රීඩා සංගමයේ සහාය ඇතිව මහරගම ජාතික තරුණ මධ්‍යස්ථානයේ ක්‍රීඩා පිටියේදී පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගි විය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිවාස තුනක් (කෝකිලා, තිසර සහ මයුර) නියෝජනය කරමින් කාර්ය මණ්ඩල සාමාජිකයින් මෙම අවස්ථාවට සහභාගී වූහ. ධාවන හා මලල ක්‍රීඩා ඉසව් ඇතුළු ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩා කිහිපයකට කාර්ය මණ්ඩල සාමාජිකයින් විශාල පිරිසක් සහභාගී වූහ. මෙම ක්‍රීඩා උළෙල කාර්ය මණ්ඩලයට මලල ක්‍රීඩා පිළිබඳ ඔවුන්ගේ දක්ෂතා ප්‍රදර්ශනය කිරීමටත් කණ්ඩායම් ශක්තිය වර්ධනය කිරීමටත් අවස්ථාවක් විය.

**පුස්තකාලය**

විදුලි සංදේශ විෂය ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතින අතර එම නිසා කර්මාන්තයේ නියැලී සිටින්නන් සහ වෙනත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් මෙම විෂය පිළිබඳ ඔවුන්ගේ දැනුම අඛණ්ඩව යාවත්කාලීන කළ යුතුය. මේ සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුස්තකාලය ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුස්තකාලය විදුලි සංදේශ පිළිබඳ පොත්පත් සහ සඟරා විශාල එකතුවක් ඇති අතර එය පරිශීලකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අඛණ්ඩව ශක්තිමත් කරනු ලැබේ. මෙම පුස්තකාලය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පමණක් නොව පර්යේෂකයන්, විශ්ව විද්‍යාල සිසුන් සහ පාසල් ළමුන් වැනි බාහිර පාර්ශවයන්ට ද පහසුකම් සපයයි.

පහත සඳහන් ක්‍රියාකාරකම් 2018 කාලය තුළ සිදු කරන ලදී;

**පුස්තකාලය නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම**

පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුස්තකාල කමිටුව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රකාශන, දේශීය හා විදේශීය පොත් කිහිපයක් මිලදී ගත්තේය. සඟරා සඳහා කමිටුව විසින් අනුමත කරන ලද දායක ගාස්තු වලට අමතරව, දේශීය හා විදේශීය සඟරා සඳහා දායක මුදල් යාවත්කාලීන කරන ලදී.

**ආයතනික සාමාජිකත්වය යාවත් කාලීන කිරීම**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් බ්‍රිතාන්‍ය කවුන්සිලයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා අරමුදල් සපයන ලදී. මහජන පුස්තකාලය සම්බන්ධයෙන්, සාමාජික ගෙවීම් කිරීමෙන් පසු කාර්ය මණ්ඩල සාමාජිකයින්ට තනි සාමාජිකත්වය ලබා ගත යුතු විය. මෙම ආයතනික සාමාජිකත්වය

භාවිතා කිරීමත් සමඟ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ඉහත පුස්තකාලවලින් පහසුවෙන් සේවාවන් ලබා ගත හැකිය. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පොත්, සඟරා, වීඩියෝ ණයට ගැනීමටත්, පුවත්පත් ලිපිවල ඡායා පිටපත් ලබා ගැනීමටත්, වෙනත් මූලාශ්‍ර ලබා ගැනීමටත් හැකිවේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පුස්තකාලය ජාතික පුස්තකාල සුමිතුරු සංගමයේ සාමාජිකත්වය ලබා ගත් අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුස්තකාලයේ කාර්ය මණ්ඩලය ජාතික පුස්තකාල සුමිතුරු සංගමයට වැලිකඩ සහ තල්දෙන බන්ධනාගාරවල අලුතින් ඉදිකරන ලද පුස්තකාලය සඳහා පොත් එකතු කිරීමට උපකාර කළහ.

මහජන පුස්තකාලයේ සාමාජිකයින්ට කොළඹ මහජන පුස්තකාලයේ සේවාවන් ලබා ගත හැකි අතර එහි ජංගම පුස්තකාලය වසර පුරා සෑම සති දෙකකට වරක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට පැමිණේ.

### අන්තර් පුස්තකාල ණය පහසුකම් ලබා ගැනීම සඳහා වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුස්තකාලය ජාතික පුස්තකාලය හා ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NIBM), කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික විද්‍යා පදනම (NSF), විශ්ව විද්‍යාල පුස්තකාල ආදිය සමඟ සම්බන්ධීකරණය කර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට අන්තර් පුස්තකාල ණය පහසුකම් සැපයීම සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

### වැදගත් විමර්ශන ලිපි එකතු කිරීම සහ සූචියක් සකස් කිරීම

වැදගත් විමර්ශන ලිපි එකතු කිරීම සහ සූචිය සකස් කිරීම 2018 වර්ෂයේ දී අඛණ්ඩව සිදු කරන ලදී. විදුලි සංදේශ, සෞඛ්‍ය අධ්‍යාපනය, වැදගත් පුද්ගලයින්, පරිසරය, සමාජ විද්‍යාව, සමාජ මාධ්‍ය, විදුලි සංදේශ සේවා සපයන්නන්, සම්මන්ත්‍රණ තොරතුරු, නව නිෂ්පාදන, ජංගම දුරකථන, විදුලි සංදේශනය ආශ්‍රිත පාරිභෝගික ආරාවුල් වැනි වැදගත් අංශ සඳහා පුස්තකාලය සූචිගත කරන ලදී.

තවද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කෙමිෂන් සභාව. හා සම්බන්ධ සාමාන්‍ය ගැසට් නිවේදන සහ සෙසු විෂයයන් සඳහා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ සඳහා සූචිය සකස් කිරීමට පුස්තකාලය අවශ්‍ය පියවර ගන්නා ලදී.

### පූර්න පද්ධතිය සංවර්ධනය කිරීම

පුස්තකාල දත්ත ගබඩාව (PURNA) වෙබ් පාදක පද්ධතියක් බවට පරිවර්තනය කර ඇත. එය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පුස්තකාලයේ ඇති පුස්තකාල පොත්පත් සෙවීම සඳහා මාර්ගගත ප්‍රවේශය සපයයි.

**මාධ්‍ය ක්‍රියාකාරකම්**

කොමිෂන් සභාවේ සෑම අංශයක් සඳහාම මාධ්‍ය ඒකකය සෑම විටම මාධ්‍ය සහාය ලබා දෙයි. ඒ අනුව, 2018 දී මාධ්‍ය ඒකකය විසින් ආවරණය කරන ලද සිදුවීම් පහත පරිදි වේ;

**ජාත්‍යන්තර වැඩසටහන්**

- දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ කාර්ය කණ්ඩායම රැස්වීම.
- 15 වැනි ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ විදුලි සංදේශන / තොරතුරු සන්නිවේදන තාක්ෂණ සංවර්ධන සමුළුව.
- ජංගම දුරකථන පෞද්ගලික දත්තවල රහස්‍යභාවය සම්බන්ධ ප්‍රතිපත්ති පිළිබඳ GSMA පුහුණු පාඨමාලාව.
- "අන්තර්ජාලයේ දෑ" පිළිබඳ GSMA පුහුණු පාඨමාලාව.
- IP IP-MPLS මූලික ජාල තාක්ෂණයන් පිළිබඳ APT-APNIC පුහුණු පාඨමාලාව.
- තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා නවීන යෙදුම් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන.
- ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ලෝක විදුලි සංදේශ තොරතුරු සන්නිවේදන තාක්ෂණ දිනය 2018.

**දේශීය වැඩසටහන්**

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපති, ජනාධිපති ලේකම් වැඩ භාර ගැනීමේ උත්සවය.
- වෙසක් උත්සවය වෙනුවෙන් ආගමික වැඩසටහනක් පැවැත්වීම.
- පෞරුෂ සංවර්ධනය හා නායකත්ව පුහුණු වැඩසටහන.
- INFOTEL 2018 ප්‍රදර්ශනය.
- වාර්ෂික ක්‍රීඩා උත්සවය.

**වෙනත් වැඩසටහන්**

ලෝක විදුලි සංදේශ තොරතුරු සන්නිවේදන තාක්ෂණ දිනය WTISD-2018, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය, නවීන යෙදුම් සංවර්ධනය පිළිබඳ ITU-TRCSL පුහුණු වැඩසටහන වැනි නිල වැඩසටහන් සඳහා වාර්තාමය වීඩියෝ සකස් කිරීම සිදු කරන ලදී.

## මූල්‍ය අංශය



මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ සියළුම මූල්‍ය කටයුතු ආශ්‍රිත සියළුම කොමිෂන් සභා තීරණ ඇතුළු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය කළමණාකරනය සිදු කිරීමයි. ආදායම එකතු කිරීම සහ එම අරමුදල් නිසි පරිදි ආයෝජනය කරමින් ප්‍රශස්ත ආකාරයෙන් පරිහරණය කිරීම සෙසු ප්‍රධාන කාර්යයන් අතර වේ.එමෙන්ම මූල්‍ය රීති, චක්‍රලේඛ සහ කොමිෂන් සභා තීරණ වැනි අදාල නීති සහ රීති වැනි ව්‍යවස්ථාපිත රාමුව තුළ මුදල් පාලනය කිරීම සහ වියදම් කිරිම වැනි කටයුතු සිදු කිරීම මූල්‍ය අංශය විසින් සිදු කරනු ලැබේ.

එමෙන්ම කොමිෂන් සභාව විසින් මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රධාන තීරණ ගන්නා බැවින්, නිවැරදි මූල්‍ය වාර්තා පවත්වා ගැනීම මූල්‍ය අංශයේ ප්‍රධාන වගකීමක් වේ.සියළුම රාජ්‍ය ආයතන, සියළුම මූල්‍ය ප්‍රතිපත්ති රජයේ මූල්‍ය රෙගුලාසි වලට හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරන ආයතනය විසින් ප්‍රසිද්ධ කළ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට සහ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන බව සහතික කිරීම මෙන්ම ගණුදෙනුවල නිරවද්‍යතාවය සහ පරිපූර්ණත්වය තහවුරු කිරීම පිණිස මූල්‍ය වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා නීතියෙන්ම බැඳී සිටී. සමාලෝචන වර්ෂය තුළදී අප විසින් අපගේ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. මූල්‍ය කළමණාකරන අංශයේ කාර්යයන් ඓතිහාසික දත්ත වාර්තාකරණය සඳහා පමණක් සීමා නොවන අතර මූල්‍ය පරිපාලනය, පිරිවැය පාලනය, සංවර්ධන සැලසුම්කරණය සහ උපාය මාර්ගික තීරණ ගැනීම සහ සහභාගීවීම මෙම අංශය මගින් සිදු කරන වැදගත් කාර්යයන් වේ.

**කාර්යයන්**

- අයවැය/පුරෝකථනය සහ ඒ හා සමාන කාරණාවල විචලායයන්ට අනුව මූල්‍ය බලපෑම් වාර්තාකරණය කිරීම.
- වාර්ෂික අයවැය/පුරෝකථන පිළියෙල කිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධතිය ස්ථාපනය කිරීම සහ පවත්වාගෙනයාම.
- සියළුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා පවත්වාගෙනයාම සහ සේවා ප්‍රශස්ත ආකාරයෙන් පරිහරණය කිරීමට සහ ආරක්ෂා කිරීමට වගබලා ගැනීම.
- ප්‍රාග්ධන සහ ආදායම් වියදම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා ඉහල කළමණාකාරිත්වයට උපදෙස් ලබාදීම සහ සහායවීම.
- බදු සැලසුම්කරණය කිරීම මෙන්ම අදාල ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීම.
- විගණකාධිපති වාර්තා සහ විගණන කමිටු වාර්තා වැනි මූල්‍ය වාර්තා සහ කාලානුරූප මෙහෙයුම් සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම මෙන්ම අවශ්‍ය නම් අපගමනයන් නිවැරදි කිරීම සඳහා නිවැරදි/සුදුසු ක්‍රියාමාර්ග ගැනිම.
- රජය සහ පාර්ලිමේන්තු පනත මගින් පනවන විවිධ බදු කඩිනමින් එකතු කිරීමට වගබලා ගැනීම සහ ක්‍රියාමාර්ග ගැනීම.
- එකතු කරන ලද අරමුදල් කාර්යක්ෂමව සහ නිසි පරිදි මහා භාණ්ඩාගාරය සඳහා ප්‍රේෂණය කිරීමට වග බලා ගැනීම.
- අතිරික්ත අරමුදල් ඇත්නම් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අඩු අවදානමක් සහිත වැඩි ප්‍රතිලාභ ලබන ආයෝජනවල ප්‍රශස්ත ලෙස පරිහරණය කිරීමට වග බලා ගැනිම.
- කොමිෂන් සභාවේ කාරක හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
- ආදායම, වියදම, වත්කම් සහ වගකීම් පිළිබඳව මූල්‍යකරණය සහ සංඛ්‍යාලේඛන වාර්තා පවත්වාගෙනයාම මෙන්ම ඉහළ කළමණාකාරිත්වයට අවශ්‍ය වූ විට තොරතුරු සැපයීම.

**කාර්යසාධනය**

**ආදායම**

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධනය කරන ලද 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත මගින් කොමිෂන් සභාවේ ආදායම උපයා ගැනීම සහ රැස්කිරීමේ ව්‍යවස්ථාපිත බලතල පැවරී ඇත. ඒ අනුව කොමිෂන් සභාව විසින් ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු, බලපත්‍ර ගාස්තු, සෙස් ගාස්තු, පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු, වෙළඳ බලපත්‍ර ගාස්තු හා පොදු ස්විචීකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම් සහ ගුවන් විදුලි සංඛ්‍යාත පරිහරණය කරන්නන්ගේ ආදායම උපයා ගැනීම/එකතු කිරීම කරනු ලැබේ. වැඩිදුරටත්, කොමිෂන් සභාවේ ආදායම වසරින් වසර වැඩිවී ඇති අතර පහත වගුවෙන් එය දැක්වේ.

*වගුව 28: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආදායම 2016-2018*

| ආදායම් ප්‍රභවය | 2016 (රු. '000) | 2017 (රු '000) | 2018 (රු. '000) |
|---|---|---|---|
| පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු | 1,751,344 | 690,143 | 122,449 |
| සෙස් ගාස්තු | 4,067,179 | 4,211,920 | 4,550,706 |
| ගුවන් විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු | 7,496,093 | 6,861,209 | 10,789,520 |
| ගුවන් විදුලි සංඛ්‍යාත පූර්ව ගාස්තු | 367,347 | 4,509,184 | 1,071,429 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | 14,771 | 13,664 | 13,818 |
| ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | 73 | 29 | 164 |
| නැව් මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | 892 | 440 | 450 |
| ගුවන් යානා මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | 1,170 | 396 | 401 |
| රැහැන් රහිත දුරකථන වෙළඳ ගාස්තු | 90,760 | 109,217 | 114,619 |
| විභාග ගාස්තු | 417 | 458 | 368 |
| අයදුම්පත් සැකසීමේ ගාස්තු | 1,632 | 1,428 | 1,020 |
| කෙටි සංකේත ගාස්තු | 19,388 | 27,704 | 26,531 |
| විවිධ ආදායම් (ස්ථාවර තැන්පතු සහ කාර්ය මණ්ඩල ණය යනාදිය සඳහා පොලියෙන් ලැබෙන ආදායම) | 2,295,412 | 2,272,462 | 1,108,519 |
| එකතුව | **16,106,478** | **18,698,254** | **17,799,994** |

**විදුලි සංදේශ බදු**

2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතේ විධිවිධාන ප්‍රකාරව විදුලි සංදේශ සේවා සැපයීමේ වටිනාකම මත වර්තමාන විදුලි සංදේශ බදු ප්‍රමාණය 25% කි.

*ප්‍රස්ථාරය 10: විදුලි සංදේශ බද්ද 2016-2018 (රු. මිලියන)*



**සෙස් ගාස්තු**

කොමිෂන් සභාව විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ වාර්ෂික දළ පිරිවැටුම සඳහා 2% සෙස් ගාස්තුවක් අය කරන ලදී.

**ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගේ බදු**

ඉහත ආදායමට අමතරව, 2009 අංක 13 මුදල් පනත මගින් සංශෝධිත 2004 අංක 11 දරන මුදල් පනතට අනුව, කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු අය කරන ලදී. ඒ අනුව, කොමිෂන් සභාව මිනිත්තුවකට ඇමරිකානු ඩොලර් 0.06 ක් දේශීය ප්‍රවේශ ගාස්තු ලෙස එකතු කර ගත් අතර එයින් 50% ක් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලදී. ඉතිරි 50% ක් විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ලෙස රඳවාගෙන ඇත. මෙයට අමතරව, පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු ලෙස කොමිෂන් සභාව ජාත්‍යන්තර ඇමතුම් වලින් විනාඩියකට රු. 3.00 ක බද්දක් අය කළේය.

පහත දැක්වෙන වගුවේ දැක්වෙන්නේ පසුගිය වසර තුනක බදු ආදායම් රටාවයි.

*ප්‍රස්ථාරය 11: ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුගේ බදු 2016-2018 (රු. මිලියන)*



### ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මුළු ආදායම

කොමිෂන් සභාවේ මුළු ආදායම පහත සඳහන් ප්‍රභවයන් යටතේ එකතු කරන ලද ආදායමෙන් සමන්විත වේ.

(i) 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත

(ii) 2011 අංක 21 විදුලි සංදේශ බදු පනත

(iii) 2009 අංක 13 මුදල් පනතින් සංශෝධිත 2004 අංක 11 මුදල් පනත

*ප්‍රස්ථාරය 12: 2016 සිට 2018 දක්වා ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ මුළු ආදායම (රු.මිලියන)*




### ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය

පහත දැක්වෙන පරිදි රජයේ ආදායම ශක්තිමත් කිරීම සඳහා 2018 දී රුපියල් බිලියන 48 ක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රජයේ භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලදී.

*වගුව 29: ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය*

| විස්තරය | 2016 රු. බිලියන | 2017 රු. බිලියන | 2018 රු. බිලියන |
|---|---|---|---|
| විදුලි සංදේශ පනත/ශ්‍රී.ල.වි.ස.නි.කො.සභා අරමුදල | 28.00 | 22.80 | 21.85 |
| විදුලි සංදේශ බදු | 30.34 | 29.13 | 24.35 |
| විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව 50% | 4.34 | 3.11 | 2.79 |
| පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු බදු | 1.13 | 0.73 | 0.54 |
| ජංගම විදුලි සංදේශ ක්‍රියාකරු බදු | 0 | 0 | 0 |
| **එකතුව** | **63.81** | **55.77** | **49.53** |

### දේපළ, පිරියත සහ උපකරණ

වායුසමීකරණ, පරිගණක, වෙනත් කාර්යාල උපකරණ, ජංගම දුරකථන, කාර්යාලීය ගෘහ භාණ්ඩ සහ තාක්ෂණික උපකරණ මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 1.35 ක්, රුපියල් මිලියන 0.86 ක්, රුපියල් මිලියන 1.19 ක්, රුපියල් මිලියන 1.27 ක් සහ රුපියල් මිලියන 0.12 ක් වියදම් කර ඇත. 2018 වර්ෂය තුළ දේපල, පිරියත සහ උපකරණ සඳහා එකතු කළ රුපියල් මිලියන 4.89 කි.

**ආයෝජන**

කොමිෂන් සභාව මහජන බැංකුව සමඟ කොටස් වෙළඳපොළ දෛනික ගනුදෙනු ගිණුමක් පවත්වා ගෙන යන අතර 2018 වර්ෂය තුළ එම කොටස් වෙළඳපොළ ගනුදෙනු තුළින් රුපියල් මිලියන 384 ක පොලී ආදායමක් උපයා ඇත.

**කාර්යමණ්ඩලය**

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, මූල්‍ය අංශය අධ්‍යක්ෂවරුන් 01ක්, නියෝජ්‍ය අධ්‍යක්ෂක 01ක්, සහකාර ගණකාධිකාරී 01ක්, සංවර්ධන නිලධාරී 01ක්, කළමනාකරණ සහායකයින් 08ක්, තොරතුරු තාක්ෂණ සහකාර 01ක් සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 02කින් සමන්විත සමස්ථ සාමාජිකයින් 15 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

## තොරතුරු තාක්ෂණ ඒකකය

තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ ඒකකය නවතම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සක්‍රීය සේවා පරිසරයක් හඳුන්වා දුන් අතර කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට සහ ගනුදෙනුකරුවන්ට ක්‍රියාවලිය පහසු කිරීම පිණිස තොරතුරු තාක්‍ෂණය පදනම් කරගත් විසඳුම් ලබා දීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ විය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන්හි කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය සහතික කිරීම සහ තොරතුරු තාක්‍ෂණයේ උපායමාර්ගික භාවිතය තුළින් මෙහෙයුම් වැඩි දියුණු කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

**කාර්යයන්**

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා සංශෝධනය කිරීම.
- සහයෝගී කාර්යය පරිසරය සඳහා ප්‍රයෝජනවත් තොරතුරු නිෂ්පාදනය කිරීම පිණිස දත්ත කාර්යක්ෂමව සැකසීම සඳහා පරිගණකගත තොරතුරු පද්ධති හඳුන්වා දීම සහ පවත්වාගෙන යාම.
- සුදුසු දෘඩාංග, මෘදුකාංග, ජාලකරණ සහ සන්නිවේදන යටිතල පහසුකම් සැපයීම.
- ඉහළම මට්ටමේ දත්ත සුරක්ෂිතතාව, රහස්‍යභාවය, අඛණ්ඩතාව සහ ලබා ගත හැකි වීම.
- ආරක්ෂිත සහ විශ්වාසදායක පරිගණක පරිසරයක් සහතික කිරීම.
- පද්ධති ලබා ගැනීමේ හැකියාව සහ ප්‍රකෘතිමත්බව ඉහළ මට්ටමක පැවතීම.
- වෙබ් අඩවි අන්තර්ගතය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම පද්ධති ලබා ගැනීමේ හැකියාව සහ ප්‍රකෘතිය ඉහළ මට්ටමක පැවතීම.
- පද්ධති අවශ්‍යතා හඳුනාගෙන විසඳුම් ලබා දීම.
- අවම අක්‍රීයතාවයකින් මෘදුකාංග හා දෘඩාංග පද්ධති නඩත්තු කිරීම.
- කාර්ය මණ්ඩලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ධාරිතාව ගොඩනැගීම.

**ප්‍රගතිය**

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව කේන්ද්‍රගතව තොරතුරු සන්නිවේදන තාක්ෂණ පරිසරය නිවැරදි දිශාවට සැකසීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තිය අනිවාර්ය සාධකයකි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම 2018 දෙසැම්බර් මාසයේදී අවසන් කරන ලදී. අවසාන ප්‍රතිපත්තිය කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ.

ජාල පරිසරයට අනවසරයෙන් ප්‍රවේශ වීම, උපාංගවල අවදානම සහ වෛරස් ප්‍රහාර වලින් ආරක්ෂා කිරීමට මෙන්ම නුසුදුසු ක්‍රියාකාරකම් වලක්වා ගැනීම සඳහා කොමිෂන් සභාව ඉහළ මට්ටමේ ආරක්ෂක පද්ධතියක් ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජාල පරිසරය ආරක්ෂා කිරීම සඳහා ෆෝර්ටිගේට් 800 ඩී ආරක්ෂක පද්ධතිය (ෆයර්වෝල්) ජාලය තුළ ස්ථාපනය කරන ලදී. පසුගිය වසර කිහිපය තුළ, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජාල භාවිතා කරන්නන්ට අන්තර්ජාලය සඳහා පූර්ණ විවෘත ප්‍රවේශය හේතුවෙන් අඩු ජාල වේගයක් අත්විඳීමට සිදුවිය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ජාලය වේගවත් කිරීමට සමත් විය.

ජාල ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, ෆයර්වෝල් ලොග් පිරික්සීම, ආරක්ෂක සිදුවීම් සහ 24/7 කලාප පළල භාවිතය සඳහා ලොග් විශ්ලේෂණ කළමනාකරණ පද්ධතියක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආරක්ෂක පද්ධතියේ (ෆයර්වෝල්) සම්පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ෆෝර්ටි ඇනලයිසර් 400 ඊ ජාලය තුළ ස්ථාපනය කරන ලදී. ජාල වේගය සහ ධාරිතාව වැඩි කිරීම සඳහා, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජාලයට තර්ජනයක් වන බවට පිළිගත් අන්තර්ජාල සම්මුති (IP) ලිපින සහ වෙබ්අඩවි අවහිර කර ඇත.

ඔෆිස් 365 විශේෂාංග භාවිතය සහ කාර්ය මණ්ඩලයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ධාරිතාව වැඩි දියුණු කිරීම.

# අභ්‍යන්තර විගණන

සමාලෝචනය

අභ්‍යන්තර විගණන අංශය ස්වාධීනව ක්‍රියාකරන අංශයක් වන අතර එම අංශයේ අරමුණ වන්නේ නිර්දේශ පාදක කරගත් හෝ විදිමත් විශ්ලේෂණය සැපයීම සහ දත්ත සහ ව්‍යාපාරික ක්‍රියාවලිය තක්සේරු කිරීම මගින් ආයතනික පාලන ඵලදායීත්වය, ආපදා කළමනාකරණය සහ කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීම වැනි කරුණු වලට අනුගතව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ එහි පාර්ශවකරුවන්ගේ වටිනාකම එකතු කිරීමයි. එමෙන්ම මෙම අංශය මෙහෙයුම් කාර්යක්ෂමතාවය, මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය, වංචා වලට දඬුවම් ලබාදීම සහ විහර්හනය කිරීම, වත්කම් ආරක්ෂා කිරීම, අදාළ නීති සහ රීති වලට අනුකූලතාවය දැක්වීම වැනි එහි කාර්යභාරයන්හි නිරතව ක්‍රියා කරයි. අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා සෘජුවම කොමිෂන් සභාවට වාර්තා කරන අතර විගණන වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. පරිපාලනමය වශයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක අධ්‍යක්ෂ ජනරාල් වරයාට වාර්තා කළ යුතු වේ.

**කාර්යයන්**

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පවත්නා ගිනුම් තැබීම සහ වාර්තාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ඒවා සමාලෝචනය කිරීම සහ ඇගයීම
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් ගැටළු පැන නැගී තිබේ නම් ඒවාට අදාළ බලපෑම් විමර්ශනය කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වත්කම් අලාභහානීන් සහ වංචා වලින් ආරක්ෂ වී තිබේ දැයි නිශ්චිතව දැන ගැනීම
- ගණු දෙනු වල අවශ්‍යතාවය, ගණු දෙනු වල ප්‍රතිලාභ විමර්ශනය කිරීම සහ නාස්තිය සහ පමණ ඉක්මවා වියදම් කිරීම, ඉවත් කිරීම තුලින් වියදම් අඩු කිරීමේ වාර්තා පිළිබඳව ගවේශණය කිරීම.
- ඉහත දැක්වෙන ක්‍රියා මාර්ග තුලින් සොයා දැන ගන්නට ලැබෙන කරුණ පාදක කර ගනිමින් විගණන කමිටු වෙත වාර්තා ඉදිරිපත් කිරීම සහ විගණන කමිටු රැස්වීම් කැඳවීමට පියවර ගැනීම.
- විගණන කමිටු තීරණ සකස් කිරීම සහ අදාළ නිසි ක්‍රියාමාර්ග ගැනීම පිණිස ඒවා අංශ ප්‍රධානීන් අතර බෙදා හැරීම.
- විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම.
- අධ්‍යක්ෂ ජනරාල්/කොමිෂන් සභා සාමාජිකයින් ඉල්ලා සිටින විට විශේෂ විමර්ශන පැවැත්වීම.
- අධ්‍යක්ෂ ජනරාල්/කොමිෂන් සභාව විසින් කලින් කල පත් කරනු ලබන විවිධ කමිටු වලට සහාය වීම හා නිර්දේශ ලබාදීම.

**කාර්ය සාධනය**

2018 වර්ෂයේදී, විගණන කමිටු රැස්වීම් පහක් පවත්වා ඇති අතර, එම රැස්වීම් වලදී පහත සඳහන් කරුණු සාකච්ඡා කර ඇත.

ආවරණය වන විෂයය කරුණු පහත දැක්වේ.

**1. 2018 මාර්තු 27 දින පවත්වන ලද විගණන කමිටු රැස්වීම**

1.1 පහත දැක්වෙන වාර්තා / කරුණු සාකච්ඡා කර ඇති අතර ඒ සඳහා ගන්නා ලද තීරණ/ක්‍රියාමාර්ග මතු දැක්වේ.

| විෂයය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියාමාර්ග/තීරණ |
|---|---|
| නෙළුම් කුළුණ සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උද්‍යානයේ අභ්‍යන්තර විගණනය | • නෙළුම් කුළුණේ අභ්‍යන්තර විගණනය හා තොරතුරු තාක්ෂණ උද්‍යානය පිළිබඳ අභ්‍යන්තර පරීක්ෂණ පැවැත්වීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීම |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හිඟ මුදල් ගෙවීම | • 2018 වර්ෂය සඳහා ගාස්තු එකතු කිරීම සහ පෙර ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් පසු විපරම් කිරීමට උපදෙස් දීම |
| ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, අයවැය ප්‍රසම්පාදන සැලැස්ම | • නියමිත දින හෝ එදිනට පෙර සියළුම වාර්තා පිළියෙල කිරීම හා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට උපදෙස් දීම |
| 2016/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනත ප්‍රකාරව විගණකාධිපති විසින් නිකුත් කරන ලද 14(2) (C) වාර්තාව පිළියෙළ කිරීම | • මෙම කරුණට ප්‍රමුඛතාවය ලබාදෙමින් නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම |
| කදිරාන පරිශ්‍රයේ ලිපිගොනු ගබඩා කිරීම | • ක්‍රියාවලිය කඩිනම් කිරීම සහ මීලඟ රැස්වීමේදි ප්‍රගතිය වාර්තා කිරීම. |
| විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම් | • දෝෂ නිවැරදි කිරීමට පියවර ගැනීම |

## 2. 2018 ජුනි 05 දින පවත්වන ලද විගණන කමිටු රැස්වීම

2.1 පහත දැක්වෙන වාර්තා/කරුණු සාකච්ඡා කර ඇති අතර ඒ සඳහා ගන්නා ලද තීරණ/ක්‍රියාමාර්ග මතු දැක්වේ.

| විෂයය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියාමාර්ග/ තීරණ |
|---|---|
| නෙළුම් කුළුණ සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උද්‍යානයේ අභ්‍යන්තර විගණනය | • නෙළුම් කුළුණේ අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හිග මුදල් ගෙවීම | • වර්තමානයේ පවතින හිග මුදල් එකතු කිරීම හා පසුවිපරම් කිරීම. |
| ආයතනික සැලැස්ම, ක්‍රියාකාරි සැලැස්ම, අයවැය ප්‍රසම්පාදන සැලැස්ම | • නියමිත දින හෝ එදිනට පෙර සියළුම වාර්තා පිළියෙල කිරීම.<br>• අනුමත සේවක සංඛ්‍යාව, ආයතනික ව්‍යුහය සහ බඳවා ගැනීමේ පටිපාටිය සමාලෝචනය කිරිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිම |
| 2016/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 1971 අංක 38 මුදල් පනත ප්‍රකාරව විගණකාධිපති විසින් නිකුත් කරන ලද 14(2)(C) වර්තාව පිළියෙළ කිරීම | • අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කරන ලෙස අදාළ සියලුම අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම |
| කදිරාන පරිශ්‍රයේ ලිපිගොනු ගබඩා කිරීම | • මීලඟ විගණන කමිටු රැස්වීමට ප්‍රගතිය දැනුම්දීම |
| විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම් | • විගණකාධිපතිවරයා වෙත පිළිතුරු යැවීම කඩිනම් කිරිම. |
| වාහන ණය පරික්ෂා කිරීම | • වාහන ණය වක්‍රලේඛය නැවත පරීක්ෂා කිරීම හා සංශෝධනය කිරීම |

**3 2018 අගෝස්තු 28 දින පවත්වන ලද විගණන කමිටු රැස්වීම**

3.1 පහත දැක්වෙන වාර්තා/කරුණු සාකච්ඡා කර ඇති අතර ඒ සඳහා ගන්නා ලද තීරණ/ක්‍රියාමාර්ග මතු දැක්වේ.

| විෂයය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියාමාර්ග/ තීරණ |
|---|---|
| නෙළුම් කුළුණ සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උද්‍යානයේ අභ්‍යන්තර විගණනය | • නව තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් කොමිෂන් සභාව වෙත තක්සේරු වාර්තා ඉදිරිපත් කිරීම |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හිඟ මුදල් ගෙවීම | • ශ්‍රී.ල.ගු.වි.සංස්ථාවේ හිඟ මුදල් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම හා වාර්තාව ඉදිරිපත් කිරීම |
| ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, අයවැය ප්‍රසම්පාදන සැලැස්ම | • ශ්‍රී.ල.වි.ස.නි කොමිෂන් සභාවේ දැනට පවතින තනතුරු පුරප්පාඩු සහ අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම |
| 2016/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 1971 අංක 38 මුදල් පනත ප්‍රකාරව විගණකාධිපති විසින් නිකුත් කරන ලද 14(2) (C) වාර්තාව පිළියෙළ කිරීම | • පාර්ලිමේන්තු කාරක සභාවේදී ඉදිරිපත් කළයුතු අදාළ තොරතුරු සකස් කිරීමට උපදෙස් දීම |
| කදිරාන පරිශ්‍රයේ ලිපිගොනු ගබඩා කිරීම | • ලිපිගොනු ගබඩා කිරීම සඳහා නිවැරදි ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම |
| වාහන ණය පරීක්ෂා කිරීම | • විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහිලා කටයුතු කිරීම |
| ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයෝජන වාර්තාව | • මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ගැනීම |
| විගණකාධිපතිවරයාගෙන් ලැබුණු විගණන විමසුම | • විගණන විමසුම් සම්බන්ධයෙන් පිළිතුරු සැපයීම පිණිස කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය වන්නේ නම් ඉල්ලීම ලිඛිතව ඉදිරිපත් කිරීම |

**4. 2018 ඔක්තෝම්බර් 11 දින පවත්වන ලද විගණන කමිටු රැස්වීම**

4.1 පහත දැක්වෙන වාර්තා/කරුණු සාකච්ඡා කර ඇති අතර ඒ සඳහා ගන්නා ලද තීරණ/ක්‍රියාමාර්ග මතු දැක්වේ.

| විෂයය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියාමාර්ග/තීරණ |
|---|---|
| නෙළුම් කුළුණ සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උද්‍යානයේ අභ්‍යන්තර විගණනය | • කොළඹ නෙළුම් කුළුණේ ඉංජිනේරුමය විගණනය/විශේෂ විගණනය සිදුකිරීමට ජාතික විගණන කාර්යාලය එකඟ වී ඇත<br>• තොරතුරු තාක්ෂණ උද්‍යානය පිළිබඳ අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීම |
| ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හිඟ මුදල් ගෙවීම | • 2017 වසරේ සිට පවතින හිඟ මුදල් සමථයකට පත්කර අයකරන තෙක් ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කිරීම |
| ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, අයවැය ප්‍රසම්පාදන සැලැස්ම | • අනුමත සේවක සංඛ්‍යාව, ආයතනික ව්‍යුහය සහ ශ්‍රී.ල.වි.ස.නි.කො සභාවේ බඳවාගැනීමේ පටිපාටිය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් කමිටුවක් පත් කිරීම |
| කදිරාන පරිශ්‍රයේ ලිපිගොනු ගබඩා කිරීම | • කදිරාන පරිශ්‍රයේ ලිපිගොනු ගබඩාකිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු නිවැරැදි කිරීම සඳහා පියවර ගැනීම සහ කඩිනම්ව ක්‍රියාත්මක කිරීම. |
| වාහන ණය පරීක්ෂා කිරීම | • වාහන ණය චක්‍රලේඛය නැවත බැලීම සහ සංශෝධනය කිරීම |
| ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයෝජන වාර්තාව. | • මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව වාර්තාව ඉදිරිපත් කිරීම. |
| වැටුප් හා පාරිශ්‍රමික ගෙවීම | • කලින් කලට වැටුප් ලේඛනයේ කාලානුරූප අතිරේක පිටපතක් (backup) පවත්වාගෙන යාම. |
| 2016/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 1971 අංක 38 මුදල් පනත ප්‍රකාරව විගණකාධිපති විසින් නිකුත් කරන ලද 14(2) (C) වර්තාව පිලියෙළ කිරීම. | • විගණකාධිපතිවරයා විසින් විමසන ලද කරුණු පිළිබඳ ගන්නා ලද ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කටයුතු කිරීම. |

4.2 කමිටුව විසින් සාකච්ඡා කරන ලද වෙනත් කරුණු.

- 2019 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වැඩසටහන
- 2019 අභ්‍යන්තර විගණන සැලැස්ම

## 5. 2018 දෙසැම්බර් දින පවත්වන ලද විගණන කමිටු රැස්වීම

5.1 පහත දැක්වෙන වාර්තා/කරුණු සාකච්ඡා කර ඇති අතර ඒ සඳහා ගන්නා ලද තීරණ/ක්‍රියාමාර්ග මතු දැක්වේ.

| විෂයය ක්ෂේත්‍රය | ගන්නා ලද ක්‍රියාමාර්ග/ තීරණ |
|---|---|
| කොළඹ නෙළුම් කුළුණේ ඉන්ජිනේරු විගණනය | • ජාතික විගණන කාර්යාලය විසින් ඉන්ජිනේරු විගණන සිදුකිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත |
| ආයතනික සැලැස්ම, ක්‍රියාකාරි සැලැස්ම, අයවැය ප්‍රසම්පාදන සැලැස්ම | • නියමිත දින හෝ එදිනට පෙර සියළුම වාර්තාවන් පිළියෙල කිරීම සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම.<br>• අනුමත සේවක සංඛ්‍යාව, සංවිධාන ව්‍යූහය සහ ශ්‍රී.ල.වි.ස.නි.කො සභාවේ බඳවාගැනීමේ පටිපාටිය සමාලෝචනය කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ ප්‍රගතිය දැනුම්දීම |
| 2016/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය පිළිබඳව 1971 අංක 38 මුදල් පනත ප්‍රකාරව විගණකාධිපති විසින් නිකුත් කරන ලද 14(2) (C) වර්තාව පිළියෙළ කිරීම | • පිළිතුරු පදනම් කරගෙන වාර්තාවක් පිළියෙල කිරීම සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම්දීම<br>• පාර්ලිමේන්තු කාරක සභාව වෙත ඉදිරිපත් කළයුතු අදාල තොරතුරු පිළියෙල කිරීම |
| කදිරාන පරිශ්‍රයේ ලිපිගොනු ගබඩා කිරීම | • මීලඟ විගණන කමිටුව වෙත ප්‍රගතිය දැනුම්දීම |
| වාහන ණය පරීක්ෂා කිරීම | • විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කටයුතු කිරීම<br>• වාහන ණය චක්‍රලේඛණය නැවත පරීක්ෂා කිරීම සහ සංශෝධනය කිරීම සඳහා පත්කරන ලද කමිටුව විසින් දෙන ලද අදහස් සම්බන්ධයෙන් කටයුතු කිරීම |
| ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආයෝජන වාර්තාව | • භාණ්ඩාගාර නිලධාරීන් සමඟ සාකච්ජා කිරීමෙන් අනතුරුව වාර්තාවක් ඉදිරිපත් කිරීම. |
| 2017/2018 විදුලි සංදේශ බදු ලැබීම් සහ ගෙවීම් | • වසරක පරිවාස කාලයේ බලපත්‍ර කොන්දේසිය වෙනස් කිරීම |
| විගණකාධිපතිගෙන් ලැබුණු විගණන විමසුම් | • මොරටුව විශ්ව විද්‍යාලය වෙත ගෙවන උපදේශක ගාස්තු සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම. |

# මූල්‍ය ප්‍රකාශනය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

**මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශනය**

**2018 දෙසැම්බර් 31 වන දිනට**

***(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)***

| | සටහන් | 31.12.2018 | 31.12.2017 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | **4** | 12,175,521,837 | 12,259,643,187 |
| අස්පෘශ්‍ය වත්කම් | **4.1** | 2,277,255 | 8,554,187 |
| නොනිමි වැඩ | **5** | 17,803,105,479 | 14,845,511,880 |
| ආයෝජන | **6** | 354,000,000 | 6,221,020,046 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **30,334,904,571** | **33,334,729,300** |
| **ජංගම වත්කම්** | | | |
| ලැබිය යුතු ගිණුම් | **7** | 3,813,836,424 | 6,339,021,114 |
| පෙර ගෙවීම් සහ අත්තිකාරම් | **8** | 581,638,428 | 990,118,972 |
| ණය සහ වෙනත් ලැබිය යුතු දෑ | **9** | 262,911,918 | 156,426,841 |
| මුදල් හා මුදල් සමාන දෑ | **10** | 3,647,565,507 | 5,624,491,369 |
| **මුළු ජංගම වත්කම්** | | **8,305,952,278** | **13,110,058,296** |
| **මුළු වත්කම්** | | **38,640,856,849** | **46,444,787,596** |
| **ස්කන්ධ සහ බැරකම්** | | | |
| **ස්කන්ධ** | | | |
| රජයේ දායකත්ව | **11** | 526,214,744 | 526,214,744 |
| සමුච්චිත අතිරික්තය | | 10,568,790,416 | 16,745,580,058 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 37,380,000 | 37,380,000 |
| **මුළු ස්කන්ධ** | | **11,132,385,160** | **17,309,174,802** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙළුම් කුළුණ) | | 7,436,902,525 | 7,588,440,328 |
| රඳවාගැනීම් | **12** | 46,152,801 | 46,152,801 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | **13** | 14,042,084 | 6,363,007 |
| නාගරික සංවර්ධන අධිකාරිය | | 9,450,000,000 | 9,450,000,000 |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **16,947,097,410** | **17,090,956,137** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**මූල්‍ය තත්ව පිළිබඳ ප්‍රකාශනය**
2018 දෙසැම්බර් 31 වන දිනට
*(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)* *(ඉදිරියට...)*

| | සටහන් | 31.12.2018 | 31.12.2017 |
|---|---|---|---|
| **ජංගම බැරකම්** | | | |
| ගෙවිය යුතු ගිණුම් | **14** | 1,934,110,203 | 180,850,917 |
| අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවීම් | **15** | 5,222,557,527 | 9,719,439,458 |
| භාණ්ඩාගාරයට ගෙවීම් | **16** | 1,497,163,849 | 2,144,366,283 |
| නෙළුම් කුළුණේ ප්‍රමාද හානි | | 1,907,542,700 | 0 |
| **මුළු ජංගම බැරකම්** | | **10,561,374,279** | **12,044,656,658** |
| **මුළු බැරකම්** | | **27,508,471,689** | **29,135,612,794** |
| **මුළු ස්කන්ධ සහ බැරකම්** | | **38,640,856,849** | **46,444,787,596** |

06 පිටුවේ සිට 28 පිටුව දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශනවලට වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටස් වේ. කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2018 දෙසැම්බර් 31 වනදාට පැවති තත්වය පිළිබඳව සහ අවසන් වූ කාල සීමාව සඳහා වන අතිරික්තය පිළිබඳව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන බව සහතික කරමි.

........................
**එම්.කේ.ජයන්ත**
**අධ්‍යක්ෂ -මුදල්**

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව කොමිෂන් සභාව වගකීම දරයි. කොමිෂන් සභාව වෙනුවෙන් අනුමත කොට අත්සන් කළේ:

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| **උදය ආර්. සෙනෙවිරත්න** | **ජී.බී.කේ. පෙරේරා** | **පී.ආර්.එස්.පී. ජයතිලක** |
| **සභාපති** | **කොමිෂන් සභාවේ සාමාජික** | **අධ්‍යක්ෂ ජනරාල්** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

**2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා ලාභ සහ පාඩු හා වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය**

***(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)***

| | සටහන් | 31.12.2018 | 31.12.2017 |
|---|---|---|---|
| ආදායම | | | |
| ආදායම | **17** | 48,032,936,440 | 54,368,045,117 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | **48,032,936,440** | **54,368,045,117** |
| අඩු කළා: නියාමන වියදම් | **18** | (82,245,610) | (66,857,614) |
| **ශුද්ධ මුළු මෙහෙයුම් ආදායම** | | **47,950,690,830** | **54,301,187,503** |
| අඩු කළා: **වෙනත් වියදම්** | | | |
| පරිපාලන හා ආයතන වියදම් | **19** | 611,910,909 | 608,717,107 |
| මූල්‍ය හා වෙනත් | **20** | 4,522,806 | 4,174,491 |
| බොල් ණයකරුවන් සඳහා ප්‍රතිපාදන | | 1,308,496 | 30,355,765 |
| විදේශ විනිමය ගනුදෙනු (ලැබීම)/පාඩුව | | 1,626,395,795 | 81,468,932 |
| **මුළු වියදම** | | **2,244,138,006** | **724,716,294** |
| **ආදායම් බදුවලට පෙර අඛණ්ඩ මෙහෙයුම් වෙතින් වසරේ ලාභය** | | **45,706,552,824** | **53,576,471,208** |
| අඩු කළා: ආදායම් බදු | | (2,349,240,362) | (536,435,813) |
| **ආදායම් බදුවලට පසු අඛණ්ඩ මෙහෙයුම් වෙතින් වසරේ ලාභය** | | **43,357,312,462** | **53,040,035,396** |
| **වෙනත් විස්තීර්ණ ආදායම** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් ලැබීම්/(පාඩු) | | (5,056,066) | 822,371 |
| **වෙනත් මුළු විස්තීර්ණ ආදායම** | | **(5,056,066)** | **822,371** |
| **බදුවලින් පසු වෙනත් මුළු විස්තීර්ණ ආදායම** | | **43,352,256,396** | **53,040,857,767** |
| අඩු කළා: ඒකාබද්ධ අරමුදලට දායකත්වය | **21-1** | (34,529,046,037) | (40,773,094,840) |
| **ඒකාබද්ධ අරමුදලට දායකත්වය ලබාදීමෙන් පසු මුළු විස්තීර්ණ ආදායම** | | **8,823,210,358** | **12,267,762,927** |
| එක් කළා: | | | |
| **ඉදිරියට ගෙන ආ මුළු විස්තීර්ණ ආදායම** | | **16,745,580,058** | **19,477,817,131** |
| අඩු කළා: ඒකාබද්ධ අරමුදලට දායකත්වය | **21-2** | (15,000,000,000) | (15,000,000,000) |
| | | **1,745,580,058** | **4,477,817,131** |
| **ඉදිරියට ගෙන ආ මුළු විස්තීර්ණ ආදායම** | | **10,568,790,416** | **16,745,580,058** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**
**2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**
***(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)***

| | සටහන | 31.12.2018 | 31.12.2017 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| මෙහෙයුම්වලින් උත්පාදිත මුදල් | **22** | 45,293,062,841 | 57,033,902,511 |
| ගෙවන ලද බදු | | (565,611,140) | (877,002,035) |
| ගෙවූ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | | (4,635,950) | (5,433,812) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **44,722,815,751** | **56,151,466,663** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| දේපල, අංගන හා උපකරණ මිලදී ගැනීම | | (4,897,318) | (11,225,556) |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම | | (3,530,936) | (9,495,150) |
| නොනිමි වැඩ යටතේ ඇති ව්‍යාපෘති | | (2,957,593,599) | (3,543,593,237) |
| නැවත මිලදී ගැනීමේ ගිවිසුම යටතේ ස්ථාවර තැන්පතු සහ රාජ්‍ය සුරැකුම්පත් තුළ ශුද්ධ ආයෝජනය | | 5,867,020,046 | (5,863,922,642) |
| ස්ථාවර තැන්පතු- පාරිතෝෂික බැඳීම් තුළ ආයෝජනය | | (900,000) | (2,600,000) |
| ස්ථාවර තැන්පතු -පාරිතෝෂික බැඳීම් වෙතින් පොළී ආදායම | | 806,301 | 5,589,452 |
| නැවත මිලදී ගැනීමේ ගිවිසුම යටතේ රජයේ සුරැකුම්පත් වෙතින් වන පොළී ආදායම | | 683,832,865 | 2,027,097,093 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළ භාවිත ශුද්ධ මුදල්** | | **3,584,737,359** | **(7,398,150,041)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | | |
| සේවා යෙදවීමේ අත්තිකාරම් ගෙවීම් | | 502,589,529 | 331,970,177 |
| මුදල් වෙළෙඳපොළ ගනුදෙනු වෙතින් පොළී ආදායම | | 384,498,838 | 209,981,046 |
| ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය | | (49,529,046,037) | (55,773,094,840) |
| ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙළුම් කුළුණ) | | (1,659,286,484) | 953,639,281 |
| රඳවාගැනීම් | | 0 | (833,045,497) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළ භාවිත ශුද්ධ මුදල්** | | **(50,301,244,155)** | **(55,110,549,832)** |
| **මුදල් සහ මුදලට සමාන දේවල ශුද්ධ (අඩුවීම) / වැඩි වීම** | | **(1,993,691,045)** | **(6,357,233,210)** |
| **මුදල් හා මුදල් සමාන දෑවල සංචලනය** | | | |
| 2018 ජනවාරි 01 වන දිනට | | 5,624,491,369 | 12,063,193,512 |
| (අඩුවීම)/ වැඩිවීම | | (1,993,691,045) | (6,357,233,210) |
| මුදල් හා මුදල් සමාන දෑ මත (පාඩු)/ ලාභ හුවමාරුව | | 16,765,184 | (81,468,932) |
| 2018 දෙසැම්බර් 31 වන දිනට | | **3,647,565,507** | **5,624,491,369** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**සමානුපාත වෙනස්කම් ප්‍රකාශනය**
**2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා**
***(ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)***

| | **රජයේ දායකත්ව** | **ප්‍රත්‍යාගණන අතිරික්තය** | **සමුච්චිත අතිරික්තය / (ඌනතාව)** | **මුළු සමානුපාත** |
|---|---|---|---|---|
| **2017 ජනවාරි 01 වන දිනට** | 526,214,744 | 37,380,000 | 19,477,817,132 | 20,041,411,876 |
| අඩු කළා: ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම | 0 | 0 | (15,000,000,000) | (15,000,000,000) |
| | **526,214,744** | **37,380,000** | **4,477,817,132** | **5,041,411,876** |
| 2017 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | 0 | 0 | 12,267,762,927 | 12,267,762,927 |
| **2017 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **526,214,744** | **37,380,000** | **16,745,580,059** | **17,309,174,803** |
| | | | | |
| **2018 ජනවාරි 01 වන දිනට ශේෂය** | 526,214,744 | 37,380,000 | 16,745,580,059 | 17,309,174,803 |
| අඩු කළා: ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම | - | - | (15,000,000,000) | (15,000,000,000) |
| | **526,214,744** | **37,380,000** | **1,745,580,059** | **2,309,174,803** |
| 2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | - | - | 8,823,210,358 | 8,823,210,358 |
| **2018 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | **526,214,744** | **37,380,000** | **10,568,790,416** | **11,132,385,160** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 31.12.2018**

**(විශේෂයන් සඳහන් කොට ඇත්තේ නම් මිස සටහන් තුළ සියලුම මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)**

**1. සාමාන්‍ය තොරතුරු**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව යනු, 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත මගින් සංශෝධනය වූ 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ පිහිටුවන ලද, විදුලි සංදේශ අංශය නියාමනය කිරීම සඳහා පිහිටුවන ලද ස්වාධීන ආයතනයකි.

කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්යාලය අංක 276, ඇල්විටිගල මාවත, කොලඹ 8 යන ලිපිනයේ පිහිටා ඇත.

පනත තුළ දක්වා ඇති පරිදි කොමිෂන් සභාව විසින් සිදු කරන කාර්යයන් පහත පරිදි වේ:

කොමිෂන් සභාව විසින් පනත යටතේ ජාතික වැදගත්කම ප්‍රවර්ධනය කරන ආකාරයෙන් එහි බලතල ක්‍රියාත්මක කළ යුතු අතර විශේෂයෙන්

(a) ජාතික අභිවෘද්ධියට හේතුවෙන හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, දුරකථන නාමාවලී තොරතුරු සේවා, සමුද්‍රීය සේවා සහ ග්‍රාමීය සේවා වැනි සේවාවන්වල අවශ්‍යතාවයන් සපුරමින් ශ්‍රී ලංකාව තුළ දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සාධාරණව හා කාර්යක්ෂමව සැපයීමට වගබලාගැනීම

(b) (අ) ඡේදයේ සාමාන්‍ය තත්වයට අගතියක් නොවන පරිදි, සෑම ක්‍රියාකරුවෙකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමනාකරණ සම්පත් ඇති බවට සහ ඔවුන් විසින් ඒවා යොදාගනු ලබන බවට වගබලා ගැනීම.

(c) අය කරනු ලබන ගාස්තු සහසපයනු ලබන විදුලි සංදේශ සේවාවන් මෙන්ම විදුලි සංදේශ උපකරණවල තත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පරිශීලකයින්ගේ සම්බන්ධතාවන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(d) විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතුවල නිරත තැනැත්තන් අතර ඵලදායී තරගකාරීත්වයක් පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාව සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.

(e) අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳව ශීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

(f) අනවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරතාවයන්ගෙන් තොරව විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමේ තම වගකීම් ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.

(g) විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම පිළිබඳව පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඒ නව තාක්ෂණික ක්‍රම වැඩි දියුණු කර ඒවා භාවිතා කිරීම.

(h) ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති, විදුලි සංදේශ සේවා බහුල වශයෙන් භාවිතා කරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම පිණිස දිරි ගැන්වීම

(i) ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම

**2. සැකසීමේ පදනම**

කොමිෂන් සභාව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට සහ 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත පනත අනුව තම මූල්‍ය ප්‍රකාශන සකසනු ලබයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල නව වෙළුමක් නිකුත් කරන ලද අතර 2012 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන වසර සඳහා ඒවා අදාළ කරගත යුතුය.

**3. ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය**

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා අදාළ කරගනු ලැබූ ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

වෙනත් ලෙසකින් දක්වා නොමැති නම් මිස මෙම ප්‍රතිපත්ති, ඉදිරිපත් කර ඇති වසර සඳහා යොදාගෙන ඇත.

**3.1 සැකසීමේ පදනම**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව සකසා ඇත. මූල්‍ය ප්‍රකාශන සකසා ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම්ව සකසා ඇත. මෙම ගිණුම්වලට බලපාන උද්ධමනකාරී සාධක සඳහා ගැලපුම් කර නැත.

**3.1.1 ශේෂ පත්‍රය සැකසීමෙන් පසු සිදුවීම්**

ශේෂ පත්‍රයට පසු සිදුවූ සියලු ද්‍රව්‍යාත්මක සිදුවීම් සලකා බලා ඇති අතර ගිණුම්වල අවශ්‍ය ස්ථානවල නිසි ගැලපුම් සිදු කර ඇත.

**3.1.2 විදේශ විනිමය පරිවර්තනය කිරීම**

සියලු විදේශ මුදල්, ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පැවති විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට හරවා ඇත. විදේශ මුදල්වලින් ඇති වත්කම් සහ වගකීම් ශේෂ පත්‍ර දිනයට පැවති විනිමය අනුපාතයන් අනුව පරිවර්තනය කර ඇත. ආදායම් සහ වියදම් ගිණුම තුළ ලාභ සහ පාඩු දක්වා ඇත.

**3.2 වත්කම් සහ වත්කම් තක්සේරු කිරීමේ පදනම**

**3.2.1 දේපළ, පිරියත සහ උපකරණ**

**(අ) හඳුනාගැනීම් මැනුම**

සියලුම දේපළ, පිරියත සහ උපකරණ, සමුච්චිත ක්ෂයවීම් අඩු කළ පිරිවැය හෝ අපහායන හානි මගින් දක්වා ඇත. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැයට, ඒවා මිලදී ගත් මිල සහ එම වත්කම අපේක්ෂා

කරන ප්‍රයෝජනය ලබාගැනීමට නිසි තත්වයට ගෙන ඒමට වැය කළ පිරිවැය සහ සෘජුවම සම්බන්ධ පිරිවැය ඇතුළත් වෙයි.

කොමිෂන් සභාවට අනාගත ආර්ථික ප්‍රතිලාභ ලැබෙන අයුරින් ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීම හෝ වැඩි දියුණු කිරීම සඳහා වැය වූ පසු පිරිවැය ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත. මාරුකළ කොටස්වල ධාරක අගය ශේෂ පත්‍රයෙන් ඉවත් කර ඇත. සියලුම අනෙකුත් අලුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සඳහා වන වැයවීම ඒවා සිදුවූ මූල්‍ය වසරවල විස්තීර්ණ ආදායමෙන් අයකරගෙන ඇත.

**(ආ) ක්ෂය වීම**

ඉඩම් ක්ෂය වීමට ලක් කර නැත. දේපළ, පිරියත සහ උපකරණයක එක් එක් කොටසේ ඇස්තමේන්තුගත ඵලදායී ආයුකාලය පුරා සරල රේඛීය පදනම මත ලාභයේ හෝ පාඩුවේ ක්ෂයවිම හඳුනා ගනු ලබයි. අත්පත් කරගන්නා වසර තුළ, ක්ෂයවීම ගණනය කෙරෙන්නේ වත්කම භාවිතයට ගත් මාසයේ සිට සමානුපාතික පදනමින් වන අතර එම නිශ්චිත වත්කම අපහරණය කළ මාසයට ක්ෂය වීම ගණනය නොකෙරේ.

**(ඇ) ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාල පහත දැක්වේ.**

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 ට වැඩි |
| විදුලි සංදේශ කුළුණු | වසර 10 ට වැඩි |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | වසර 10 ට වැඩි |
| කාර්යාල උපකරණ | වසර 10 ට වැඩි |
| පරිගණක | වසර 04 ට වැඩි |
| වායු සමීකරණ | වසර 10 ට වැඩි |
| මෝටර් වාහන | වසර 08 ට වැඩි |
| විදුලි ජනක යන්ත්‍ර | වසර 10 ට වැඩි |
| විදුලි සෝපාන | වසර 10 ට වැඩි |
| කාර්යාල දුරකථන | වසර 10 ට වැඩි |
| කාර්යාල ගෘහභාණ්ඩ | වසර 10 ට වැඩි |
| තාක්ෂණික උපකරණ | වසර 10 ට වැඩි |
| වෙබ් සර්වරය | වසර 04ට වැඩි |
| ක්‍රීඩාගාර උපකරණ | වසර 04 ට වැඩි |
| වීඩියෝ ඒකකයේ උපකරණ | වසර 04 ට වැඩි |

**(ඇ) අස්පෘශ්‍ය වත්කම්**

අත්පත් කරගැනීමට සහ නිශ්චිත මෘදුකාංගය භාවිතයට ගෙන ඒම සඳහා වැය වූ පිරිවැය මත අත්පත්කරගත් පරිගණක මෘදුකාංග ප්‍රාග්ධනකරණය කර ඇත. එම පිරිවැය එක් වසරක ඵලදායි ආයුකාලය තුළ ක්‍රමක්ෂය කර ඇත.

**(ඉ) නොනිමි ප්‍රාග්ධන වැඩ**

නොනිමි ප්‍රාග්ධන වැඩ පිරිවැයක් ලෙස දක්වා ඇත. මේවා නම් ප්‍රාග්ධනිතකරණය සිදු කිරීමට ඇති ගොඩනැගිලි, සහ පද්ධති සංවර්ධනය තුළ ඍජුව සිදුවන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම්ය.

**(ඊ) ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම**

දේපළ, පිරියත සහ උපකරණවල අයිතමයක ධාරක අගය අපහරණයේදී ශේෂ පත්‍රයෙන් ඉවත් කෙරේ. දේපළ, පිරියත සහ උපකරණවල අයිතමයක් අපහරණයේදී ලැබෙන ලාභ සහ පාඩු තීරණය කෙරෙනුයේ දේපළ, පිරියත සහ උපකරණවල ධාරක අගය සමග අපහරණයේදී වැය වන මුදල සමග සන්සන්දය කිරීමෙන් වන අතර ලාභයේ හෝ පාඩුවේ "වෙනත් ආදායම්" තුළ හඳුනාගනු ලැබේ

**3.2 2 ආයෝජන**

ආයෝජනවලට ඇතුළත් වන්නේ, මාස තුනකට අඩු කාලයක් රඳවාගත් ස්ථාවර තැන්පතු හා මුදල් වෙළෙඳපොළ ආයෝජන පමණි. මෙම ආයෝජන ප්‍රකාශ කර ඇත්තේ වසර අවසානය දක්වා පිරිවැය සහ උපචිත පොළිය ලෙසයි. එබැවින්, මූල්‍ය වසර අවසානයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නිරාවරණය වූ මූල්‍ය උපකරණ පිළිබඳ අවදානමක් නොමැත.

**3.2.3 ලැබිය යුතු ගිණුම්**

ලැබිය යුතු ගිණුම් හඳුනාගෙන ඇත්තේ මුල් ඉන්වොයිසිවල අගයන් අනුව හා එකතු නොකළ මුදල් අනුවයි. සම්පූර්ණ මුදල් එකතු කරගැනීමට තවදුරටත් හැකියාව නොමැති විට අඩමාණ ලැබීම් පිළිබඳ තක්සේරුවක් සිදු කර ඇත.

**3.2.4 පෙර ගෙවීම් සහ අත්තිකාරම්**

(a) නෙළුම් කුළුණ 2019 වසරේදී සම්පූර්ණ කිරීමට අදහස් කෙරේ.

(b) තොරතුරු තාක්ෂණ උද්‍යානයේ බේරුම්කරණ ක්‍රියාවලිය ICTAD කොන්දේසි අනුව දින 84 ක් තුළ අවසානාත්මක කළ යුතුය.

**3.2.5 මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් හා මුදල් සමාන දෑවලට, අතැති මුදල් හ බැංකු තැන්පතු අයත් වේ.

**3.3 බැරකම් සහ ප්‍රතිපාදන:**

ශේෂ පත්‍රයට අනුව සියලුම ද්‍රව්‍යාත්මක බැරකම් මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කර ඇති අතර පවතින බවට පෙනී යන, එහෙත් නිවැරදිවම තීරණය කළ නොහැකි බැරකම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

ඉල්ලීම මත හෝ මූල්‍ය තත්ව ප්‍රකාශයේ සිට වසරක් ඇතුළත ලැබිය යුතු බැදීම්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම බැරකම් ලෙස සැලකේ. මූල්‍ය තත්ව ප්‍රකාශයෙන් වසරකට පසු ලැබිය යුතු බැදීම්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන බැරකම් ලෙස සැලකේ.

### 3.3.1 ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිතතා

ශේෂ පත්‍රයේ දිනය අනුව ප්‍රාග්ධන වියදම් බැඳීම් සහ අවිනිශ්චිත බැරකම් ගිණුම්වලට ඇති සටහන්වල අනාවරණය කර ඇත.

### 3.3.2 සේවක ප්‍රතිලාභ

### (අ) විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

වසර තුළ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්වල සංචලනය පහත දක්වා ඇත.

| | 2018 (රු.) | 2017 (රු.) |
|---|---|---|
| **මූල්‍ය වසර ආරම්භයේදී** | **49,963,007** | **43,596,474** |
| වත්මන් සේවා පිරිවැය | 3,359,039 | 3,115,425 |
| පොළී පිරිවැය | 3,993,620 | 3,917,840 |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ලාභය හා පාඩුවට අය කර ඇත.** | **7,352,659** | **7,033,265** |
| ආයු ගණක පාඩු/ (ලාභ) | 5,056,066 | (822,371) |
| ගෙවූ ප්‍රතිලාභ | (4,635,950) | (5,433,812) |
| **එක් කළා:** පාරිතෝෂික බැඳීම් ආවරණය කිරීමට ඇති ආයෝජනවලින් ඉපයූ පොළිය | 5,194,733 | 5,589,452 |
| **මූල්‍ය වසර අවසානයේදී** | **62,930,515** | **49,963,007** |

කොමිෂන් සභාව විසින් 1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ අවශ්‍ය වන පරිදි සියලුම සුදුසු සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් ක්‍රියාවට නංවා ඇත. විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමට අරමුදල් සපයනු නොලැබේ.

විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම යනු විශ්‍රාම ගැනීමේදී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ මුදලයි. දක්වා ඇති ප්‍රතිලාභ සැලසුමට අදාළව මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනාගෙන ඇති බැරකම, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් LKAS 19තුළ නියම කර ඇති ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය යොදාගෙන කොමිෂන් සභාව විසින් වාර්ෂිකව ගණනය කර ඇත. සේවක ප්‍රතිලාභ

පෙර වසරේ අධි හෝ ඌණ ප්‍රතිපාදන හේතුවෙන් ඇති වූ ලාභ සහ පාඩු, ඒවා ඇතිවූ කාලය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙන් අයකරගනු හෝ බැරකරනු ලැබේ. වසර සඳහා වන බැඳීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ඒ අවස්ථාවේම හඳුනාගෙන ඇත. පාරිතෝෂික බැඳීමට සමාන මුදලක් කොමිෂන් සභාව විසින් ස්ථාවර තැන්පතු තුළ ආයෝජනය කෙරේ.

භාවිතා කළ ආයුගණක උපකල්පනයන් පහත පරිදි විය:

| | |
|---|---|
| වට්ටම් අනුපාතය | : වසරකට 9% |
| වැටුප් වැඩිවීමේ අනුපාතය | : 1% - 6.7% |
| විශ්‍රාම වයස | : අවුරුදු 60 |

**(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්**

නිශ්චිත දායකත්ව සැලසුමකට දායක වීමේ බැඳීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගැනේ.

කොමිෂන් සභාව සේවකයන්ගේ දළ වැටුපෙන්, පිළිවෙළින් 15% හ 3% ක ප්‍රමාණයක් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට (ETF) බැර කරනු ලබයි.

**(ඇ) සේවක අර්ථසාධක අරමුදල**

කොමිෂන් සභාවේ සියලුම සේවකයින් සේවක අර්ථ සාධක අරමුදලේ සාමාජිකයින් වන අතර සේවකයන් තම මූලික වැටුපෙන් 10% ක් ද ශ්‍රී ලංකා විදුලි සංදේශ කොමිෂන් සභාව සේවකයාගේ මූලික වැටුපෙන් 15% ක් ද එයට බැර කරනු ලබයි.

**සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල**

කොමිෂන් සභාව සේවකයාගේ මූලික වැටුපෙන් 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට බැර කරනු ලබයි.

**3.4 ආදායම හඳුනාගැනීම**

**3.4.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත -LKAS 18 අනුව ආදායම හඳුනාගෙන ඇත.**

**3.4.1.1 මෙහෙයුම්කරු බලපත්‍ර ගාස්තු**

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධනය කළ 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ (17) වන වගන්තිය යටතේ විදුලි සංදේශ මෙහෙයුම්කරුවන්ට වසර 10 ක් හෝ 05 ක් සඳහා නව බලපත්‍රයක් නිකුත් කරන විට හෝ පවතින බපලත්‍ර අලුත් කරන විට, මුදල් පදනම මත මෙහෙයුම්කරු බලපත්‍ර ගාස්තුව හඳුනාගනු ලැබේ.

**3.4.1.2 වෙළෙඳ බලපත්‍ර ගාස්තු/ රැහැන් රහිත දුරකථන නියෝජිත ගාස්තු/කෙටි කේත ගාස්තු/ අයදුම්පත්‍ර සැකසීමේ ගාස්තුව**

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධනය කළ 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ (21) වන වගන්තිය යටතේ පුද්ගලයන්ට නව බලපත්‍රයක් නිකුත් කරන විට මුදල් පදනම මත වෙළෙඳ බලපත්‍ර ගාස්තුව හඳුනාගනු ලැබේ.

**3.4.1.3 සෙස් ගාස්තුව**

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධනය කළ 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 (උ) තුළ වන කොන්දේසි අනුව සෙස් ගාස්තුව හඳුනාගනු ලැබේ.

**3.4.2 විදුලි සංදේශ බදු**

2011 අංක 21 දරන විදුලි සංදේශ පනත යටතේ විදුලි සංදේශ මෙහෙයුම්කරුවන්ගෙන් ලද විදුලි සංදේශ බදු ආදායම ලෙස හඳුනාගෙන ඇති අතර ඉන්පසුව රාජ්‍ය ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඇත.

නොගෙවන ලද විදුලි සංදේශ බදු සහ සෙස් ගාස්තු, ලංකා කේබල් සැටලයිට් නෙට්වර්ක් (පුද්) සමාගම, ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් (පුද්) සමාගම සහ සිටි කේබල් ලින්ක්ස් (පුද්) සමාගම වෙතින් නැවත අය කරගැනීමේ ක්‍රියාවලිය ආරම්භ වී ඇත. නොගෙවන ලද විදුලි සංදේශ බදුවලට එරෙහිව 2011 අංක 21 දරන විදුලි සංදේශ පනතේ විධි විධාන ප්‍රකාරව නීති ක්‍රියාමාර්ග ගනු ලැබේ.

### 3.4.3 විදුලි සංදේශ සංවර්ධන ගාස්තු

2004 අංක 11 දරන මුදල් පනතේ III කොටස යටතේ බාහිර පිවිසුම් මෙහෙයුම්කරුවන්ගෙන් (External Gateway Operators) ලැබුණු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම ලෙස හඳුනාගෙන ඇත. මෙම ආදායමෙන් සියයට 50 ක් රාජ්‍ය ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඇත.

### 3.4.4 ජාත්‍යන්තර ඇමතුම් බදු

2004 අංක 11 දරන මුදල් පනතේ III කොටස යටතේ සහ 2011 දෙසැම්බර් 29 වන දිනැති අංක 1738/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද රෙගුලාසි යටතේ බාහිර පිවිසුම් මෙහෙයුම්කරුවන්ගෙන් (External Gateway Operators) ලැබුණු ජාත්‍යන්තර ඇමතුම් බදු ආදායම ලෙස හඳුනාගෙන රාජ්‍ය ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඇත.

### 3.4.5 පොළී ආදායම

පොළී ආදායමට ඇතුළත් වන්නේ කෙටි කාලීන ස්ථාවර තැන්පතු සහ මුදල් වෙළෙඳපොළ ආයෝජනයන් තුළ ආයෝජනය කෙරුණු අරමුදල් සඳහා ලැබුණු පොළී ආදායමයි. කල් පිරීමේ දිනයේදී එයට ලැබෙන ලාභය හෝ පාඩුව මත පොළී ආදායම හඳුනාගැනේ.

### 3.4.6 ආදායම් බදු

කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය ආදායම් බද්දෙන් නිදහස් වේ. ආදායම් බදු හඳුනාගනු ලබන්නේ පොළෝ ආදායමෙන් පමණි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට 2006 අංක 10 දරන සංශෝධිත ආදායම් බදු පනත යටතේ ලබා දී ඇති බදුවලින් නිදහස් වීම, 2018/4/1 සිට ක්‍රියාත්මක වන 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනත බලාත්මක වීමත් සමග අහෝසි කෙරිණි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ බදු කාල සීමාව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කළ පරිදි ජනවාරි 1 දා සිට දෙසැම්බර් 31 දා දක්වාය. ඒ අනුව, 2018 වසර සඳහා වන බදු බැරකම පහත දක්වා ඇත.

| | **2018 (රු.)** |
|---|---|
| බදුවලට පෙර ගිණුම්කරණ ලාභය | 36,969,615,832 |
| **එක් කළා:** බදු අයකළ හැකි ආදායම/ (පාඩුව) තීරණය කිරීමේදී ඉඩ නොදිය හැකි වියදම්වල බදු බලපෑම | – |
| **අඩු කළා:** බදු අයකළ හැකි ආදායම/ (පාඩුව) තීරණය කිරීමේදී ඉඩ දිය හැකි වියදම්වල බදු බලපෑම | (29,658,574,415) |
| ආදායම් බද්දට අය කළ හැකි ගිණුම්කරණ ලාභය/අලාභය | 7,311,041,417 |
| පොළී ආදායම | 1,079,102,734 |
| **මුළු බදු අය කළ හැකි ආදායම** | **8,390,144,151** |
| වසර සඳහා වන බදු අනුපාතිකය | 28% |
| **වසර සඳහා වන බදු බලපෑම** | **2,349,240,362** |

### 3.4.7 ආර්ථික සේවා ගාස්තුව (ESC)

වගකිය යුතු ලාභයක් මත නිශ්චිත අනුපාතිකයන්ට ESC ගෙවිය යුතුය. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ සහ එයට පසුව සිදු කළ සංශෝධනවල විධි විධාන අනුව, ආදායම් බදු බැරකමෙන් ESC අඩු කළ හැකිය. පනතේ අදාල විධිවිධානය අනුව හිමිකම් නොපාන ලද ඕනෑම ගෙවීමක් ඉදිරියට ගෙන ය හැකි අතර ආදායම් බදු ගෙවීමක් සඳහා හිලව් කළ හැකිය.

## 3.5 වියදම්

වැයවූ පිරිවැය සහ ආදායමේ නිශ්චිත අයිතමයක් උපයා ගැනීම අතර වන ඍජු සම්බන්ධතාවයක පදනම මත විස්තීර්ණ අදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනාගැනේ. කොමිෂන් සභාව පවත්වාගෙන යාමේදී සහ කාර්යක්ෂම තත්වයෙන් ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේදී දරන ලද සියලු වියදම් වසර සඳහා වන අතිරික්ත ආදායමෙන් අය කරගෙන ඇත.

## 3.6 ව්‍යාපෘති

### 3.6.1 කොළඹ නෙළුම් කුළුණ

2010 ඔක්තෝඅර් 27 සහ 2011 දෙසැම්බර් 14 වන දින පිළිවෙළින් 10/2473/401/301 සහ 11/2262/501/026 යොමු අංක සහිත අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන අධිකාරිය විසින් "කොළඹ නෙළුම් කුළුණ" ලෙසින් හඳුන්වන මීටර් 350 ක් උසැති බහු කාර්ය රූපවාහිනී සහ විදුලි සංදේශ කුළුණක් ඉදිකිරීම ආරම්භ කර ලදී. මෙම කුළුණ ඉදිකිරීම අමාත්‍ය මණ්ඩලය විසින් චයිනා නැෂනල් ඉලෙක්ට්‍රොනික්ස් ඉම්පෝර්ටර්ස් ඇන්ඩ් එක්ස්පෝර්ටර්ස් කෝපරේෂන් (CEIEC) සහ ඒරෝස්පේස් ලෝන්ග් මාච් ඉන්ටර්නැෂනල් ට්‍රේඩ් කම්පනි ලිමිටඩ් (ALIT) වෙත පිරිනමන ලදී.

එමෙන්ම කොළඹ නෙළුම් කුළුණ සම්පූර්ණ කිරීමෙන් පසු, 2 වන අදියර මෙන් විශාල විනෝද උද්‍යානයක්ද ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

ඉදිකිරීම් වියදම ඇඩො මිලියන 104.3 ක් ලෙස ඇස්තමේන්තුගත කර තිබුණු අතර ඉන් 85% ක් චීනයේ එක්සිම් බැංකුව වෙතින් වසර 14 ක ණයක් යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ එක්සිම් බැංකුව අතර පවතින මිලදී ගන්නාගේ ණය ගිවිසුම අංක BLA-201207 යටතේ මූල්‍යයනය කරනු ලැබේ. මේ සඳහා එවකට මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ඇපකරු ලෙස අත්සන් කර ඇත. ව්‍යාපෘති පිරිවැයේ ඉතිරි 15% එනම් ඇඩො මිලියන 15.645 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දැරීමට නියමිතය.

2018.12.11 වන විට ව්‍යාපෘතිය 95% ක් සම්පූර්ණ කර තිබිණි. අතුරු ගෙවීම් සහතික 20, 21 හා 22 වෙතින් ඇඩො 10,430,000 ක සමුච්චිත ප්‍රමාද හානියක් අඩු කරගෙන තිබිණි. ව්‍යාපෘති උපදේශක ඒකකයේ නිර්දේශය හා අනුමැතිය මෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ සාකච්ඡා කමිටුවේ පිළිගැනීම මත ගිවිසුමේ කොන්දේසි අනුව මුදාහළ රඳවාගැනීම් සහ HSBC වෙතින් ස්ථිර ඉල්ලු බැංකු සහතිකය ඉදිරිපත් කරන ලදී.

ඇඩො 67,259,754 දී එක්සිම් බැංකු ණය කල් ඉකුත් වූ අතර ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුදල් වෙතින් ඉතිරි කොන්ත්‍රාත් මුදල වන ඇඩො 21,395,247 ක් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී.

එක්සිම් බැංකු ණය 100% ක්ම කොළඹ නෙළුම් කුළුණ ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණයක් වන බැවින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 23 ට අනුව ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේදී මුළු ණය පිරිවැය සහ අදාළ වියදම් පූර්ණ ලෙස ප්‍රාග්ධනිත කරනු ඇත.

### 3.6.2 භූමිය - නෙළුම් කුළුණ

"කොළඹ නෙළුම් කුළුණ" ඉදිකෙරෙමින් පවතින නෙළුම් කුළුණ භූමිය අක්කර 7, රූඩ් 2 සහ පර්චස් 8.41 කින් (හෙක්ටයාර 3.0564) යුතු වපසරියකින් සමන්විත වන අතර 2011 දෙසැම්බර් 22 දිනැති 11/2262/501/026/TBR අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පොළී රහිත පදනමින් නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට පැවරිය යුතුය.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ නාගරික සංවර්ධන අධිකාරිය අතර, 2012 23 දිනැති හා යොමු අංක 5023 දරන අවබෝධතා ගිවිසුම අත්සන් තැබුණු අතර රු. මිලියන 1,500 ක මූලික ගෙවීමක් කිරීමටත් පැවරීම් ගිවිසුම ක්‍රියාත්මක වීමේ දිනයේ සිට වසර 34 ක් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව රු. මිලියන 300 බැගින් ගෙවිය යුතු බවටත් එකඟ වී ඇත.

නාගරික සංවර්ධන අධිකාරියේ 2012 ජූලි 18 දිනැති ලිපිය මගින් භාර දුන් දින්යේ සිට උපයෝගිතා බිල්පත් සහ ඇගයීම් ගාස්තු අදාළ බලාධිකාරීන්ට ගෙවීමට යටත්ව හිස් භෞතික හිමිකාරීත්වය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන අධිකාරියට භාර දෙන ලදී. අදාළ බලාධිකාරීන් ක්‍රියා පටිපාටීන්ට යටත්ව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ඔප්පු හිමිකාරීත්වය පැවරීමේ කටයුතු කරගෙන යනු ලබයි.

### 3.6.3 හම්බන්තොට සූරියවැව තොරතුරු තාක්ෂණ උද්‍යානය

2012 ජූලි 04 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අංක 12/0836/501/019 දරන හා 2012 ජූනි 14 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මත පදනම්ව විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපෘතියක් (හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය) ස්ථාපිත කිරීමට ගත් තීරණය අනුව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන අධිකාරිය ඒ සඳහා මූලාරම්භය ගනු ලැබිණි.

ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයා වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) පත් කරන ලද අතර අනුමත ටෙන්ඩර් පටිපාටියට අනුව කටයුතු කිරීමෙන් පසුව රු.2,493,870,318.00 ක ඉදිකිරීම් පිරිවැයක් සමගින් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව තුඩාවේ බ්‍රදර්ස් පුද්. සමාගමට පිරිනමන ලදී.

සැලසුම් කළ ආකාරයටම කොන්ත්‍රාත්කරුවා 2015 ජූනි මස වන විට 3 වන මහල දක්වා ගොඩනැගිල්ලේ උපරිව්‍යුහය සම්පූර්ණ කර තිබිණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ආයෝජන මණ්ඩලය සහ ජනාධිපති ලේකම් කාර්යාලය නිරීක්ෂණය කළේ ප්‍රදේශයේ සැලසුම් කළ අනෙක් සංවර්ධන ව්‍යාපෘතීන් ආරම්භ කර නොමැති බවත් ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කළ යුතු බවත් ය.

ව්‍යාපෘතියේ රු. මිලියන 423.9 ක් වූ සම්පූර්ණ කළ ප්‍රතිශතය 33% ක් වූ අතර එයට වැඩබිමේ ද්‍රව්‍යයද ඇතුලත් වේ. 2018.12.31 වන විට රඳවාගැනීම් සහ සචලන අත්තිකාරම නැවත අයකරගැනීම පිළිවෙළින් රු. මිලියන 46 ක් සහ රු. මිලියන 157 ක් විය.

මෙම ව්‍යාපෘතියේ ඉංජිනේරු උපදේශක ලෙස ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධ කටයුතු කරමින් සිටි අතර 2016 අගෝස්තු 10 වනදා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ තුඩාවේ බ්‍රදර්ස් පුද් සමාගම අතර ගිවිසුම කල් ඉකුත් විය. ඒ අනුව ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයා වූ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශ මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තුඩාවේ බ්‍රදර්ස් පුද් සමාගම සමග වූ ගිවිසුම අවසන් කළේය. මෙම ව්‍යාපෘතිය සඳහා මෙතෙක් වැය වූ මුළු පිරිවැය දළ වශයෙන් රු.මිලියන 715 ක් (නැවත අයකරගනු නොලැබූ මිලියන 157 ද ඇතුළුව) වූ අතර කොන්ත්‍රාත්කරුවා වූ තුඩාවේ බ්‍රදර්ස් පුද් සමාගම, ගිවිසුම අවසන් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව මතභේද විනිශ්චය මණ්ඩලයට යොමුවක් ඉදිරිපත් කරන ලදී.

මතභේද විනිශ්චය මණ්ඩලයේ තීරණය සලකා බැලීමෙන් පසුව, රු මිලියන 46 ක පිරිවැය සහ රඳවාගැනීම් මුදලක්, සවලකරණ අත්තිකාරම වන රු. මිලියන 157 වෙනුවෙන් හිලව් කිරීමට එකඟ විය. ව්‍යාපෘතියේ ඉංජිනේරුවරයා වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ උපදෙස් මත ඉතිරි මුදල වන රු. මිලියන 50, රු. මිලියන 50 ක බැංකු ඇපකරයක් මගින් ආවරණය කෙරුණු අතර එම කරුණ බේරුම්කාර මණ්ඩලයට යොමු කෙරිණි. සටහන 3.7 (ඇ) බලන්න.

රජයේ තක්සේරුකරු විසින් භූමිය තක්සේරු කිරීමෙන් පසු සූරියවැව ඉඩමේ පිරිවැය ප්‍රාග්ධනිත කෙරෙනු ඇත.

මෙම ව්‍යාපෘතිය රාජ්‍ය- පුද්ගලික් හවුල්කාරීත්ව පදනමකින් සංවර්ධනය කිරීමේ හැකියාව සම්බන්ධව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ගවේෂණය කරමින් සිටී.

### 3.7 අවිනිශ්චිත වියදම්

**(අ) <u>DC/DMR/6188/2010</u>**

ගෙවාන් ඉන්ජිනියරින් සමාගමේ ගාමිණී රාජපක්ෂ මහතා, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විත්තිකරු කරමින් කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ අංක 6188/2010 දරන නඩුවක් ගොනු කර ඇත.

පැමිණිලිකරු විසින් මෙම නඩුව ගොනු කර ඇත්තේ 2007 ජූලි 19 වනදා පැමිණිලිකරු සහ විත්තිකරු විසින් එළඹුණු ගිවිසුම කඩකිරීමෙන් සිදු වූ හානිය විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් අය කරගැනීම සඳහාය. සහනය ලෙස රු. මිලියන 1.5 ක් පැමිණිලිකරු අපේක්ෂා කරයි.

**(ආ) <u>HC Civil No. 137/2011</u>**

ඉලෙක්ට්‍රොටෙක්ස් ලිමිටඩ් සමාගම විසින් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට එරෙහිව HC (Civil) No. 137/11 දරන නඩුව ගොනු කර ඇති අතර තීන්දුවේ දිනය දක්වා වන නෛතික පොළියද සමග රු. 47,345,112,000 හා සම්පූර්ණ ගාස්තුව ගෙවන තෙක් තීරණයෙන් සමාහාර මුදලක්ද අපේක්ෂා කරයි. නොගෙවන ලද රු. 172,500,000 ක් වන සංඛ්‍යාත බලපත්‍ර ගාස්තුව සහ නෛතික පොළිය වන රු. 2,300,000 ක මුදලක් පැමිණිලිකරුගෙන් අය කරගැනීම සඳහා විත්තිකරු ප්‍රති ඉල්ලීමක් කර ඇත.

(ඇ) <u>තොරතුරු තාක්ෂණ උද්‍යානය- හම්බන්තොට</u>

මතභේද නිරාකරණ මණ්ඩලයේ තීරණයට දෙපාර්ශ්වයම එකඟ නොවූ නිසා මෙම කරුණ බේරුම්කාර විනිශ්චය සභාවක් වෙත යොමු කරන ලදී. හිමිකම් පාන්නා වන තුඩාවේ බ්‍රදර්ස් පුද්ගලික සමාගම රු. 706,066,168.64 ක හිමිකම් පෑමක් සිදු කර ඇත.

(ඈ) **<u>DC/DMR/3277/17</u>**

සම්පූර්ණ යාපන අර්ධද්වීපයම සහ යාබද දූපත් සියල්ලම ආවරාය කළ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයට සිදු වූ හානිය සහ සේවා බිඳ වැටීම මගින් සිදුවූ හානිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් අය කරගැනීමට පැමිණිලිකරු විසින් නඩුවක් ගොනු කර ඇත.

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

**මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 31.12.2018** *(ඉදිරියට...)*

***(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

**4. දේපළ, පිරියත සහ උපකරණ**

| පිරිවැය | 01.01.2018 වන දිනට ශේෂය | 2018 වසර සඳහා | | 31.12.2018 වන දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් | අපහරණ/මාරු කිරීම් | |
| ඉඩම් | 148,863,771 | 0 | 0 | 148,863,771 |
| බදු ඉඩම් | 345,502 | 0 | 0 | 345,502 |
| ගොඩනැගිලි | 150,381,065 | 0 | 0 | 150,381,065 |
| කොකාවිල් කුළුණ | 314,933,479 | 0 | 0 | 314,933,479 |
| වවුනියා කුළුණ | 29,900,741 | 0 | 0 | 29,900,741 |
| වාහන | 168,717,224 | 0 | 0 | 168,717,224 |
| වායු සමීකරණ | 15,104,152 | 1,350,702 | 0 | 16,454,854 |
| සෝපාන | 4,683,848 | 0 | 0 | 4,683,848 |
| විදුලි ජනක යන්ත්‍ර | 2,665,428 | 0 | 0 | 2,665,428 |
| පරිගණක | 98,473,387 | 861,400 | 0 | 99,334,787 |
| වෙබ් සර්වර | 2,213,661 | 0 | 0 | 2,213,661 |
| වෙනත් කාර්යාල උපකරණ | 34,080,287 | 1,195,890 | 0 | 35,276,177 |
| ජංගම දුරකථන | 1,081,968 | 93,081 | 0 | 1,175,049 |
| කාර්යාල ගෘහ භාණ්ඩ | 22,366,731 | 1,274,298 | 0 | 23,641,029 |
| තාක්ෂණික උපකරණ | 70,004,517 | 121,947 | 0 | 70,126,463 |
| FMMS ව්‍යාපෘතියේ අවේක්ෂණ වාහන | 61,712,127 | 0 | 0 | 61,712,127 |
| FMMS ව්‍යාපෘති උපකරණ | 408,303,544 | 0 | 0 | 408,303,544 |
| ව්‍යායාමශාලා උපකරණ | 5,629,707 | 0 | 0 | 5,629,707 |
| වීඩියෝ ඒකක උපකරණ | 12,572,266 | 0 | 0 | 12,572,266 |
| | **1,552,033,405** | **4,897,318** | **0** | **1,556,930,722** |
| නෙළුම් කුළුණේ භූමිය | 11,715,212,127 | 0 | 0 | 11,715,212,127 |
| | **13,267,245,532** | **4,897,318** | **0** | **13,272,142,850** |

| ක්ෂය වීම | 01.01.2018 වන දිනට ශේෂය | 2018 වසර සඳහා | | 31.12.2018 වන දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | එකතු කිරීම් | අපහරණ/මාරු කිරීම් | |
| ගොඩනැගිලි | 120,428,049 | 4,528,572 | 0 | 124,956,621 |
| කොකාවිල් කුළුණ | 213,044,126 | 31,493,348 | 0 | 244,537,474 |
| වවුනියා කුළුණ | 20,930,519 | 2,990,074 | 0 | 23,920,593 |
| වාහන | 113,996,042 | 16,242,757 | 0 | 130,238,799 |
| වායු සමීකරණ | 11,286,242 | 835,378 | 0 | 12,121,620 |
| සෝපාන | 4,683,848 | 0 | 0 | 4,683,848 |
| විදුලි ජනක යන්ත්‍ර | 2,665,428 | 0 | 0 | 2,665,428 |
| පරිගණක | 89,219,164 | 4,662,478 | 0 | 93,881,642 |
| වෙබ් සර්වර | 2,213,661 | 0 | 0 | 2,213,661 |
| වෙනත් කාර්යාල උපකරණ | 23,605,259 | 1,877,066 | 0 | 25,482,324 |

| | | | | |
|---|---|---|---|---|
| ජංගම දුරකථන | 736,144 | 68,239 | 0 | 804,382 |
| කාර්යාල ගෘහ භාණ්ඩ | 15,156,043 | 1,442,714 | 0 | 16,598,757 |
| තාක්ෂණික උපකරණ | 26,778,660 | 6,551,010 | 0 | 33,329,670 |
| FMMS ව්‍යාපෘතියේ අවේක්ෂණ වාහන | 19,336,483 | 7,164,016 | 0 | 26,500,498 |
| FMMS ව්‍යාපෘති උපකරණ | 326,385,647 | 10,760,214 | 0 | 337,145,861 |
| ව්‍යායාම්ශාලා උපකරණ | 5,629,707 | 0 | 0 | 5,629,707 |
| වීඩියෝ ඒකක උපකරණ | 11,507,324 | 402,802 | 0 | 11,910,126 |
| | **1,007,602,345** | **89,018,668** | **0** | **1,096,621,013** |
| ශුද්ධ පොත් අගය | **12,259,643,187** | | | **12,175,521,837** |

***සටහන්:***

ඉඩමේ වටිනාකම වන රු. 148,235,572 කට මීගමුව, කදිරානේ පිහිටි ඉඩම සඳහා වන රු.45,000,000 ද ඇතුළත් වේ. ඉඩමේ වපසරිය අක්කර 112 රූඩ් 01 ක් සහ පර්චස් 10.5 ක් වේ. දළ වශයෙන් ඉඩමේ 50% ක ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අත්පත් කරගෙන ඇති නමුත් අත්පත්කරගැනීම හේතුවෙන් අගයේ වෙනස්වීම ගිණුම්වලට ඇතුළත් කර නැත.

**4.1 අස්පෘශ්‍ය වත්කම්**

| පිරිවැය | 01.01.2018 වන දිනට ශේෂය | 2018 වසර සඳහා එකතු කිරීම් | 2018 වසර සඳහා අපහරණ/මාරු කිරීම් | 31.12.2018 වන දිනට ශේෂය |
|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 17,924,924 | 8,397,924 | 4,866,988 | 21,455,861 |
| | **17,924,924** | **8,397,924** | **4,866,988** | **21,455,861** |

| ක්ෂයවීම | 01.01.2018 වන දිනට ශේෂය | 2018 වසර සඳහා එකතු කිරීම් | 2018 වසර සඳහා අපහරණ/මාරු කිරීම් | 31.12.2018 වන දිනට ශේෂය |
|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග | 9,370,737 | 9,807,868 | **0** | 19,178,605 |
| | **9,370,737** | **9,807,868** | **0** | **19,178,605** |
| ශුද්ධ පොත් අගය | **8,554,187** | | | **2,277,255** |

**5. නොනිමි වැඩ**

| | 01.01.2018 වන දිනට ශේෂය | 2018 වසර සඳහා එකතු කිරීම් | 2018 වසර සඳහා (මාරුකිරීම්) | 31.12.2018 වන දිනට ශේෂය |
|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල | 10,057,910 | 0 | 0 | 10,057,910 |
| නෙළුම් කුළුණ ඉදිකිරීම | 14,152,597,375 | 2,955,826,557 | 0 | 17,108,423,931 |
| තොරතුරු තාක්ෂණ උද්‍යානය- හම්බන්තොට | 682,856,596 | 1,158,714 | 0 | 684,015,309 |
| TRC ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම - නව ගොඩනැගිල්ල | 0 | 608,329 | 0 | 608,329 |
| | **14,845,511,880** | **2,957,593,599** | **0** | **17,803,105,479** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 31.12.2018** *(ඉදිරියට...)*
***(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

| | | 31.12.2018 | 31.12.2017 |
|---|---|---|---|
| **6. ආයෝජන** | | | |
| භාණ්ඩාගාර තැන්පතු | | 354,000,000 | 354,000,000 |
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | | 0 | 5,600,000,000 |
| | | **354,000,000** | **5,954,000,000** |
| ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොලිය | | 0 | 267,020,046 |
| | | **354,000,000** | **6,221,020,046** |
| **7. ලැබිය යුතු ගිණුම්** | | | |
| ලැබිය යුතු CESS | | 465,636,257 | 408,978,695 |
| ලැබිය යුතු TDC | | 957,178,524 | 911,312,704 |
| ලැබිය යුතු OLAC මත බදු | | 39,280,793 | 53,403,552 |
| ලැබිය යුතු ටෙලිකොම් බදු | | 977,293,794 | 1,635,306,264 |
| කොකාවිල් කුළුණ -අයකරගැනීම් | | 83,297,174 | 94,308,595 |
| අයකරගැනීමට ඇති හිඟ කාර්ය මණ්ඩල ණය | | 2,547,337 | 2,547,337 |
| අයකරගැනීමට ඇති කොකාවිල් බදු කුලිය | | 700,561 | 1,536,292 |
| ලැබිය යුතු ගුවන් ටිකට්පත් | | 97,920 | 0 |
| වෙළෙඳ ණයකරුවන් | **07 A** | 1,287,804,064 | 3,231,627,673 |
| | | **3,813,836,424** | **6,339,021,114** |
| **වෙළෙඳ ණයකරුවන්** | | | |
| ගුවන්විදුලි සංඛ්‍යාත ගාස්තු | | 1,661,483,613 | 3,603,995,092 |
| ආමේචර ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | | 39,981 | 43,614 |
| | | **1,661,523,593** | **3,604,038,706** |
| *අඩු කළා* -බොල් ණයකරුවන් සඳහා ප්‍රතිපාදන | | (373,719,529) | (372,411,033) |
| | | **1,287,804,064** | **3,231,627,673** |

| **සටහන: (1)** | *ණයකරු* | | *ප්‍රතිපාදන* |
|---|---|---|---|
| ***බොල් ණයකරුවන් සඳහා ප්‍රතිපාදන*** | | | |
| වසර 02 කට වැඩි | 373,504,055 | **100%** | 373,504,055 |
| වසර 01 කට වැඩි හා වසර 02 කට අඩු | 2,154,742 | **10%** | 215,474 |
| මාස 6 කට වැඩි හා වසර 01 කට අඩු | 3,200,915 | **0%** | 0 |
| මාස 2 කට වැඩි හා මාස 6 කට අඩු | 181,728,329 | **0%** | 0 |
| මාස 01 කට වැඩි හා මාස 2 කට අඩු | 714,427,525 | **0%** | 0 |
| මාස 01 කට අඩු | 386,508,028 | **0%** | 0 |
| | **1,661,523,593** | | **373,719,529** |

**සටහන: (2)**
වසරකට වැඩි බොල් සහ අඩමාන ණය සඳහා පිළිවෙළින් 100% හා 10% ක ප්‍රතිපාදන සැපයීමෙන් පසුව වෙළෙඳ ණයකරුවන් සාධාරණ අගයට ප්‍රකාශ කර ඇත.

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

**මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 31.12.2018** *(ඉදිරියට...)*

***(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

| | | **31.12.2018** | **31.12.2017** |
|---|---|---|---|
| **8. පෙර ගෙවීම් සහ අත්තිකාරම්** | | | |
| විශේෂ අත්තිකාරම් | | 575 | 575 |
| උත්සව අත්තිකාරම් | | 205,111 | 217,000 |
| මිලදී ගැනීමේ අත්තිකාරම් | | 202,140 | 132,140 |
| පූර්ව ගෙවීම් | | 2,464,652 | 0 |
| සංවලන අත්තිකාරම් ගෙවීම - (නෙළුම් කුළුණ) | | 421,684,520 | 832,687,828 |
| සංවලන අත්තිකාරම් ගෙවීම - (තොරතුරු තාක්ෂණ උද්‍යානය) | | 157,081,430 | 157,081,430 |
| | | **581,638,428** | **990,118,972** |
| **9. ණය සහ වෙනත් ලැබිය යුතු දෑ** | | | |
| ආපදා ණය | | 34,555,456 | 36,930,236 |
| මෝටර් වාහන ණය | | 184,937,193 | 114,882,989 |
| දේපළ ණය | | 1,724,586 | 2,053,446 |
| යතුරු පැදි ණය | | 203,298 | 348,401 |
| වැටුප් අඩුකිරීම් අයකරගැනීම | | 16,987 | 20,648 |
| වෙනත් ලැබීම් | | 2,086,122 | 2,066,122 |
| ලංවිම ආරක්ෂක ඇප තැන්පතු ගිණුම (තොරතුරු තාක්ෂණ උද්‍යානය) | | 125,000 | 125,000 |
| දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (WHT) | | 17,861,411 | 0 |
| හිමිකම් පෑ හැකි සේවා ගාස්තු | | 18,276,866 | 0 |
| නෙළුම් කුළුණ විදුලි ආරක්ෂක තැන්පතු | | 3,125,000 | 0 |
| | | **262,911,918** | **156,426,841** |
| **10. මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| බැංකුවල මුදල් | **10 A** | 866,915,447 | 210,286,330 |
| අතැති මුදල් | **10 B** | 70,000 | 70,000 |
| මුදල් වෙළෙඳපොළ ඉතුරුම් ගිණුම - (අංක.119-2-001-2-3693169) | | 2,780,580,061 | 5,414,135,038 |
| | | **3,647,565,507** | **5,624,491,369** |
| **10 A.** බැංකුවල මුදල් | | | |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව (තැන්පතු ගිණුම) | | | |
| ගිණුම් අංකය.119402113960300 (RFC USD 0032) | | 106,141,131 | 87,987,394 |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව (එකතු ගිණුම) | | | |
| ජංගම ගිණුම් අංකය 119-1-001-4-3693169 | | 737,578,215 | 88,545,068 |
| මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව (ITO බදු) | | | |
| ජංගම ගිණුම් අංකය 119-1-001-3-3693264 | | 312,076 | 379,303 |
| ලංකා බැංකුව - නාරාහේන්පිට ශාඛාව | | | |
| ජංගම ගිණුම් අංකය 2323167 | | 22,884,024 | 33,374,566 |
| | | **866,915,447** | **210,286,330** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

**මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 31.12.2018** *(ඉදිරියට...)*

***(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

| | 31.12.2018 | 31.12.2017 |
|---|---|---|
| **10 B. අතැති මුදල්** | | |
| සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය | 10,000 | 10,000 |
| සුළු මුදල් - පරිපාලන හා මානව සම්පත් අංශය | 5,000 | 5,000 |
| සුළු මුදල් - කොකාවිල් | 10,000 | 10,000 |
| සුළු මුදල් - නෙළුම් කුළුණ | 25,000 | 25,000 |
| සුළු මුදල් - අ/ජ කාර්යාලය | 15,000 | 15,000 |
| සුළු මුදල් - අනුකූලතා | 5,000 | 5,000 |
| | **70,000** | **70,000** |

| | | |
|---|---|---|
| **11. රජයේ දායකත්ව** | | |
| ලෝක බැංකු ණය ගිවිසුම | 298,572,434 | 298,572,434 |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | 19,533,906 | 19,533,906 |
| භාණ්ඩාගාරය විසින් ප්‍රදානය කළ ප්‍රාග්ධනය | 208,108,404 | 208,108,404 |
| | **526,214,744** | **526,214,744** |

| | | |
|---|---|---|
| **12. රඳවාගැනීම්** | | |
| රඳවාගැනීම - තොරතුරු තාක්ෂණ උද්‍යානය | 46,152,801 | 46,152,801 |
| | **46,152,801** | **46,152,801** |

**නෙළුම් කුළුණ**

ව්‍යාපෘති උපදේශක ඒකකයේ නිර්දේශය හා අනුමැතිය මෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ සාකච්ඡා කමිටුවේ පිළිගැනීම මත ගිවිසුමේ කොන්දේසි අනුව මුදාහළ රඳවාගැනීම් සහ HSBC වෙතින් ස්ථිර ඉල්ලු බැංකු සහතිකය ඉදිරිපත් කිරීම

**තොරතුරු තාක්ෂණ උද්‍යානය**

කරුණාකර මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 3.6.3 බලන්න

| | | |
|---|---|---|
| **13. පාරිතෝෂික ප්‍රතිලාභ** | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 62,930,515 | 49,963,007 |
| ස්ථාවර තැන්පතු (පාරිතෝෂික) | (44,500,000) | (43,600,000) |
| පාරිතෝෂික ප්‍රතිලාභ සඳහා වන ස්ථාවර තැන්පතුවලට ලැබියි යුතු පොළිය | (4,388,432) | 0 |
| **ශුද්ධ ප්‍රතිලාභ වගකීම** | **14,042,084** | **6,363,007** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 31.12.2018** *(ඉදිරියට...)*
***(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

| | **31.12.2018** | **31.12.2017** |
|---|---|---|
| **14. ගෙවිය යුතු ගිණුම්** | | |
| උපචිත වියදම් | | |
| දුරකථනය - කාර්යාලය | 1,010,070 | 811,017 |
| සන්නිවේදන දීමනාව | 219,112 | 223,079 |
| වැටුප් පාලන | 99,183 | 11,884 |
| ගෙවිය යුතු වැටුප් | 185,634 | 216,634 |
| ගෙවිය යුතු වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් | 97,280 | 2,991 |
| විදුලිය | 1,047,053 | 1,019,198 |
| ජලය | 66,751 | 86,505 |
| සනීපාරක්ෂක සේවා | 553,741 | 648,438 |
| ආරක්ෂක සේවා | 2,573,800 | 2,000,000 |
| අතිකාල | 1,385,575 | 1,321,907 |
| සේ.අ.අ. | 3,354,845 | 3,303,928 |
| සේ.නි.භා.අ. | 402,581 | 397,020 |
| අන්තර්ජාලය | 317,243 | 506,262 |
| වෛද්‍ය රක්ෂණාවරණ හිමිකම් | 250,995 | 250,995 |
| ගෙවිය යුතු ප්‍රවාහන සහ් උපවේශන | 6,156 | 2,200 |
| කාර්ය මණ්ඩල සුබසාධනය | 794,091 | 272,737 |
| පුවත්පත් සහ දැන්වීම් | 84,080 | 30,040 |
| විගණන ගාස්තු | 2,367,460 | 1,267,460 |
| ප්‍රසාද දීමනා | 35,263,211 | 33,782,946 |
| රඳවාගැනීම් | 66,279 | 40,595 |
| කො.ජ.IR ( ESC,NBT සහ මුද්දර ගාස්තු) | 56,290,538 | 66,309,297 |
| වැටුප් අඩු කිරීම් | 132,189 | 132,214 |
| අළුත්වැඩියා සහ නඩත්තු | 3,653,025 | 23,227,871 |
| ගෙවිය යුතු ගුවන් ටිකට්පත් | 0 | 154,480 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 993,032 | 1,495,449 |
| ගෙවිය යුතු PAYE (කොමිසමේ සාමාජික දීමනා) | 2,338,664 | 3,245,758 |
| ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | 1,818,593,410 | 34,964,188 |
| විවිධ. ගෙවිය යුතු මිලදීගැනීම් හා සැපයුම් | 716,286 | 1,629,429 |
| ගෙවිය යුතු වාර්ෂික දායකත්ව | 0 | 545,611 |
| උපදේශනයන් සඳහා ගෙවීම් | 0 | 285,000 |
| කාර්ය මණ්ඩල ණය අධි අයකරගැනීම් | 13,657 | 157,010 |
| ගෙවිය යුතු ඉන්ධන | 150,698 | 265,943 |
| ගෙවිය යුතු මුද්‍රණ සහ ලිපි ලේඛන | 1,023,437 | 2,242,831 |
| ගෙවිය යුතු රඳවාගැනීම් බදු | 12,628 | 0 |
| Filling & Depend Court | 47,500 | 0 |
| | **1,934,110,203** | **180,850,917** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

**මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 31.12.2018** *(ඉදිරියට...)*

***(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

| | | **31.12.2018** | **31.12.2017** |
|---|---|---|---|
| **15. අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවීම්** | | | |
| කළින් ලැබුණු ආදායම | | 3,312,802,741 | 8,193,005,490 |
| ටෙන්ඩර සඳහා නැවත ගෙවන තැන්පතු | | 1,524,167 | 1,508,167 |
| නැවත ගෙවන තැන්පතු - සේවකයින් | | 2,086,843 | 2,086,843 |
| 1800 MHz පරාසය සඳහා ලද අත්තිකාරම් | | 57,500,000 | 57,500,000 |
| ඵලදායී ආපදා කළමනාකරණ කමිටුව සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | 34,210 | 34,210 |
| හානිවූ ඇන්ටනා සඳහා රක්ෂණ හිමිකම් | | 25 | 25 |
| සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු අයකිරීම් | | 2,129,435 | 2,101,870 |
| C.T.O ටෙලිසෙන්ටර් ව්‍යාපෘතිය | | 924,492 | 924,492 |
| VAT පාලන ගිණුම | | 223,392,670 | 100,761,116 |
| ඉදිකිරීම් ණයකරුවන් | | 751,650 | 751,650 |
| ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙළුම් කුළුණ) | | 1,621,411,295 | 1,360,765,595 |
| | | **5,222,557,527** | **9,719,439,458** |
| | | | |
| **16. භාණ්ඩාගාරයට ගෙවීම්** | | | |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු 50% TDC | | 478,589,261 | 455,656,465 |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු OLAC මත බදු | | 39,280,793 | 53,403,552 |
| භාණ්ඩාගාරයට ගෙවිය යුතු ටෙලිකොම් බදු | | 979,293,795 | 1,635,306,265 |
| | | **1,497,163,849** | **2,144,366,283** |
| | | | |
| **17. ආදායම** | | | |
| ආදායම් - බලපත්‍ර ගාස්තු | **17 A** | 17,563,075,810 | 18,286,520,005 |
| විදුලි සංදේශ බදු | | 24,349,276,331 | 29,133,386,810 |
| ටෙලිකොම් සංවර්ධන ගාස්තු | **17 B** | 5,581,629,186 | 6,217,860,564 |
| පිටතට යන දේශීය පිවිසුම් ගාස්තු මත බදු | | 538,955,113 | 730,277,739 |
| | | **48,032,936,440** | **54,368,045,117** |
| | | | |
| **17 A. ආදායම් - බලපත්‍ර ගාස්තු** | | | |
| පද්ධති මෙහෙයුම්කරු බලපත්‍ර ගාස්තු | | 122,448,980 | 690,142,880 |
| සෙස් ගාස්තු | | 4,550,705,960 | 4,211,919,781 |
| ගුවන්විදුලි සංඛ්‍යාත ගාස්තු | | 10,789,520,442 | 6,861,209,627 |
| සංඛ්‍යාත සඳහා සම්පූර්ණයෙන් කෙරෙන ගෙවීම් | | 1,071,428,571 | 4,509,183,673 |
| වෙළෙඳ බලපත්‍ර ගාස්තු | | 13,818,111 | 13,663,749 |
| ආමේචර ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | | 163,630 | 29,345 |
| නැව් මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | | 449,994 | 440,142 |
| ගුවන් යානා මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු | | 401,530 | 396,266 |
| රැහැන් රහිත දුරකථන නියෝජිත ගාස්තු | | 114,619,244 | 109,217,025 |
| විභාග ගාස්තු | | 367,511 | 457,819 |
| අයදුම්පත්‍ර සැකසීමේ ගාස්තු | | 1,020,408 | 1,428,572 |
| කෙටි කේත ගාස්තු | | 26,530,612 | 27,704,056 |
| අනියම් ආදායම - **17 A (1)** | | 1,108,518,638 | 2,272,461,943 |
| | | **17,799,993,632** | **18,698,254,879** |
| ***අඩු කළා:*** ජාතිය ගොඩනැගීමේ බද්ද | | (236,917,822) | (411,734,874) |
| | | **17,563,075,810** | **18,286,520,005** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 31.12.2018**
*(ඉදිරියට...)*
***(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

| | 31.12.2018 | 31.12.2017 |
|---|---|---|
| **17 A(1). විවිධ ආදායම්** | | |
| කාර්ය මණ්ඩල ණය වෙතින් පොළී ආදායම | 7,800,124 | 6,047,699 |
| ස්ථාවර තැන්පතු වෙතින් යුතු පොළිය | 683,832,865 | 2,027,097,093 |
| මුදල් වෙළෙඳපොළ ගනුදෙනු වෙතින් පොළී ආදායම | 384,498,838 | 209,981,046 |
| කොකාවිල් බදු කුලිය | 15,406,525 | 12,348,475 |
| වෙනත් ආදායම් - විවිධ | 4,199,591 | 987,631 |
| චිත්‍රපටිය සහ ටෙලි නාට්‍යය | 10,400,000 | 16,000,000 |
| අධිකරණ නඩුවේ පාඩු අයකරගැනීම | 2,380,696 | 0 |
| | **1,108,518,638** | **2,272,461,943** |
| **17 B. විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC)** | | |
| TDC ආදායම | 5,581,629,186 | 6,217,860,564 |
| | **5,581,629,186** | **6,217,860,564** |
| **18. නියාමන වියදම්** | | |
| ITU වාර්ෂික දායකත්වය | 26,636,951 | 24,727,919 |
| APT වාර්ෂික දායකත්වය | 2,397,118 | 2,370,835 |
| SAFIR වාර්ෂික දායකත්වය | 1,071,157 | 545,611 |
| SATRC වෙත ප්‍රදාන | 0 | 2,315,430 |
| පුස්තකාල වාර්ෂික දායකත්වය | 127,145 | 0 |
| CTO වාර්ෂික දායකත්වය | 5,666,572 | 5,000,836 |
| නියාමන කටයුතු හා සම්බන්ධ වීම | 35,381,542 | 18,051,265 |
| Filling & Depending Court Actions | 3,577,430 | 3,783,278 |
| ශුද්ධ අන්තර්ජාල සුරක්ෂිත දරුවා | 0 | 4,110 |
| විවිධ නියාමන වියදම් | 0 | 1,175,537 |
| ආර්ථික සමාජ වගකීම | 0 | 825,000 |
| විදේශ අභිනියෝජිතයන් බැහැදැකීම | 114,128 | 219,387 |
| නෙළුම් කුළුණ ව්‍යාපෘතිය | 136,522 | 126,121 |
| පාසල සම්බන්ධ කරන්න/ ප්‍රජාවක් හා සම්බන්ධ වන්න (Connect School/Connect Community) | 24,190 | 0 |
| නියාමන කටයුතු සඳහා ප්‍රවාහන හා උපවේශන | 1,351,666 | 1,788,052 |
| ජාත්‍යන්තර සමුළු පැවැත්වීම | 1,500 | 5,924,234 |
| ව්‍යවසායකයින් සඳහා ITU/TRC සහය වැඩසටහන | 36,821 | 0 |
| මහජන දැනුවත් කිරීමේ වැඩසටහන | 10,000 | 0 |
| ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය | 168,130 | 0 |
| දේශීය පුහුණු වැඩසටහන - ITU/APT | 5,544,739 | 0 |
| | **82,245,610** | **66,857,614** |

 *(ඉදිරියට...)*
***(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

| | **31.12.2018** | **31.12.2017** |
|---|---|---|
| **19. පරිපාලන හා ආයතන වියදම්** | | |
| වැටුප් | 167,042,327 | 159,514,188 |
| සේ.අ.අ. (15% දායකත්වය) | 23,444,942 | 22,456,336 |
| සේ.නි.භා.අ. (3% දායකත්වය) | 4,695,918 | 4,564,951 |
| ප්‍රවාහන දීමනා | 19,374,024 | 18,581,767 |
| නිවාස කුලී දීමනා | 14,736,703 | 13,313,846 |
| වෙනත් දීමනා | 3,313,674 | 1,532,366 |
| කාර්ය සාධන දිරිදීමනා | 36,602,559 | 33,261,744 |
| විශේෂ දීමනා | 348,871 | 139,567 |
| අතිරේක දීමනා | 2,476,023 | 9,142,552 |
| ප්‍රසාද දීමනා | 40,519,848 | 27,085,968 |
| අතිකාල | 15,247,454 | 13,925,559 |
| සභාපතිගේ පාරිශ්‍රමික | 1,200,000 | 400,000 |
| උපයෝජනය නොකළ විවේක නිවාඩු දීමනා | 10,420,588 | 9,773,331 |
| විශ්‍රාම වැටුප සඳහා කොමිෂන් සභාවේ දායකත්වය | 1,345,161 | 2,569,049 |
| සන්නිවේදන දීමනාව | 2,701,852 | 2,813,275 |
| නිල ඇඳුම් | 785,254 | 504,127 |
| කාර්ය මණ්ඩල සුබසාධනය | 7,934,824 | 10,469,038 |
| ක්‍රීඩා කටයුතු සංවර්ධනය | 1,500,000 | 2,120,947 |
| කාර්ය මණ්ඩල වෘත්තීය සාමාජිකත්ව දායකත්වය | 626,006 | 484,198 |
| දේශීය පුහුණුව | 1,395,770 | 1,919,716 |
| කොමිෂන් සභා සාමාජික දීමනා | 262,500 | 262,500 |
| විගණන කමිටු දීමනා | 168,250 | 110,000 |
| නිවාස ණය 2/3 පොළී ප්‍රතිපූර්ණය | 5,126,002 | 4,210,790 |
| ප්‍රවාහන සහ උපවේශන | 0 | 20,325 |
| පාරිතෝෂික | 3,359,039 | 3,115,425 |
| විදුලිය | 13,380,319 | 13,788,075 |
| ජලය | 487,685 | 715,682 |
| සනීපාරක්ෂක සේවා | 6,454,720 | 5,196,220 |
| ආරක්ෂාව | 11,086,450 | 10,454,599 |
| වරිපනම් හා බදු | 3,000 | 142,839 |
| පුස්තකාල පොත් | 68,356 | 0 |
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 11,733,439 | 7,904,072 |
| ඉන්ධන | 3,885,742 | 2,819,109 |
| තැපැල් ගාස්තු | 878,625 | 814,290 |
| දුරකථන, ෆැක්ස් සහ PABX | 6,076,255 | 7,423,220 |
| රක්ෂණය (දේපළ හා වෛද්‍ය) | 52,889,494 | 44,492,883 |
| අන්තර්ජාල ගාස්තු | 4,414,579 | 3,261,138 |
| පුවත්පත් සහ දැන්වීම් | 5,044,512 | 5,598,646 |
| උපදේශන ගාස්තු | 179,500 | 385,000 |
| සම්මන්ත්‍රණ | 681,499 | 1,005,852 |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**

**මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 31.12.2018** *(ඉදිරියට...)*

***(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

| | | 31.12.2018 | 31.12.2017 |
|---|---|---|---|
| විගණන ගාස්තු | | 1,100,000 | 600,000 |
| නෛතික වියදම්/විනය පරීක්ෂණ/මූලික පරීක්ෂණ | | 318,348 | 378,680 |
| බදු පරිශ්‍ර සඳහා කුළී | | 0 | 1,665,554 |
| ක්ෂය වීම | | 89,018,668 | 98,459,127 |
| ක්‍රමක්ෂය | | 9,807,868 | 3,333,800 |
| පරිපාලන විවිධ | | 2,241,500 | 704,127 |
| මිලදීගැනීම් හා සැපයුම් විවිධ | | 1,965,189 | 969,352 |
| මෙහෙයුම් පිරිවැය විවිධ | | 571,444 | 61,490 |
| කාර්යාල උපකරණ නඩත්තුව | | 11,174,579 | 1,513,406 |
| විදුලි සෝපාන නඩත්තුව | | 0 | 1,118,417 |
| විදුලි ජනක යන්ත්‍ර නඩත්තුව | | 49,725 | 62,438 |
| වාහන නඩත්තුව | | 4,397,987 | 4,751,277 |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් නඩත්තුව | | 4,313,054 | 1,460,319 |
| තාක්ෂණික උපකරණ නඩත්තුව | | 93,840 | 2,614,209 |
| මෘදුකාංග නඩත්තුව සහ සංවර්ධනය | | 1,831,728 | 43,610,724 |
| කුළුණු නඩත්තුව | | 244,262 | 253,996 |
| අධීක්ෂණ මධ්‍යස්ථාන නඩත්තුව | | 2,563,522 | 697,701 |
| නඩත්තුව - තොරතුරු තාක්ෂණ උද්‍යානය සූරියවැව | | 12,310 | 0 |
| විවිධ අලුත්වැඩියාවන් හා නඩත්තුව | | 0 | 26,000 |
| පාරිතෝෂික වශයෙන් කෙරෙන ගෙවීම | | 0 | 143,300 |
| අන්තර්ජාල ලීස් ලයින් | | 289,364 | 0 |
| CCTV නඩත්තුව | | 25,760 | 0 |
| | | **611,910,909** | **608,717,107** |
| **20. මූල්‍ය සහ වෙනත් වියදම්** | | | |
| බැංකු ගාස්තු | | 279,186 | 256,651 |
| මුද්දර ගාස්තු | | 250,000 | 0 |
| පාරිතෝෂික ප්‍රතිපාදන මත පොළිය | | 3,993,620 | 3,917,840 |
| | | **4,522,806** | **4,174,491** |
| **21. ඒකාබද්ධ අරමුදලට දායකත්වය** | **21-1** | | |
| විදුලි සංදේශ පනත යටතේ 2018.12.31 දිනට අවසන් වූ වසර සඳහා දායකත්වය | | 6,850,000,000 | 7,800,000,000 |
| මූල්‍ය පනත යටතේ 2018.12.31 දිනට අවසන් වූ වසර සඳහා දායකත්වය | | | |
| ගෙවූ විදුලි සංදේශ බදු | | 24,349,276,331 | 29,133,886,819 |
| 50% විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | | 2,790,814,593 | 3,108,930,282 |
| ගෙවූ OLAC මත බදු | | 538,955,113 | 730,277,739 |
| | | **34,529,046,037** | **40,773,094,840** |
| **විදුලි සංදේශ පනත යටතේ දායකත්වය** | **21-2** | | |
| 2017.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා වූ මුළු විස්තීර්ණ ආදායමෙන් | | **15,000,000,000** | **15,000,000,000** |

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**මූල්‍ය ප්‍රකාශනවලට සටහන් - 31.12.2018**
*(ඉදිරියට...)*
***(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)***

| | | 31.12.2018 | 31.12.2017 |
|---|---|---|---|
| **22. මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්** | | | |
| බදුවලට පෙර ශුද්ධ ලාභය | | **45,706,552,824** | **53,576,471,208** |
| *පහත දෑ සඳහා ගැලපීම්;* | | | |
| දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය වීම | | 89,018,668 | 98,459,127 |
| අස්පෘශ්‍ය වත්කම් මත ක්‍රමක්ෂය | | 9,807,868 | 3,333,800 |
| බොල් සහ අඩමාන ණයකරුවන් සඳහා ප්‍රතිපාදන | | 1,308,496 | 30,355,765 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | | 3,359,039 | 3,115,425 |
| ස්ථාවර තැන්පතු සහ EPO වෙතින් පොළිය | | (683,832,865) | (2,027,097,093) |
| මුදල් වෙළෙඳපොළ ගනුදෙනු වෙතින් පොළී ආදායම | | (384,498,838) | (209,981,046) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත පොළී පිරිවැය | | 3,993,620 | 3,917,840 |
| විදේශ විනිමය ගනුදෙනුවලින් ලැබීම | | 1,626,395,795 | 81,468,932 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්** | | | |
| ලැබිය යුතු ගිණුම් | **22-1** | 2,523,876,193 | 181,061,207 |
| පෙර ගෙවීම් සහ අත්තිකාරම් | | (2,522,763) | 47,000 |
| ණය සහ වෙනත් ලැබිය යුතු දෑ | | (106,485,077) | (24,495,480) |
| ගෙවිය යුතු ගිණුම් | **22-2** | (30,369,935) | 58,070,122 |
| අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවීම් | | (4,496,881,931) | 5,684,813,220 |
| භාණ්ඩාගාරයට ගෙවීම් | | (647,202,434) | (425,637,516) |
| නෙළුම් කුළුණේ ප්‍රමාද හානි | | 1,680,544,180 | 0 |
| **මෙහෙයුම්වලින් උත්පාදිත මුදල්** | | **45,293,062,841** | **57,033,902,511** |

| | 31.12.2018 | 31.12.2017 |
|---|---|---|
| **22-1. ලැබිය යුතු ගිණුම්** | | |
| ලැබිය යුතු CESS | 465,636,257 | 408,978,695 |
| ලැබිය යුතු TDC | 957,178,524 | 911,312,704 |
| ලැබිය යුතු OLAC මත බදු | 39,280,793 | 53,403,552 |
| ලැබිය යුතු ටෙලිකොම් බදු | 977,293,794 | 1,635,306,264 |
| කොකාවිල් කුළුණ -අයකරගැනීම් | 83,297,174 | 94,308,595 |
| අයකරගැනීමට ඇති හිඟ කාර්ය මණ්ඩල ණය | 2,547,337 | 2,547,337 |
| ලැබිය යුතු ගුවන් ටිකට්පත් | 97,920 | 0 |
| ගුවන්විදුලි සංඛ්‍යාත ගාස්තු | 1,661,483,613 | 3,603,995,092 |
| අයකරගැනීමට ඇති කොකාවිල් බදු කුලිය | 700,561 | 1,536,292 |
| ආමේචර ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු | 39,981 | 43,614 |
| | **4,187,555,954** | **6,711,432,147** |
| | **2,523,876,193** | **181,061,207** |

| | 31.12.2018 | 31.12.2017 |
|---|---|---|
| **22-2. ගෙවිය යුතු ගිණුම්** | | |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය අනුව | 1,934,110,203 | 180,850,917 |
| ***අඩු කළා:*** ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | (1,818,593,410) | (34,964,188) |
| | **115,516,793** | **145,886,728** |
| | **(30,369,935)** | **58,070,122** |

# විගණකාධිපතිගේ
# වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඑම්යූ/ඒ/ටීආර්සී/01/18/17 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 මැයි 30 දින

සභාපති

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර්31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

ගිණුම්කරණ ප්‍රමිත 16 දේපළ පිරියත හා උපකරණ

(i) කොමිෂන් සභාවේ දේපළ පිරියත හා උපකරණවල වටිනාකම පිරිවැය වූ රු. 13,272,142,850 කට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එහි සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

කොමිෂන් සභාවට අයත් ලෙස දක්වා තිබූ රු. 45,000,000 ක් වටිනා අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ප්‍රමාණයකින් යුත් ඉඩමකින් ආසන්න වශයෙන් සියයට 50 ක ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අත්පත් කරගෙන තිබියදී ඒ ගැන නොසලකා ඉඩමේ මුළු පිරිවැය ඉහත වටිනාකම තුළ අන්තර්ගත කර තිබුණි.

(ii) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු.15,192,644 ක් වූ ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ප්‍රමිතියේ 51 ඡේදය ප්‍රකාරව එම වත්කම් නැවත අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නෙළුම් කුළුණ ව්‍යාපෘතියේ ප්‍රමාදයන් සඳහා අයකර ගන්නා ලද ප්‍රමාද ගාස්තු මුදල වූ රු. 1,680,544,180 වෙනත් ආදායම් ලෙස ගණනය කළ යුතු වුවත් නෙළුම් කුළුණ ප්‍රමාද ගාස්තු ලෙස ජංගම වගකීම් යටතේ ගිණුම් ගත කර තිබුණි. ඊට අමතරව ඒ සඳහා විනිමය අලාභ ගණනය කර රු. 226,998,520 ක මුදලක් ද එම ගිණුමට බැර කර තිබුණි. මොරටුව විශ්වවිද්‍යාලය මගින් දී ඇති රෙකමදාරුවට අනුකූලව ඉදිරියේදී ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීමක් සඳහා වූ කැබිනට් අනුමැතිය ලබාගැනීම සඳහා වූ කෙටුම්පත් මුදල ප්‍රමාද ගාස්තු ලෙස ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර ඇති බව අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණි. එසේ වුවද මෙම ප්‍රකාශය තහවුරු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකෙරුණි.

(ii) 2018 ඔක්තෝබර් 24 සිට 2019 ඔක්තෝබර් 23 දක්වා වූ වර්ෂය සඳහා Oracle Database Support සේවා ගිවිසුම අළුත් කිරීම වෙනුවෙන් රු. 1,924,800 ක් ගෙවා තිබූ අතර 2019 ජනවාරි 01 සිට 2019 ඔක්තෝබර් 23 යන කාලපරිච්ඡේදයට අදාල වටිනාකම ලෙස රු. 1,560,934 ක් ඉදිරියට ගෙවීමක් ලෙස ගිණුම්වල හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව එම ගණනින් වර්ෂයේ ලාභය අඩුවෙන් දක්වා තිබුණි.

(iii) කොමිෂන් සභාවේ විදුලි සෝපානයේ 2018 සැප්තැම්බර් 01 සිට 2019 අගෝස්තු 31 දින දක්වා සේවා කටයුතු ඉටුකිරීම සඳහා 2018 නොවැම්බර් 30 දින රු. 560,955 ක් ගෙවා තිබුණ අතර 2019 ජනවාරි 01 සිට 2019 අගෝස්තු 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල රු. 373,458 ක් ඉදිරි ගෙවීමක් ලෙස ගිණුම්වල හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව එම ගණනින් වර්ෂයේ ලාභය අඩුවෙන් දක්වා තිබුණි.

(iv) ආයතන 03 ක් විසින් පිළිවෙලින් සංඛ්‍යාත ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හා කොන්ත්‍රාත් ගිවිසුම කඩවීම මත එකතුව රු. 62,146,612,000 ක් වන්දි ඉල්ලා කොමිෂන් සභාවට එරෙහිව නඩු පවරා තිබුණි. සේවා කඩකිරීම් හා සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයකට හානි වීම් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට එරෙහිව පනවා තිබූ නඩුව සම්බන්ධයෙන් රු. 14,800,000,000 ක වන්දි මුදලක් ඇස්තමේන්තු කර තිබුණද එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) පැහැදිලි නොකළ වෙනස්කම්

(i) සමාලෝචිත වර්ෂයේදී ජාතිය ගොඩනැගීමේ බද්දට සහ ආර්ථික සේවා ගාස්තු බද්දට යටත් පිරිවැටුම, බදු ගෙවීම් උපලේඛනය අනුව රු. 11,845,891,066 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු. 11,811,272,245 ක් වූයෙන් බද්දට යටත් පිරිවැටුම රු. 34,618,821 ක් අඩුවෙන් හඳුනාගෙන තිබුණි. මෙම වෙනස හඳුනා ගැනීම සඳහා සැසඳීම් ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ ශේෂය රු. 223,392,670 ක් වුවද ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වගකීම රු. 238,629,877 ක් වූයෙන් ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වගකීම රු. 15,237,207 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම

භාණ්ඩාගාර තැන්පත් ලෙස පෙන්වා තිබූ රු. 354,000,000 ක ආයෝජන තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් නොතිබුණු අතර මෙම ශේෂය වසර 09 කට අධික කාලයක සිට චලනය නොවී පැවතුණි. මෙම ආයෝජනය පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර අදාල ලිපිගොනු යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ

සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාවේ පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | විස්තරය |
| --- | --- |
| (අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | උපයන විට ගෙවීම් මත බදු අදාල නිලධාරීන්ගේ වැටුපෙන් අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වුවද, ඊට පටහැනිව කොමිෂන් සභාවේ අරමුදලින් රු. 6,795,783 ක් පෙර වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේ ද ගෙවා තිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.2 වගන්තිය | බදවා ගැනීමේ පරිපාටිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757(2) | කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරුණි. |
| (ඈ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 ඡේදය | රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා තීරණය කිරීමේදී, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවද එම නිර්දේශ හා අනුමැතිය නොමැතිව කොමිෂන් සභා තීරණ මත හා අභ්‍යන්තර චක්‍රලේඛවලට අනුගත වෙමින් කාර්යමණ්ඩලය වෙත දිරි දීමනා, ප්‍රසාද දීමනා හා ගෙවල් කුලී දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු. 91,859,110 ක් ගෙවා තිබුණි. |
| (ඉ) 2007 ජුනි 01 දිනැති අංක එන්එස්සීසී/3/ඒසීසී/24 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපිය | මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය සඳහා රු. 2,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් අනුමත කර තිබුණද රු. 6,000 බැගින් සමාලෝචිත වර්ෂයේ රු. 11,808,000 ක් ගෙවා තිබුණි. ඒ අනුව අනුමත ප්‍රමාණයට වඩා රු. 7,872,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  කොමිෂන් සභාවේ අරමුණුගත කාර්යයන් නොවන චිත්‍රපටයක් හා ටෙලිනාට්‍යයක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු. 32,192,177 ක් හා රු. 7,160,400 ක මුදලක් කොමිෂන් සභා අනුමැතිය මත 2015 වර්ෂයේදී ගෙවා තිබුණු අතර චිත්‍රපටය වෙනුවෙන් වැය කරන ලද මුදලින් රු. 26,400,000 ක් පමණක් චිත්‍රපට අධ්‍යක්ෂවරයා විසින් 2018 ජනවාරි 12 දින වන විට ආපසු ගෙවා තිබුණි. එසේ තවදුරටත් රු. 5,782,177 ක මුදලක් අයකර ගැනීමට ඉතිරිව තිබුණි. ඒ අනුව චිත්‍රපටි නිෂ්පාදනයෙන් අයකරගත නොහැකි වූ සහ ටෙලි නාට්‍ය වෙනුවෙන් ගෙවූ එකතුව රු. 12,942,577 ක මුදල ආර්ථික නොවූ ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

  (අ) ඉදිකිරීම් කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 2,494 ක් වූ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම් ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2014 අගෝස්තු 10 දින වැඩ ආරම්භ කර 2016 ජූලි මාසය වන විට ඉදිකිරීම නිම කළ යුතු විය. මෙම ව්‍යාපෘතිය 2016 ජූනි 23 දින වන විට නතර කර තිබුණ අතර 2018 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද මුළු වියදම රු. මිලියන 684 ක් වූයෙන් ඉදිකිරීම් නිම නොකරන ලද මෙම ගොඩනැගිල්ල වසර 02 කට අධික කාලයක සිට නිශ්කාර්යව පැවතුණි.

  (ආ) ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කලද වර්ෂය තුළ ක්‍රියාත්මක නොකරන ලද රු. 1,856,798,710 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යයන් 32 ක් වූ අතර ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුලත් අයිතමයන්ගෙන් වර්ෂය තුළ ප්‍රසම්පාදන කාර්යයන් 11 ක් පමණක් අවසන් කර තිබුණි.

  (ඇ) 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් නොකර වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රසම්පාදන 10 ක් වූ අතර එහි වටිනාකම රු. 3,376,754 ක් විය.

## 3. අනෙකුත් විගණන නිරීක්ෂණ

### (අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(i) කොකාවිල් ඇන්ටනා හා ට්‍රාන්ස්මිෂන් කුළුණ භාවිතා කරන ක්‍රියාකරුවන් 04 දෙනෙකුගෙන් 2012 වර්ෂයේ සිට අයවිය යුතු කල්බදු මුදල් අයකර ගැනීමට ගිවිසුම් ගත වී නොතිබුණ අතර ගිවිසුම් ගත වූ එක් ක්‍රියාකරුවකුගෙන් රු. 334,293 ක් 2019 මැයි 15 දින දක්වාම අයකර ගෙන නොතිබුණි.

(ii) මෙම කුළුණ භාවිතා කරනු ලබන ක්‍රියාකරුවන්ගෙන් 2012 ජනවාරි සිට 2018 නොවැම්බර් 30 දින දක්වා අයවිය යුතු විදුලි බිල්පත් වටිනාකමින් රු. 75,463,256 ක් 2019 මැයි 15 දින දක්වා අයකර ගෙන නොතිබුණි. මෙම මුදල් නොගෙවීම සම්බන්ධව ක්‍රියාකරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) ණය සහ වෙනත් ලැබිය යුතු ශේෂ

- සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු. 1,661,523,593 ක් වූ අතර වසර 02 කට වැඩි ණය ශේෂය රු. 373,504,055 ක් විය. ණයගැති වර්ගීකරණය අනුව වසර 02 කට වැඩි සියළුම ණයගැතියන් මෙම ඛාණ්ඩයට ඇතුළත් කර තිබූ බැවින් එම ණයගැතියන්ගේ වයස් විශ්ලේෂණය නිවැරදිව හඳුනාගත නොහැකි වූ අතර අවුරුදු 07 සිට අවුරුදු 30 කට අධික කාලයක සිට පැවතෙන ආයතන 10 ක රු. මිලියන 1 ට වැඩි එකතුව රු. 302,858,443 ක ශේෂයක්ද මෙම ශේෂය තුළ පෙන්වා තිබුණි.

- 2018 දෙසැම්බර් 31 වනවිට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් අයවිය යුතු මුදල රු. 145,254,449 ක් වූ අතර ඒ තුළ 1981 වර්ෂයේ සිට පැවත එන ශේෂයන් ද විය.

- ණයගැතියන්ගෙන් වැඩියෙන් අයකරගෙන තිබුණු සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු මුදල වූ රු. 2,129,435 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කොමිෂන් සභාවට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර 2014 ජූලි 28 දින එළඹුණු කොන්ත්‍රාත් ගිවිසුම 2016 අගෝස්තු 10 වන දින අවසන් කර තිබූ අතර කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව කොන්ත්‍රාත්කරු විසින් ආරවුල් බේරුම්කාර මණ්ඩලය වෙත පැමිණිල්ලක් යොමු කර තිබුණි. බේරුම්කාර මණ්ඩලයේ තීරණය අනුව රු. 139,931,875 ක මුදලක් පැමිණිලිකරුට ගෙවන ලෙස කොමිෂන් සභාවට නියම කර තිබුණද කොමිෂන් සභාව විසින් එම තීරණයට එරෙහිව වැඩිදුරටත් බේරුම්කරණය (Arbitration) සඳහා යොමු කර තිබුණි. පැමිණිලිකාර ආයතනය විසින් රු. 706,066,169 ක වන්දි මුදලක් ඉල්ලා තිබුණි.

(ඇ) ක්‍රියාකාරිත්වය සහ සමාලෝචනය

(i) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරන ලද එහෙත් ක්‍රියාත්මක නොකරන ලද "Net Safe Child Protection" වැඩසටහන සඳහා 2018 වර්ෂයේදී ද රු. මිලියන 10 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. මෙම වැඩසටහන සඳහා කොමිෂන් සභා අනුමැතිය ලැබී නොතිබුණ අතර ව්‍යාපෘතියේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පෙරහණු ක්‍රම (Filtering Mechanism) මගින් අන්තර්ජාලයේ අන්තර්ගතයන් පාලනය කිරීමට ක්‍රමවේදයක් සැකසීමට යෝජනා කර තිබුණි. එසේ වුවද 2019 අප්‍රේල් 09 තෙක් එම යෝජනාවද ක්‍රියාත්මක කරවීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ii) ප්‍රමාණවත් තාක්ෂණික නිලධාරීන් නොමැති වීම හේතුවෙන් 2016 වර්ෂයේදී කල්දමා තිබූ සංඛ්‍යාත නිරීක්ෂණ පද්ධතිය ස්වයංක්‍රීය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම යන වැඩසටහන සමාලෝචිත වර්ෂය තුළදී ද සිදුකර නොතිබුණි.

(iii) ජංගම දුරකථන භාවිතා කරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම උදෙසා "ජාතික උපකරණ හඳුනා ගැනීමේ ලේඛනය"(National Equipment Identity Register) සකස් කිරීම සඳහා 2014 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබුණද ව්‍යාජ දුරකථන වෙළෙඳපොළට ඒම වැළැක්වීම සඳහා වූ වැඩසටහන 2018 වර්ෂයේදී ද ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv) විශ්වවිද්‍යාල සහාය කරගෙන විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීමට පසුගිය වර්ෂයේදී සැලසුම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ද ඒ සඳහා රු. මිලියන 1.5 ක ප්‍රතිපාදනයක් වෙන්කර ගෙන තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු වැයක් දරා නොතිබුණද, එහි ප්‍රගතිය සියයට 50 ක් බවට ආයතනය විසින් දන්වා තිබුණි.

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

නෙළුම් කුළුණ ව්‍යාපෘතිය

2010 ඔක්තෝබර් 29 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නෙළුම් කුළුණ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව චීන සමාගම් 02 ක් වෙත ප්‍රදානය කර තිබුණ අතර 2012 ජනවාරි 03 දින විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා එම සමූහය, කොන්ත්‍රාත් ගිවිසුමට එළඹ තිබුණි. කොන්ත්‍රාත් වටිනාකම එ.ජ.ඩො 104,300,000 ක් වූ අතර ගිවිසුමට අනුව 2012 නොවැම්බර් 12 සිට 2015 මැයි 12 දින දක්වා දින 912 කින් මෙම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුව පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2011 දෙසැම්බර් 14 දිනැති අංක අමප/11/2262/501/026/ටීබීආර් දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව හෙක්ටයාර් 2.59 ක ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය මගින් කොමිෂන් සභාව වෙත පවරා දී නොතිබුණි.

(ii) නෙළුම් කුළුණ ඉදිකිරීමෙහි කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසු 2015 අගෝස්තු 28 දිනැති අංක 2K15.217.02(2) දරන කොමිෂන් සභා තීරණය අනුව කොන්ත්‍රාත් කාලය 2017 ඔක්තෝබර් දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී තිබුණද 2019 මාර්තු 31 දින වන විටත් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

(iii) උපදේශන ගාස්තු වශයෙන් වාරික 12 ක් එනම් රු. 150,000,000 ක් ගෙවීමෙන් පසු එම ගෙවීම් අත්හිටුවා උපදේශන ගාස්තු ගෙවීම් ගිවිසුම් කොන්දේසි විධිවිධානවලට පරිබාහිරව කොන්ත්‍රාත් අධීක්ෂණය වෙනුවෙන් යැයි සඳහන් කර මසකට රු. 3,000,000 බැගින් 2015 නොවැම්බර් මස සිට උපදේශක ගාස්තු වශයෙන් මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවමින් පවතී. එසේ ගෙවීමට සිදු වූ මූලික කාරණාව ව්‍යාපෘතිය ඉදිකිරීමේ වැඩ මනා අධීක්ෂණයකින් තොරව සිදු කිරීමට

ඉඩහැරීමෙන් සිදුවිය හැකි හානි වළක්වා ගැනීම බව කොමිෂන් සභාව විසින් දන්වා තිබුණි.

(iv) කොළඹ නෙළුම් කුළුණ දේපළ කලමනාකරණ සමාගමකට බදු දීම සඳහා වූ ක්‍රියාවලියක් ආරම්භ කර තිබුණ ද ඒ සඳහා මෙතෙක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති